http://e-pusthakalaya.blogspot.

රෝහණ



The Reader's Place
Novel..

# සතුට ඔබේ කඳුලක් නම්

http://e-pusthakalaya.blogspot.com

සුනිල් රෝහණගේ නිර්මාණ

<u>නවකතා</u>

- ගලාගිය කඳුළු
- දෙලොවට පියගැට
- ඒ කඳුළුත් මහ මුහුදට එකතු වුනා
- තුෂාරයෙන් වැසුනු සඳක්
- සමුගනිමි
- දුක්බර මොහොත
- සමාරාධනය
- සිහිනයේ දෙව් දුවනි
- අගෝස්තුවේ සීතල සුළඟක්
- ගිම්හාන නිවාඩුව
- පියාපත් දෙන්න දෙවියනි
- පිපී වීදුක සටහනක්
- හොඳ ළමයෙක් වෙන්න පුලුවි
- ආත්මයෙන් ගැලූ කඳුලක්
- දෙපා තබමි කඳුළු මාවතේ
- ඔබ මට අහිමි නම්
- සචිත්‍රා
- අයාලයේ ගිය ගමන
- තවත් උණුසුම් දවසක්
- බ්‍රින්දාවන් එක්ස්ප්‍රස්
- මලක් නොවෙමි ඔබේ
- සතුට ඔබේ කඳුලක් නම්
- හංසිමාලි

<u>සඟරා</u>

- සුමග
- මග
- පියවර
- චින්තා

<u>නාට්‍ය</u>

- භය වෙනියා
- තුෂාරි
- පාරා (රචනය)
- කොටළුවෝ

The Reader's Place Novel.



කිසි දිනෙක යළිත් අප දෙදෙනා හමු නොවෙනු ඇත. එහෙත් අප ජිවත් වූ අතීතයේ සුවඳ අපේ හදවත් තුළින් කිසිදක මැකී නොයනු ඇත. ඒ උත්තරීතර හැඟීමක අසිරිමත් නිර්මානයයි. එයද යම් දිනෙක දෙවියන්ගේ නිර්මානයක් වෙනු නිසැකය. මම එසේ සිතුවෙමි.



1

මම මද වේලාවක් දෑස් පියාගෙන සිටියෙමි. මගේ අත්ලට සුමුදු පහසක් දැනේ. ඒ සිනිඳු පහස මල්පෙත්තක ඇති සියුමැලි පහසක් හා බැඳුණු සුගන්ධයක් සේ මට දැනේ. මම සිත අවදි කරමි. මගේ සිත සියුම් මිහිරකින් වෙළී යයි.

හිරු රැසින් බොඳ වුනු මීදුම් පටලයක් සේ කිසියම් දැහැනකින් මගේ සිත කය දෙක වෙලාගෙන ඇත. මම ඇගේ කණට කොඳුරා මෙසේ ඇසුවෙමි.

" ඔයා කියන්නේ අපි ආයෙත් ගොවිපලට යමු කියලද ?"

http://e-pusthakalaya.blogspot.com



"ඔයාට පිස්සුද ශාන් මම එහෙම කිව්වෙ විහිළුවට. අපි කොච්චර අමාරුවෙන්ද එහෙන් ගැලවිලා ආවේ"

"ගෝති ගැන මට හරි දුකයි"

"මහන්තා ඒ ගෑණිව මරල දාවි"

"අපි නිසා ඒ ගෑණිට ඒ වගේ ඉරණමක් අත්වුනොත්.....

"මට නම් හිතාගන්නත් බැහැ ශාන්"

මම ඇය දෙස බැලීමි. ඒ දෑස් මොන තරම් ලස්සනද ? බලාපොරොත්තුවේ සේයාවක් ඒ දෑස් තුළ සැගවී ඇත.

"මට දැන් ගෙදර මැවිල පේනව....."

"මට නම් හිතාගන්නත් බැහැ දේවි ඔයාව කොහොම පිළිගනීවිද කියල. එයා හිතාවි එයා තමයි දැන් මේ ලෝකෙ ඉන්න වාසනාවන්තම පෙම්වතා කියල. අංජු දන්නවද වටිනා වස්තුවක් නැතිවෙල තිබිල ආපහු හම්බවුනාම මොනතරම් හිතට සතුටක් දැනෙනවද කියල....."

"අරුණිටත් එහෙම හිතේවි"

"ඔව්....."

"දැන් එයා ඔයා එන දවස ඇඟිලි ගණන් කරනව ඇති"

"පිස්සුද අංජු ඒ දවස දැන් පහුවෙලා."

"ඒක තමයි ඒ ගොල්ලො අපි ගැන දැන් මොනව හිතාගෙන ඉන්නවද දන්නෙ නැහැ. අපි කිසිම දෙයක් දන්නෙ නැහැ පත්තරයක් තියා රේඩියෝ එකක්වත් අපි මේ මාස ගානකට ඇහැව්වෙ නැහැ"

"හරි පුදුමයි ශාන්. ඒත් මේක කිසිදක නොමියන සත්‍යයක්."

"මේ වගේ දෙයක් ලෝකෙ කවදාවත් සිද්ධවෙල නැතුව ඇති.

"මගේ හුස්ම යනකන් කවදාවත් මට ඔයාව අමතක කරන්න බැරිවේවි"





"මටත් එහෙමයි"

"අපි පොලීසියට ගිහින් අපේ විස්තර කියපු ගමන් මොන වගේ දෙයක් වෙයිද ? ඒ ගොල්ලො මේ ගැන හැමතැනම ප්‍රචාරය කරාවි. රේඩියෝ එකේ......, ටී.වී...... එකේ, පත්තරකාරයො අපිව වටකරගනීවි.

"ලොකුම කරදරේ ඒ ගොල්ලො අහන ප්‍රශ්නවලට උත්තර දෙන එක."

"අපි දෙන්නගෙ පින්තූර පත්තරේ ලොකුවට වැටේවි. අපි කියන දේවල් ඒ ගොල්ලො විශ්වාසකරයිද ? විශේෂයෙන්ම අම්මල නම් අපි ගැන අහිතක් හිතන එකක් නැහැ. ඒත් දේවි....."

"දේවි මාව විශ්වාස කරනව ශාන්...... ඒත් අරුණි කොහොමද ?"

"අරුණිටත් මම මේ කතාව කියනව. ඒක පිළිගන්න එක නොපිළිගන්න එක එයාගෙ වැඩක්. හැබැයි පත්තරේ සිද්ධිය විකෘති කරල පල කලොත්..... ?"

"ඒක තමයි ප්‍රශ්නෙ. මම කියන්නම් අපි කෙලින්ම මද්‍රාසියට නොගිහින් අපේ ගෙදර යමු. එහෙ ගිහින් මොකක්ද කරන්නෙ කියල අපි දෙවෙනියට තීරණයක් ගමු."

"මටත් හිතෙන්නෙ ඒක තමයි හොඳ"

"අනික ඔයාගෙ පාස්පෝට්ටුත් නැහැ. වීසත් නැහැ"

"මාව අත්අඩංගුවට ගත්තොත්..... ?"

"ඒවා කියන්න බැහැ. ඇත්ත එළිවෙන්නෙ පස්සෙ"

"ජීවිතේට මං හිරකූඩුවක ලැගල නැහැ"

"හොඳට කල්පනා කරල ඕන මේ ප්‍රශ්නෙට මුහුණ දෙන්න."

හිටිහැටියේම ලොරිය නතර විය. මම හිස ඔසවා බැලීමි. එක දිගට ලොරි පේළියක් නතර කොට තිබිණ. රියදුරා ලොරියෙන් බිමට බැස්සේ තම සහායකයාටද මහත් හඬින් යමක් කියමිනි.



The Reader's Place novel..

http://e-pusthakalaya.blogspot.com

මම හාත්පසම සිසාරා බැල්මක් හෙලුවෙමි. අවට පැතිර තිබුණේ දුමාරයක් වැනි මීදුම් පටලයකි. පාර දෙපසේම වූයේ මහ කැළෑය. ජේන තෙක් මානයේ එකද නිවසක් හෝ ගොඩනැගිල්ලක් දක්නට නොවීය.

"මොකද දන්නේ නැහැ ලොරිය නවත්තගෙන ඉන්නේ"

"ඒක තමයි මාත් කල්පනා කලේ."

"ඔයා බිමට බැහැල අහන්න....."

මා බිමට බසින්නට සැරසෙත්ම රියදුරා ආපසු නගින ලෙස මට සංඥාවක් කලේය. මා ලොරියට නගිත්ම එය ආපසු හරවා පවනට බඳු වේගයෙන් ධාවනය කලේය.

The Reader's Place Novel..

"මේ කොහේද යන්නේ..... ?"අංජු බියවී ඇසුවාය.

"මේක ආපු පාර නෙවි....."

"වෙන පාරකින් යනවද දන්නෙ නැහැ"

"ලොරිත් නවත්තල....."

"පාර පේන්නෙත් නැහැ"

ලොරිය ධාවනය කළ වේගය සිතා ගත නොහැකි තරම් විය. හැලහැප්පෙමින් ගමන් ගත් එය වලවල් වල වැටුනද එහි වේගය අඩු කලේ නැත. වරෙක අංජු විසිවී ගොස් වැටුනේ අනෙක් පැත්තටය.

"මේ යක්කු අපිව මරන්නද හදන්නෙ..... ? අංජු හයියෙන් අල්ලා ගන්න....."

"අල්ලගන්න තියෙන්නෙ ලූනු ගෝනි විතරයි. ඒවත් පෙරලෙනවා"

"ඔයා කෑගහන්න"

"උන්ට ඇහෙන්නේ නැහැ"

"එහෙනම් වීදුරුවට ගහන්න....."





"නැගිට්ටොත් මාව විසිවෙල යාවි" "නැගිටින්න මෙතනින් බැහැ. නැගිට්ටොත් මාව විසිවෙල යාවි"

"අනේ දෙයියනේ"

"කෑගහන්න"

අපි මරලතෝනි දුන්නෙමු. එහෙත් අපේ හඬ ඔවුනට ඇසෙන්නට නැත. අංජු කිවාක් මෙන් මම ලූනු ගෝනිවල ආධාරයෙන් ටිකින් ටික නැගිට ගොස් වීදුරුවට ගැසීමි. රියදුරා මා දෙස බලා නැවත්විය නොහැකි බවට සංඥාවක් කලේය. අනතුරුව ඔහු රිය ධාවනය කලේ පෙරටත් වඩා වේගයකිනි.

දෙවියනේ සිදුවන්නට යන්නේ කුමක්ද ?

"ශාන් ආයෙත් අපි අමාරුවෙ වැටුන වගේ"

"මේ යක්කු කොහේද අපිව ඒ පාර එක්කගෙන යන්නෙ"

"අපිට ගැලවීමක් නැහැ ශාන්. අපි හරිම කරුමයක් කරල තියෙනව"

"මට තේරෙන්නෙ නැහැ අංජු"

"පාර පේන්නෙ නැති තරම් මීදුම වැටිල"

"උන් එළවන්නෙ පුරුද්දට"

"කරන්න දෙයක් නැහැ. අපි ලොරියෙන් පනිමු"

"බෙල්ල කඩාගන්නද ?"

"මේ බැංගලෝර් යන ගමනක් නෙවි"

"ඇයි ඔයා නැග්ගෙ. දැනගෙන නෙවිද ?"

"ඔයානේ ඇහැව්වෙ"

"මමදැයි ඇහැව්වෙ, ඔයානේ"

http://e-pusthakalaya.blogspot.com



"මේ යක්කු අපෙන් සල්ලි ගන්නද කොහේද බොරුවක් කිව්වෙ"

"මේ පැත්තෙ කිසිම ගෙයක් දොරක් නැහැ. ගිය පාරත් අපි අමාරුවෙ වැටුනෙ ලොරියක නැගල. ඔයා ආයෙත් කලේ ඒ මෝඩ කමමයි"

"මං මේ ලොරිකාරයින්ව දන්නෙ නැහැ"

"ඔයා කියන දේවල් අහල තමයි මාත් අමාරුවෙ වැටුනෙ" අංජු හඩන්නට පටන් ගත්තාය.

"ඔක්කෝටම ඉස්සෙල්ල ඔයා අඩන්න පටන් ගන්නව. ඇඬුවට ප්‍රශ්න විසඳේවිද ?"

"මොනව හරි ඉක්මනට කරන්න ශාන්"

"මේ කල්පෙ මට නම් ලංකාවට යන්න ලැබෙන එකක් නැහැ"

"ඔයා ලංකාව ගැන කියනව. මට පූනෙටවත් යාගන්න පුළුවන් කමක් නැහැ"

"මේක නම් මහ පුරුවෙ කරුමයක්ම තමයි"

"ගෝති දුන්න සල්ලි ටික කෝ ?"

"මම හැට්ට අස්සෙ ගහගත්ත"

"එතනත් විශ්වාස නැහැ"

"එහෙනම් කොහේද හංගගන්නෙ"

"ඒ සල්ලි ටිකත් මංකොල්ල කෑවොත් අපි දෙන්නම ඉවරයි"

"එහෙනම් ඔයා හංග ගන්න"

"මම කොහේ හංගන්නද ? අඩුම ගානෙ මට යට ඇඳුමක්වත් නැහැ. ඒකත් ගොවිපොළේදි පරණවෙල දිරලම ගියා"

"කතා කර කර ඉඳල වැඩක් නැහැ ශාන් මොනව හරි කරන්න....."





"මොනවද කරන්න පුළුවන්..... අර පොල්ලෙන් ගහල වීදුරුව කඩන්නද ?"

"ඔයාට පිස්සුද අපිට ඩැමේජ් ගෙවන්න වුනොත් මේ සල්ලි ටිකත් නැතිවේවි....."

"හිකන්ම කාලෙ යනව"

"ලොරියත් හැටට හැරේ යනව ශාන්"

"පාරෙන් පැන්නොත් අපි දෙන්නම ඉවරයි"

"එහෙමවත් ඉවරයක් වෙනව නම්....."

"කට වරද්දගන්න එපා....."

"මේක යනවද ඉගිල්ලෙනවද මන්ද ?"

"එයාර් හොස්ටස් කෙනෙක් හින්ද ඔයාට ඒ ගැන මට වඩා හොඳට තේරෙනව....."

"පිස්සු කතා. ලොරි කොහේද ඉගිල්ලෙන්නෙ"

"එහෙනම් කියන්නෙ....."

ලොරියේ වේගය උන්හිටි ගමන් අඩු විය. මගේ මුවින් පිටවූයේ සැනසුම් සුසුමකි.

"ඇති යාන්තම් මෙහෙමම ගියානම් අපි දෙන්න ඕනු ගෝනිවලටම යටවෙල මැරෙනව"

ලොරිය සෙමින් සෙමින් ගොස් එක්තරා මංසන්ධියකදී නතර කෙරිණ. ඒ සමගම රියදුරා බිමට බැස අපටද බිමට බසින ලෙස සංඥාවක් කලේය. ඒ අනුව මම බිමට බැස්සෙමි. එහෙත් ලොරියේ පිටුපස පොළව මට්ටමේ උස්වූ හෙයින් අංජුට බිමට බැසීමට නොහැකි විය. මම අංජු ඔසවා බිමින් තැබීමි.

"තමුසෙල කොහේද අපිව මේ ගෙනාවෙ ?"

http://e-pusthakalaya.blogspot.com



"මේ හරියට කියන නම අපි දන්නෙ නැහැ"

"එහෙනම් බැංගලෝර් යනව කියලනෙ තමුසෙල අපිව ත... ගත්තෙ ..... ?"

"බැංගලෝර් යනව තියා අපිට බීරූර්වලටවත් යාගන්න බැ... වුනා. ඒ පාර ඔක්කොම යටවෙල. ෂිවානි පාලමත් කැඩිල..... මෙ... නතර කරල තියෙන්නෙ දවස් තුනකට උඩදි. පාර පේන්නෙ නැහැ....."

"තමුසෙල මෙහෙ කොහේද ආවෙ ?"

"අපි ෂිමෝගවලට ගිහින් ටොරන්ගල්ලු වලට යනව."

"ඒ කොයි පැත්තද ?"

"කර්ණාටක"

"තමුසෙල අපිව හරි අමාරුවකනෙ දැම්මෙ"

"අපිට මෙතන බලාගෙන ඉන්න බැහැ..... රෑ වෙන්න කලි... අපිට ශිමෝගවලට නොගියොත් අපිත් අමාරුවෙ වැටෙනව."

"තමුසෙල හදන්නෙ අපිව දාල යන්නද ?"

"වෙන කරන්න දෙයක් නැහැ"

"අපිට යන්න ඕන කරන්නෙ පූනෙවලට"

"ඒ පැත්ත අපි දන්නෙ නැහැ"

"තමුසෙල මහ පුදුම මිනිස්සුනෙ....."

තවත් කතා කිරීමෙන් ඵලක් නැත. ඔවුන් අප දෙදෙනා ඒ මංසංධියේ අතරමං කොට දමා යන්නට ගියහ. අපි යළිත් වරක් අතරමංවීමු. යායුතු අතක් තබා සිතිය හැකි දෙයක්ද මට ඉතිරි වී නොතිබිණ. මංසංධියේ ගෙයක් දොරක් තබා සතෙකුගේ පුළුටක්වත් දක්නට නොවීය. දෙපස වූයේ ගල් කඳු සහ ලඳු කැළෑය. ඒ දෙ... කැළෑද මීදුමින් වැසී තිබිණ.





"ෂිමෝග කියන්නෙ කොහේද ?" මා අංජුගෙන් අසද්දී ඇය මා දෙස බැලුවේ නොමනාපයෙන් මෙනි.

"මම දන්නෙ නැහැ"

"ඔයා ඔයාගෙ රටේ නගර ගැනවත් දන්නෙ නැද්ද ?"

"ශාන් මේක ඔයාගෙ රට වගේ පුංචි රටක් නෙවි. සියගණනක් ගම්බිම් ගැන දැනගන්න මම භූගෝලෙ කරල නැහැ"

"ඒත් ඔයා ගුවන් සේවිකාවක්"

"ශාන් වෙන දෙයක් ගැන කතා කරන්න. අපි දැන් කොහේද යන්නෙ..... ? මීදුමෙන් පාර පේන්නෙත් නැහැ. වැස්සොත් අපිට මොකද වෙන්නෙ. ඔයා භූගෝලෙයි ඉතිහාසෙයි ගැන කතා කරනව. මොකක්ද ශාන් මේකෙ තේරුම"

මම අසල වූ ගලක් මත වාඩි වීමි. මීදුමෙන් දැන් සියල්ල වැසී ඇත. දෙපස පෙනෙන්නේ තෙරක් නොපෙනෙන මුහුදක් සේය.

"අපි ඉස්සරහට පුළුවන් තරම් යමු..... මැරෙන්න බලාගෙන හරි කරන්න තියෙන්නෙ එච්චරයි"

"කොයිතරම් දුරක් යන්නද ?"

"යන්න පුළුවන් දුරක් යමු."

වෙන කල හැකි දෙයක් නොමැති තැන අපි ඉදිරියටම ගමන් කලෙමු. කොපමණ දුරක් ගමන් කලේදැයි මම නොදනිමි. අන්තිමට බැටිම තැන අංජු නැවතුනාය.

"මට හරි මහන්සියි..... මෙහෙම යන එකේ තේරුමක් තියෙනවද ශාන්"

"මෙතන ඉන්න එකේ තේරුමක් තියෙනවද..... ? ගෙයක් දොරක් පේනතෙක් මානයේ නැහැ"

"මගේ කකුලුත් රිදෙනව"



The Readers Place novel.

http://e-pusthakalaya.blogspot.com



කළ යුත්තේ කුමක්ද ? මග රැඳෙන්නට කිසිසේත් පුළුවං කමක් නැත. අධික ශීතලක් දැනේ. වරින් වර හමන සුළඟ ඒ සීත දෙගුණ තෙගුණ කරයි. අවට කිසිම හැල හොල්මනක් නැත.

"අංජු පොඩ්ඩක් නවතින්න. පිටිපස්සෙන් මොකක්ද එනව වගේ."

"මීදුම නිසා පේන්නෙ නැහැ"

"කාර් එකක් වගේ ශබ්දයක් ඇහෙනව"

"ආයෙ ලොරිවලට නම් නගින්න බැහැ"

"අංජු වෙලාවෙ හැටියට ලොරියක නෙවි ට්‍රැක්ටරේක වුනත් නගිමු. ගෙයක් දෙරක් නැති මේ මහපාරෙ නැත්නම් අපි කොහෙද ඉන්නද ?"

"අනේ දෙවියනේ ! ඔබවහන්සේවත් අපිට පිහිට වෙන්නෙ නැද්ද ?" අංජු දෑත් එක්කොට අහස දෙස බලා කිවාය.

"අපි මේ ලෝකෙ විතරක් නෙවි ජීවිතෙත් අතරමං වෙලා"

"කාර් එකක් අංජු....." මම හිටිවනම කෑ ගැසිමි.

"අපි දිහා දෙයියො බැලුව වගේ"

"පරණ ඇම්බැසඩර් එකක්"

ඉතා සෙමින් සෙමින් ඉදිරියට ආ මෝටර් රථය අප අසලට එත්ම මම වහා පාරට පැන මොටර් රථය නතර කොට ගතිමි.

වීදුරුව පහත්කල කළු පැහැති තොප්පියක් පැළඳ සිටි මිනිසෙකු කවුළුවෙන් පිටතට ගෙල දමා අප දෙස බැලුවේය.

"ඇයි ?" ඔහු කතාකලේ හින්දි භාෂාවෙනි.

"අපි අතරමං වෙලා" මම ඉංග්‍රීසියෙන් කීවෙමි.

අංජු මා නිහඬ කොට කතාව මැදට පැන්නාය. ඇය කතා කලේ දෙමලෙනි.





"අපිට උදව් කරන්න. අපිට පුළුවන්නම් බැංගලෝරිවලට යන්න උදව් කරන්න"

"බැංගලෝරි........ ? මෙහෙන් කොහේද බැංගලෝරි යන්නෙ..... මේ පාර වැටෙන්නෙ ෂිමෝගාවලට. එතනටත් හැතැප්ම පනස් හතරක් තියෙනව."

මා කතා කරන්නට උත්සාහ කරත්ම අංජු මා නතර කලාය.

"ඔයා කතා කරන්න එපා ප්ලීස්"

අමුත්තා වෙලාව බලනු පෙනිණ. ඔහුගේ මුව මොහොතකින් වෙනස්වී ගියේය.

"මෙතන ඉන්න පුළුවන් තැනක් නෙවි. කාර් එකට නගින්න"

ඔහු කියන්නටත් පළමු අපි මෝටර් රථයේ පිටුපසට නැග ගතිමු. ඔහු වෙලාව බලමින් හැකිතරම් වේගයෙන් මෝටර් රථය පැදවූවේය.

"මේ කතා කර කර ඉන්න වෙලාවක් නෙවි. අපි පස්සෙ කතා කරමු. දවල් දොළහ වෙන්න ඉස්සෙල්ල බැන්ගල්කොට් පන්න ගන්න ඕන....." ඔහු තවත් එකද වචනයකුදු කතා කලේ නැත.

මාත් අංජුත් මුහුණට මුහුණ බලා ගතිමු. පැයකට ආසන්න මොහොතක් ගතවෙන්නට ඇත. ඒ අතර පාර මුළුමනින්ම නොපෙනී ගියේය. අමුත්තා ඒ අතර රිය පැදවූයේ නොපෙනෙන පාර සිතින් පමණක් ඉලක්ක කරගෙනය.

"දෙවියන් සිහිකරගන්න..... පාර මොකවත් පේන්නෙ නැහැ....."

"ඉස්සරහින් වාහනයක් එයිද ?"

"මැරිච්ච මිනිස්සු කොහේද කාර් එළවන්නෙ"

"මොනව..... ?"

"මළවුන්ගෙ ලෝකය ගැන අහල නැද්ද ? මේ උන්ගෙ වැයික්කිය."



The Reader's Place Novel..

http://e-pusthakalaya.blogspot.com



"මේ මිනිහ මොනවද මේ කියන්නෙ..... ?" මම අංජුගේ කණට කොඳුරා කීවෙමි.

"ඒ පාර අපි යන්නෙ මැරිච්ච මිනිස්සු ළඟට වගේ....." මඳක් ඉස්සී රියදුරු ආසනය දෙස බැලිමි. මගේ සිතට සහනයක් දැනුණේ ඔහුගේ පාද ක්‍රියාත්මක වෙනු දකිත්මය.

"මිනිහගෙ කකුල් තියෙනව" මම යළිත් වරක් අංජුගේ කොඳුරුවෙමි.

"මොනවද මේ ඔයා කියවන්නෙ ?" අංජු මා දෙස බැලුවාය.

"මිනිහ අමනුෂ්‍යයෙක් නෙවි. එයාට කකුල් තියෙන භූතයින්ට කකුල් නැහැ පාවෙනව"

"විකාර කතා කරන්න එපා ශාන්"

"ඒ මනුස්සය කොහොමද කාර් එක එළවන්නෙ ? මොකවත් පේන්නෙ නැහැ..... මට නම් පුදුමයි මේ එළවන ඉස්සරහින් මොකවත් ආවොත් අපි කුඩේ කුඩු"

අංජු මගේ කකුලේ ඇඟිල්ල ටිදෙන්න පෑගුවාය.

"කියවන්න එපා ශාන්. දැන් ඔයාගෙ කටම වදින්නෙ....."

"ඇස් දෙක පියාගන්න. එතකොට මොනව වුනත් නැහැ....."

අංජු මගෙන් මඳකට ඈත් වී කවුළුව අසලටම ගියාය. වටින් කිසිම දෙයක් නොපෙනෙන ලෝකය මැද අමුත්තා රිය ධාවනය කලේ කිසිදු කතාවකින් තොරවය. තවත් මොහොතකින් ඔහු තැන රිය නතර කළේය.

"පාර හොයාගන්න බැහැ"

"දෙයියෝ සාක්කි" මට කියවුනේ ඉබේටමය. ඒ වචනයකි. අමුත්තාට එය ඇසෙන්නට ඇත. ඔහු මා දෙස විදියට බැලුවේය. මම ඔහු දෙස බලා අහිංසක සිනහවක් පෑවෙමි. සමහරවිට ඔහුට එය නොතේරෙන්නට ඇත.

The Reader's Place Novel..



"මීදුම ටිකක් අඩු වෙනකන් අපිට මෙතන නතර වෙන්න වේවි. දැන් භයානක හරිය පැන්න....." ඔහු සුසුමක් හෙලා ලය සැහැල්ලු කරගත්තේය.

"ඔය දෙන්නට මොකද වුනේ ?"

"අපි දෙන්න අතරමං වුනා සර්..... අංජු හැඬූ කඳුලින් කතා කළාය.

"අපි දැන් අතරමං වෙලා මාස හතරක් විතර වෙනව. අපි මෙච්චර දවසක් හිටියෙ වහල් කඳවුරක."

"කොහේද දෙන්නගෙ ගම..... ?"

"අපි පූනෙ. වැඩ කරන්නෙ මද්‍රාසියෙ....."

"මොනවද කරන්නෙ....?"

"අපි බිස්නස් කරන්නෙ..... අපිට ෆාමසි එකක් තියෙනව."

"නම කවුද ?"

"මගේ නම ශාලු. හස්බන්ඩ්ගෙ නම මිට්‍රුන්....."

"දෙන්නම හින්දිද ?"

"මම හින්දි..... හස්බන්ඩ් මැලේ....."

"මට හිතුන..... එයා කේරළේ වෙන්න ඇති"

"ඔව්....."

"මූනුණෙන් කියන්න පුළුවන්"

"කොහොමද අතරමං වුනේ..... ?"

"අපි පූනෙ ගිය බස් එක මගදි මංකොල්ල කෑව..... අපි ජීවිතේ බේරගන්න ලොරියකට නැග්ග. ලොරිකාරය අපිව අතරමං කලා. පස්සෙ අපි වහල් කඳවුරකට අහු වුනා....."

"දෙන්නත් එක්ක මේ පැනල එන ගමන්ද ?"

http://e-pusthakalaya.blogspot.com



"ඔව්....."

"මට තේරුන..... මට සැක හිතුන ඔය ළමයගෙ ලස්සනයි ඇඳුමයි දැක්කම..... ඔය ඇඳුම් අයිති ග්‍රෝතික මිනිසුන්ට.....මේ පැත්තෙ මිනිස්සු නැති එක හොඳයි නැත්නම් ගෝත්‍ර වාදිකයො දෙපැත්තට බෙදිල සටන් කරනව."

"අපිව පොලිසියකට ඇරලන්න බැරිද සර්....."

"පොලිසියකට..... මම පොලිසියට විරුද්ධ මිනිහෙක්... මේ පැත්තෙ පොලිසි නැහැ. මං ජීවත්වෙන්නෙ පොලිසියක් ගව්ගානකවත් නැති පැත්තෙ."

"අපි දැන් කොහේද මේ ඉන්නෙ..... ?"

"මේ හරියට කියන නම මම දන්නෙ නැහැ. මම අවුරුදු දෙකකින් ටවුමක් දැකල නැහැ. මම අද ගියේ බීරුඒර්වලට අවුරුදු ගානෙ පුතාට කතා කරන්න හිතාගෙන. එයා ඉන්නෙ ඉතාලියෙ. මම අවුරුදු ගානකින් මගේ පුතාව දැක්කෙ නැහැ..... එයාට අන්තිමට කතාකලේ දැනට අවුරුදු දෙකකට උඩදී. ඊට පස්සෙ මම මළවුන් අතරට එකතු වුනා. දැන් එයාට මම මැරිච්ච මිනිහෙක්"

"මොනව..... ?"

"මිස්ටර් ඇත්තටම මැරිච්ච කෙනෙක්ද ?"

"ඔව්....." මගේ ඇග සීතල වී ගියේය. අංජු ඇස් මහත්කොට මා දෙස බැලුවාය.

"මම මැරිච්ච මිනිස්සු අතර ජීවත්වෙන කෙනෙක්"

"මට තේරෙන්නෙ නැහැ"

"අපිට කතාකරන්න හුගක් දේවල් තියෙනව. ඒත් බය වෙන්න එපා මම අමනුෂ්‍යයෙක් නෙවි."

"එහෙනම් මැරිච්ච මිනිහෙක් කිව්වෙ ?"

"ඔයගොල්ලො වගේ..... දැන් ඔයගොල්ලන්ගෙ දෙමව්පියන්ට ඔය ගොල්ලො මැරිච්ච මිනිස්සු. මෙහෙම තව අවුරුදු දෙකක් ගියොත් මොකද වෙන්නෙ....."





"හපෝ දෙවියනේ ! අද හෙටම අපි ගෙදර යන්න ඕන."

"මාත් හිතුවෙ එහෙමයි. ඒත් ඒක සිද්ධවුනේ නැහැ. දැන් මායි මගේ බිරිඳයි ලෝකයට මැරිච්ච දෙන්නෙක්..... ඒත් ඒකෙ වෙනසක් නැහැ..... අපි දෙන්න ජීවත්වෙන්නෙ මැරිච්ච මිනිසුන්ගෙ ආත්මයන් එක්ක....."

"ඒ කියන්නෙ මිනී පිට්ටනියකද ?" ඔහු මහත් හඩින් සිනහසුනේය.

"මිනී පිට්ටනියක නෙවෙයි. හොඳ සැප පහසු බංගලාවක..... ඒක මැරිච්ච සුද්දෙකුගෙ ....."

ඔහු ගමන් මල්ලක් දිග හැර පෙති කපන ලද පාන් ගෙඩි දෙකක් පිටතට ගත්තේය. බෝතලයක බහාලන ලද අල හොද්දක් ගෙන එය කරදිසියකට හලා අප වෙතට දිගු කලේය.

"පාන් කන්න දැන් බඩගිනිත් ඇති. මේ බීරුඒර්වලට යන්න තෙරේසා මට හදල දුන්නු කෑම. ඒත් දැන් ඒ ගමන නවත්තල ආපහු මම ගෙදර යනව. පාලම් කැඩිල මීදුම නිසා පාර පේන්නෙ නැහැ. මගේ පුතාට කවද මට කතාකරන්න ලැබේවිද දන්නෙ නැහැ. අද මහ නරක දවසක්. මළවුන්ගෙ දවස්වලට මිනිස්සු එළියට බහින්නෙ නැහැ. මේ දවස්වල ගෝත්‍රිකයො කරන්නෙ පූජා පවත්වන එකයි"

"අපිට ටවුමට යන්න පාර කියන්න බැරිද සර්"

"ඇයි ඉතිහාසයයි භූගෝලයයි දන්නෙ නැද්ද. ඉන්දියානු ඉතිහාසය දන්න කෙනෙක් විවිධ ග්‍රෝතිකයො ජීවත්වෙන්නෙ කොහේද කියල දන්නව. මට හිතෙන හැටියට මෙහෙ නීතියක් ක්‍රියාත්මක වෙන්නෙ නැහැ"

අපි ඔහු දුන් පාන් සහිත ආහාරය ගිල දැම්මේ මහත් රුචියකිනි. අවස්ථාවේ හැටියට එය අපට දිව්‍ය භොජුනක් සේ දැනිණ. මාස ගානකින් අප පාන් පෙත්තක් දුටුවේ නැත. මේ මිනිසා අපට පිළිගැන්වූයේ ඒ නොදුටු පාන්ය.

"මගේ නම සොල්මන්....." ඔහු තමා හඳුන්වා දෙමින් මා වෙතට අත දිගු කලේය.

මම ඔහුට අතට අත දී ඒ ආචාරය පිළිගතිමි.

http://e-pusthakalaya.blogspot.com



"වෘත්තියෙන් මම හිතිදයෙක්. ඊට ඉස්සෙල්ල මම සේවය කරේ ගුවන් හමුදාවෙ....."

ඔහු කතාව නතර කොට මා දෙස බැලුවේය.

"මොකද දැන් කියන්නෙ..... ? මට කරන්න පුළුවන් එකම උදව්ව දෙන්නට මගේ ගෙදර නවතැන් දෙන එකයි. එහෙම නැත්නම් මෙතනින් බැහැල යන තැනක යන්න"

මම අංජු දෙස බැලීමි.

"මොනව කරන්නද අපි එහෙ යමු"

"ඔන්න පස්සෙ මට දොස් කියන්න එපා. ඔයා තමයි මේ තීරණේ ගත්තෙ ....."

"ඉතින් ඔයා කියන්න අපි වෙන මොනවද කරන්නෙ ?"

"මට ඔය වචනවලට අහුවෙන්න බැහැ"

"මීදුම ටිකින් ටික දියවෙල යනව වගේ. තව ටිකකින් අපිට යන්න පුළුවන් වේවි. මේ හරිය බය නැහැ. මෙතනින් එහා තියෙන්නෙ තිලිප්පන්ගෙ අණසක....."

"තිලිප්පන්....." මට එය කියවුනේ උස්හඬිනි.

"ඔව් තිලිප්පන් තමයි"

"දැනට මාස තුනහතරකට උඩදී බස් එකක් මංකොල්ලකාල ගිහි තිබ්බේ..... ?"

"ඒක සිද්ධකලේ තිලිප්පන් නෙවි"

"එහෙනම් ?"

"රජයේම අනුගාමිකයො රැලක්. ඒ අයට ඕන උනේ ඒ බස් එකේ එන දේශපාලකයෙක් ඝාතනය කරන්න. මංකොල්ලෙ සිද්ධ වුනෙත් ඒ අය අතරින්මයි. ඔය සිද්ධිය වෙනකොට තිලිප්පන් හිරිගෙ මළඩ ඇදේ."

"අපිත් ඒ මංකොල්ලෙට අහුවුනා"





"ඒක සිද්ධවෙල දැන් මාස හතරකටත් වැඩිනෙ"

"අපිට දින වකවානු කියන්න මතක නැහැ"

"මටත් විස්තර දැනගන්න ලැබුනෙ රේඩියෝ එකෙන්. ඒත් මට දැන් ඒ විස්තර කියන්න මතක නැහැ. ඒත් මට එකක් කියන්න තියෙනව. ඒ බස් එක මංකොල්ල කෑවෙ තිලිප්පන් නෙවි. මම ඒක කියන්නෙ වගකීමකින්"

"අපි තිලිප්පන් ගැන දන්නෙ එයා මහා භයානක හොරෙක්, මිනිමරුවෙක් හැටියටයි....."

අමුත්තා මහත් හඬින් සිනහාසුණේය.

"එහෙම වෙන්නෙ කොහොමද ? තිලිප්පන්ගෙ හිතිදයා මමයි. මමයි එයාගෙ ස්ත්‍රී දූෂණ, මිනීමැරුම් මංකොල්ලකෑම් නඩුවලට කතාකලේ. ඒ හැම නඩුවකම තිබුණෙ ඇත්තක් නෙවි. භයානක බොරුවක්. තිලිප්පන් නම් ගිය අපරාධකරුවෙක් වුනේ අසාධාරණේට විරුද්ධව සටන් කරපු මිනිසෙක් නිසා. එයා මහ ඇමතිට විතරක් නෙවි, මන්ත්‍රීවරුන්ටත් දඬුවම් කළා. රේස් බූති මංකොල්ලකෑව. ගණිකා නිවාසවලට ගිහි තිබ්බ. දූෂණවලට සම්බන්ධ ඇමතිවරු දෙන්නෙක් ඝාතනය කළා. එයා නම් ගිය අපරාධකාරයෙක් වුනේ එහෙමයි"

ඔහු තවත් යමක් කියන්නට පෙර රිය යළි පණගැන්වූවේය.

"මාත් එක්ක යනවද ? බහිනවද ?"

"බැස්සොත් අපිව අතරමං වේවිද ?"

"මට ඒක කියන්න බැහැ. ගෙයක් දොරක් හම්බවෙන්න අඩුමගානෙ මෙතන ඉඳල හැතැප්ම දහයක්වත් යන්න වේවි. පයින් එච්චර දුරක් යන්න බැහැ. මේ වෙලාවට කිසිම වාහනයක් මේ පාරෙ යන්නෙ නැහැ"

"වෙන කරන්න දෙයක් නැත්නම් අපි යමු"

"අපිව කරදරයක් වේවිද දන්නෙ නැහැ." අංජු කීවාය.

"තෙරේසා එහෙම හිතන්නෙ නැහැ"

http://e-pusthakalaya.blogspot.com

"අපිට ඉක්මනට ගෙදර යාගන්න ඕන"

"මට ඒ ගැන නම් වචනයක් දෙන්න බැහැ. මට ... පුළුවන් එකම උදව්ව ගැනයි මම කිව්වෙ"

කැමැත්තෙන් හෝ අකමැත්තෙන් හෝ වෙන දෙයක් ... අප දැන් ඔහු සමග යායුතුය. මෙතැන සිටියොත් සිදුවන්නේ ... යළිත් වරක් මංකොල්ලකරුවන්ට අසු වීමය. නැතිනම් මිනිමරු... ගැහී මිය යාමය. ඔහු තවත් යමක් අපෙන් විමසුවේ නැත. ... වරක් මීදුම ඝණවෙන්නට කලින් ඔහු මදක් වේගයෙන් රිය ... කොට අතුරු පාරකට හැරවූවේය. ඒ කැළෑවක් මැදින් වැටී ඇති ... පාරකි. දෙපස කැලය දකින්ම, මගේ සිතට චකිතයක් දැනිණ.

දෙයියෝ සාක්කි !

මේ මිනිසා ජීවත්වන්නේ වනාන්තරයකද ? වනාන්... අභයන්තරයට තව තවත් ගමන් කරද්දී මා අංජු දෙස බැලුවේ ... සැකයකිනි.

"මේ මිනිහත් අපිව ගෙනියන්නෙ ගොවිපලකට ... නැහැ....." මම අංජුගේ කණට ලංකර කිවෙමි.

The Reader's Place novel...

"ඔයා අහන්න"

"සර් මේ කොහේද යන්නෙ..... ?"

"මගේ ගෙදරට..... "

"මේ කැලේ..... ?"

"ඔව් මට මිනිස් සමාජේ ජීවත්වෙන්න ආණ්ඩුව ඉඩ... නැහැ. ඒකයි මම මෙහාට ආවෙ. මේක තිලිප්පන්ට අයිති ගෙ...

අප දෙදෙනාට දෙදෙනා මුහුණ බලාගන්නවා හැරෙන්න... හැකි කිසිදු දෙයක් නොවීය. මේ ඝණවනාන්තරේ අප යළිත් ... අතරමං වූ බවක් මට හැඟිණ. අප මීට දින කිහිපයකට ... වහලුන් සේ කල් යැව්වේ මහන්තාට අයත් කැලයෙන් ... ගොවිපලකය. යන්නම් පණකෙන්ද රැකගෙන බේරී ආ අප දැ... වූයේ ඊටත් වඩා භයානක අපරාධකරුවෙකුගේ වැයික්කියකට ... නම් අපට පෙර භවයේම වූ අකුසලයක් පඩිසන් දෙන්නකි.



මේ ගමන එන්නට කලින් අරුණි මොනතරම් මට කරුණු කියා දුන්නද ? කොටින්ම ඇය බැංගලෝර් විශ්ව විද්‍යාලයේ තෙවසරක උපාධියක් හැදෑරූ ඇගේ යෙහෙළියක දුන් උපදෙස් අලලා කුඩා පොත් පිංචක්ද මට සාදා දුන්නාය.

දැන් මා ළඟ ඒ පොත් පිංචද නැත. උපදෙස්ද නැත. ඒ උපදෙස් නොපිළිපැදීමේ ප්‍රතිඵලය පමණක් මා සතුව ඇත.

ඝණ වනාන්තරය ක්‍රම ක්‍රමයෙන් ලඳු කැලයකට පරිවර්තනය වූයේ සෑහෙන දුරක් ආපසුය. ඉන් පසු හමුවූයේ එළිමහනකි. එහි කුඩා ගෙවල් කිහිපයක් තිබූ අතර, තවත් ඔබ්බට ගිය කල හමුවූයේ කුඩා ගම්මානයකි. එහි බොහෝ ගෙවල් තනා තිබුණේ පිදුරු සෙවිලි කොටය.

"මෙහෙ ඉන්නෙ තවත් ගෝත්‍රයක මිනිස්සු. මේ මිනිස්සු තිලිප්පන්ට හුගක් පක්ෂපාතයි. තිලිප්පන් හුගක් දුප්පත් මිනිස්සුන්ට සළකනව. ඒ ගොල්ලො හිතන්නෙ තිලිප්පන් ඒ අගොල්ලන්ගෙ නායකයා හැටියටයි. ඒත් මේ මිනිස්සු අහිංසක නැහැ. මේ ගොල්ලන්ගෙ භයානක පැත්තක් තියෙනව. මේ මිනිස්සු අදහන්නෙ මළවුන්."

අංජුටත් මටත් කතාකරන්න දැන් වචන නැත. හොඳකමකට වූයේ මෙහි ගැහැණුන් උඩුකය වසා ඇඳුමක් හැඳ සිටීමය. නැතිනම් අංජුට එයද ප්‍රශ්ණයක් වෙනු ඇත. මහන්තාගේ ගොවිපලේදී මා එහි කෙල්ලන් දෙස බලනවාට අංජු අකමැති වූයේ ඔවුන් ඉනට ඉහළින් කිසිදු ඇඳුමක් හැඳ නොසිටි නිසාය. අප එක දිගට ඇවිත් පාරෙන් හැටි කොපමණ දුරක් මේ කැළෑවේත් ගම්මානයේත් ආවේදැයි මම නොදනිමි. සමහරවිට එය කිලෝමීටර් දහයක් දොළහක් වන්නට බැරි නැත. ගම්මානය පසු කොටද අප සෑහෙන දුරක් ආවේ වැඩි වශයෙන් හරකුන්, එළුවන් බහුල තණ බිම් සහිත ප්‍රදෙසකටය.

සොලමන් රිය නතර කළේය. ඒ ගස් කිපයක් උපයෝගි කොටගෙන, තැනූ වහලක් යටය.

"මින් එහාට වාහනයෙන් යන්න බැහැ. බහින්න."

"තව කොච්චර දුරක් යන්න තියෙනවද ?" මගේ කට හඬ දැන් හුගක් දුර්මුඛය.

"කිලෝ මීටර් භාගයක් විතර..... "

http://e-pusthakalaya.blogspot.com



අවට ආලෝකය දුර්වල වී යයි. ඒ හවස් යාමයෙහි පෙර නිමිතිය. ශීතල දැනුනද දැන් මීදුම දක්නට නැත. පාර ඉතා කෙටි එකකි. ඒ පාරෙහිද තැනින් තැන ලැග සිටින්නේ ගවයින්ය. සොලමන්ගේ අතේ කෙවිටකි. ඔහු තැනින් තැන පාර අවහිර කරන හරකුන් පලවා හරිමින් ගමන් කරයි. කල හැකි කිසිවක් නොමැතිව අපි ඔහු පසු පස ගමන් කළෙමු. අවසානයේදී මඳ දුරක් ගමන්කොට අප පැමිණියේ ලීයෙන් තනන ලද තරමක් විශාල වූ පැරණි ගෘහයකටය. තහඩු සෙවිලිකොට විශාල වීදුරු කවුළු දමා තනා තිබූ එය බැලූ බැල්මට පෙනුණේ මා පින්තූරවල දැක ඇති යුරෝපයේ හිම වැටෙන රටක තනා තිබූ උස් දුම් කවුළුවක් සහිත නිවසක් ලෙසිනි. කලෙකින් කරන ලද ප්‍රතිසංස්කරණයක් නැති නිසාදෝ පිට වරේ වූ ලිවල සායම පලින් පල බොඳ වී තිබිණ.

ගෙට ගොඩවන්නට තිබුණේ එක් පසෙකින් වූ තරප්පුවක් නැගය. එය පොළව මට්ටමින් අඩි තුනක් පමණ උසින් පිහිටා තිබුණේය. අපි තරප්පු පෙළ නැග තරමක් විශාල සඳළු තලයකට ඇතුළුවීමු. සොලමන් ඉදිරිපස වූ දොරට තට්ටු කොට ඔහුගේ බිරිඳ තෙරේසාගේ නම කියා තිප වරක්ම කෑගැසුවේය.

දොර විවෘත විය.

අප දෙදෙනාත්, සොලමන් මහතාත් දකිත්ම ඇගේ දෙනෙත් පිසියම් විමතියකින් මෙන් මහත් විය.

"මොකෝ මේ...... ඔයා ගියෙ නැද්ද ?"

"කොහොමවත් යන්න බැහැ. පාලම් කැඩිල බීරූර් වතුරේ යට වෙලා. පාර පේන්නේ නැහැ මීදුම හැමතැනම."

"කවුද මේ...... ?"

"මේ ගාලු...... මේ මිට්‍රන්... අපේ අළුත් යාළුවෝ. මට මේ දෙන්නව හම්බවුනේ පාරෙ අතරමං වෙලා ඉඳිද්දි. මේ ගොල්ලො අර බස් මංකොල්ලෙට අහුවෙච්ච අය......"

"එන්න ඇතුලට......"

අපි ගේ ඇතුලට ගියෙමු.

"වාඩිවෙන්න......"





"බස් මංකොල්ලෙ වෙල දැන් මාස ගානක් වෙනවනෙ"

"ඔව්......"

"මේ ගොල්ලො ගෝත්‍රිකයන්ට අහුවෙලා. වහල් කඳවුරක ඉඳල තියෙන්නෙ. ඒකෙන් බේරිල පැනල එන ගමන් තමයි මට හම්බවුනේ"

"අනේ දෙවියනේ ලස්සන කෙල්ලෙක්" සොලමන්ගේ බිරිඳ අංජු වෙත අවුත් ඇගේ හිස අත ගෑවාය.

"දුවගේ ගම කොහේද ?"

"පූනෙ......"

"පූනෙ...... ?" ඇගේ දෙනෙත් යළිත් වරක් මහත් විය.

"පූනෙ තියන්නෙ බොම්බාය ළඟනෙ"

"ඔව්...... අපි බැංගලෝරයෙ ඉඳල යන ගමන් තමයි බස් එක මංකොල්ලකාල ගිහි තිබ්බෙ...... ඒ පාර...... අපි මංකොල්ලකරයින්ගෙන් බේරෙන්න ලොරියකට නැග්ග. ලොරිකාරයා අපිව රවට්ටල වහල් කඳවුරකට අරගෙන ගියා......"

"තෙරේසා ඉක්මනට මේ දෙන්නට කාමරයක් ලෑහැස්ති කරන්න...... අපිට ඒ ගොල්ලන්ට ඇඳුම් ටිකක් දෙන්න වෙනව. ඒ වගේම රෑ කෑමත් ඉක්මනින්ම හදන්න වේවි" ඒ අතර සොලමන් කිවේය.

"දෙවියන් වහන්සේ දෙන්නට අනුකම්පා කරල තියෙනව...... ඉන්න ඉක්මනින් මම කාමරේ ලෑහැස්ති කරන්නම්."

"ස්ටුවර්ට් හිටිය කාමරේ හොඳද ?"

"ඔව් ඒක අපි කාලෙකින් පාවිච්චි කරල නැහැ......"

"එහෙම කියන්න එපා. මොන එහෙකටද මන්ද මං දවස් තුනකට කලින් ඒ කාමරේ අස් කළා. මං හිතන්නෙ ඒක දෙවියන්ගෙ පණිවුඩයක් වෙන්න ඇති. ඉන්න මං ඉක්මනට ඇඳ පිළියෙල කරන්නම්...... එන්න දුව......" ඈය අංජු කැඳවාගෙන ගියාය.



The Reader's Place novel..

http://e-pusthakalaya.blogspot.com



"ඔය ළමයාගෙ නම මිටුන් කිව්ව නේද ?" සොලමන් ඇසුවේ ජනේලයෙන් ආ සිහින් පින්න සහිත සුළඟ ආවරණය කිරීමට මෙන් කවුළුව වසා දමමිනි.

"හොඳ වෙලාවට ආවේ..... මහ වැස්සකට එනව. මෙහෙ එහෙම තමයි. වහින්න පටන් ගත්තොත් පැය ගානක් වහිනව. හුළඟත් හරි සැරයි"

"ජනෙල් වහන්න..... " තෙරේසා ඇතුලේ සිට කෑගැසුවාය. කවුළු තිරපට සුළඟට වේගයෙන් සෙලවෙන්නට විය. සොලමන් මහතා ජනෙල් වසා දමා කාමරයට ගොස් ආපසු ආයේ ඇඳුම් කට්ටල දෙකක්ද අතැතිවය. ඉන් එකක් පිජාමා ඇඳුමකි. අනික කලිසමක් හා කමිසයකි.

"මේ ඇඳුම් කොහොම වෙයිද දන්නෙ නැහැ. මේව මගේ නෙවි අපේ පුතාගෙ. මේ ඇඳුම් තමයි අපිට තියෙන සිහිවටන්"

"මට ගානටම වගේ තියෙනව. ප්‍රශ්ණයක් වෙන එකක් නැහැ..... " මම කලිසම ඉණට තබා මිනුම බලමින් කීවෙමි.

"තෙරේසට ඔයාගෙ බිරිඳ දැක්කම ලොකු සතුටක් දැනෙන්න ඇති. අවුරුදු දෙකකින්වත් එයාට ඔයාල වගේ අමුත්තො මුණ ගැහිල නැහැ"

සොලමන් මහතා විසිත්ත කාමරයේ වූ කනප්පුවක් ඇඳ පුටු දෙකක් ලං කලේය. අනතුරුව ඔහු අල්මාරියක් ඇර මත්පැන් බෝතලයක් අතට ගත්තේ, වීදුරු දෙකක්ද මේසය මත තබමිනි.

"එන්න මිටුන්. අපි ටිකක් ගමු. අපේ හමුවීමේ සතුට අපි මෙහෙමවත් සමරමු"

"මම මත්පැන් පාවිච්චි කරන්නෙ නැහැ"

"ටිකක් ගමු." ඔහුගේ පෙරත්තට මම ඉතා ස්වල්පයක් බීවෙමි. ඒ අතර ඔහු වීදුරු කීපයක් සෝඩා දියර කලවම් කොට බී දැමුවේය. මොහොතකින් ඔහු දොඩමලු විය.

"මේ සමාජේ මොනතරම් දූෂණ, වංචාවෙන් පිරිලද ? අවංක කමින්, මේ රටේ ජීවත්වෙන්න බැහැ මිටුන්. මං පොලිසියට අවශ්‍ය කරන මිනිහෙක්. මට දැන් සමාජයක් නැහැ. මට මගේ මුළු ජීවිතේම ගත





කරන්න සිද්ධවෙලා තියෙන්නෙ මුළු මහත් සමාජයෙන්ම ඈත්වෙලා....."

"ඇයි සර්..... ? "

"මම කරපු ලොකුම වරද තිලිප්පන්ගෙ හඬුවලට පෙනී හිටිය එකයි. මම කලේ නීතිඥයෙක් හැටියට මගේ වෘත්තිය. තිලිප්පන් මහ ඇමතිගෙ දූෂණ වංචාවලට විරුද්ධව නැගී හිටපු කෙනෙක්. ඒ මිනිහ මුලින් නැගී හිටියෙ සමාජ අසාධාරණේට විරුද්ධව. තිලිප්පන්ගෙ නංගිව දූෂණය කලේ මහ ඇමතිගේ පුතා. ඒ විතරක් නෙවි තිලිප්පන්ගෙ ගෙවල් දෙරවල් විනාශ කලේ, ඒ මිනිහ තමන්ගෙ නංගිට යුක්තිය ඉටුකරන්න අධිකරණයට ගිය නිසා. ඒ පැමිණිල්ල මෙහෙයුයෙ මම. අන්තිමට මටත් මහ ඇමති මරණ තර්ජනය කරන්න පටන් ගත්ත." ඔහු කතාව මදකට නවතා ලය සැහැල්ලු කරගන්නට මෙන් සුසුමක් හෙලුවේය.

"මට හිටියෙ දුවයි පුතයි. පුතා ඉතාලියෙ ඉංජිනේරුවෙක් හැටියට සේවය කලා. තෙරේසගෙ තාත්තත් ඉතාලි ජාතිකයෙක්. එයා ඒ නිසයි ටිකක් බටහිර පැත්තට බර..... මහ ඇමතිගෙත් අමාත්‍ය මංඩලයේත් දූෂණ හෙළිකරන්න හින්දු පුවත් පතට මම දිගටම ලිව්ව. ඒ පාර තමයි මහ ඇමති මාව මරන්න කුමන්ත්‍රණය කලේ. මගේ ගෙදරට බෝම්බ ගැහැව්ව. ඒ බෝම්බ පහරින් මගේ දුව මිය ගියා. එයාගෙ අළු අපි ගාව තියෙනව. මම මෙහාට ඒ අළු අරගෙන ආවෙ නිකන් නෙවි මිටුන්. මෙහෙ ප්‍රසිද්ධ මන්දිරයක් තියෙනව. ඒ මන්දිරය මිනිසුන්ට අයිති එකක් නෙවි."

"එහෙනම්..... "

"ඒ ගැන මම පස්සෙ කියන්නම්. ඊට ඉස්සෙල්ල මම කියන්න ඕනි මාවයි මගේ බිරිඳවයි බේරගත්තෙ තිලිප්පන්. එයා අපි දෙන්නව කුමන්ත්‍රණකාරයින්ගෙන් බේරගන්න මෙහාට ගෙනාව. මේ පැත්ත පළාතකටවත් පොලිසිය නියා කිසිම කෙනෙක් එන්නෙ නැහැ. දන්නවද මොකද කියල මේ පළාත ප්‍රසිද්ධ වෙල තියෙන්නෙ භූත, හොල්මන්වලට."

ඔහු ලය සැහැල්ලු කොටගෙන සුසුමක් හෙලුවේය.

"අපි මෙහෙ හිටියට මිනිසුන්ගෙන් තරම් මේ අමනුෂ්‍යයින්ගෙන් කරදරයක් නැහැ"

http://e-pusthakalaya.blogspot.com



"මට තේරෙන්නෙ නැහැ..... සර් ටිකක් මත් පැන් ගත්ත වැඩියි වගේ"

"ඔයාට තේරෙන්නෙ එහෙමද ? එහෙනම් ඔයාම බලා ගන්නකෝ. ඒත් එකක් කියන්න ඕනි. තෙරේසා ඔයාගෙ බිරිඳගෙ මුණගැහීම නිසා අද හරියට සතුටු වෙනව ඇති. ශාලුත් හරියට අලේ දුව වගේමයි. වෙනසකට ටිකක් හරි තියෙන්නෙ ඔයාගෙ ශාලු, අලේ දුවට වඩා ලස්සනයි"

මම සිනහවක් පෑවෙමි. අප කතාකරමින් සිටින අතර තෙරේසා සාලයට දිව ආවාය.

"මගේ දුවගෙ ඇඳුම් ශාලුට දුන්න. එයා ගවුමට හරි ලස්සනයි සොලමන්"

"ඇත්තද ?"

"ඔව් එයා ඒවි අපි එක්ක කෑම කන්න. මම කෑම ලෑහැස්ති කලා..... "

"මොනවද ලෑහැස්ති කලේ"

"ඩෝසා"

"ඩෝසා නම් හුගක් කාලෙකින් කෑවෙ නැහැ. මිටුන් ආසද ඩෝසවලට"

"'ඔව් මම ඉන්දියානු කෑම වලින් ආසම කරන්නෙ ඩෝසාවලට"

අංජු ඒ අතර කාමරයෙන් පිටතට ආවාය. ඇය දුටු මා එකවරම තිගැස්සුනේ ඇය හඳුනාගත නොහැකි තරමට වෙනස් වී සිටි බැවිනි. ඇය හැඳ සිටියේ පියකරු ගවුමකි. දණහිසට අඟල් දෙකක් තරම පහත් වූ ගවුම තුලින් ඇගේ සුදු පැහැති දෙකකුල්වල අලංකාරත්වය කැපී පෙනිණ. පිට මැදට වැටෙන්නට ගොතා මුදා හැර තිබූ ඇගේ කොණ්ඩය මා මෙතරම්ම දිගට දුටුවේ පළමු වතාවටය. අංජු දැන් ශාලු වී ඇත. ඒ වෙනස මා දුටුවේ වෙන කවරදාටත් වඩා ගවුමට ඉස්මතු වූ ඇගේ පියකරුත්වය මට අදහාගත නොහැකි වූ හෙයිනි.

The Reader's Place Novel..





යක්ෂයින්, භූතයින්, ප්‍රේතයින් ගැන මා තුළ එතරම් විශ්වාසයක් නැත. ඒ සියල්ල මනෝවිකාරයන් බව පිළිගන්නට මනෝවිද්‍යාවෙහි බොහෝ සාධක තිබේ. හුදෙක් ආගමික විශ්වාසයන් නිසා අපට සිදුව ඇත්තේ, ඒ විශ්වාසයත්, සාධකයත් අතර අතරමං වීමය.



2

අප ආහාර ගනිමින් සිටින අතර තද වැස්සක් කඩා හැලුනේ වහලේ තහඩු දෙවනත් කරමිනි. ඒ සමගම සාලයේ දල්වා තිබූ ලාම්පුව කිපවරක්ම තිරය ඉහළට එසවී නිවී ගියේය. මුළු විසිත්ත කාමරයම අන්ධකාර විය.

"සොලමන් ඉක්මනට ලාම්පුව පත්තු කරන්න" තෙරේසා කෑගැසුවාය. ඒ සමගම කවුදෝ මගේ කෑම පිගාන අදින්නාක් සේ මට දැනිණ. ඒ අංජු විය යුතුය. එහෙත් ඇයට මගේ පිගාන අදින්නට උවමනා නැත.

http://e-pusthakalaya.blogspot.com



සොලමන් මහතා යළි ලාම්පුව දැල්වූවේය. එය ලී සිවිලි... දම්වැලකින් පහලට ඇදෙන විශාල පැරණි පන්නයේ වි... ලාම්පුවකි.

කිසිවක් සිදුවී නැත. මගේ පිගාන එලෙසමය. එහෙත් එහි... ඩෝසා දෙකම කැබලි කැබලිවලට කඩා දමා තිබූ අතර, ඉන්... ආයේ සුවඳක් නොව කිසියම් දුර්ගන්ධයකි. මගේ දෑස් මහත්... සොලමන් මහතා දකින්නට ඇත. ඔහු මා දෙස බලා අඩ සිනහ... පෑවේය. කිසිවෙකුට එය තේරුම් ගියාදැයි මම නොදනිමි.

"ඔහොම ඩෝස කන්නෙ නැහැ මිට්‍රුන්. ඔක්කොම අනාගත... අප්‍රිය හිතේවි."

ඔහු මා වෙතට වෙනත් පිගානක් දිගු කලේ මගේ පිගා... පසෙක තබමිනි. එහෙත් මට ඒ කෑම පවා එපා විය. මම යන්... ආහාර ගෙන මේසයෙන් ඉවත් වීමි.

"ඇයි ?" අංජු ඇසුවාය.

"මගේ බඩ ටිකක් අප්සෙට් වගේ..... "

අංජු රස කරමින් ආහාර ගනු මම දුටුවෙමි. අන්ධකාර... ගිලගත් මොහොතේ කිසිවෙකු මා අසලට ආ බව මට දැන් ... කවුදේ මගේ ඇගේ ගෑවෙනුද මට දැනිණ. ඒ අංජු නොවේ. දෙවිය... එසේ නම් ඒ කවුද ?

සොලමන් මහතා ආහාර ගෙන අවසන් වූ සැනෙකින්ම ... වෙත අවුත් මා අසල වාඩිවී මගේ කණට කොඳුරා යමක් ඇසුවේය.

"ඇයි ? ඔයාට මොනව හරි අමුත්තක් දැනුනද ?"

"ඔව්..... "

"මොකක්ද ?"

"මගේ පිගාන කවුද ඇද්ද ? මම ඩෝසා කෑලි කෑලිවල... කඩල දැම්මෙ නැහැ..... මගේ ඇඟට සීතලක් දැනුන."

"මිට්‍රුන් බය නැහැ නේද ?"

"නැහැ..... "





"ඒ වජානි..... "

"වජානි..... ?"

"ඔව්..... එයා තමයි අපිට හිටිය එකම දුව. එයත් අපිත් එක්ක ආව. මම එයාට කියල තියෙනව අමුත්තන්ට සංග්‍රහ කරන්න එන්න එපා කියල. ඒත් දන්නෙ නැද්ද ? එයා හිටියෙ ආදරය කරන වයසෙ. කඩවසම් තරුණයෙක් දැක්කම දන්නෙ නැද්ද ඉතින්..... "

"සර් කිව්වෙ..... දුව මැරුන කියල"

"ඔව් එයා මැරිල ..... ඒ වුනත් එයා අපිත් එක්ක ඉන්නව. සුදු දිග සායක් ඇඳල තොප්පියක් දාල ලස්සන කෙල්ලක් කලුවරේ උන්හිටි ගමන් දැක්කොත් ඒ තමයි මගේ දුව වජානි. එයා සමහර වෙලාවට අපිටත් විහිළු තහළු කරනව."

මේ මොනවද මේ මනුස්සයා කියවන්නෙ තවමත් ඔහුගේ ශරීරයේ මත් පැන් සැර බලපවත්වන්නේද?

"මම ඕව විශ්වාස කරන්නෙ නැහැ සර්..... " මම ඔහුගේ මනස්ගාත අදහස්වලට විරුද්ධවීමි.

"ඒක ඔයාගෙ කැමැත්ත. ඒත් ඇත්ත පැහැදිලි කරල දෙන එක මගේ යුතුකමක්" ඔහු සුසුමක් හෙළුවේය.

"එක අතකින් වජානි එහෙමවත් ඉන්න එක අපිට සැනසීමක්. තෙරේසත් එහෙමයි හිතන්නෙ. ඒත් එයා කාටවත් කැමති නැහැ අගවන්න එයාගෙ දුව දැන් ඉන්නෙ ඔය වගේ අන්ධකාර ආත්මෙක කියල. මිට්‍රුන් ශාලුට ඒ බව අඟවන්න එපා..... "

"නැහැ මම කියන්නෙ නැහැ..... ශාලු ඒක දැනගත්තොත් ඇත්තටම එයා විශ්වාස කරාවි."

"ඒ විතරක් නෙවි එයා බය වේවි"

"ඔයාට ඕන නම් පුළුවන් වජානිව ගල් පල්ලියේදි හම්බවෙන්න"

"මොකටද ?"

The Reader's Place Novel..

http://e-pusthakalaya.blogspot.com



"සමහරදාට එයා එයාගෙ සුදු මංගල ගවුමත් ලග තියා...
බලාගෙන ඉන්නව එයාගෙ දුක කියන්න"

සොලමන් මහතාගේ දෙනෙත්වල කඳුළු පිරී ඇත. ... වැස්ස ඇදීවන බව හැගෙන්නේ තහඩුවලින් නැගෙන ... හඩත් සමගය. ඒ සමගම සුළි සුළගක් හමන්නාක් සේ ... ඇඹරෙන හඬ ඇසිණ. සොලමන් මහතා දුව ගැන කතාව ... යුද්ධ බිමේ අත්දැකීම් විස්තර කරන්නට පටන් ගත්තේය. ඒ ... ගිනි වැස්සියට වඩා සතුටින් සිහිකල අතීත පසු බිමයි. ... සවන් දී සිටියෙමි. වේලාව ගත වෙනු අපට නොදැනිණ. ... අවුත් කතා කරන තෙක්ම අප සිටියේ විසිත්ත කාමරයේය.

"සොලමන් මේ ගොල්ලන්ට නිදිමතයි මහත්තයා ... ඇති. පස්සෙ විස්තර කතා කරන්න පුළුවන්නෙ. ඒ ගොල්ලො ... ජෝඩුවක් සොලමන්..... ඉතින්....." තෙරේසා මා දෙස ... කොණින් සිනහසී සිටියාය.

"නුගත් කාලෙකට පස්සෙ තාත්තේත් තමිව වුනේ ... තියෙන ලේවිල් මට කියන්න කෙනෙක් නැතුව හිටියෙ ... අමතක වුනා ඔයගොල්ලන්ගෙ මිටුසමය ගැන. මේ කාලෙ ... ඔයාට ඕවිදට ආදරය කරන කට්ටි ඉගෙන ගන්න ඕනෙ ... කාලය. කැමතියි මම එකත් කියන්න ඕන. ඔයාල ... ලස්සනයි. එයාව ටිකක් මේ නෝට්ටුවක්වත් ... වෙච්"

"ඇයි..... ?"

"නෝට්ටු ගණු කටිම සපුරයි. ඒ වගේම ටීකොට්ට...

සොලමන් මහතා අනතුරුව ප්‍රීතිමත් රාත්‍රියක් ... පැතුවේය. මම මුහුටද පෙරළා ඇත පසා කාමරයට ... ඇඳ මත දිගාවී සිටියාය. ඇය හැඳ සිටියේ සිහිඳ රෝස පැහැ... ඇඳුමකි. ඇය දුටු විගස මා තිගැස්සී ගියේ ඇයිදැයි මම ... මම දැස් පොඩිකර නැවතත් ඇය දෙස බැලීමි. මීට පැයකට ... පෙර ඇය හැඳ සිටියේ ගවුමකි. දැන් ඇය වෙනස් වී ... වෙන්කි නොවන බව පෙනයයි.

"ඇයි..... ?"



මා ඇය දෙස ටික මොහොතක් බලා සිටින්නට ඇත. ඇය වහා පොරෝනයෙන් ඇගේ පපුව වසාගත්තේ කිසිවක් ඇයට හැඟුණු නිසා විය යුතුය.

"මොකවත් නෑ."

මම සොලමන් මහතා දුන් පිජාමා ඇඳුම් කට්ටලයත් ගෙන නාන කාමරයට ගියෙමි. ඇඟපත සෝදා නා පිරිසිදු වූ පසු මගේ ගතට අමුතුම සිසිලසක් දැනිණ. මා නාන කාමරයෙන් එන විටත් අංජු නොනිදා කල්පනා කරමින් සිටියාය.

"මොකද ඔයා මෙච්චර බොරු කිව්වෙ අංජු. අනිත් එක ඇත්ත කිව්වයි කියල අමුතුවෙන් වෙන දෙයක් නැහැ. මොන එහෙකටද මට මිටුත් කියල නමක් දැම්මෙ. මට තේරෙන්නෙ නැහැ අංජු. ඊළඟට අපි අමාරුවෙ වැටෙන්නෙ බොරු කියල." මම ඇයට මදක් නොමනාපයෙන් කතා කලෙමි.

"එහෙනම් මම ඔයාට ඔයාගෙ නියම නම ශාන් අබේසේකර කියල කියන්නද ? එහෙම කිව්වොත් මොකද වෙන්නෙ ? ඔයා ඉන්දියානුවෙක් නෙමෙයි කියලද මට කියන්න කියන්නෙ. අනික් අතට අපි දෙන්න ස්වාමියයි බිරිඳයි කියල නොකිව්වොත් මොකද වෙන්නෙ..... ? වහල් කඳවුරෙන් යන්තමට අපි දෙන්න බේරුනෙත් එහෙම රඟපාපු නිසයි..... මේ ඔක්කොම බොරු ශාන්. කොටින්ම දැන් අපේ ජීවිතත් අපිම රවටගෙන ඉවරයි. එක වලකින් ගොඩ ඇවිල්ල අපි වැටුනෙ තවත් වලකට....."

"මට නම් මේක මහ අවුලක්. අපි බොරු ගොතන එකේ සීමාවත් දැන් පැනල. මෙච්චර කලක් මම ඔයාට කතා කලේ අංජු කියල. මම කොහොමද ඔයාට ශාලු කියල දැන් කතා කරන්නෙ. මගේ දිවත් පැටලෙනව"

"මම කිව්වෙ බොරුවක් නෙවි. මගේ නියම නම අංජු වර්මා වුනාට මට මගේ අම්මල ආදරේට කතා කලේ ශාලු කියල .... අනිත්



The Reader's Place novel

http://e-pusthakalaya.blogspot.com



අතට අපි නීතියෙන් කසාද නොබැන්දත් ගෝති අපි දෙන්නව දෙවිය ඉදිරියේ කසාද බැන්දුව නේද ?"

මම තවත් යමක් කතා නොකළෙමි. ඇය සමග කතා ගොස් පරදින්නේ මාය. හොඳම දේ නිහඬවීමය. මම ඇඳ මත රෙද්දත් කොට්ටයත් ගෙන කාමරයේ අනික් මුල්ලට ගොස් ඇතිරි බිම එළා ගතිමි.

"ශාන් ඔයා ගිහින් ඇඳේ නිදාගන්න. මම බිම නිදාගන්නම්"

"එපා බිම හුගක් ශීතලයි"

"කමක් නැහැ..... "

ඇය පොරෝනයෙන් මුළු ගතම වසාගෙන සිටියාය. ලාම්පුවේ දැල්ල උස් පහත් වී වරින්වර සෙලවෙනු පෙනිණ. එය නිවී ගියොත් වාසනාවකට ලාම්පුවේ අසලම ගිනි පෙට්ටිය තිබිණ. අංජු බිම එළ තිබූ ඇතිරිල්ල මත වැතිරෙත්ම මම ඇඳ වෙත ගියෙමි. එහෙත් ඇඳ නිදි නොගෙන ඒ මේ අත ඇඹරෙනු දකිත්ම මම යළිත් ඇඳ බැස්සෙමි.

"ඇයි අංජු..... ?"

"නින්ද යන්නෙ නැහැ ශාන්"

"ඒක තමයි මම ඇඳට එන්න කිව්වෙ"

"වැස්ස එන්න එන්නම තදයි"

"ඔයාට ඇහෙනවද සුළඟෙ ශබ්දෙ ?"

ඇය හූල්ලනු මට ඇසිණ.

"මොකද ශාන් අපිට මේ වුනේ..... ?"

"අනේ මන්ද අංජු පුදුම කරුමයක් මේක..... "

"අපි මේ ඉන්නෙ කොහේද කියලවත් දන්නෙ නැහැ"



"එක අතකින් මේ මිනිස්සු හම්බවුනේ නැත්තම්..... අපි මහ පාරෙම මැරෙනව"

"මදැයි ගෙදර ගියා..... "

"අපේ ගෙදර මිනිස්සු නම් දැන් අපි ගැන තියෙන බලාපොරොත්තු අත් ඇරල ඇති..... "

"දේව්ට මොනව හිතෙනව ඇත්ද ? මෙහෙම නොවුන නම් මෙලහකටත් ඔයා දේව්ගෙ ආදරණීය බිරිඳ වෙලා"

"අරුණි මොනව හිතනවද දැන්..... ඔයා ආවෙ එයාගෙ වෙඩින් සාරිය අරන් යන්නනෙ..... මදැයි වෙච්ච දේ..... "

"ඒ මොනව වුනත් අපි ඉක්මනට දික්කසාද වෙන්න ඕන. ඒ දෙන්න වෙනුවෙන්. මෙහෙ දේවාලයක් තිබුණොත් අපි ඉක්මනින්ම එහෙම කරමු."

"මම නම් ඒක පිළිගන්න දෙයක් නෙවි. ඒ වුනත් ඔයාලගෙ සම්ප්‍රදායට විවාහය කියන්නෙ දෙවියන් ඉදිරියේ බිරිඳගේ නළලේ සින්දූර් තැවරීම නම් අපි ඒක කලානෙ."

"අපිට දෙවියන් ඉදිරියේ කරන පොරොන්දුවලින් ඈත්වෙන්න බැහැ ශාන්"

"අපි කසාද බඳින්නෙ නීතිය ඉදිරියේ. ඒ නිසා මම නම් අපේ කසාදෙ පිළිගන්නෙ නැහැ. ඇරත් ඒ සම්ප්‍රදාය වුනත් සිද්ධවුනේ අපේ උවමනාවට නෙවි. ගෝතිගෙන් බේරෙන්න. එහෙම නොකල නම් අද අපි දෙන්නට මෙහෙමවත් එකට ඉන්න ලැබෙන්නෙ නැහැ"

"බිම එන්න එන්නම ශීතලයි"

වේගවත් සුළං පහරට ජනෙල් කවුළුවේ තිර රෙදි කීප වරක්ම ඉහළට එස වී ගියේය. ඒ සමගම ලාම්පුව නිවී ගියේය. අංජු එකපාරටම කෑ ගසාගෙන ඇඳ මතට දිව ආවාය. මම නැගිට ගොස් ගිනි කූරක් ගසා යළි ලාම්පුව දැල්වීමි. අංජු ඇඳ මත වකුටු වී සිටියාය.

"මට බයක් හිතුන..... "

The Reader's Place novel..

http://e-pusthakalaya.blogspot.com



"මොනවටද බය වෙන්නෙ..... ?"

මම අංජුට ඇඳ දී බිමට බැස්සෙමි.

"ඔයා බිමට යනවද ?"

"ඔව්..... "

"ඇයි..... ? "

"අපි දෙන්න යාළුවො දෙන්නෙක් මිසක් අඹු සැමි
නෙවිනෙ..... එහෙම එකේ දෙන්න එක ඇඳක නිදගන්න එක
නැහැනෙ..... "

"..... හ්..... ම්"

"අපි දෙන්න වගේ හොඳ යාළුවො දෙන්නෙක් මේ
ලෝකෙම නැතුව ඇති..... "

"අපේ යාළුකම ගැන අපි ගෙදර ගියාම මොනවද කියන්නේ

"මටත් දැන් ඒක තමයි ප්‍රශ්නෙ..... ?"

"ඒ ගොල්ලො අපිව විශ්වාස කරාවිද ?"

"කවුරු විශ්වාස නොකලත් දෙවියන් අපිව විශ්වාස කරනවා

"ඔයා පොරවන රෙද්ද දල ඇවිත්. ඉන්න මම ගො
දෙන්න..... "

මා ඇතිරිල්ල දමා තිබූ කවුළුව අසලට ගියෙමි. ඒ සම
සුළඟට තිර රෙදි මෑත් වී ගියේය. විදුලි කෙටීමත් සමග
කවුළුව අසල සිටින්නාක් සේ මට දැනිණ. සිහින් තිගැස්මක් මා
ඇති වුවද මම එය මැඩගෙන අංජු දෙස බැලීමි. අංජු වැතිර සිට
මට පිටුපාය. ලාම්පුවේ දැල්ල වැඩිකොට මම කවුළුව අසලට
තිර රෙද්ද මෑත්කොට වීදුරුවෙන් එබී බැලීමි.



බිත්තිය අසල දිග සුදු ගවුමක් හැඳ තොප්පියක් පැළඳගත් කෙල්ලක් ගුලිවී සිටියාය. ඇගේ මුව මට යන්තමට පෙනිණ. ඇය මා හා සිනහසුණාදැයි මම නොදනිමි. මම වහා ඇතිරිල්ලක් ගෙන ඇඳ මතට දිව ආවෙමි.

"රතන සූත්‍රය කියන්න..... " මම කලබල වූ තරම කියතොත් අංජුට එසේ කීවෙමි.

අංජු දෑස් දල්වා මා දෙස බැලුවාය.

"මොකද ඔයා ගැහෙන්නෙ..... ?"

"හරි ශීතලක් දැනුන. මම ජනේලෙ ලඟට ගියා..... "

"කෝ මගේ පොරෝනෙ..... "

"ඒකත් දල ආවෙ..... "

මගේ දෙකකුල් වෙව්ලනු මට දැනිණ. ඒ සිටියේ සොලමන්ගේ මැරිච්ච දුව ටජානිද ? සොලමන් ඒ දේවල් කියන්නට ඇත්තේ, වෙරිමතින් නොවේ. එහෙත් මට එය විශ්වාස කල හැකිද ? ඔහු මගේ සිතට ඇතුළු කලේ මනස විකෘති කරන අදහස්ය. සමහර විට ඒ මගේ විකාර අදහස් වලින් මගේ යටි සිත ක්‍රියා කරන්නට ඇත.

එහෙත් අනු මුළු හා අන්ධකාරයේ අමනුෂ්‍යයින් ගැවසෙන බව එක්තරා භික්ෂූන් වහන්සේ නමක් ධර්ම දේශනයකදී සඳහන් කලා මට මතකය. සොලමන් මහතා කීවේද ඒ ටිකය. කොයිකටත් රතන සූත්‍රය කියන එක හොඳය.

මම රතන සූත්‍රය උස් හඬින් කියන්නට පටන් ගත්තෙමි.

"මොකක්ද ශාන් ඔයාට වෙලා තියෙන්නෙ..... මට නිදගන්න දෙන්නෙ නැද්ද ?" ඇය තරහෙන් ඇඳෙන් බිමට බැස බිම අතුරා තිබූ ඇතිරිල්ල වෙත ගියාය. මම රතන සූත්‍රය කියා නිමකර සිත සැහැල්ලු කොට ගෙන මෙසේද සිතුවෙමි.



The Reader's Place novel

http://e-pusthakalaya.blogspot.com



අහසෙහි හෝ මිහිතලයෙහි වසන
මෙහි රැස්වූ භූතයින් වෙත්නම්
සියල්ලෝ සතුටු වෙත්වා !
ඔවුන් සතුටින් මේ පිරිත් දේශනය අසා
මෙත් කරව් පොදු මිනිස් දන වෙත.

බුදුන් වහන්සේ අමනුෂ්‍ය උපද්‍රව්‍ය වලින් මිදෙන විවිධ ... අපට කියා දී ඇත. සූත්‍ර පිටකයෙහි ඇති බොහෝ සූත්‍රවලින් ... සලසා ඇත්තේ ආරක්ෂාවය. බෞද්ධයෙකු හැටියට ඒ අනුව මට ... වෙන්නට කිසිදු අවශ්‍යතාවයක් නැත.

"ශාන්..... " අංජු යලිත් මට කතා කළාය.

"ඇයි ඔයා නිදි නැද්ද ?"

"ඔයාගෙ මන්තරෙ මතුරල ඉවරද ?"

"මම කිව්වෙ පිරිතක්"

"ඕක ඔයා හැම වෙලාවෙම මතුරනවනෙ..... ? "

"දැන් මොකද ඒ පාර ඔයා කියන්නෙ ?"

"මාත් ඇඳට එන්නද ?"

"ඇයි ඉතින් මහ ලොකුවට ගියේ"

"එක එක සද්ද ඇහෙනව"

"ඔයාගෙ මනස්ගාත ..... "

"මට මෙතන ඉන්න බයයි"

"ඉතින් එහෙනම් එන්න..... "

"කමක් නැද්ද ?"

"ඔයාට කමක් නැත්නම් මට කමක් නැහැ."



අංජු යලිත් ඇඳ මතට ආවාය. ඇය එක් කෙලවරක නිද ගනිද්දී මම අනික් කෙලවරේ නිදගතිමි.

"ඔයා ගෙදර ගිහින් අපි මෙහෙම හිටියයි කියල දේවි එක්ක කියන්න එපා. මොනව වුනත් එයාගෙ හිත රිදේවි"

"ඔයත් කියන්න එපා. අරුණි නම් කොහොමටවත් කැමති වෙන එකක් නැහැ"

"ඒක නම් ඇත්ත අංජු. කොහොමටත් ගැහැණු ඊර්ෂ්‍යාවන්තයි..... "

"ඔයා කිව්වෙ මටත් එක්කද ?"

"මතකනෙ වහල් කැඳවුරේදී මම කෙල්ලො දිහා බලන කොට ඔයාට තරහ ගිය හැටි"

"වැඩේමයි. එහෙම වෙන්න ඔයා මගේ කවුද ?"

"දෙවියන් ඉදිරියේ මම ඔයාගෙ ස්වාමි පුරුෂයා"

"ඔයාමනෙ කිව්වෙ එහෙම වෙන්නෙ නැහැ කියල"

"ඒ ලංකාවෙ නීතිය අනුව."

"ඔයා පිළිගන්නෙ ඒ නීතියනෙ..... "

"ඔව්..... "

"එහෙනම් කමක් නැහැ..... "

"අපි අපරාදෙ මුණගැහුනෙ..... "

"මේ ඔක්කොටම හේතුව අර "බ්‍රින්දවන් එක්ස්ප්‍රස්"

"එද සීට් එකක් මට තිබුණ නම්..... "

"එහෙනම් බස් එක ගිනි තිබ්බ වෙලාවෙ ඔයාව තිලිප්පන්ගෙ මිනිස්සුන්ට අහුවෙනව. මම නම් මෙලහකටත් ලංකාවෙ..... අපරාදෙ අපි මුණ ගැහුනෙ..... "

http://e-pusthakalaya.blogspot.com



"ඇත්තටම ගෑන් දැන් ඔයාට එහෙම හිතෙනවද ?"

"ඔව්"

"තාමත් නැහැ....." ඇගේ දෑසේ කඳුළු පිරුණේ ම... සිටිද්දීමය.

"අපි දෙවියන්ට කියමු අපි දෙන්නව ඉක්මනින් වෙන් ක... කියල ....."

"මෙහෙ දෙවියොත් පේන්න නැහැ"

"දැන් වෙලාව කීයද ?"

"රෑ දොළහට ළඟයි..... ඔර්ලෝසුව වැඩ කරන එකක්"

"ඉතින් ඔයා නිදාගන්න....."

ඇය මට පිටුපා අනිත් ඇලයට හැරුනාය. තවමත් ... පායා නොතිබිණ. මා දෑස් පියාගත්තද මට නින්ද යාමක් ... නැත. මම තවත් වේලාවක් කල්පනා කරමින් ඇඳ මත ... සිටියෙමි. තවත් මොහොතකින් අංජු සිහින් හඬින් ගොරවන ... ඇසිණ. ඇයට නින්ද ගොස්ය. එක අතකින් එය සිතට සැනසිල්ල... නින්ද යන්නට ඇත්තේ පාන්දර විය යුතුය. මා අවදිවන විට ... ගොඩින් එළිය වැටී තිබිණ. වැස්ස පායා තිබිණ. මම ඇඳෙන් ... ගොස් කවුළුවෙන් පිටත බැලිමි. ඈත සිහින් දුමාරයක් අහස ... විසවෙනු පෙනිණ. වැස්සට තෙමුණු තණ කොල අග සිහින් පිනි ... මතු වී තිබිණ. කවුළුව අද්දර වවා තිබූ රෝස ගස්වල පිපි තිබූ ... දෙස මා මොහොතක් බලා සිටියේ පෙර දින රාත්‍රියේ සිදුවූ ... මොහොතකට අමතක කරමිනි.

ඒ අතර තේ කෝප්පයක්ද අතැතිව අංජු කාමරයට ආ... ඇය සිනිඳු ඇඟ පෙනෙන ඇඳුම මාරුකොට තිබිණ.

"මෙන්න ඔයාගෙ තේ එක....."

"තෑන්ක් යූ..... කොහේද ඔයා යන්නෙ ?"



"මම මිසිස් පෙරේරාට උදේ තෑම හදන්න උදව් වෙනව..... ඇයි ?"

"නැහැ මොකවත් නැහැ..... ඒත්....."

ඇය ආපසු හැරී එක එල්ලේම මා දෙස බැලුවාය.

"අංජු"

"මොකද ?"

"මම ඊයෙ කියපු කතාවට ඔයාට තරහ ගියාද ?"

"හිතේ තියෙන අදහස්නෙ එළියට එන්නෙ....."

"මම ඒක හිතල කිව්වෙ නැහැ"

"මොනව වුනත් ඇත්ත එකයි. මං නිසානෙ ඔයා අමාරුවෙ වැටුනෙ....."

"නැහැ....."

"මොකද නැත්තෙ 'බ්‍රින්දාවන් එක්ස්ප්‍රස්' එකට ශාප කරල දැන් වැඩක් නැහැ."

ඇය කාමරයෙන් පිට වී යන්නට ගියාය.

මම ඇගේ සිත රිදවීම ගැන මටම දොස් පවරා ගතිමි. දැන් අතීතය මතක් කිරීමෙන් හෝ ඒ ගැන සිතමින් කම්පාවීමෙන් හෝ ඵලක් නැත. කළ යුතු හොඳම දෙය වර්තමානය ජය ගැනීමය. මට ඩේල් කානගී නැමති ලේඛකයා පොතක ලියා තිබූ එක්තරා වැකියක් මතකයට නැගේ.

Shut The Iron Doors On The Past And The Future Live In Day- Tight Conpartments.

The Reader's Place novel...

http://e-pusthakalaya.blogspot.com



එක අතකින් බලන කල මේ වැකිවල ඇත්තේ අප දැකිය
සත්‍යතාවයයි. ඒ හැරෙන්නට අතීතය ගැන සිත සිතා පසු තැවි
හෝ එකිනෙකාට දොස් පවරා ගැනීමෙන් සිදුවන්නේ මේ ආගාධ
මිදීම නොව තව , තවත් මේ ආගාධයටම තල්ලු කිරීමය. මම
ජාතිකයාගේ කාමරයේ වූ යම් යම් භාණ්ඩ දෙස මදක්
සහගතව බැලීමි. එහි පසෙක වූයේ පොත් අල්මාරියකි.
පසෙක වූයේ නානා මාදිලියේ සිතුවම් රැසකි. කලකින් ප්‍රයෝජන
නොගෙන තිබූ ලියන මේසය මත භූත විද්‍යාව ගැන ලියූ පොත් දෙ
තබා තිබිණ.

මම ලියන මේසය මත වූ ඒ පොත් දෙක පිටු පෙරළා බැලු
එහි ගත යුත්තක් මට නැත. මා එහි ලාච්චුවක් ඇරියේ ම
උවමනාවට නොව අත තියාගෙන ඉන්නට බැරිකමටය. ඒ ලාච්චු
වූයේ දින පොතකි. මම ඒ දින පොත ගෙන පිටු පෙරළා බැලීමි.

The Reader's Place Novel

2002 මැයි 03

මම ගල් පල්ලියේ සිට ගෙදර එමින් සිටියෙමි. වේලාව
අටට පමණ ලං වී තිබුණි. සඳ එළිය පොළොව මතට වැටී තිබූ බැවි
මට මගේ නිවසට වැටී ඇති කෙටි මාර්ගය සොයා ගැනීම එතර
අසීරු නොවීය. අවට ඇති යෝධ ගස්වල අඳුරු සෙවනැලි පළින්
වැටී තිබුණු බැවින් ඇතැම් තැන්වල වූයේ අඳුරකි.

වරින් වර නිශාචර සතුන්ගේ කෑ ගැසීමේ හඬ අවටින්
ආයේය. වවුලන් රංචු පිටින් අහසේ සැරි සරද්දී, ඉඳ හිට කෑගස
උලලමෙකුගේ අමිහිරි නාදය ඒ හා මුසුව ඇසිණ. පිටු පසින් ඇසුණු
ශබ්දයකට මම එකවරම නැවතුනෙමි. මගේ ඇඟට ගෑවෙ
නොගෑවෙන තරමේ ළඟින් ඇය මා අසලින් ඈතකට ඇදී ගියාය.

මා පර්යේෂණ පැවත්වූයේ මීට අවුරුදු හතරකට පෙර මි
ගිය 'ෂෙරීන්' නැමති භූතාත්මයක් පිළිබඳවය. ඇය මිය ගිය දින
අදයි. අද ඇගේ ඒ දිනය සැමරීමට මා ඉදිරියේ දර්ශනය වූ
නිසැකය.



භූතාත්ම පිළිබඳ දීර්ඝ කාලයක සිට මා කරනු ලබන පර්යේෂණ අද දින සාර්ථක වූවායැයි මම සිතමි. බොහෝ දෙනෙකු මේ පිළිබඳ උනන්දුවක් නොදක්වන්නේ, එය මිත්‍යා විශ්වාසයක් වශයෙන් නූතන ලෝකයා පිළිගන්නා බැවිනි. එහෙත් බුදු දහම හදාරන්නෙකුට අමනුෂ්‍යයින් පිළිබඳ ඇති විස්තරාත්මක කතා ලෙහෙසියෙන් බැහැර කල නොහැක. මරණින් මතු ජීවිතය ගැන බුදු දහමෙහි සඳහන් කරුණු පිළිබඳව මේ දිනවල මම ප්‍රවේශමෙන් හදාරන්නෙමි.

2002 ජූනි 08

මට දැන් ඇය බොහෝ දිනවල මුණ ගැසේ.

මා නිසොල්මනේ මගේ ඇඳ මත සිටින විට සෙමින් සෙමින් දොරට තට්ටු කරන හඬක් මට ඇසේ. ටක්..... ටක්..... ටක්.

ඇය පැමිණ ඇත. මම දොර හරින්නෙමි. ඇය මට දර්ශනය නොවූවද ඇගේ අඩි ශබ්දය මට ඇසේ. මට ඇය සමග කතාකරන්නට බොහෝ දේවල් ඇත. මා දන්නා තරමින් ඇය මා මිත්‍ර ස්ටුවර්ට්ගේ හතරවෙනි බිරිඳය. ඇගේ මරණයට ස්ටුවර්ට්ගේ සම්බන්ධයක් ඇත්දැයි මම නොදනිමි. එක අතකින් ඔහුගේ වයසත් ඇගේ වයසත් අතර පරතරය අවුරුදු තිස් පහකට වැඩිය. ඇගේ මරණයට හේතු වූයේ නිවසෙහි සිටි මෙහෙකරු සමග ඇය පැවැත්වූ අනියම් සබඳතාවය නම් මරණයේ වගකීම වෙනුවෙන් ස්ටුවර්ට් ගැන සැක සිතීම සාධාරණය. ඇගේ මරණය සම්බන්ධව ඔහු කල පාපොච්චාරනය මම පිළි නොගනිමි. එහෙත් ඇගේ භූතාත්මය ඔහුට නිතර කරදර කරන්නේ යයි, ඔහු පැවසූ කාරණය මම අද පිළිගනිමි. ඊට හේතුව මට ඇය හමුවීමයි.

2002 දෙසැම්බර් 26

මා දැන් ඔබ හඳුනාගෙන මාස කීපයක් ගතව ඇත. ඔබ දැන් පවසන්නේ ඔබ සිටින භවය ඉතා වේදනාකාරී බවය. යළිත් භවයක් ලැබෙන තෙක් ඔබ ගත කරන අන්තර්භවය වේදනාකාරීනම් මට ඔබ ගලවන ලෙස දෙවියන්ට යාඥාකල හැක. එහෙත් ඉන් ඵලක් අත්වේදැයි මම නොදනිමි.

මේ ඔබේ පෙම්වතා ලියූ කවියකි. මට එය හමු වූයේ දින පොතක් ඇතුලත තිබියදීය.

http://e-pusthakalaya.blogspot.com



සඳකාලිකව නිදන්නට
ඔබ ඒ ආත්මය සුනු විසුනු කොට දමා
මලක් බවට පත් විය.
මම ඒ මල සොයා සතර දිග්භාගයේ
සැරි සැරුවෙමි.
තුෂාරයේ සැඟ වී ගිය ඒ මල
සොයන්නට මම දෑස් රිදෙනකන්
බලා සිටියෙමි.
එහෙත් ඒ හැම මොහොතකම
කඳුළු සලන්නට ඉඩ තබා
ඈත ගිරි ශිඛ අතරට ඔබ
පාවී යන්නේය.
ඒ ඔබේ ආත්මීය සත්‍යයයි
එය එසේනම් මා තව දුරටත් ඔබට
කෙසේ නම් ආදරය කරන්නද ?

The Reader's Place novel..

මා මේ සටහන අද හත්තල් දින කියවන විට ඔබ වෙනුවෙ තැබූ කේක් බඳුන මේසය මත තබා තිබිණ. මා බලා සිටිද්දීම ඔබ එක් කේක් කැබැල්ලක් අඳිනු මට පෙනිණ. මම එකව තිගැස්සුනෙමි. එහෙත් ඒ එක්කම මට ඇසුනේ මිහිරි සිනහ හඬකි.

ඔබ දකින්නට මා තුළ ඇති ආශාව ඔබට නොහැඟෙන් ඇයි ? මම දෑස් පියාගතිමි.

මගේ වම් කම්මුලට එකවරම ශීතලක් දැනිණ. කිසි සුඝන්ධයක් මා අවටින් හමා ආයේය. ඒ විලවුන් සුවඳක් වන්නට බ නැත.

හරි.....

ඔබ මගේ කම්මුල සිප ගත්තේය. මම ඔබට ප්‍රීතිම නත්තලකට ශුභ ප්‍රාර්ථනා කළෙමි.

2003 ජනවාරි 07

අද ඔබට මේ පාපකාරී, වේදනාකාරී භවයෙන් සමුගත යුතු බව කීයේ මොනතරම් වේදනාබර හැඟුමකින් දැයි මම නොදනිමි. ඒ සඳහා ඔබට උපකාරවන ලෙස ඔබ කල ආයාචනය මා කෙසේ නම් බැහැර කරන්නද ? මිනිස් සිරුරක් නොමැතිව ශීත උෂ්ණ දෙක



අපරිමිත වේදනාවක් විඳින ඔබ ගැන ඇත්තෙන්ම මා සතුටු වනවා යැයි ඔබ සිතන්නේද ? මම ඔබෙන් ඔබ මින් ගලවා ගන්නා මාර්ගය ගැන ඇසුවෙමි.

ඔබ මා නිඳ සිටිද්දී මගේ කණට කොඳුරා කී සියල්ල පසුද නින්දෙන් අවදිවන විටත් මගේ මතකයේ මෙසේ රැඳී තිබිණ.

හෙට මගේ උපන් දිනයයි. ඔබ උදෑසනින් අවදි වී මගේ සොහොන වෙත යන්න. එහි මා පිළිස්සීමෙන් ඉතිරි වී ගිය අළු බඳුන ඇත. මා පස් යට වළනොද පුළුස්සා දැමුවේ මගේ මිනිය ඉතිරි කිරීමේ අදහසක් ඔහු තුළ නොවූ නිසා විය හැක. එහෙත් ඔහු එහි මගේ අළු බඳුනක් තැන්පත් කලේ ඇයිදැයි මම නොදනිමි. කෙසේ වෙතත් ඔහු මගේ රූපයට ආශා කරන්නට ඇත. ඇතැම් දිනක ඔහු මල් පොකුරක් ඒ සොහොන මත තබන්නට ඇත්තේ ඒ නිසා විය යුතුය. කෙසේ වෙතත් වරද ඇත්තේ මා අත බැවින් මම ඔහුට වෛර නොකලෙමි. මට දැන් උවමනා වී ඇත්තේ මේ අන්ධකාර ආත්මයෙන් ගැලවී මනුෂ්‍ය භවයක උපත ලැබීමටය.

දෙවියන්ගේ නාමයෙන් මගේ මේ ඉල්ලීම ඉටු කරන්න. මගේ සොහොන මෙම නිවසේ සිට කිලෝ මීටර් භාගයක් වම් පසින් ඇති ගරා වැටුනු ගල් බිත්ති දෙකක් අසලින් ගමන් කරන විට හමුවෙනු ඇත. කැළෑවෙන් වැසී ඇතත් එහි ගසා ඇති කුරුසය අඩි පහක් පමණ උසින් ඇති නිසා එය සොයා ගැනීම අසීරු නොවනු ඇත. මගේ අළු බඳුන ඇත්තේ ඒ කුරුසයට අඩි එකහමාරක් පමණ ඈතින් පිහිටා ඇති ගඩොලින් තනන ලද කුහරකය. එහි කුඩා කොන්ක්‍රීට් පියන විවෘත කරන්න. ඔබට හමුවන අළු බඳුනත් ගෙන ඔබ බිලිගිලිරත්ගන් කඳු වැටිය වෙත යන්න. එතැනින් ශර්වාන් ඍෂිවරයාගේ වාස භවනයට යන පාර වැටී ඇත. එතැනට ඔබ ගිය විට සියළු විස්තර ඔබට දැන ගැනීමට එක්තරා මිනිසෙක් ඔබට මුණ ගැසෙනු ඇත. ඔහු හැඳ සිටින්නේ කළු පැහැති වස්ත්‍රයකි. ජප මාල කීපයක් ඔහුගේ කර වටා ඇත. කොණ්ඩය මුදුන් කොට බැඳ ඇත. මේ ඔබ කරන පර්යේෂණවලට එකතුවන අළුත්ම ප්‍රතිඵලයකි.

http://e-pusthakalaya.blogspot.com



මට පුදුම මෙතරම් විස්තරයක් උදෑසන අවදිවන විට මගේ මතක රැඳීමය. මම එය ඒ මොහොතේම සටහන් කලෙමි.

මා ඒ දින පොත එකවරම ලාච්චුවට දමා වැසුවේ පිටති අඩි ශබ්දයක් ඇසුණු හෙයිනි. ඒ අංජුය.

"මොකද ඔයා කරන්නෙ..... ?" ඇය කාමරයට ඇතුළු වී ඇඳ මත හිඳ ගනිමින් ඇසුවාය.

"මොකවත් නැහැ..... "

"තවම ඔයා මුහුණ හෝදලත් නැහැ..... "

"මම පොතක් බැලුව..... "

"අපි පරාටෙ හැදුව..... කවුද මිනිහෙක් ආව. මට මිස් තෙරේස කාමරයට ගිහින් දොර වහගන්න කිව්ව"

"ඒ මොකද ?"

"මම දන්නෙ නැහැ..... "

"ඉන්න ඉක්මනට මම මුහුණ හෝදගෙන එන්නම්..... "

"බාත්රූම් එකේ වතුර වැඩියෙ නාස්ති කරන්න එපා... මෙහෙ පොඩි ජෙනරේටරයක් තියෙන්නෙ. ඒක දුවන්නෙ ඩීසල්වලින් සතියකට සැරයක් ඒ ගොල්ලන්ට ඩීසල් ලැබෙන්නෙ. වතුර පුරවන මෝටරේට විතරයි ඒ ගොල්ලො ඒක පාවිච්චි කරන්නෙ....."

අංජු හැල්ලක් කියාගෙන යද්දි මම අළුත් ඇඳුම් කට්ටලයක් රැගෙන නාන කාමරයට ගියෙමි. බොහෝ කලකට පසු ඇඳින්නට මට කලිසමක් ලැබුණේ අදය.





"ශාන් රැවුල කපා ගන්න..... " අංජු කාමරයේ සිටම කෑගැසුවාය.

"රේසරයක් නැහැ..... "

"ඉන්න මම මිස්ටර් සොලමන්ගෙන් ඉල්ලල දෙන්න"

මගේ රැවුල වැඩී ඇති තරමට එය කපා දමන්නටද ලෙහෙසි නැත. එහෙත් මා නොදකින මගේ මුහුණ අංජුට නිතර දෙවේලේ පෙනෙයි. ඇය ඊට කැමති නැත.

සිහින් දොරට තට්ටු කිරීමක් ඇසිණ.

"ආ මෙන්න රේසර් එක..... "

මම යන්තමට දොර හැර රේසරය අතට ගතිමි. අනතුරුව මා මෙතෙක් මුහුණ පුරා වවාගෙන සිටි රැවුල මුළුමනින්ම කපා දැමුවෙමි. මගේ මුවට දැනුණේ අමුතුම සැහැල්ලුවකි. මම මුහුණ කට සෝදගෙන කලිසමෙන් හා කමිසයකින් සැරසී නාන කාමරයෙන් පිටත ආවෙමි. අංජු මා දෙස බලා දෑස් මහත් කලාය.

"..... ආ..... ච්" ඇයට කියවුනේ ඉබේටමය.

"මොකද ?"

"නැහැ නිකන්..... "

"මට නම් දැන් බඩත් ගිනියි..... ඊයෙත් හරියට කන්න බැරිවුනා"

"දැන් ඔයාගෙ බඩේ අප්සෙට් එක හොඳද ?"

"හොඳයි..... "

"ශාන්..... "

"ඇයි..... ?"



The Reader's Place novel..

http://e-pusthakalaya.blogspot.com



මිස්ටර් සොලමන්ට කියල අපිට බැරිද මෙතනින් ගෙදර ය
මාර්ගයක් හදගන්න....."

"මාත් ඒක තමයි හිතුවෙ..... ඔයා තෙරේසත් එක්කත් ක
කරල බලන්න"

"මම නිකමට ඇහුව. එයා හරියට මේ පැත්ත ගැන දන්
නැහැ. තිලිප්පත් එයාලව මෙහාට ගෙනත් දල තියෙන්නෙ ඇස් ෙ
බැඳල....."

"ඒක විශ්වාස කරන්න බැහැ අංජු. තිලිප්පත් එහෙම කලා
ඇයි එයා මිස්ටර් සොලමන්ට තනියම කාර් එකේ යන්න ඉඩ දුන්
අපිට සොලමන් හම්බ වුනේ මහ පාරේදී....."

"ඒකත් ඇත්ත ....."

"මට මේ දෙන්න ගැනත් සැකයි"

"අපි පරිස්සම් වුනොත් හොඳයි....."

"ශාලූ....."

"අන්න මිසිස් තෙරේස කතා කරනව. අපි යමු කෑම කන්න..."

The Reader's Place Novel..

අප සාලයට යන විටත්, සොලමන් මහතා කෑම මේසය අස
රැඳී සිටියේය. ඒ අප එනතෙක්ය. රාත්‍රියේ සිට කුසගින්නේ සිටි ම
උදෑසන ආහාර ගත්තේ අංජුටද පින් දෙමිනි. ආහාර ගැනීමේ
අනතුරුව සොලමන් මහතාගේ ආරාධනය පරිදි ඔහු පිවත්ව
පරිසරය දැක ගැන්මට මා ගියේ තනිවමය.

අංජු සිය කැමැත්තෙන්ම අපේ ගමනට එක් නොවූවාය. 
ඇයට තෙරේසා සමග තනිවම කතා කරන්නට අවස්ථාවක් ල
ගැන්මට විය යුතුය. මම ඇයට බාධා නොකළෙමි. කෙසේ වෙතත් දැ
අපට ඇති එකම අරමුණ ගෙදර යාමය. ඒ අරමුණ ඉටු කරගැනීම
මා පමණක් නොව අංජු ද මහන්සි විය යුතුය.



මම සුදු ජාතිකයාගේ දින පොත කියවීමි. එහි ඇති ඇතැම් කරුණු මගේ සිතට වද දෙයි.

ටක්..... ටක්..... ටක්..... සිහින් හඬින් දොරට ගසන හඬක් ඇසී මම දොර ඇරියෙමි. එහෙත් කිසිවෙකු පෙනෙන්නට නැත.



3

පරිසරය ගැන අත්දැකීමක් ලබා ගැන්ම, එක් අතකින් මින් ගැලවෙන්නට ඇති එක් මාර්ගයකි. සොලමන් මහතා පොලිසියට අවශ්‍යව ඇති පුද්ගලයෙකි. එහෙයින් ඔහු සිටින්නේ පොලිසියෙන් පමණක් නොව සමාජයෙන්ද සැඟවීය. සමහර විට ඔහු අපව විශ්වාස කලත්, ඔහු සිටින මේ පරිසරයේ නියම තොරතුරු අපට නොකියනු ඇත.

තමන්ගේ ගෙලට සියතින්ම තොන්ඩුවක් දගැනීමට සිතන මිනිසා මෝඩයකි. එහෙත් සොලමන් මහතා මෝඩයකු නොවේ. ඔහු කපටියෙකු වංචාකරයෙකු ද නොවේ. මට සිදුව ඇත්තේ ඔහු කවුදැයි මුලින්ම තේරුම් ගැනීමය.

http://e-pusthakalaya.blogspot.com



"මිටුන් රැවුල කැපුවම හුගක් ලස්සනයි. ඔයාගෙ ගාම්භීර හොඳට ගැලපෙනව. ඔයාගෙ හැඩ රුව ගැන බැලුවම ඉන්දියානුවෙක් කියල කියන්නවත් බැහැ" සොලමන් මහතා ... බැලුවේ විපරම් සහගතවය. මම ඔහුගේ කතාවට ... තිගැස්සුනද, මම මගේ හැඟීම් ඔහු ඉදිරියේ වසන් කලෙමි.

"අපි මෙහෙ ගත කරන්නෙ හිරකරුවන්ගෙ ජීවිතයක් ... අපි දෙන්නට ඔල්මාදෙ හැදෙන්නෙ නැති එක පුදුමයි. ආශ්‍රය ... කිසිම කෙනෙක් නැහැ. තිලිප්පන්ගෙ මිනිස්සු එකා දෙන්න ... එනව. ඒ එන්නෙ අපිට බඩු මුට්ටු අරගෙන. වෙන ඉතින් අපේ ... රකින්නෙ..... " ඔහු කියන්නට ගිය දේ එකවරම ගිලගත්තේය.

"කොච්චර කලක් සර් මෙහෙ ඉන්නද බලාපොරොත්තුව ..." මම අවස්ථාව බලා ඔහුගෙන් ඇසීමි.

"ලෝඩ් ක්‍රිෂ්ණන් අපිට සාධාරනත්වය ඉටු කරාවි. තව ... කලක් නැහැ මේ පාර ඡන්දෙන් මහ ඇමතිගෙ පරාජය වළක්ව... බැහැ. දැනටමත් මහජනයා උද්ඝෝෂණ කරනව කියල ආරංචියි"

"ඡන්දෙ තියෙන්නෙ කොයි කාලෙද ?"

"ලබන මාර්තුවල ..... "

"තව මාස හතරක් තියෙනව"

"ඔව්..... "

අපි කතා කරමින් සෙමින් සෙමින් ඉදිරියට ගියෙමු. ... දිස්වෙන්නේ කඳු වැටි පෙළකි. මුළු රාත්‍රියක් මුළුල්ලේ එක දිගට ... පැවත්වූ වර්ෂාව නිසා ගස් කොළන්වල ඇත්තේ ප්‍රාණවත් ... පලින් පල කැලෑ ගස්වල ලස්සන මල් පිපී ඇත. සොලමන් මහතා ... පාරක් දිගේ ගමන් කළේය. මමද ඔහු පසු පස ගමන් කලෙමි.

"මිටුන්ට ඊයේ රෑ නින්ද ගියාද ?"

"ඔව්..... "

"කරදරයක් වුනේ නැහැනෙ..... "

"නැහැ..... "



"මම ඊයෙ රාත්‍රියේ මගේ දුවට හොඳටම දොස් කිව්ව..... එයත් ආසයි අපිට එකතු වෙන්න. ඒත් කොහොමද එහෙම කරන්නෙ. මොනව වුනත් එයා මනුෂ්‍යයෙක් නෙවිනෙ."

"..... හ්..... ම්..... "

"මොනව කරත් එයාට බනින්න එපා. එයා අහිංසකයි. එයාව මැරුවෙ අර මහ ඇමති. මම ඕකගෙන් පළි ගන්නව..... මම දෙවියන්ට පොරොන්දු වෙල තියෙන්නෙ..... " ඔහු මදක් නතර වී දත්මිටි සැපුවේය.

"මට අද මගේ පුතාවත් දකින්න නැහැ. තිලිප්පන් මට පොරොන්දු වුනා ඉක්මනට මගේ පුතාව මුණගස්සනව කියල ..... පුතා ඉන්දියාවට ආවොත්, තිලිප්පන් කොහොම හරි එයාව මෙහාට රහසෙ අරගෙන ඒවි. ඊට ඉස්සෙල්ල මම පුතාට කතා කරන්න ඕන. ආයෙත් තිලිප්පන්ගෙ අවසරය ලැබුනම මම යනව බීරූර්වලට..... ඒත් කවදද කියල මට හරියට කියන්න බැහැ..... "

"බීරූර්වලට යනකොට අපි දෙන්නටත් යන්න බැරිද ?"

"පුළුවන් වේවි..... ඒත් ඉන් එහාට ..... බීරූර් වෙනකන් විතරයි තිලිප්පන්ගෙ අණසක තියෙන්නෙ..... "

"අපි ඉක්මනින් ගෙදර යන්න ඕන සර්..... "

"මට තේරෙනව..... එක අතකින් ඔය දෙන්නව මට මුණ නොගැහුන නම් හොඳයි කියලත් දැන් මට හිතෙනව"

"ඒ ඇයි..... ?"

"මේක රහස් තැනක්. තිලිප්පන්ගෙ බඩු හංගල තියෙන්නෙත් මේ කැලේ. අවි ආයුධ වගේම එයා මංකොල්ල කන බඩුත් මෙහාට ගේනව. මං දන්නෙ නැහැ එයා ඒව කොහේ හංගනවද කියල ..... ඒත් මට විශ්වාසයි එයාගෙ අවි ගබඩාව තියෙන්නෙ මේ කැලේ කොහේ හරි තැනක"

"තිලිප්පන්ට අහුවුනොත් එහෙනම් අපිව මරාවි"

"කලබල වෙන්න එපා මිටුන්. කොහොම හරි අපි ඒ ප්‍රශ්ණය විසඳ ගමු"

http://e-pusthakalaya.blogspot.com



"ඒ කියන්නෙ අපිට මෙහෙ ඉන්න වෙන්නෙ හැංගිල..... "

"බොහෝ දුරට..... "

"අනේ දෙවියනේ අපිට වෙච්ච දෙයක්..... "

"තෙරේස මට මේක කිව්ව. මම කොහොමද ඔය ළමයි මෙහෙ උදව්වක් ඉල්ලනකොට මග ඇරල දාන්නෙ. සමහර විට එද ... දෙන්නව තිලිප්පන්ගෙ මිනිස්සුන්ට අහුවුනානම්..... මෙලහකට දෙන්නගෙ ඉරණම විසඳිල ..... " ඔහු සුසුමක් හෙලුවේය.

"ඊයෙ තිලිප්පන් මෙහාට එන පාර වැහැව්ව"

"මේකත් හරියට වහල් ජිවිතයක් වගේ"

"ඇත්තටම..... "

"මිට්‍රුන් හිතනවද අපි මෙහෙ ඉන්නෙ සන්තෝසෙන් කියල"

"මට තේරෙනව සර්..... "

අපි කතාකරමින් ලගා වූයේ සොහොන් කොතක් අද්දරට. එය මුළුමනින්ම පඳුරුවලින් වැසී තිබුණත් කවුදෝ ඒ අවට ... පෙහෙළි කොට තිබුණේ ටික කලකට උඩදී විය යුතුය.

"මම ඉද හිටල මේ සොහොන්ගේ මිනිහෙක් අල්ලගෙන ... පවිත්‍ර කරනව. ඒත් හරි ඉක්මනට කැලේ වැවෙනව..... " ... සොහොන් ගේ අද්දරට ගොස් ඒ අවට වූ වැල් හා කුඩා පැල ගල ... දැම්මේය. අනතුරුව ඔහු ඒ අසලට ගොස් මද වේලාව ... නිසොල්මන්ව සිටියේ ඔහුගේ ආචාරය පුද කරන්නට විය යුතුය.

"මේක තමයි සුදු ජාතිකයගෙ සොහොන් කොත. 'ජෝ... මැකාර්ති' ඉපදිල තියෙන්නෙ 1945. මරණය සිද්ධ වෙල තියෙන්... 2004දි. මේ සොහොන හදල තියෙන්නෙ කවුද කියල මම දන්... නැහැ..... "

"මේකෙ ලෑල්ල ඇරලනෙ..... " මම සිමෙන්ති කොන්ක්... ලෑල්ල දෙස බලමින් කීවෙමි.

සොලමන් මහතා තිගැස්සී ගියේය.



"මොකව..... ඒක වෙන්න බැහැ"

"ඇයි වෙන්න බැරි..... කොහොම හරි මේ ලෑල්ල ඇරල තියෙනව..... "

"මීට කලිනුත් ඔහොම වැඩක් වෙල මම සිමෙන්ති දල ලෑල්ල තද කලා..... " ඔහු සුසුමක් හෙලුවේය.

"මේ මනුස්සයට මැරිලත් නිදහසක් නැහැ"

"ඒ ඇයි..... ?"

"දවසක් මම බලනකොට මේ වලේ මිනිය තිබුණෙ නැහැ. පෙට්ටිය ඇරල තිබුණා.. අඩුම ගානෙ දිරාගිය මළ කුණවත් එතන තිබුණෙ නැහැ"

"ඇයි මොකද වෙලා තියෙන්නෙ..... "

"මම හිතන්නෙ එයා නැගිට්ටින්න ඇති"

"මළවුන්ගෙ නැගිටීම ගැන මම විශ්වාස කරන්නෙ නැහැ"

"ඔයා ඩ්‍රැකියුලා පින්තූර දැකල තියෙනවද ?"

"ඔව්"

"ඩ්‍රැකියුලා උදේට පෙට්ටියේ නිදාගෙන ඉන්නෙ හරියට අහිංසකයෙකු වගේ. රෑට නැගිටල ගිහින් මිනිසුන්ගෙ ලේ උරා බොනව"

"ඒක ප්‍රබන්ධ කතාවක්..... "

"ඇත්ත. ඒත් එහෙම කතා හැදෙන්නත් මොකක් හරි වස්තු බීජයක් තියෙන්න ඇති"

"සමහර මිතභාවන් ඇතිවෙල තියෙන්නෙ අභිරහස් මුල්කරගෙන"

"මිට්‍රුන්ගෙ හිත හුගක් තදයි"

The Reader's Place novel..

http://e-pusthakalaya.blogspot.com



සොලමන් මහතා ලෑල්ල මැදක් තල්ලු කරන්නට උ කරත්ම, මම ඔහු අසලට ගොස් වැර යොදා ලෑල්ල එහා කලෙමි. බලාපොරොත්තු නොවූ පරිදි පුපුරා තිබූ කොටසක් ඉත් වල තුලටම වැටිණ. මම ඒ කුහරයෙන් එබී බැලුවෙමි. එහි වූයේ සිරුරක් නොව කට ලගටම පුරවන ලද අවි ආයුධය. මම සොලමන් මහතා දෙස බැලිමි.

"මෙතන තියෙන්නෙ ආයුධ"

"මොනව..... ? "

මා බලා සිටිද්දීම සොලමන් මහතාගේ මුව අඳුරු වී ගි මොහොතකින් එහි ආරූඪ වූයේ කිසියම් බියකරු පෙණුමකි.

"මොකද දැන් කරන්නේ..... මෙතන තිලිප්පන් හංගලා..... මෙතනින් ඉක්මනට ගියොත් හොඳයි"

අපි ලහි ලහියේ එතැනින් නික්ම ගෙදර ආවෙමු. ගෙද විගස සොලමන් මහතා කලේ කාමරයට වැදී දොර වසා ගැනීම වූයේ කුමක්දැයි මට එකවරම සිතාගත නොහැකි විය. එහෙ දෙයක් මට පැහැදිලි විය. ඒ තිලිප්පන් බොහෝ විට මෙම ප්‍ර පුරාම පතුරුවා ඇති මිත්‍යාව, ඔහුගේ අපරාධවල වැ හරවාගෙන ඇති බවය.

මම අංජු සමග කිසිවක් නොකීවෙමි. ඇය කාමරයේ කල්පනා කරමින් සිටියාය. ඇගේ මුවෙහි වූයේ කනස්සලු ස්වභාව

"ඇයි අංජු..... ?"

"අපිට මෙහෙන් ගැලවිල යන එකත් ලෙහෙසි නැහැ"

"ඇයි ඔයා මිසිස් තෙරේසා එක්ක කතා කරාද ?"

"ඔව්..... තිලිප්පන්ගෙ රහස් ඔක්කොම තියෙන්නෙ ප්‍රදේශයේ. මේ ගම වටකරගෙන ඉන්නෙ නොදියුණු ගෝත්‍රිකයෝ තිලිප්පන්ට නායකයෙකුට වගේ සලකනව..... ගෝත්‍රික මිනිස්සු නපුරුයිලු"

"දැන් මොකද කරන්නෙ..... ?"



"අපිට ගෙදර යන්න හම්බවෙන එකක් නැහැ ශාන්..... " අංජු සුන්වූ බලාපොරොත්තුවෙන් යුතුව මා දෙස බැලුවාය. ඇගේ දෑසේ පිරුණු කඳුළු මොහොතකින් කොපුල්තල හරහා ගලා ආයේය.

"ශාන්..... මට වහ ටිකක් බීල මැරෙන්න හිතයි"

"අපි තව ටිකක් උත්සාහ කරල බලමු. ඔයා මැරුණ කියල ප්‍රශ්නෙ විසඳෙන්නෙ නැහැනෙ"

"මගේ හිතේ මොනතරම් බලාපොරොත්තු තිබුණද ? දේවි ආචාර්ය උපාධිය ගත්තට පස්සෙ එයා හිතාගෙන හිටියෙ මුම්බායිවලට එන්න. මුම්බායි පූනෙට ලගයි. එහෙ ගෙයක් අරන් පදිංචි වුනාම මට අම්ම තාත්තවත් බලාගන්න පුළුවන්. මල්ලිටත් උගන්නන්න දේවි පොරොන්දු වෙල හිටියෙ. මට තිබුණ ලොකුම බර මල්ලිගෙ අධ්‍යාපනය. ඒක දේවි බාරගන්නව නම් මට රස්සාවත් ප්‍රශ්ණයක් නෙවි. කොහොමත් මට හැමදාම මගේ රස්සාව කරන්න බැහැ. ගුවන් සේවිකාවක් හැටියට මට මගේ පවුල් ජීවිතය සාර්ථක කරගන්න බැහැ"

"ඔයා ඔය ගැන හුඟක් හිතන්න එපා. අපිට මොනව හරි වෙන්නෙ නැතැයි..... "

"ශාන් හිතනවද අපිට මෙතනින් ගැලවෙන්න ලෙහෙසි වෙයි කියල. මේක තිලිප්පන්ගෙ තිප්පොලක්. උන් කවදවත් අපිව මෙහෙන් පිටකරන එකක් නැහැ. උන්ගෙ රහස් ඔක්කොම තියෙන්නෙ මේ කැලේ. අපි ගැන විශ්වාස කරල අවදානමක් ලබාගන්න උන් විතරක් නෙවි මිස්ටර් සොලමනුත් කැමති වෙන එකක් නැහැ"

ඇය සුසුම් හෙලන හඬ මට ඇසේ. බලාපොරොත්තුවේ කිසිදු සේයාවක් ඇගේ මුව තුල නැත.

"මිසිස් තෙරේසා මොකද කියන්නෙ..... ?"

"එයා අහිංසකයි. එයා එයාගෙ දුව ගැන හැම වෙලාවෙම මතක් කර කර අඬනව. එයා ආසයි මම හැමදම වුනත් එයා ගාව ඉන්නවට..... අපිට මේ ගෙයින් එළියටවත් බහින්න බැරිවේවි ශාන්. මිසිස් තෙරේසා මේ ගෝත්‍රිකයින් ගැන කියපු කතා අහල මට හරි භයක් හිතුන. උන්ට පිරිමියෙක් අහු වුනොත්..... "

The Readers Place novel..

http://e-pusthakalaya.blogspot.com



"හැම ගෝත්‍රික ගෑනියෙක්ම එහෙමයි. දැක්කෙ නැද් ගෝතිත් එක්ක හිටිය ගෑනු..... "

"ඒත් එහෙ තිබුණෙ ගෝතිගෙ අණසක. මෙහෙ..... හුඹ හේතුවෙල තියෙන්නෙ ගෝත්‍රිකයින්ගෙ පිරිමින්ට වඩා ගැහැණු විමයි ශාන්. තෙරේස කිව්ව ඔයාව හුඟක් ප්‍රවේශම් කරගන්න කිය

"මිස්ට සොලමනුත් මට ඔය කතාවම කිව්ව..... වෙලාවකට හිතෙනව ඒ ගොල්ලො එහෙම කියන්න ඇත්තෙ අපිව කරන්න"

"අනිත් එක සති පූජාවත් මෙහෙ තියෙනව. මිනිහ මැරු ගෑනිවත් ඒ දර සෑයටම දනව"

"එහෙනම් මම හදිසියෙවත් මැරුණොත් ඔයාවත් දුවි දර සෑයට..... "

"ඒ කොහොමද ?"

"අපිත් ඉතින් ඔයාලගෙ සිරිත් විරිත් අනුව බැඳලනෙ..... "

"ඒක දන්නෙ අපි දෙන්න විතරයි"

"මේක මහ රැවටීමක් ශාන්..... "

"කවුද කතා කරනව ඇහෙනව..... "

"ඒ මිස්ටර් සොලමන්ගෙ කට හඬ නෙව්"

කිසිවෙකු දිව එන හඬ ඇසිණ. ඒ සමගම ඇසුනේ කාම දොරට ගසන හඬකි. මම නැගිට ගොස් දොර හරිත්ම, තෙ දොරකඩ අසල සිටියාය.

"දොරේ අගුල දගන්න. සද්ද කරන්න එපා. තිලිප්ප මිනිස්සු ඇවිත්..... "

මම දොර වසා අගුළු දාගතිමි. කිසිවෙකු බහින් බස්වන පිටතින් අපට ඇසිණ. ඒ දෙතුන් දෙනෙකුගේ කට හඬය. ඔවුන් දිගට සොලමන් මහතාට බැණ වැදුනේ අප ගැන යම් කිසි සැක එහෙත් සොලමන් මහතා ද කළේ ඔවුනට උස් හඬින් බැණ වැදීම



"උඹලට කොහේ තියෙන හයියක්ද මගේ ගේ පරීක්ෂා කරන්න..... උඹල දැනගනිල්ල මං හින්දයි උඹේ මහ එකා බේරිල ඉන්නෙ..... "

"අපේ කෙනෙක් දැකල තියෙනව මෙහාට දෙන්නෙක් එනව."

"ඒ මගේ පුතා..... "

"අපිට එයාව බලන්න ඕන..... "

"එයා ටිකක් අසනීපයෙන්. මේ වෙලාවෙ කතා කරන්න බැහැ"

"අපිට පුතා එන බව කිව්වෙ ලබන මාසෙ..... "

"නැහැ එයා කලින් ආව. මම බීරුඊර්වලට ගියේ එයාව එක්ක ගෙන එන්න. තිලිප්පන් ඒක දන්නව..... "

"එතකොට අනිත් එක්කෙනා..... "

"ඒ මගේ ලේලි..... "

"අපි තිලිප්පන්ට කියන්නම්"

"කියපල්ල කියපල්ල ..... තව කොච්චර කල් උඹලත් එක්ක මම මෙහෙම කට ගහන්නද ? උඹල දැනගනින් මහ ඇමති පැරදුනත් තිලිප්පන්ගෙ ගැලවීම තියෙන්නෙ මගේ අතේ"

"අපි බොස්ට මොකවත් කිව්වෙ නැහැ. අපි ඇහැව්වෙ අමුත්තො දෙන්න ගැන..... "

"මම උඹලට සැරයක් කිව්ව පලයල්ල යන්න මෙතනින්"

සොලමන් මහතා කිප සැරයක්ම සැර වූවේය. මාත් අංජුත් මුහුණට මුහුණ බලා ගතිමු. තවත් මොහොතකින් සියල්ල සන්සුන් විය. මම දෙර ඇරගෙන කාමරයෙන් පිටතට ආවෙමි. තෙරේසාද ඔහු අසල වාඩි වී සිටියාය. මා දකිත්ම ඇය නැගී සිටියේ කිසියම් බියකින් මෙනි.

"මේ වැඩේ මහ අවදනම් සොලමන්. ශාලු ලස්සනයි..... තිලිප්පන්ගෙ අගසව්ව හොඳ මිනිහෙක් නෙවි. මුන් දැන් ගිහින් එක දෙක කරල කියාවි. උන් දන්නව අපි මෙයාලව හංගගෙන ඉන්න බව"



The Reader's Place Novel..

http://e-pusthakalaya.blogspot.com



"මොකද්ද තෙරේසා අපි මේකට කරන්නෙ. අපිට ... මේ දෙන්නට යන්න කියන්න. ඇරත් රටත් කොටක් ... ගොල්ලො කොහේ කියල යන්නද ?"

"මිස්ටර් සොලමන්ට කරදරයක් වෙනව නම් අපි ... යන්නම්....." සොලමන් මහතා කෝපයෙන් මා දෙස බැලුවේය.

"කොහාටද ?"

"මම දන්නෙ නැහැ. අපි කොහාටද යන්නෙ..... අපි ... කරන්නෙ කියල. ඒත් අපි ඉක්මනට මෙහෙන් යන්න ඕන. එච්චර... දන්නෙ....."

අංජු දොරකඩ අසල සිට අපේ කතාවට සවන් දී සිටි... ඇගේ මුහුණේද ප්‍රසන්න පෙනුමක් නොවීය. ඇය ඉඟියකින් ... කළාය. මම කාමරයට ගිය පසු අංජු එය වසා ඇඳුමේ ... හොයාගෙන පසුවිනි.

"මොකවද ඔයා මේ කියවන්නෙ..... අපිට පුළුවන්ද ... තිබ්බට එක පාරටම එහෙම යන්න"

"ඉතින් ඔයාගෙ කියන්නෙ හැම වෙලාවෙම යන්න ඕන කිය..."

"යන්න ඕන තමයි. ඒත් පාරක් කොටක් දැනගෙන. ... වහල් කඳවුරේ හිරිය හැටි වැරහැලි ඇඳගෙන ඇට ජාති ... මෙතන තව ඉන්නවත් පුළුවන් කමක් තියෙනව. කට ඉස්සර කර... එපා ශාන්"

"ඔයා හැම වෙලාවෙම අවලාද කියන නින්දයි මම එ... කිව්වෙ....."

"මම කියන්නෙ ඔයාට. සොලමන්ට නෙවී"

තවත් කතා කිරීමෙන් ඵලක් නැත. කතාව දිග්ගස්ස ගන්න... වඩා, වඩාම හොඳ නිහඬ වීමය. මම ඇඳ මත දිගාවී දෑත් හිස ... තබාගෙන දෙනෙත් පියාගතිමි. අංජු ඇගේ ඇඳුම්ද ගෙන ... කාමරයට වැදී දොර වසා ගත්තාය. නොදැනුවත්ම මට නින්ද ... තිබිණ.

The Reader's Place novel..



"ශාන්..... මිසිස් තෙරේසා කතා කරනව කෑම කන්න....."

මම තිගැස්සී දෑස් ඇරියෙමි. අංජු දිය නා කොණ්ඩය පිසදමමින් මා ඉදිරියේ සිටියාය. ඇය හැඳ සිටියේ රැලි වැටුණු සායක් හා කර පළල් හැට්ටයකි. ඇය මේ මාරකොළ දෙවන ඇඳුමයි. මගේ සිතට සිසියම් බියක් දැනුනේ ඇය හිසට මල් කොප්පියක්ද පැළඳ ගනීවියැයි යන සැකයෙනි. පෙර දින රාත්‍රිය මට මතකය. ඒ විදුලි කෙටීමත් සමග මා දුටුවේ ජනේලය අසල ගුළි වී සිටින ටජාහිය. මේ ටජාහිගේ ඇඳුම්ය. ඇය ඒ ඇඳුම්වලට ආසය. ඒවා තවකෙකු අඳිනවා දකින්න ඇය කැමති නොවනු ඇත.

"ඇයි..... ?" මා ඇය දෙස බිලින්නට මෙන් බලා සිටිනු දුටු අංජු ඇසුවාය.

"හරියට මාව කවදාවත් දැකල නැහැ වගේ"

"ඔය විදියට නම් මම දැකල නැහැ"

"ඔයා ආස නැද්ද මම ගවුම් අඳිනවට"

"ඒක අහන්න තියෙන්නෙ මගෙන් නෙවී"

"එහෙනම්"

"දේවිගෙන්....."

"එයා මේ ඇඳුම දැක්කොත් මාව පන්න ගනීවී"

"ඇයි ඉතින් එහෙනම් අඳින්නෙ ?"

"මම මිසිස් තෙරේසගෙන් සල්වාර් එකක් ඉල්ලුව. එයාගෙ දුව සල්වාර් ඇඳල නැහැ"

"ටජාහිගෙ සීයා ඉතාලි ජාතිකයෙක්. එයා වඩාත් කැමති ඇති ගවුම් ඇඳල ලස්සන තොප්පියක් පළඳින්න....."

ඇය දෑස් අමුතු කොට මා දෙස බැලුවාය. මම තවත් ඇය දෙස නොබැලුවෙමි. මා අනිත් ඇලයට හැරෙනු දුටු අංජු උරහිසට අත තබා සෙලවූවාය.

http://e-pusthakalaya.blogspot.com

"මිසිස් තෙරේසලා අපි එනකන් බලාගෙන ඉන්නැ

"ඔයා ගිහින් කෑම කන්න. මට බඩගිනි නැහැ"

"එහෙනම් මටත් බැහැ යන්න"

"ඇයි ?"

"ඒ ගොල්ලො මොනව හිතාවිද ? මම තනියෙන්

"මොනව හිතන්නද ? මට නින්ද ගිහින් කියන්න"

"මට බොරු කියන්න බැහැ"

"එහෙනම් කියන්න මම පස්සෙ කන්නම් කියල"

"මට හුගක් බඩගිනියි"

"ඉතින් ඔයා කන්න..... "

"මම දන්නව ඔයා කරන්නෙ බොරු. ඔයා
මම කියපු කතාවටනෙ. ඔයා හැමදම මාත් එක්ක
හදනව. ඔයාට ඕන කරන්නෙ මගේ ඇස්වල කඳුළු

මොහොතකින් ඇය කිවාක් මෙන් ඒ දෑස් කඳුළු
මම වහා ඇඳ මතින් නැගිට කාමරයෙන් පිටත ආවේ
දහවල් කෑම මේසයට වී සොලමන් යුවළ බලා සිටියහ.

"මොකද මිට්‍රන්..... මූණ අමුතු වෙලා"
දුටුවේ මගේ කිසියම් වෙනසකි.

"නින්ද ගිහින් හිටියෙ. මමයි කතා කළේ
පිළිතුරු දුන්නේ අංජුය.

"මිට්‍රන් කිසිම දෙයක් හිතට ගන්න එපා....
බලාගත්තම්....."

මම අංජු දෙස එතවරම බැලිමි. කට ඉස්සර
ගොස් සිදුවන්නේ නැති ප්‍රශ්ණ අවුළුවා ගැනීමය.



"තිලිප්පන්ට ලෙහෙසියෙන් මාව බය කරගන්න බැහැ. උසාවියේදී එයා වෙනුවෙන් කතා කරන්න නීතිඥයො බයයි. එයා දන්නව මගේ වටිනාකම. ඒක සල්ලිවලට ගන්න බැහැ. තිලිප්පන් දැන් මහ ඇමතිගෙ විරුද්ධවාදීන්ට උදව් කරනව. මොනව වුනත් එයා චෝදනාවලින් බේරෙන්න උසාවි යන්න ඕන"

සොලමන්ගේ කතාව තෙරේසාද අනුමත කරයි. එහෙත් ඔහු එය පුන පුනා කියන්නේ ඇයි දැයි මට නොතේරේ. සමහර විට අපේ බිය සැක දුරු කරන්නට විය හැක. ආහාර ගැනීමෙන් අනතුරුව දහවල් නින්ද සඳහා සොලමන් මහතා කාමරයට ගියාය. තෙරේසාට කෑම පිගන් අස්පස් කර ගැනීමට අංජුද උදව්වට ගිය අතර මම කාමරයට ආවෙමි.

මා නිදා සිටි ඇඳ මත සුද්දගේ දින පොත තිබිණ. එය දකින්ම මා එකවරම තිගැස්සුනු අතර, මේස ලාච්චුව බලද්දී එය හැර දමා තිබුණි. දින පොත තිබුණේ ඒ හැර දමා තිබූ මේස ලාච්චුව තුළය. මම පොත අතට ගත් විට එහි එක්තරා පිටුවක සළකුණක් දමා තිබුණ.

පිටතින් අඩි ශබ්දයක් ඇසිණ. ඒ අංජු විය යුතුය. මම වහා පොත යළි ලාච්චුවට දමා වැසිමි. අනතුරුව මා ඇඳට ගොඩවූයේ නිදගත් බව ඇඟවීමටය. දොර ඇරින හඬ ඇසිණ. අංජු ඉන් කාමරයට ඇතුළුවන්නට ඇත. ඇය ඇඳමත වාඩි වෙනු මට දැනිණ. මම දෑස් යන්තමට ඇරියෙමි.

ඇඳ මත වාඩි වී සිටියේ අංජු නොව ටජානිය. ඇය මට පිටුපා සිටියාය. ඇය පැළඳ සිටි තොප්පිය මා දුටුවේ ඊයේ රාත්‍රියේ ජනේලය අද්දරදීය. වකුටු වී ගුලි වී සිටි ඇය තොප්පිය මදක් මෑත් කොට මා දෙස බැලුවාය.

"අනේ දෙවියනේ" මට කෑ ගැසුණේ ඉබේටමය. මා කලබල වූ තරම කියතොත් ඇඳෙන් පැනගත්තේ දොර දෙසට දිව යාමටය. එහෙත් දොර වසා දමා තිබිණ.

"මොකද මොකද ?" අංජු කලබල වී ඇසුවාය.

"ඔයාට පිස්සුද ?"

"මේ ඔයා..... ? "

http://e-pusthakalaya.blogspot.com



"මිසිස් තෙරේසලා අපි එනකන් බලාගෙන ඉන්නව"

"ඔයා ගිහින් කෑම කන්න. මට බඩගිනි නැහැ"

"එහෙනම් මටත් බැහැ යන්න"

"ඇයි ?"

"ඒ ගොල්ලො මොනව හිතාවිද ? මම තනියෙන් ගියාම"

"මොනව හිතන්නද ? මට නින්ද ගිහින් කියන්න"

"මට බොරු කියන්න බැහැ"

"එහෙනම් කියන්න මම පස්සෙ කන්නම් කියල"

"මට හුගක් බඩගිනියි"

"ඉතින් ඔයා කන්න....."

"මම දන්නව ඔයා කරන්නෙ බොරු. ඔයා ඔහොම කරන... මම කියපු කතාවටනෙ. ඔයා හැමදාම මාත් එක්ක තරහ වෙ... හදනව. ඔයාට ඕන කරන්නෙ මගේ ඇස්වල කඳුළු දකින්නද ?"

මොහොතකින් ඇය කිව්වාක් මෙන් ඒ දෑස් කඳුලින් පිරී ගියේ... මම වහා ඇඳ මතින් නැගිට කාමරයෙන් පිටත ආවෙමි. අප එනතෙ... දහවල් කෑම මේසයට වී සොලමන් යුවළ බලා සිටියහ.

"මොකද මිට්ටුන්..... මූණ අමුතු වෙලා" සොලමන් මහ... දුටුවේ මගේ කිසියම් වෙනසකි.

"නින්ද ගිහින් හිටියෙ. මමයි කතා කලේ" මා වෙනුවෙ... පිළිතුරු දුන්නේ අංජුය.

"මිට්ටුන් කිසිම දෙයක් හිතට ගන්න එපා..... වෙන දෙයක් ... බලාගන්නම්..... "

මම අංජු දෙස එකවරම බැලීමි. කට ඉස්සර කරගන්නට ගොස් සිදුවන්නේ නැති ප්‍රශ්ණ අවුළුවා ගැනීමය.



"පිලිප්පන්ට ලෙහෙසියෙන් මාව බය කරගන්න බැහැ. උසාවියේදී එයා වෙනුවෙන් කතා කරන්න නීතිඥයො බයයි. එයා දන්නව මගේ වටිනාකම. ඒක සල්ලිවලට ගන්න බැහැ. පිලිප්පන් දැන් මහ ඇමතිගෙ විරුද්ධවාදීන්ට උදව් කරනව. මොනව වුනත් එයා චෝදනාවලින් බේරෙන්න උසාවි යන්න ඕන"

සොලමන්ගේ කතාව තෙරේසාද අනුමත කරයි. එහෙත් ඔහු එය පුන පුනා කියන්නේ ඇයි දැයි මට නොතේරේ. සමහර විට අපේ බිය සැක දුරු කරන්නට විය හැක. ආහාර ගැනීමෙන් අනතුරුව දහවල් නින්ද සඳහා සොලමන් මහතා කාමරයට ගියාය. තෙරේසාට කෑම පිගන් අස්පස් කර ගැනීමට අංජුද උදව්වට ගිය අතර මම කාමරයට ආවෙමි.

මා නිද සිටි ඇඳ මත සුද්දගේ දින පොත තිබිණ. එය දකිත්ම මා එකවරම තිගැස්සුනු අතර, මේස ලාච්චුව බලද්දී එය හැර දමා තිබුණි. දින පොත තිබුණේ ඒ හැර දමා තිබූ මේස ලාච්චුව තුළය. මම පොත අතට ගත් විට එහි එක්තරා පිටුවක සළකුණක් දමා තිබුණ.

පිටතින් අඩි ශබ්දයක් ඇසිණ. ඒ අංජු විය යුතුය. මම වහා පොත යළි ලාච්චුවට දමා වැසීමි. අනතුරුව මා ඇඳට ගොඩවූයේ නිදගත් බව ඇඟවීමටය. දොර අරින හඬ ඇසිණ. අංජු ඉන් කාමරයට ඇතුළුවන්නට ඇත. ඇය ඇඳමත වාඩි වෙනු මට දැනිණ. මම දෑස් යන්තමට ඇරියෙමි.

ඇඳ මත වාඩි වී සිටියේ අංජු නොව වජානිය. ඇය මට පිටුපා සිටියාය. ඇය පැළඳ සිටි තොප්පිය මා දුටුවේ ඊයේ රාත්‍රියේ ජනේලය අද්දරදීය. වකුටු වී ගුලි වී සිටි ඇය තොප්පිය මඳක් මෑත් කොට මා දෙස බැලුවාය.

"අනේ දෙවියනේ" මට කෑ ගැසුණේ ඉබේටමය. මා කලබල වූ තරම කියතොත් ඇඳෙන් පැනගත්තේ දොර දෙසට දිව යාමටය. එහෙත් දොර වසා දමා තිබිණ.

"මොකද මොකද ?" අංජු කලබල වී ඇසුවාය.

"ඔයාට පිස්සුද ?"

"මේ ඔයා..... ? "



The Reader's Place Novels

http://e-pusthakalaya.blogspot.com



"ඔව් ඇයි..... ?"

"ඔය තොප්පිය..... "

"මේක තෙරේසගෙ දුවගෙ ..... මට මේක තෙරේස පෙන්නුව. මම ලස්සනයි කිව්වම එයා මට දුන්න. මම ඉතින් දාගෙන ආව. ඔයා කිව්වනෙ තොප්පියක් දැම්මම ලස්සනයි කියල"

"මම එහෙම කිව්වද ?"

"ඔයා කියන ඒව ඔයාටම මතක නැහැ..... ඇයි ඔයා හති අරින්නෙ..... ඇයි ඔයා කෑගහගෙන පැනල යන්න හැදුවෙ"

"මම හීනයක් දැක්ක"

"ඔයාට දවල් හීනත් පේනවද ?" අංජු හඬ නගා සිනහාසුණාය.

"මම ආස නැහැ ඔය තොප්පියට"

"ඇයි..... ?"

"ඕක මැරිච්ච කෙනෙක්ගෙ සිහිවටනයක්"

"ඉතින් මොකෝ..... ? "

"මොනවටද ඒ සිහිවටන් අපිට"

"ඔයා ආස නැත්නම් මම මේසෙ උඩින් තියන්නම්" ඇය නැගිට ගොස් තොප්පිය මේසය මත තැබුවාය.

"ඔයා දැන් නිදාගන්නද හදන්නෙ ?"

"ඔව්..... "

"දවල්ට කියල කරන්න දේකුත් නැහැ. රෑට කියල කරන්න දේකුත් නැහැ. මුළු දවසෙම අපි කාමරේ හිරවෙල ..... "

"මම යනව හෙට ගමනක්"



The Reader's Place Novels

"කොහාටද ?"

"ගල් පල්ලියට..... "

"මාත් එනව..... ?"

"මම යන්නෙ මිස්ටර් සොලමන් එක්ක"

තවමත් ඇගේ කොණ්ඩය වේලී නැත. මම යටසින් ඇය දෙස බැලීමි. ඇය කෙතරම් සුන්දර පියකරු කෙල්ලක්ද ? වහල් කඳවුරේ සිටිද්දී මෙතරම් පියකරුත්වය මා ඇය තුළින් දැක නැත. ඇය මෙතරම් ලස්සන මේ ඇඳුම් නිසාද ? නැතිනම් ඇය තුළින් මා මින් පෙර නොදුටු සුන්දරත්වයක් දකින්නට මගේ සිත පෙළඹෙන්නේද ? මා සිතට එන හැඟීම් මැඩගත යුතුය.

විරාගයේ එන අරවින්ද මට සිහිපත් වෙයි. විරාගයෙන් රාගය මැඩීම තෙරෙපෙන සිතුවිලි තුළ පීඩනය තුනී කරන්නෙකි. ඇගේ සුදු පැහැති ගෙල දෙසත් ගවුමෙන් නිරාවරණය වූ ලස්සන දෙකකුල් දෙසත් මම හොර රහසේ බලමි. මට දැන් කෙලින්ම ඇය දෙස බැලීමට අපහසු කමක් දැනේ. අවස්ථාවේ හැටියට පිළිකුල් භාවනාව සුදුසු නැත. කෙසේ වුවද මා හැඟීම් පාලනය කල යුතුය. ලස්සන කෙල්ලක් සමග නොසිතූ විරූ අයුරින් මාස හතරකට අධික කාලයක් තනිවූ මා දැන් මේ ගෙවන අමාරුම කාල පරිච්ඡේදයයි.

ලස්සන කෙල්ලක හා දවස් කීපයක් ඔබ එකම කුටියක තනි වී නම්..... ඔබට කුමක් වේද? ඔබේ සිතුම් පැතුම් කෙසේ ක්‍රියාකරන්නේද? එලෙස අසන්නට පවා මා සමීපයේ දැන් කිසිවෙක් නැත. මා දන්නේ එකම දෙයකි. ඇය අන් ළඳකි. ඇය විවාහ ගිවිස ගත් කෙල්ලකි. මා කල යුත්තේ වටිනා භාණ්ඩයක් සේ ඇය පරිස්සම් කොට භාරදී මා අරුණි වෙත යාමය. ඇය තවමත් මා ඉන්දියාවෙන් සාරිය ගෙනෙන තෙක් මග බලා සිටිනු ඇත.

"ශාන්..... "

මම දෑස් ඇරියෙමි. ඇය මේසය අසල ලාච්චුව ඇර දින පොතේ පිටු පෙරළමින් සිටියාය. මගේ ඇඟ සීතල වී ගියේය.

http://e-pusthakalaya.blogspot.com



"ශාන් ඔයා මේ දින පොත කියෙව්වද..... ?"

"මොකටද ඔයා ඕක ඇදල ගත්තෙ ..... "

"මම කියවන්න බැලුව..... "

"ඕකෙ තියෙන්නෙ විකාර..... "

"මට මේකෙ තියෙන ඉංග්‍රීසි තේරෙන්නෙ නැහැ..... ඒත් මට හිතෙනව සුද්දා මෙහෙන් පිටවෙන පාරක්වත් මේකෙ ලියල ඇති කියල. මට මිසිස් තෙරේසා කතා කරපු නිසා මම මේක ඇද උඩින් තියල ගියා..... "

මම සුසුමක් හෙලා ලය සැහැල්ලු කර ගතිමි.

"ඔයාද ආපහු ලාච්චුවට දැම්මෙ..... "

"ඔව්..... "

"යන්තම් ඇති..... "

"මොනවද ඔයා කුටු කුටු ගාන්නෙ..... "

"ඕකෙ තියෙන්නෙ සුද්ද ලියපු විකාර"

"ඔයා මේක කියෙව්වද ?"

"ටිකක් කියෙව්ව..... එහෙනම් ඔයාම කියවල බලන්නකො..... කොළොම්බස් හොයාගත්ත වගේ අපිටත් මෙහෙන් ගැලවිල යන්න පාරක් තොටක් හොයාගන්න පුළුවන්නම්..... ?"

ඇය කියන ඒ කතාව මට විශ්වාස කල හැකිද ? දින පොත ඇය ඇඳමත තැබුවේ නම් මා එය කලින් නොදුටුවේ ඇයි ?

"ශාලු" ඒ තෙරේසාගේ කට හඬය.

"මිසිස් තෙරේසා කතාකරනව..... එයාටත් දැන් මම නැතුව බැහැ වගේ..... "





ඇය දින පොත ඇතුලට දමා කාමරයෙන් පිටව ගියාය. මම නැගිට ගොස් දින පොත යළි අතට ගතිමි. ශාලුත් තෙරේසාත් කතා කරන හඬ සාලය දෙසින් ඇසේ. මම ඊට සවන් දුන්නෙමි. මට එය පැහැදිලි නැත. දොරක් ඇරෙන හඬක් ආපසු වැසෙන හඬත් ඇසී මම වහා කවුළුව අසලට ගියෙමි. තේරේසාත් අංජුත් ලී තරප්පුව බැස මිදුලට ගොඩවූහ.

සවස් වී නොතිබුණද හිරු එළියක් දක්නට නැත්තේ මුළු පරිසරයම යළි මීදුමින් වෙලාගෙන ඇති හෙයිනි. තෙරේසා ආඩම්බරයෙන් කතාකරන්නේ ඇගේ රෝස පාත්තිය ගැන විය යුතුය. ඇත්තෙන්ම එය සුන්දරය. කහ, රතු, රෝස පාට මදක් විශාල මල් එහි පිපී ඇත. තෙරේසා මල් පාත්තිය අසල සිට අංජුට යමක් විස්තර කරයි. මම එය බලා සිටිමි. මලක් අසල සිටින විට අංජු තව තවත් පියකරු යැයි මට සිතේ. අංජු හිටි හැටියේම මලක් ඇල්ලීමට මෙන් පාත් වූවාය. ඇගේ කර පළල් වූ හැට්ටය තුළින්..... ?"

මම වහා අහක බලා ගතිමි.

The Reader's Place Novel..

http://e-pusthakalaya.blogspot.com



රාත්‍රිය නොඑන්නේ නම්
අන්ධකාරය මෙතරම්
බිහිසුණු නැත.



අඳුර ළඟාවන විට මගේ සිත සසල වෙයි.

වැස්සත් සුළඟත් අඳුරට හවුල්වන විට මගේ මනස අවුල් වන්නාක් සේ මට හැගේ. මම සුදු ජාතිකයාගේ දින පොත පමණක් නොව ඔහුගේ ඇතැම් සටහන්ද අංජු නැති අතර කියවා දැමීමි. ඒ සටහන් තුළින් අංජු කීවාක් මෙන් බොහෝ කරුණු අනාවරණය කර ගැනීමට මට හැකි විය.

දැන් මේ අප සිටින්නේ ටිප්ටූර් හා හුලියාර් මැදිකොට ගත් කොටසකය. මන්දිරය ඇත්තේ මෙහි සිට සැතපුම් අටක් පමණ ගිය විට මුණ ගැසෙන වානිවිලාසා සාගරය තවත් සැතපුමක් තරනය කල විට හමුවන යෝධ ගල් තලාවක් ආශ්‍රිත කොට ගෙනය. සුදු ජාතිකයා කිප විටක් එහි ගිය බව ඔහුගේ අත් දැකීම්වලින් සනාථ වෙයි. ගල් තලය ආශ්‍රිත කොටගෙන මහත් බලසම්පන්න සෘෂිවරයෙකු වාසය කරන බවත්, ඔහු භූතාත්ම ගෙන්වා ඔවුන් ඒ පාපි ආත්මයන්ගෙන්





මුදවනු ලබන බවත් සටහන් කිපයක පෙන්වා ඇත. නානා පළාත්වලින් මෙම ගල්තලයට බැතිමතුන් ඇදෙන බවත් ඔහුගේ සටහන් වලින් පැහැදිලි වන නිසා, මින් ගැලවීමට නම් මුලින්ම කල යුත්තේ එහි යාමය. කෙසේ හෝ එහි ගියහොත් එහි පැමිණෙන බැතිමතුන්ගේ සහාය ඇතුව මින් ගැලවී යාමට හැකිවනු ඇත. එක් අතකින් බලන කල සුදු ජාතිකයාගේ දින පොත තුළින් අංජු දුටුවේ මේ සත්‍යයයි. එහෙත් ඒ සත්‍ය කරා යාමට ඇති එකම මාවත පාදාගත හැක්කේ සොලමන් මහතා අප කෙරෙහි දක්වන ආකල්පය මතය. මම ඔහුට තම දියණිය සිටින පාපකාරී ජීවිතය ගැන මුලින්ම අදහස් දක්වමි.

ශරීරයක් නොමැති වීම ආවරණයක්, ගෙයක් දොරක් නොමැති කමට සමාන වේ. ශීත උෂ්ණ දෙකේදී මෙන්ම වැසි සුළං සහිත දේශගුණික විපර්යාසයන්ට ගොදුරුවන ආත්මයන් වේදනාවත් පීඩාවත් තුරුළු කොට ගනියි. ඇතැම් විට ඔවුන් රැකෙන්නේ මිනිස් සිරුරු තුළට හොර රහසේම ඇතුල් වීමෙනි.

මා ඒ අදහස් දක්වද්දී සොලමන් මහතා නිසොල්මනේ එය අසා සිටියේය. මා බලා සිටිද්දීම ඔහුගේ දෑසේ කඳුළු නැගුනේ නිරායාසයෙනි.

"මට එයාව අල්ලන්න බැහැ. වැළඳගන්නත් බැහැ. සමහරදට එයා මගේ ලඟට ඇවිත් කතා කරනව. එයා මගෙන් අහනව කවදද එයා කසාද බඳින දවස කියල..... එයාගෙ කසාද තීන්දුවක් මම අරගෙන තිබුණා. එයා වෛද්‍යවරයෙක්. මම එයාගෙ මඟුල් ඇඳුමත් පිළියෙල කලා" ඔහු කතාව අතරමග නවතා මා දෙස බැලුවේය.

"මම හුගක් කල් යනකන් එයාගෙ මඟුල් ඇඳුම මගේ අල්මාරියෙ තියාගෙන හිටිය. ඒත් පහුගිය දවස්වල එයා ඒක ඉල්ලල මට කරදර කලා..... මම පස්සෙ ඒක එයාට දුන්න"

"ඒ කොහොමද ?"

"මම ගල් පල්ලියට ගිහින් එයාගෙ ඇඳුම පරිස්සම් කරල අල්තාරය ලඟ තිබ්බ"

"ඉතින් එයා ඒක ගත්තද ?"

"මම දන්නෙ නැහැ. මම ගියේ නැහැ ඊට පස්සෙ බලන්න. ඒ ඇඳුම දැක්කම මගේ වේදනාව තවත් වැඩි වෙනව"



The Reader's Place novel.lk

http://e-pusthakalaya.blogspot.com



"සර් කැමතිද ටජානි මේ ආත්මයෙන් මිදෙනවට" සොලමන් මහතා දෑස් ලොකු කොට මා දෙස බැලුවේය.

"ඇත්තෙන්ම මම කැමතියි. දැන් ටජානි අපිට හැම වෙලාවෙම කරදර කරනව. එයාගෙ දුක කියනව. ඒත් මම දන්නෙ නැහැ ඇයට ශාන්තියක් කරන්න පුළුවන් කියල ....."

"භූතාත්මයන්ට නිදහස දෙන්න පුළුවන් සාමිවරයෙක් මු පළාතේ ඉන්නව" සොලමන් මහතා සිනහාසුනේය.

"ඔය කියන්නෙ අර සුද්දගෙ සටහන් ගැනද ? ඔයා ඒ පොත දැක්කද ?"

"ඔව්....."

"ඒ සටහන් විශ්වාස කරන්න පුළුවන්ද ? අනික ඔය කියන මන්දිරයක් ගැන මම අහල නැහැ. අඩුම තරමෙ මම දන්නෙ බීරැර්වලට යන්න විතරයි. ඔය කියන පැත්තට යන්න තිලිප්පන් අපිට අවසර දෙන එකකුත් නැහැ"

"ඒත් ඇයි අපිට උත්සාහ කරන්න බැරි"

"මැරුම් කන්නද ?"

"එතකොට සුද්ද එතනට ගියේ කොහොමද ? එයා ලග ඒකෙ සිතියමකුත් තියෙනව"

"මම හිතන්නෙ මිටුන් දුරගියා වැඩියි වගෙයි" ඔහුගේ මුවෙහි කෝපය සටහන් විය. ඔහු මොහොතක් වෙලා කල්පනාවේ ගිලී සිට කතා කළේය.

"මම ඔය දින පොතයි එයාගෙ සටහනුයි අල්මාරියෙ අරන් තියල තිබුණෙ. ඕක ඇදල ගත්තෙ තෙරේසා. තෙරේසටත් ඕන කරල තිබුණ ටජානිව ඔය ආත්මයෙන් මුදවන්න. එයත් ඔය සුද්දගෙ පිස්සු සටහන් විශ්වාස කරා. මිටුන් හිතනවද කෙනෙකුගේ ආත්මයක් තවත් කෙනෙකුට ගලවන්න පුළුවන් කියල..... "

"සමහර විට..... ටජානි මැරුනෙ අකාලයෙ. එයාගෙ ආයුෂ ගෙවෙනකන් එයා ඔය ආත්මභාවයෙන් මුදවන්න පුළුවන් බලයක් සාමිවරයෙකුට තිබෙන්න පුළුවන්. මෙතනදී සිද්ධ වෙන්නෙ අලුත්





ජීවිතයක් නිර්මානය කරන එක නෙවි. එයාට තවත් භවයක පිළිසිඳ ගැනීමේ අවස්ථාව ඉක්මන් කරන එකයි. අපි හුගක් පින් කරන්නෙ, තමන් නමින් මිය පරලොව ගිය අයගෙ ආත්ම භාවයන් සුඛිත මුදිත කරවන්න. ඒ පින් අනුමෝදන් කරවන සිරිතක් අපිට තියෙනව. සමහරවිට සාමිවරය කරන්නෙත් ඒ බලයෙන් ඒ ටිකමද දන්නෙ නැහැ"

"මිටුන් ඔයා හිතන්නෙ මට දැන් වයස කියක් විතර වෙනව කියලද ?"

"හැටක්..... ? "

"හැට පහක් වෙනව..... මම මෙහෙම හිටියට මට ප්‍රෙෂර් එක තියෙනව. ඔය වගේ ගමන් යන්න පුළුවන් වයසක නෙවි මම ඉන්නෙ. ඇරත් ඉස්සෙල්ලම ටජානි කැමති වෙන්න ඕන. එයා අකමැතිනම් අපිව දල යන්න..... "

"සර් හිතනවද එයාගෙ ආත්මෙ එයාට වේදනාවක් නැහැ කියල.....

"මොනවද ඔයා මේ කියන්න හදන්නෙ..... "

"මෙතෙක් සර්ට දකින්න බැරිවුන ඇත්ත. සර් හිරකාරයෙක් නිසා සර්ට නිදහසේ හිතන්න බැහැ. ඒක හින්දම සර් හිතන්නෙත් නැහැ"

ඔහු තවත් කතා නොකළේය.

මම ඔහුට තවත් හිතන්නට ඉඩ දී කාමරයට ආවෙමි. අංජු මා දෙස බැලුවේ එතරම් ප්‍රසන්න තාවයකින් නොවේ.

"මොනවද ඔයා ඔයතරම් මිස්ටර් සොලමන් එක්ක දෙඩෙව්වෙ. ...නවට වඩා කතාවට යන්න එපා. කතාවට ගියාම ඔයාම දන්නෙ ...ැහැ ඔයා කතා කරන්නෙ මොනවද කියල ..... බැරිවෙලාවත් ඔයාගෙ ...වින් පිටවුනොත් ඔයා ඉන්දියානුවෙක් නෙවෙයි කියල ..... අපි ...න්නම ඉවරයි"

"ඔයාට පිස්සුද අංජු. මම පොඩි බබෙක්ද ?"

"ඔයා දින පොත බැලුවද ?"

http://e-pusthakalaya.blogspot.com



"ඔව්..... "

"මාත් එහෙන් මෙහෙන් බැලුව..... "

"ඔයා කිව්ව හරි..... ඒකෙ තියෙනව අපිට මෙහෙ... ගැලවෙන්න පුළුවන් මාර්ගයක්..... "

"මොනව ?"

"මෙහෙන් අපි යුලියාර්වලට ගියොත්..... "

"ඒ කියන්නෙ කොහේද ?"

"මං දන්නෙ නැහැ. ඒ නම ඒකෙ සඳහන් වෙල තියෙන... මන්දිර් තියෙන්නෙ වානිවිලාසා සාගරය පහු කලාම හම්බවෙ... ගල්තලාවෙ. එතනට එක එක ප්‍රදේශවලින් බැතිමත්තු එන... කොහොම හරි අපි එතනට ගියොත්..... අඩුම ගානෙ පූජෙ ගැ... දන්න කෙනෙක් වත් ඔය බැතිමත්තු අතරින් හොයාගන්න පුළු... වේවි"

"මම ඔයාට කිව්වෙ ශාන්"

"මිටුන් මිටුන්..... "

"මිස්ට සොලමන් නේද කතා කරන්නෙ..... "

මම නැගිට විසිත්ත කාමරයට ගියෙමි. සොලමන් මහ... බස්තමක් අතැතිව මිදුලට බැස මා එන තෙක් මග බලා සිටියේය.

"එහෙනම් අපි යමු මිටුන්"

"කොහේද ?"

"ගල් පල්ලියට..... "

"ඇයි..... ?"

"මං ඔයාගෙ කාරණාව ගැන හිතුව..... "



මගේ සිතට සියුම් බියක් නැගී ආවේය. මිථ්‍යාවිශ්වාස ගැන මා කෙතරම් තර්ක විතර්ක කලද මගේ යටි සිත මා මවාපාන තරම් නිර්භීත නැත. වඩාත්ම අන්ධකාරයට බිය වීරයන්සේ කැපී පෙනෙන්ට උත්සාහ දරන්නෝය.

"ඇයි කල්පනා කරන්නෙ..... ?" මා නැවතී සිටිනු දුටු සොලමන් මහතා ප්‍රශ්ණ කලේය.

"නැහැ..... "

"ඔයා කැමති නැද්ද මගේ දුව මුණ ගැහෙන්න"

"අනේ දෙවියනේ" මට කියවුනේ ඉබේටමය. ඇය මුණ ගැහෙන්නට මා තුළ ඇත්තේ ආශාවක් නොව බියකි. ඇය කාමරය අයිනේ වකුටු වී සිටි සැටි තවමත් මට මතකය. එය කෙතරම් මගේ සිත තුලට කා වැදී තිබුණේදයත් ඇඳු තොප්පිය පැළඳගෙන සිටි මොහොතේ පවා මට සැගැසුනේ ඉබේටමය.

"විදුලි පන්දමක් ගත්තනම් තමයි හොඳ"

"දැන් හවස් වෙලා නේද සර්..... "

"හවස් වෙන කොට තමයි එයා එන්නෙ. මම ඉටිපන්දම් ටිකකුත් ගන්න පත්තු කරන්න. අද බදාදා..... අනිවාර්යෙන්ම අද එනව මිටුන්..... අපි යමු"

"මම ශාලුට කියල එන්නම්..... "

"එයාට මේ කතාව කියන්න එපා..... "

"නැහැ. ඒත් ශාලු තනියම කාමරේ..... "

"එහෙනම් ගිහින් කියල එන්න..... " මා කාමරයට යත්ම අංජු මා දෙස බැලුවේ දෑස් මහත්කර ගනිමිනි.

"මොකද බය වෙලා..... "

"නැහැ..... "

"ඔයාගෙ මූණ සුදු මැලිවෙලා..... "

http://e-pusthakalaya.blogspot.com



"ඔයාට පිස්සු….. " අංජු සිනහවක් පෑවාය.

"මොනවද මිස්ටර් සොලමන් එක්ක පටලවගෙන ආවෙ"

"එයා කතා කරනව ඇවිදින්න යන්න"

"ඔයා කියන්නෙ මට කාමරේ තනියම ඉන්න කියලද ?"

"මම මොකද කරන්නෙ අංජු….. මට පුළුවන්ද බැ කියන්න"

"ඔයා ඊයෙත් ඇවිදින්න ගියා. මාව කොහේවත් එක්කගෙ යන්නෙ නැහැ. ඒක මහ අසාධාරණයි"

"ඔයාට පුළුවන් මම එනකන් මිසිස් තෙරේසත් එක්ක ක කර කර ඉන්න….. "

"එයා එක්ක මොනව කතා කරන්නද ? එයා කතා කරන් එයාගෙ දුව ගැනයි මල් ගැනයි. මට දැන් ඒ කතාත් එපා වෙලා"

"මෙහෙම යනකොට අපිට හැම දෙයක්ම එපාවේවි"

"එපා වේවි නෙවි දැනටමත් එපා වෙලා"

"මිස්ටර් සොලමන් බලාගෙන ඉන්නව….. මොකද කියන්නෙ"

"ඉතින් යන්න"

"කමක් නැද්ද ?"

"මට මොකෝ ?"

"ඔයා තරහෙන් නේද කියන්නෙ"

"මගේ තරහෙන් ඔයාට වැඩක් නැහැනෙ….. "

"අනේ මන්ද ලස්සන ගෑනු මෙච්චර නපුරුද කියල"

"මමද නපුරු ඔයාද ?"





"මාව තනියම දාල ඔයා අර හොල්මනත් එක්ක හැමතැනම රවුම් ගහනව….. "

"හොල්මනක් කිව්වෙ මිස්ටර් සොලමන්ටද ?"

"වෙන කාටද ඉතින්"

"එහෙනම් කමක් නැහැ….. "

"මිටුන් පරක්කු වෙනව….. "

"අන්න සොලමන් මහත්තය කෑගහනව. මෙතන ගමන් හදාගෙන ඇවිත් බොරුවට මට එක එක ඒවා කියනව"

"ප්ලීස් මාව තේරුම් ගන්න අංජු"

මම දොර වසා දමා කාමරයෙන් පිටව ආවෙමි. තෙරේසා මල් පාත්තිවලට සාත්තු කරමින් මිදුලේ සිටියාය. අංජු කී කතාව සැබෑය. ඇයට දුවත්, මල් පැලත් හැර වෙන ලෝකයක් නැත.

"කෝ ශාලු….. "

මා දකිත්ම තෙරේසා ඇසුවාය.

"එයා කාමරේ….. "

"මොකද කරන්නෙ….. ?"

"ඔහේ නිකන් ඉන්නව….. "

"කෙල්ලට කම්මැලි ඇති. ඉන්න මං ගිහින් දුවගෙ ඇල්බම් එක දෙන්න….. "

"ඇල්බම් එක….. "

"ඒකෙ තියෙන්නෙ දුවගෙ පින්තූරද ?" මම තිගැස්සී ඇසීමි.

"වෙන කාගෙ පින්තූරද ?"



The Reader's Place Novel..

http://e-pusthakalaya.blogspot.com



මා සිනහාසුනේ මෝඩකමට දැයි මම නොදනිමි. සොලමන් මහතා ටික දුරක් ගොස් ආපසු හැරී බැලුවේය. මා තවමත් එතැනමය. මම තවත් ප්‍රමාද නොවී ඉක්මනින් ඔහු වෙත ගියෙමි.

"එහින්න වගෙයි....."

"අද රෑත් එහිවි"

"අපි හෙට යමුද ?"

"ඇයි..... ?"

"වැස්සොත් කියල මම හිතුවෙ"

"මම පොරොන්දු වුනා දුවට දැන් එනව කියල..... මට බැහැ දුවගෙ හිත රිදවන්න..... අනික එයා ඔයාවත් බලාපොරොත්තුවෙන් ඇති. පව් මිථුන් ඔයා මොනවත් එයාගෙ හිත රිදෙන්න කියන්න එපා. එයා ලස්සන තරුණයෙක් දැක්කම හරියට විමසිලිමත් වෙනව...... ඇත්තටම මිථුන් බැඳල නොහිටියනම්....."

මේ මිනිහට පිස්සුදැයි මට සිතිණ. ඔහු මෙතරම් කතා කරන්නේ මැරිච්ච කෙල්ලක් ගැනය. හොඳ වෙලාවට මා අංජු සමග නොහිටියේ නම් මේ මිනිසා තම මැරිච්ච දියණිය වුවද මට විවාහ කර දීමට උත්සාහ කරනු නොඅනුමානය.

දෙපස වැවී ඇති තණකොල මැදින් වූ කුඩා අඩි පාරක් ඔස්සේ සොලමන් මහතා ගමන් කළේය. ඒ ගමන මට මතක් කළේ සිංහරාජ අඩවියයි. දෙතුන් සැරයක් සිංහරාජ අඩවියට ගොස් හුරු පුරුදු මට, මේ පරිසරය එතරම් අමුත්තක් සේ නොපෙනිණ.

සැඳෑවෙ ගෙවී යන ආලෝකය රූස්ස ගස් අතරින් එබී බලද්දී නිසාවර සතුන් එකා දෙන්නා බැගින් අහසේ පියාසර කරනු පෙනිණ.

මීදුම සිහින් වළාපටලයක් සේ ගස් වැල් වෙලාගෙන තිබිණ. අප ටික දුරක් යන තෙක්ම ගමන් කළේ කතාවකින් තොරවය. දැඩි නිහැඬියාවකින් මගේ හදවත වෙලාගෙන තිබිණ. ක්‍රම ක්‍රමයෙන් පරිසරය සීතල වෙන තරමටම මගේ ගතද සීතල වනු මට දැනිණ. සත්‍ය වශයෙන්ම මා ඉදිරියේ ගමන් කරන්නේ මනුෂ්‍යයෙක්ද ? නැතිනම් වජානිගේ ආත්මයේම කොටසක්ද ?





තවත් දුර ගිය සොලමන් මහතා නැවතී මා දෙස බැලුවේය. ඔහුගේ දෑස් රතු වී තිබිණ. අමනුෂ්‍යයින්ගේ දෑස් රත් පැහැයෙන් යුක්ත බව මා අසා ඇත. එහෙත්..... ?

ඔහුගේ දෑස් කඳුලින් තෙමී තිබෙනු දුටු මම, ඒ අදහස අත්හළෙමි.

"මිථුන්" ඔහු කතා කළේය.

"මේ හරියෙ මල් තියෙනව. මල් පොකුරක් කඩා ගන්න"

"ඒ මොකටද ?"

"ඔයා දුවගෙ අතට ඒ මල් පොකුර දෙන්න"

"මම කොහොමද ඒක කරන්නෙ..... වජානි පීවතුන් අතර නැහැ" මම එය සොලමන් මහතාට මතක් කළෙමි.

"ආ..... මට මතක නැති වුනා. සමහර වෙලාවට මට මතක නැහැ එයා මැරිල කියල ....."

පියෙකුගේ අසීමිත ආදරය ඔහු තුළින් දිස් වේ. ඒ ආදරයේ තරමටම මගේ හදවත ගැහේ. අංජු කීවාක් මෙන්ම මා ආවේ අනවශ්‍ය ගමනකි. තවත් දුරක් යනවිට ගරා වැටී ගිය පල්ලියක ඡායාවක් ඈතින් දිස් විණ. එය දකිත්ම මාගේ හදවත තවත් වේගයෙන් ගැහෙන්ට පටන් ගත්තේ, ඒ පල්ලිය අසල අහසේ විශාල කළු වවුලන් එහා මෙහා සැරිසරනු දකිත්මය.

"ඉක්මනට යමු මිථුන්.... මෙලහකටත් දුව බලාගෙන ඇති..."

මා ඉක්මන් කරන්නෙ කෙසේද මගේ දෙකකුල් දැනටමත් මදක් අප්‍රාණික වී ඇත.

"අපි ආපහු යමු සර්....." මම බිඳුණු හඬකින් කීවෙමි.

"ඇයි මිථුන්....."

"දැන් රෑ වේගෙන එනව..... සතා සර්පයොත් ඇති....."

ඔහු හිටිවනම එක තැනම නැවතී මට කෑ ගැසුවේය.

http://e-pusthakalaya.blogspot.com



"අර බලන්න මිටුන්..... අර ජායාව. අන්න මගේ දුව....."

"මට බැහැ සර්..... " මම ආපසු හැරුනෙමි.

"ඔයා කොහේද යන්නෙ..... ? "

"මම ආපහු ගෙදර යනව..... "

"ඇයි ඔයා පල්ලිය ඇතුලට යන්නෙ නැද්ද ?"

"බැහැ..... "

"මම යනව ඉටිපන්දම් පත්තු කරන්න. මට බැහැ මගේ දුවට වුනු පොරොන්දුව කඩ කරන්න. ඒත් මම දැන් මොනවද එයාට ගිහිං කියන්නෙ..... "

"මම වෙන දවසක එනව කියන්න"

"කමක් නෑ මිටුන් මම දන්නව ඔයාට එයාව මුණ ගැහෙන්න ආත්ම ශක්තියක් නැහැ"

මම ආපසු හැරී පසු නොබලා දිව ආවෙමි. මොන තරම් ශක්තියක් මාගේ දෙකකුල්වල තිබුණේද ? ගේ පෙනෙන තෙක් මාතු වන තෙක්ම මම උත්සාහය අත් නොහලෙමි. අවසානයේ මා නැවතුණේ විශාල රුස්ස ගසක් යටය.

අන්ධකාරය හාත්පසම වෙලා ගත්තාක් සේ මට දැනිණ. වවුලකු මගේ හිසට පහරනු දැනී මම අතගා බැලිමි. කිසියම් දුර්ගන්ධයක් මගේ ඇඟිලි තුඩු අගින් හමා ආයේය. මෙවැනි මොහොතක සිතට මොනතරම් ධෛර්යයක් ගත්තත් සිත පාලනය තබා ගැනීම අසීරුය.

දැන් සොලමන් මහතා කුමක් කරනු ඇත්ද ?

ඔහු අතර මග දමා මා පැන ආ බව තෙරේසාට මෙන්ම අංජුටද දැන ගැනෙන්නට ඉඩ තැබීමට මට කිසිසේත් කල නොහැක. විශේෂයෙන්ම එය අංජු දැනගතහොත් ඇය මා බිය ගුළු පුද්ගලයෙකු ලෙස සිතනු ඇත.





වහල් කඳවුරේදී මා ඇයට වීරයෙකි. ඒ සැබෑ මිනිසුන් අතරය. මේ හොල්මන් ගෙයකට වැදී මට සිදුවූයේ මෙතෙක් පැවති මගේ ආත්මශක්තියත් ගිලිහී යාමය. පෙනෙන බලවේග සමග මට කුමන හෝ සටනක් කල හැක. එහෙත් මේ නොපෙනෙන බලවේග සමග සටන් කරන අයුරු මා ඉගෙන ගෙන නොමැත.

මගේ සිත අවුල් වූ තරම කියතොත්, ඈත එන සොලමන් මහතා පවා මා මුලින් දුටුවේ ටජානි ලෙසය. මා දෑස් පොඩි කොට යළිත් වරක් බලා, ඒ සොලමන් මහතා බව නිසැක වශයෙන්ම දැනගනිත්ම මගේ සිතට ඇතිවූයේ මහත් අස් වැසීමකි.

මා ඔහු දුටු විගස ඔහු වෙත ගොස් කල වරදට සමාව අයැදිමි.

"මාත් පල්ලිය ඇතුලට ගියෙ නැහැ මිටුන්. මටත් ටිකක් බය හිතුන. එයාට තරහ ගිහින් තිබුණොත්..... මාත් ආපහු ආව. අර බලන්න මිටුන් මීදුම අස්සෙන් හඳ මතු වේගන එනව. අද මහ නරක දවසක්"

"සර්..... "

"ටජානි හොඳ වගේම වෙලාවකට නපුරුයි. එයා පිවත් වෙල ඉන්න කොටත් එහෙමයි"

බල්ලෙක් උඩු බුරන හඬ ඇසුනු මගේ මයිල් කෙලින් වී ගියේය. ඒ වෘකයෙකුගේ හඬක් නොවේ. එහෙත් ඒ හඬේ අමුතුම දෝංකාරත්වයක් ඇත.

"ඒ වෘකයෙකුගෙ හඬක් නෙවි නේද සර්"

"ඇයි එහෙම අහන්නෙ..... ? "

"හඳ නැග ගෙන එනකොට වෘකයින්ගෙ හඬ අසුබදායකයි"

"නැහැ ඒ බල්ලෙක් උඩු බුරන හඬ..... ගෝත්‍රිකයින්ගෙ වාස භූමියෙ බල්ලො ඉන්නව. අද උන්ගෙ දවසක්. උන් සත්තුන්ගෙ අද ලේ බොනව"



The Reader's Place Novel..

http://e-pusthakalaya.blogspot.com



"අපි ගෙදර යමු සර්" මම හැගිම් බරව කීවෙමි. ඔහු ... තර වටා අත දැමුවේය. අනතුරුව ඔහු මා දෙස බලා ... සෙනෙහෙබර බැල්මකි.

"මම කල්පනා කලා මිට්‍රුන්. ඔයාගෙ අදහස හරි. ... ඉක්මනින්ම ටජානිව මේ පාපකාරී ආත්මයෙන් මුදවන්න ඕන. ... පුළුවන්ද මට ඒ උපකාරය කරන්න. මටත් දැන් ඇයත් එක්ක ... ජීවිතේ ඇතිවෙල ....."

ඔහු සුසුමක් හෙලුවේය.

"මට බැහැ මිට්‍රුන් එයාගෙ ඉල්ලීම ඉටු කරන්න..... ... මනුෂ්‍යයෙක්. එයා මනුෂ්‍යයෙක් නෙවි....."

ඔහු මදක් හතිලෑවේය.

"මගේ පපුව රිදෙනව" මම ඔහුගේ පපුව අත ගෑවෙමි.

"කවද වෙනකන් මම මේ දුක විඳින්නද ? එයා තෙරේසට ... කිසිම දෙයක් කියන්නෙ නැහැ. ඔක්කොම කියන්නෙ මට. ... දන්නවද එයා පුංචිකාලෙ හැදුනෙ මගේ තුරුලෙ. දැන් එයා ... කියනව. එයාගෙ විවාහය ඉක්මන් කරන්නලු..... අනේ දෙවියනේ ... කොහොමද ඒක කරන්නෙ. ඔයාට ඇත්තටම පුළුවන්ද මිට්‍රුන් එයාව ... ආත්මයෙන් නිදහස් කරන්න....."

"මම හිතන්නෙ මට පුළුවන් වේවි"

"ඒක කොහොමද ඔයා කරන්නෙ..... ?"

"මට සර්ගෙ අකමැත්තක් නැත්තම්..... මට පො... අල්මාරියෙයි මේස ලාච්චුවලයි යතුර දෙනව නම් මට පුළුව... පැහැදිලි යමක් හොයාගන්න. භූත විද්‍යාව ගැන පර්යේෂණ පවත්ව... සුදු ජාතිකය ස්ටුවර්ට් මහතා නෙවි. එයාගෙ මරනයෙන් පස්සෙ තම... මේ පර්යේෂණ සිද්ධවෙල තියෙන්නෙ..... කොහොම වුනත් එ... ස්ටුවර්ගෙ හතරවෙනි බිරිඳගෙ ආත්මයට සැනසීමක් අත් කරල දී... තියෙනව"





"මට ඕව තේරෙන්නෙ නැහැ." ඔහු හුන් තැනින් නැගී සිටියේය. අපි සෙමින් සෙමින් නිවස දෙසට පිය නගද්දි, සාලයේ කෝපි බොමින් අංජුත් තෙරේසාත් කතා කරමින් සිටියහ.

"එන්න කෝපි බොන්න..... " තෙරේසාගේ ආරාධනය මොනතරම් කාරුණිකද ? මම අංජු දෙස යටැසින් බැලිමි. ඇගේ මුවෙහි කෝපය මුසු බැල්මක් නැත. මම යන්තම් සැනසුම් සුසුමක් හෙලුවෙමි.

"ඉතින් කියන්නකො විස්තර" මාත් සොලමන් මහතාත් මේසය අසල අසුන් ගනිද්දි, අප දෙදෙනාටම දුම් දමන කෝපි කෝප්ප දෙකක් පිළිගන්වමින් තෙරේසා කිවාය.

"දුවව හම්බවුනාද ?"

"නැහැ..... "

"ඇයි..... ?"

"එයා ආවෙ නැහැ" සොලමන් මහතා සැහැල්ලුවෙන් පිළිතුරු දෙද්දි අංජු මගේ මුව දෙස බැලුවේ කිසියම් විමතියකින් මෙනි.

"මම කාමරයට යන්නද .? මට අද ටිකක් සනීප මදි....." සොලමන් මහතා නැගී සිටියේය.

"පපුව ටිකක් රිදෙනව"

සඳ එළිය මීදුම කෙරපාගෙන මතුවෙන්නට උත්සාහ කරද්දී, එක දිගට උඩු බුරලන බලු රංචුවකගේ අම්හිරි නාදය ඈතින් ඇසිණ. තෙරේසා ඊට කන් දෙමින් නිසොල්මනේ මඳ වේලාවක් සිටියාය.

"අද තමයි ගෝත්‍රිකයින්ගෙ මළවුන් අදහන දවස. ඒ ගොල්ලො අද සත්තුන්ගෙ ලේ මළවුන්ට පූජා කරනව. අමනුෂ්‍යයො දකිනකොට තමයි බල්ලො ඔය විදියට කෑ ගහන්නෙ..... සියුම් දේවල් උන්ට පේනව..... "

"ඕව ඔක්කොම මිත්‍යාමත ...." මම හැගිම් මැඩගෙන කීවෙමි.



The Reader's Place Novel..

http://e-pusthakalaya.blogspot.com



"ඒක ඇත්ත. ගෝත්‍රිකයින්ගෙ විශ්වාසයත් ඒ ගොල්ලන්ගෙ සම්ප්‍රදායයත් හා බැඳී තිබෙනව. මාත් ඕව විශ්වාස කරන්නෙ … සොලමන් මට හුඟක් කරුණු කියල දීල තියෙනව. මං අද … තිබ්බ ගෝත්‍රිකයින් ගැන හුඟක් දේවල්..... ඒ ගොල්ලො දරු … ලබන්නත් යම් යම් යාග හෝම කරනව....."

"මිසිස් තෙරේස ගෝත්‍රිකයින්ව අඳුනනවද ?"

"මං තුන් හතර වතාවක් උන්ගෙ කුප්පායමට ගිහින් තියෙනවා… උන් සොලමන්ට ගරු කරනව. උන් හිතාගෙන ඉන්නෙ තිබ්බිපන්… නායකයා සොලමන් කියල. සමහරදාට උන්ගෙ සම්ප්‍රද උත්සව වලට… සොලමන් යනව"

ඇය කී හැම දෙයක්ම අංජු අසා සිටියා මිස ඒ කිසිවකට… පිළිතුරු දෙන්නට උත්සාහ නොකළාය.

"දැන් බැඳල අවුරුදු දෙකක් වෙනවලු නේද ?"

මම අංජුගේ මුව දෙස බැලීමි. ඇය මට ඇහෙන් ඉඟියක් කළාය.

"ඔව්..... "

"ඇයි තවම දරුවෙක් ගැන බලාපොරොත්තුවක් නැද්ද ?"

"නැහැ" මම කලබල වී කීවෙමි.

"ඇයි..... ?"

"අපිට තව හුඟක් දේවල් ගැන හිතන්න තියෙනව" එයට… පිළිතුරු දුන්නේ අංජුය.

"මොනවද ඔච්චර හිතන්න තියෙන්නෙ ?"

"අපිටම කියල ගෙයක් දොරක් හදාගන්න ඕනි. අනික අපේ… කල්පනාව තියෙනව ගමේම පදිංචිවෙල ව්‍යාපාරයක් කරන්න"

"ඇයි මදුරාසිය හොඳ නැද්ද ?"





"මදුරාසියෙ ෂොප් එක අපිට ඒකෙම ආයතනයක් හැටියට තියාගන්න පුළුවන්..... "

අංජු කතා කරන්නේ ක්ෂණිකව කටට එන දෙයය. එහෙත් ඇය ඒ කියන්නේ බොරුය. බොරු ගෙතීමට ඇය තරම් මා දක්ෂ නැත. එහෙයින් මම නිහඬව අහක බලා ගතිමි.

"ඒ මොනව වුනත් දරුවෙක් හිටිය නම් නේද හොඳ ? ශාලුගෙ ලස්සනට ඔයාට බෝනික්කෙක් වගේ දරු පැටියෙක් ලැබේවි. මේ දවස්වල ඔයා පෙති ගන්නවද ?"

අංජු තිගැස්සෙනු මම දුටුවෙමි.

නැහැ..... " ඇය හිස සැලුවාය.

"ඒක හොඳයි. මගේ මුල්ම දරුව හම්බවෙන්න ඉස්සෙල්ල මම පෙති ගත්ත. ඒ ළමයාගෙ දත් ටිකක් කහ පාටයි. ඔය මොනව වුනත් ඕවවල අතුරු ප්‍රතිඵල තියෙනව"

"ඇන්ටි මම කාමරයට යන්නද ?" අංජු නැගී සිටියේ ඒ කතාව තවත් දිග්ගැස්සෙන්නට පෙරය.

"රෑ කෑමට මොනවද කන්නෙ..... ? චපාති..... "

"කමක් නැහැ..... " අංජු මගේ මුව දෙස බැලුවාය.

"ඔයාට කමක් නැද්ද ?" මම හිස සැලීමි.

"ශාලු මොකද එක පාරටම නැගිට්ටෙ..... ? "

"මට බාත් රූම් එකට යන්න ඕන..... මම ඉක්මනට එන්නම් ඇන්ටීට උදව් කරන්න." ඇය තවත් එතැන රැඳී නොසිට කාමරයට ගියාය.

"එයාට ටිකක් ලැජ්ජ හිතෙන්න ඇති. මම ආහපු ප්‍රශ්නෙට"

ඇය ගිය පසු තෙරේසා කීවාය.

"ඇත්තටම ඔයා ආස නැද්ද දරුවෙකුට..... ? " ඇය මා දෙස බැලුවේ විමසිලිමත්වය.



The Reader's Place Novel..

http://e-pusthakalaya.blogspot.com



"ආසයි..... "

"මොනව වුනත් මිථුන් දරුවිල ලබන්නත් වාසනාව තියෙන් ඕන. අපිටත් අවුරුදු තුනක් යනකන් දරු එලක් තිබුණෙ නැහැ. අ ශාන්ති කර්ම තුනක් කරා. ඊට පස්සෙයි හරි ගියේ"

"ඇත්තද ?"

මට අරුණි මතක් වේ. ඇය කුඩා දරුවන්ට අසීමිතව ආද කරයි. ඇය කුඩා දරුවන් සුරතල් කරන්නේ ඉමහත් සතුටකිනි.

"මට නම් ඉක්මනට දරුවෙක් ඕන"

"..... හ්..... ම්..... "

"ශාන් ආස දුවෙකුටද ? පුතෙකුටද ?..... මම න ඉස්සෙල්ලම ආස දුවෙකුට..... ඊට පස්සෙ පුතෙකුට ඊට පස් ආයෙත් දුවෙකුට..... ඊට පස්සෙ..... "

"නවත්තගන්න නවත්තගන්න..... ඔයා හදන්නෙ පඩි පෙළ හදන්නද ?"

"ඔයා දන්නෙ නැහැ. මම කොච්චර ආසද බබාලට..... " අ මගේ ගතට තව තවත් තුරුළු වෙයි.

"ශාන් අපි බැඳල ටික කලක් යනකන් වෙනමම ගෙදරක ඉ එතකොට අපිට අපේම ලෝකයක ජීවත් වෙන්න පුළුවන්. අ ඇනෙක්ස් එකක් ගමු"

මම අරුණිගේ මුව දෙස බලමි. ඒ මුව ආදරයේ මිහිරියාවෙ . පිරී ඉතිරී ඇත.

"ඔයා ඉන්දියාවෙ ගියාම මට කොච්චර සාරි ගේනවද ?"

"ඔයාට කීයක් ඕනද ?"

"හුගක් එපා වෙඩින් සාරිය ඇරුනම තව සාරි දෙක තුනක් තිබුණොත් හොඳටම ඇති. මොකද වෙඩින් එකට වියදම් කරන්න තියෙන නිසා සල්ලි නාස්ති කරගෙන බැහැනෙ"



මගේ දෑස් යන්තමට තෙත්වූයේ ඒ අතීතය මතක්වූ නිසාදැයි මම නොදනිමි. දැන් ඒ අතීතය මෙන්ම අනාගතයද මා ඉදිරියේ බොඳ මිදුමක් වැන්න. දැන් මට ඇත්තේ වර්තමානය පමණකි.

"මොනවද මිථුන් කල්පනා කරන්නෙ..... ?"

මම නිගැස්සී තෙරේසාගේ මුව දෙස බැලිමි.

"මොනවත් නැහැ"

"මට ඔයාගෙ මූනෙ වෙනසක් පේනව..... "

"නැහැ..... "

"මම දන්නව ශාලු එහෙම කිව්වට එයත් කතා කරේ හිතේ අමාරුවෙන්..... අපි මැඩ්‍රාස් ගියාම මම ඔය දෙන්නව එක්කගෙන යන්නම් හොඳ කෝවිලකට..... මදුරේවල මීනච්චි කෝවිලට භාරයක් වුනත් හොඳයි"

"ඇත්තද ?"

"මට ශාලුව දැක්කම මගේ දුව නැති එකේ අඩුව දැනෙන්නෙම නැහැ. මදුරාසියෙදිත් අපිට පුළුවන් එකට ඉන්න. අපිට තව මාස හතරකින් විතර මෙහෙන් යන්න ලැබෙයි. ඔයාල පූනෙ ඉඳල එහෙ ආවම අපේ ගෙදරම පදිංචි වෙන්න"

සොලමන් මහතාගේ කාමරයේ දොර ඇරෙනු ඒ අතර ඇසිණ. ඔහු මා අසලට ආයේ යතුරු කැරැල්ලක්ද අතැතිවය.

"මට ටිකක් නින්ද ගියා. දැන් ඇඟට හොඳයි. මෙන්න අර යතුරු"

මා ඔහු අතින් යතුරු ගනිද්දී තෙරේසා කිසියම් කුතුහලයකින් මෙන් අප දෙස බැලුවාය.

"මොනවද සොලමන් මේ යතුරු"

"ස්ටුවර්ට්ගෙ කබඩ්වල ..... "



The Reader's Place novel..

http://e-pusthakalaya.blogspot.com



"ස්ටුවර්ට්ගෙ කබඩ්වල ..... ?"

"ඇයි ඒව දෙන්නෙ..... ?"

"මං ඔයාට පස්සෙ කියන්නම් තෙරේසා. මිනුන් හඳුන්නෙ අඹි උදව් කරන්න. එයා තරුණයෙක්. ඒ වගේම එයා ශක්තිමත්..... එයා පුළුවන් යමක් කරන්න"

"මොනව ගැනද සොලමන් මේ කියන්නෙ ?"

"විශේෂයෙන්ම අපේ දුව ගැන..... "

"දුව ගැන..... ?"

"ඔව්..... "

සොලමන් මහතා ඉහළට ඇදගත් සුසුම සෙමින් සෙමින් පි කළේය.

The Reader's Place novel..

"අපි දුවට ජීවිතයක් දෙන්න ඕන..... ඊකයි අපේ යුතුක තෙරේසා..... "

ඇගේ දෑස කඳුලින් බරව ගියේය. ඇය අසුන මතින් නැඟි කාමරයට ගොස් දොර වසා ගත්තාය.

"එයා කැමති නැහැ දුවගෙන් ඈත් වෙන්න. කරන්න දෙයක් නැහැ. ඒත් අපි හුඟක් පරිත්‍යාගශීලි වෙන්න ඕන. ඔහු කීයේ බිඳුණු ස්වරයකිනි. ඔහු අනතුරුව රවුම් මේසය අසලට ගියේ අල්මාරිය හා මත් පැන් බෝතලයක් අතට ගෙනය.





මීදුම තෙරපාගෙන සඳරැස්
නැගෙන අයුරු මම කවුළුවෙන් බලා සිටියෙමි.
ඈත බල්ලෙකු උඩු බුරන හඬ ඇසිණ.
සොලමන් මහතා කිවාක් මෙන් අද දවස ශුභදායක
නැතැයි මට ද සිතිණ.



5

මීදුම අතරින් ඈත කඳුකරයේ සඳරැස් නැගී එන්නට තැත් කරනු මට පෙනිණ. මම තිර රෙදි මෑත්කොට මඳ වේලාවක් ඒ දෙස බලා සිටියෙමි. නාන කාමරයේ වතුර වැටෙන හඬ මට ඇසෙයි. ඒ අංජුය. සොලමන් මහතා දුන් යතුරු කැරැල්ල මා අතේ ඇත. සුදු ජාතිකයා කල පර්යේෂණවල වැදගත් ප්‍රතිඵල ඇතැම්විට ඒ පොත් අල්මාරියේ ඇති ·පියන වසා ඇති කොටසේත් යතුරු දමා ඇති කොටසේත් තිබෙන්නට පුළුවන. ඇත්ත වශයෙන්ම ඔහු කල පර්යේෂණ සාර්ථක නම් මට ඒ අනුව සොලමන් මහතාටද උදව්කොට අපටද මින් ගැලවී යාමට පුළුවන.

http://e-pusthakalaya.blogspot.com



එක් අතකින් බලන කල ටජානි, ඇගේ ඒ පාපි ආත්මයෙන් ගැනීමට මට හැකිනම් එය මගේ අතින් සිදුවන විශාල කර්මයකි.

අප දනමානදී පිංකොට ඥාතීන්ට පිං පමුණුවන්නේ පරලොව ජීවිතය සුඛිත මුදිත කිරීමටය. එය පවතින්නේද මතය. හුදෙක් විශ්වාසය මත සිදුවන බොහෝ දේ සත්‍ය අපට පෙනෙන්නට නැත.

මම ගල් පල්ලිය අසලදී ටජානිගේ අවතාරය එහෙත් මා ක්‍රියා කලේ ඒ මොහොතේ සොලමන් මහතා මැවූ අනුවය. මට මතක් වූයේ එද රෑ මා දුටු වකුටු වී ගුලිවී අද්දර සිටි ටජානිගේ ඡායාවයි. එය කෙතරම් මගේ මනස තුළ තිබුණේදැයි කියතොත් මා ඇතැම් විට බොහෝ දේ තුලින් මැවූ මනෝ විකාරයයි. වරක් අංජු තොප්පියක් පැළඳ ටජානිගේ හැඳ සිටිනු දුටු මම තිගැස්සුනෙමි. තවත් වරෙක ඇසෙන ශබ්දයටත්, දොරවල්වලට ගසන හඬටත් මම සිත සසල කරගතිමි.

නාන කාමරයේ අගුල හරින හඬ මට ඇසිණ. මම බැලුවෙමි. සැක සිතන්නට කරුණක් නැත. ඒ අංජුය. ඇය මුහුණකට සෝද රාත්‍රි ඇඳුමකින් සැරසී සිටියාය. එය දුහුල් වුවද දිග සායකි. ඇය කෙලින්ම නිදන ඇඳට ගොස් එහි වැතිර පොතක්ද අතට ගෙනය.

ඒ තෙරේසා දුන් ටජානිගේ පිංතූර ඇල්බමය විය. හිටිවනම මහත් හඬින් බල්ලෙකු උඩු බුරන හඬ ඇසිණ. මම රෙද්ද මෑත් කළෙමි.

අංජු එකවරම මා දෙස බැලුවාය.

"මොනවද ඔයා ඔතන කරන්නෙ..... ?"

"මොකවත් නැහැ..... "

"අද කොහේද ඔයා නිදා ගන්නෙ බිමද ඇඳේද ?"

"මම ඇඳේ නිදගන්නම්..... "

අංජු කටකොනකින් සිනහසුනාය.



"මාත් අද ඇඳේ නිදගන්නව..... ඔයාට පුළුවන්නම් ලාම්පුව ටිකක් වැඩි කරන්න..... "

"ඇයි..... ?"

"මම මේ ඇල්බම් එක බලනව..... "

"ඕක දවල්ට බලන්න පුළුවන්නෙ..... "

"මට නිදිමත නැහැ"

මා නැගිට ගොස් ලාම්පුවේ එළිය වැඩිකලේ අංජු තවත් යමක් කියන්නට පෙරය. සඳරැස් කවුළුවෙන් ඇතුලට වැටුණේ සුළඟට තිර රෙදි එසවීමත් සමගය. මම ඒ දෙස බලා සිටියෙමි.

වරින් වර හමන සුළඟට තිරපට එසවෙනවාත් සමග ගුලි වී වකුටු වී තොප්පියක් පැළඳ සුදු ගවුමක් හැඳගත් කෙල්ලකගේ ඡායාවක් වීදුරුව තුලින් එක වරම මතු විය. මගේ මුවින් කුමන ශබ්දයක් පිටවුවේදැයි මම නොදනිමි. මම දැතින්ම මුහුණ වසා ගතිමි.

"මොකද ? මොකද ?" අංජු කලබල වී ඇසුවාය.

"මොකවත් නැහැ..... "

"මොකද ඔයා බය වෙලා..... "

"මම..... ? ඔයාට පිස්සුද ?"

"මට නෙවී පිස්සු ඔයාට. දවල් තිස්සෙ සොහොන් පිට්ටනිවල ඇවිදිනව..... රෑට මෙතන බෙරිහන් දෙනව..... "

දොරට තට්ටු කරන හඬ ඇසිණ.

"දොර අරින්න එපා" මම කෑගැසීමි.

"මිටුන් මිටුන්..... "

"මිස්ටර් සොලමන් කතා කරනව" අංජු මගේ ඇඟට ඇගිල්ලෙන් ඇන පොරෝනය ගෙන ඇඟ වැසෙන්නට පොරවා ගත්තාය. මම නැගිට ගොස් දොර ඇරියෙමි.

http://e-pusthakalaya.blogspot.com



සොලමන් මහතාත් තෙරේසාත් දෙර අසල සිටියහ. කාමරයෙන් පිටව විසිත්ත කාමරයට ආවෙමි. සොලමන් මහතා දෙස බලා තෙරේසාට යමක් කීය. ඇය දිවගොස් වතුර වීදුරු ගෙන මා අතට දුන්නාය.

"එයා ඇවිල්ල" මම සොලමන් මහතාට කීවෙමි.

"ඔයා දැක්කද ?"

"ඔව්....."

"ශාලුත් දැක්කද ?"

"නැහැ....."

"එයා මොකද කරන්නෙ....."

"දුවගෙ ඇල්බම් එක බලනව"

සොලමන් මහතා නලලේ අත තබා ගත්තේය.

"කොහොමද ඔයා දැක්කෙ..... ?"

"වතුරුවෙල ඉඳල තොප්පියක් දාගෙන හෙමින් හෙමින් ජනේ ළඟින් නැගිට්ට"

"හරි..... ඒක තමයි ඒ ළමයගෙ පුරුද්ද ?"

"මොකද දැන් අපි කරන්නෙ ?"

"ශාලුට එයා මොනව හරි අනතුරක් කරාවිද ?"

"නැහැ. එයා එහෙම කරන ළමයෙක් නෙවි. මම කියන් මම එයාට කතා කරන්නම්"

"ඒ කොහොමද ?"

"මම මගේ ජනේලෙ ළඟට ගිහින් එයාගෙ නම තුන් පාර කතා කරාම එයා මගේ ළඟට එනව"

"අනේ දෙවියනේ"





"හිත ධෛර්ය කරගන්න මිටුන්"

"සර්ට එයාව පේනවද ?"

"සමහර වෙලාවට..... නොපෙනුනත් එයා කතා කරන හඬ මට ඇහෙනව..... හෙට යමුද අපි ගල් පල්ලිය ළඟට..... ගිහින් අපි එයාගෙ වේදනාවට කන්දෙමු"

"අපි උදේ යමු"

"බලමු..... එයා ආස වේවි ඔයා එක්ක කතා කරන්න....."

"තවම ඒ හැටි රෑ වෙලා නැහැ..... අද වේලාසනින්ම ඇවිත්....."

"ඔය ඇවිත් තියෙන්නෙ අපි කාපු කාරණේ අහන්න"

තෙරේසා අපේ කතාවට සවන් දී සිටියා මිස ඇය කතා කළේ නැත. බියෙන්, සැකයෙන් ඇගේ මුව සුදු මැලිවී තිබිණ.

"තෙරේසා....." සොලමන් මහතා කතා කළ හඬට ඇය තිගැස්සුණාය.

"ඔයාට දැන්වත් තේරෙනවද එයාගෙ පාපකාරී ජීවිතය..... මේ රාත්‍රියේ ශීතලෙන් ගැහි ගැහී, අර මල් පොකුරයි සුදු දිග ගවුමයි ඇඳගෙන එයා හැම තැනම ඇවිදිනව. මේ වගේ පවක් තවත් තියෙනවද ? එයා ජීවතුන් අතර හිටියනම්, තනියම මේ වගේ රාත්‍රියක අපි එයාට ඔහොම නිදැල්ලේ ඇවිදින්න දෙනවද ?" සොලමන් මහතාට හැඬුනේ දුක වේදනාව වාවාගත නොහැකි වූ නිසා විය හැක.

"ඔයා ශාලුට දුවගෙ භූතාත්මය ගැන කිව්වද ?" සොලමන් මහතා අනතුරුව තෙරේසා දෙස බැලුවේ කිසියම් සැකයකිනි.

"නැහැ....."

"තිකමටවත් එයාට දැනගන්න ඉඩ තියන්න එපා. එයා බය වේවි. ඇරත් මගේ දුවට තවත් කෙල්ලක් ඉදිරියේ හිගා කරන්න මම කැමති නැහැ."

"මොකක්ද සොලමන් අපි මේකට කරන්නෙ..... ?"

http://e-pusthakalaya.blogspot.com



"අපි තීරණයක් ගන්න ඕන..... අද හෙටම. එයාගෙ ඉවසීම සීමාව නැතිවුණොත්....."

"මට තේරෙන්නෙ නැහැ සොලමන්. අපි මේ ගේ අත් ඇර ඉක්මනින්ම මදුරාසියට යමු. මම ශාලුට කතා කලා එයත් කැමති මදුරාසියෙ අපේ ගෙදර ඉන්න....."

"ශාලු එහෙම කිව්වද ?....." මම තෙරේසා දෙස බැලීමි.

"එයා කිව්ව නෙවි මම එයාව පොරොන්දු කරගත්ත"

සිහින් කැස්සක හඬක් කිප වරක්ම අපේ කාමරය තුළ ඇසිණ. ඒ සමගම සොලමන් මහතාගේ දෑස් එකවරම මහත් විය.

"ඇයි..... ?"

"ඔය වගේ කැස්සක් දුවට තියෙනව"

"ඒ කියන්නෙ එයා අපේ කාමරය ඇතුලට ඇවිද්ද ?"

"නැහැ එහෙම දෙයක් වෙන්න බැහැ"

"සර් කියන්නෙ එද මගේ කෑම පිගාන ඇද්දෙ එයාද ?"

"ඔව්....."

"එහෙනම් එයා එන්න ඇති"

"මම කාමරේ දොර වහගෙන ආවෙ....."

"මට මේව ඉවසන්න බැහැ සොලමන්" තෙරේසා කාමරය යමින් කීවාය. මා සොලමන් මහතාගෙන් සමුගනිද්දී ඔහු මට වාසනාවන්ත රාත්‍රියකට සුබ පැතුවේ නැත.

මා බිය විය යුතු නැත. මා දහම් පාසලේ ධර්මාචාර්ය විභාගයද සමත් වූ කෙනෙකි. බුදු දහමේ අමනුෂ්‍ය බිය උදෙසා මොන තරම් පිරිත් ධර්ම ඇත්තේද ? මට ඉන් කීපයක්ම තවමත් කට පාඩම්ය.





කරණීය මෙත්ත සූත්‍රය මෙන්ම, ජය පිරිතද මේ අමනුෂ්‍ය උපද්‍රවවලින් මිදීමට ඉතාමත් යහපත්ය. එක්තරා කාලයකදී අපේ මහ ගෙදර වූ ප්‍රේත දෝෂයක් දුරු කිරීමට මේ පිරිත් දෙක නොකඩවා දින දහතරක් කියා දනයක් දුන්නාද මට මතකය. මගේ පිහිටට මට දැන් ගාථා පවා මතක් වෙයි. මගේ සිත මෙතරම් දුර්වල වෙගන එන්නේ ඇයි..... ? ඊට හේතුවක් ඇත. බොහෝවිට අප දන්න යථාර්ථය මෙය නොවේ. අමනුෂ්‍යයින් පිළිබඳ අප තුළ ඇත්තේ හැඟීමක් මිස සත්‍යයයි යන ස්ථිරසාර විශ්වාසය නොවේ. එහෙත් ඔබටත් මට ලැබුණු මේ අත්දැකීම අත් විඳින්නට ලැබුණේ නම්..... කිසිදක ඔබ එසේ නොසිතනු ඇත.

මා කාමරය වෙත ගියේ ඇජුගෙන් දෙස් ඇසීමේ බලා පොරොත්තුවෙනි. මා කෑ ගසා සොල්මන් යුවළට කරදර කළාට ඇය මට අවලාද නගනු නිසැකය.

එහෙත් මා දොර විවෘත කල විට.....

"අනේ දෙවියනේ" මට කෑගැසෙත්ම ඒ හඬ මම ආයාසයෙන් මැඩ ගතිමි.

තොප්පියක් පැළඳගෙන ටජානි මට පිටුපා ඇඳ මත වාඩි වී සිටියාය. මා ආපසු සොලමන් මහතා වෙත දිව ගියේ හතිලමිනි.

මගේ මුළු ගතම කිළිපොලා ගියේය. මගේ දෙකකුල් අප්‍රාණික වී යන්නාක් සේ මට දැනිණ. දෙවියනේ මේ මොන පාපකර්මයක්ද ?

"එයා කාමරේ ඉන්නව" මම පහත් හඬින් කිවෙමි.

"මොනව..... ?"

සොලමන් මහතාගේ මුවට ආරූඪ වූයේ බියක්දැයි මම නොදනිමි.

"කෝ ශාලු"

"එයා පේන්න නැහැ....."

"මේ ළමයා මොනව කරනවද මන්දා යමු බලන්න....." මම ඔහුගේ පිටුපසින් ගියෙමි.

http://e-pusthakalaya.blogspot.com



එවර ඇය සිටියේ දෙර පැත්තට මුහුණලාය. ඇය
තොප්පිය පැළඳ සිටියේ නැත. ඒ තොප්පිය තිබුණේ ඇඳ
ඇල්බමයද පසෙකින් වූ අතර, ඇගේ නෙත් යොමු වී තිබුණේ
සිවිලිම මතය. වරින් වර ඒ දෑස් නිදිබරව පිය වෙනු ඒ අතර
පෙනිණ. සොලමන් මහතා මගේ මුව දෙස බැලුවේය. මට කට
නැති විය. තොප්පිය දමාගෙන ඇල්බමයේ පිටු පෙරළමින් සිටි
ඇත්තේ අංජු‍ය. ඇය කරන මේ පිස්සු වැඩ නිසා ඇත්තෙන්ම
සිත මොනතරම් නොසන් සුන් වන්නේද ? හොල්මන් යනු
සිතයි. සසල වූ විට මනස විකාරත්වයට පත්වීම පුදුමයක් නොවේ.

සොලමන් මහතා මගේ පිටට තට්ටු කොට යන්නට ගියේ
මම කාමරයට ඇතුළු වී දොර වසා අගුළු දැමීමි. අනතුරුව
කවුළුව අද්දරට ගොස් ඉන් පිටත නොබලාම තිර රෙදි එකිනෙක
ලංකොට ඊට කටුවක්ද ගැසීමි.

ලාම්පුවේ ආලෝකය අඩු කරන්නට මට සිතක් නැත. මම
දෙස බැලීමි. ඇගේ ඇස් පිහාටු පිය වී ඇත. ඇය හුස්ම
සෙමිනි. පොරෝනයෙන් නිරාවරණය වූ ඇගේ පිරුණු ළය
සෙමින් උස් පහත් වෙයි. මා මේ කාමරයේ තනි වී
මොනතරම් සුරූපී කෙල්ලක් සමගද ? මට මා ගැනම පුදුමය.
අරුණිත් එක්ව හින්දි චිත්‍රපටයක් බලන විට ඇය එහි හින්දි නිළිය
ගැන කරන කතා මට මතක් වෙයි. ඔවුන්ගේ ලස්සන ඇය වර්ණ
කරන හැටි මට සිහියට නැගේ.

හින්දි යුවතියක් සමග මා අද ගතකරන ජීවිතය එක් අතකින්
සිහිනයකි. මම ඇය සමීපයට ගොස් ඇය අංජුමදැයි සැක හැර
බැලීමි.

එහි සැකයක් නැත. ඒ අංජු‍ය.

මම ඇයට නොදැනෙන සේ ටජානිගේ පින්තූර ඇල්බමය
තොප්පියත් අතට ගතිමි. ඒ ඇය ඇහැරෙතැයි යන හැඟීමෙනි. මම
තොප්පිය ගෙන ගොස් මේසය මත තබා ඇල්බමයේ පිටු පෙරළා
බැලීමි.

එහි මුල් පිටුවේ ටජානිගේ විශාල පින්තූරයක් තිබිණ. ඇය
ගවුමක් හැඳ තොප්පියක් පැළඳ සිටියාය. ඇගේ දඟකාර සිනහව
පෙනුමත් බොහෝ දුරට අංජුට සමාන විය. ඇගේ එකම අඩුව වූයේ





ඇගේ මුව අංජුගේ මුව තරම් ලස්සන නොවීම පමණි. ඇල්බමයේ තිබූ ඒ පිංතූරය දකින විට අංජුටද තොප්පිය පැළඳ බලන්නට අදහසක් පහළ වන්නට ඇත. ඇය ඇඳ මත සිට ඇල්බමය පෙරළමින් සිටි අවස්ථාවේ මා සසල වූයේ ඇය ටජානියැයි යන හැඟීම මගේ සිතට එකවරම නැගී ආ හෙයිනි.

මම ඇල්බමය ලාච්චුවේ දමා වැසීමි. අනතුරුව මා නාන කාමරයට ගියේ ඇඟපත සෝද ගැනීමටය. නානකාමරයේ දල්වා තිබුණු කුඩා ලාම්පුව නිවී ගොස් තිබුණු බැවින් අන්ධකාරය එහි ගුලි ගැන්වී තිබිණ. ඒ අඳුර අතරින් මා දුටුවේ කුමක්ද ? සුදු පැහැති ගවුමක ජායාවකි. සෙමින් සෙමින් එය පාවී එන්නාක් සේ මට හැඟිණ. මම වහා දොර වැසීමි.

ටජානි දැන් නාන කාමරයේය.

මම අංජු දෙස බැලීමි.

කිසිම දෙයක් නොදැක්කාක් සේ ඇය අහිංසකව නිද සිටියි. ඇය අවදි කරන්නට මට නොහැක. ඇය අවදි කලත් මා ඇයට පවසන්නේ කුමක්ද ? අනේ දෙවියනේ ! මෙය නම් පුදුම කර්මයකි.

හැකිතරම් ඉක්මනින් මෙයින් ගැලවී යනවා විනා වෙනකල හැකි කිසිම දෙයක් නැත.

මුත්‍රා කිරීමට මට ඇති අවශ්‍යතාවය දෙගුන තෙගුන වේ. වරින් වර සුළඟක් හමා එයි. දැන් සඳ එළියද නැත. මම ලාම්පුවේ දැල්ල උස් පහත් වෙනු මොහොතක් වේලා බලා සිටියෙමි.

අප නිදගත් විට ටජානි නාන කාමරයේ දොර ඇරගෙන ආවොත්..... අද නම් මට කිසිසේත් නිදගත නොහැක. හොඳම දෙය අංජු අවදි කරවාගෙන කාමරයෙන් පිටව යාමය.

හෙට මා ඉල්ලීමක් කරන්නට කැමැත්තෙමි. මට ටජානි සමග මෙසේ ජීවත් විය නොහැක. හොඳම දෙය අංජුට තෙරේසා සමග ඇගේ කාමරයේ නිදගන්නටත්, මා සොලමන් මහතා සමග ඔහුගේ කාමරයේ නිදගන්නටත් යෝජනා කිරීමය. එසේ කිරීමෙන් අඩුම තරමේ මෙහි ගතකරන කාලය තුළ, බියක් සැකයක් නැතිව වත් සිටිය හැක.

The Reader's Place Novel..

http://e-pusthakalaya.blogspot.com



මම මේසය අසලට ගොස් ගිනි පෙට්ටිය අතට ගත්තෙමි. මූත්‍රා කිරීමේ අවශ්‍යතාවය මට තවත් ඉසිලිය නොහැක. එක්කෝ මා නාන කාමරයට යා යුතුය. නැතිනම් ජනේලය හැර, එහි කණ්ඩිය උඩ නැග සිට මූත්‍රා කල යුතුය.

සෙමින් සෙමින් නාන කාමරයේ දෙර ඇරෙනු මට පෙනිණ. අනේ දෙවියනේ මම දෑස් වසා ගතිමි. වෙලාවකට මේ සුළඟත් මහා කරදරයකි. සුද්දා මේ කාමරයේ පිවත්ව ඇත්තේ හැම විටම සිසිල් වාත්‍රාශය ලබාගෙනය. බිත්තියට අඩියක් පමණ උසින් හැම තැනම ඇත්තේ සුළං කවුළුය. සමහර විට ඔහු කාමරයට විදුලි පංකාවක් සවිකොට නැත්තේද ඒ නිසා විය යුතුය. මම යන්තමට දෑස් ඇර නාන කාමරය දෙස බැලීමි.

කාමරයේ ආලෝකය යන්තමට ඒ තුළට වැටී ඇත. කිසිවෙක් එහි දැන් නැත. තව දුරටත් මෙසේ සිටියහොත් සිදුවන්නේ මා හැඳ සිටින ඇඳුම මුළුමනින්ම තෙත් වීමය.

මම ඉතිපිසෝ ගාථාව මතුරමින් නාන කාමරය අසලට ගොස් ගිනි කූරක් ගැසීමි.

මට කාරණය අවබෝධ වූයේ එවිටය.

ඒ අංජු හැඳ සිටි ගවුමය. ඇය එය සෝදා වනා තිබුණේ නාන කාමරයේ වූ කුඩා වැලකය. අන්ධකාරයේ සුළඟට සෙලවුණේ ඒ ගවුමය. දැන් ඒ ගවුම සුළඟට බිමට වැටී ඇත. මා නාන කාමරයේ දිව ආවා මිස එය වැසුවේ නැත. එය සුළඟට ඇරුණේ ඒ නිසාය.

මට මා කෙරෙහිම උපන්නේ ලජ්ජාවකි. එක් අතකින් බලන කල අපේම මනස විකෘති කරගන්නේ අපමය. බොහෝ දේ ගැන සාධාරණ විනිශ්චයක් කරන්නේ නම් යථාර්තය මීට වඩා වෙනස් වෙනු ඇත.

මම බිය සැක අතහැර දමා නාන කාමරයේ ලාම්පුව පත්තුකොට ඇගපත සෝද ගතිමි. මගේ ගතට මෙන්ම සිතටද සිසිලසක් දැනිණ. මා නාන කාමරයෙන් පිටවූයේ සිතෙහි ඒ සැහැල්ලුවත් සමගය. මා කාමරයට අවුත් ඇඳමත දිගා වී වීහ වේලාවක් සිටියද මට නිදිමතක් නොදැනිණ. මම වට පිට බැලීමි. සියල්ල සන්සුන්ය. සුද්දාගේ දිනපොත යළි බලන්නට මට සිතේ. මගේ





දෑස් එකවරම දිව ගියේ සොලමන් මහතා දුන් යතුරු කැරැල්ල වෙතය. මම නැගිට ගොස් ඒ යතුරු කැරැල්ල ගෙන මේසයේ වම් පැත්තෙහි වූ කුඩා කබඩය විවෘත කළෙමි. අනේ දෙවියනේ ! ඒ සමගම බිමට වැටුනේ මිනී හිස්කබලකි. මම වහා පැන අවුත්, ඇඳමතට නැග ගතිමි.

මට ඒ දෙස බලන්නට පවා බියක් සිතිණ. මම දෑස් තරකොට පියා ගතිමි. ඇවිදින ඇට සැකිලි හා හිස් කබල් ගැන සඳහන් වන්නේ ප්‍රබන්ධ කතාවලය. එහෙත් මේ ප්‍රබන්ධ කතාවක් නොවේ. සත්‍යවූත් කෙනෙකුට විශ්වාස කල නොහැකි වූත් අත් දැකීමකි. ඒ අතර මගේ පපුව මත අතක් තබනු සිහිනෙන් මෙන් මට දැනිණ. මගේ මුළු ගතම සීතල වී ගියේය. කන් දිගේආ සිහින් හිරි වැටීමක් මට දැනිණ. මම යන්තමට ඇස් ඇර මගේ පපුව දෙස බැලීමි.

ඒ අංජුගේ අතය. ඇය නින්දෙන්ම මගේ පපුව මත අත තබා ඇත. මා කලබල වූ තරම, කියතොත් මා ඇඳට නැග දිගාවූයේ ඈ සමීපයේය.

මම ඇගේ ඒ අත දෙස බැලීමි.

සුදු පැහැති ඒ අත මොනතරම් සියුමැළිද ? මට එය අල්ලන්නට සිතේ. මම සෙමින් සෙමින් ඇගේ අත මත අත තැබීමි. ඇය ඒ සමගම තිගැස්සී අවදි වූවාය.

"ඔයා මෙතන..... "

"'ඔයාගෙ අත මගේ පපුවෙ වැදුන..... "

ඇය වහා අත ඇද ගත්තාය.

"ඔයා තාම නිදි නැද්ද ?"

"නැහැ..... "

"ඇයි..... "

"මට නිදිමත නැහැ..... "



The Reader's Place Novel..

http://e-pusthakalaya.blogspot.com



"මොනවද ඔයා මෙච්චර වෙලා කලේ. අර මිස්ට සොලමන්ගෙ භූත කතා ඇහැව්වද ?"

"නැහැ මම කාමරේ හිටියෙ..... "

ඇය ඇඳ මතින් නැගිට නාන කාමරයට ගියාය. ඒ සමඟම ඇය කෑ ගසනු මට ඇසිණ.

"මොකක්ද ශාන් ඔයා මගේ ගවුම වට්ටල නේද ? බලන්න ගවුම ඔක්කොම තෙමිල. හෙට මං අඳින්නේ මොකක්ද ? මට බැහැ තෙරේසගෙන් තවත් ඇඳුම් ඉල්ලන්න"

"මම නෙවි වැට්ටුවෙ සුළඟට වැටිල..... මම අරන් තිබ්බ..... "

මම හිස් කබල දෙස බැලීමි. එය හෙල්මට් එකක් සේ ඇ බැලි අතට පෙරළී ඇත. අංජු එන්නට කලින් එය ආපසු තිබූ තැනට දැමිය යුතුය. මා නැගිට ඒ අසලට ගියද එය අතින් අල්ලන්නට මට පිළිකුලක් දැනිණ. මා මේසය මතවූ පොතකින් කොලයක් ඉරාගෙන අහක බලාගෙන මිනි ඔලුව අතට ගත්තෙමි.

"ශාන්..... "

මම තිගැස්සී ගියෙමි.

"මොකක්ද ඔය" අංජු කෑගැසුවාය.

"මම සුද්දගෙ කබඩ් එක ඇරිය..... ඊකෙ තිබිල ඔක බිමට වැටුන..... "

"මොනවද ශාන් ඔයා මේ රෑ තිස්සෙ කරන්නෙ. ඔක ඇතුළට දල ගිහින් අත හෝදගන්න"

මම හිස් කබල ආපසු ඇතුලට දමා නාන කාමරයට ගොස් දෑත් සබන් ගා සෝද ගතිමි. අනතුරුව මා යළි ඇඳ මතට එද්දී ඇය කොට්ටය ඇදෙහි විට්ටමට තබා හිස හේත්තු කොට ගෙන සිටියා. ඇය යමක් කල්පනා කරනු මට පෙනිණ. මම රහසේ ඇය දෙස බැලීමි. ඇය හිටිවනම මා දෙස බැලුවාය.

"මොකක්ද ශාන් දැන් අපි දෙන්නගෙ අනාගතය..... ඇයි දෙවියන් අපි දෙන්නව මේ තරම් ලං කරන්නෙ..... අපි ඈත් වෙන්න





හදන හැම මොහොතකම අපිට සිද්ධ වෙන්නෙ තව තවත් ලංවෙන්න. තව කොච්චර කාලයක් අපි මේ විදියට ඉන්නද ?"

ඇගේ මුවින් පිටවුනු සුසුම් පහරේ සිහින් හඬ මට ඇසිණ.

"ඔයා මොකවත් හොයාගත්තද ශාන්"

"නැහැ..... "

"කොහේද ඔයා හැම තිස්සෙම මිස්ටර් සොලමන් එක්ක යන්නෙ..... "

"ඔයාට වගේම තමයි මටත් වෙලා තියෙන්නෙ. ඔයාට තෙරේසගෙන් ගැලවෙන්න බැහැ වගේම, මටත් ඒ මනුස්සයගෙන් ගැලවෙන්න බැහැ. ඔයා නිදාගන්නෙ නැද්ද ?"

"මට නිදිමත නැහැ..... "

"අපි එහෙනම් මේසෙ ලාච්චු අරිමුද ?"

"මේ රෑ ඔයාට පිස්සුද ?"

"නැහැ මම හිතුවෙ වෙන කරන්න දෙයක් නැති නිසා..... "

"ඔයා හදන්නෙ මේ මහ රෑ අර මිනී ඔලුව එළියට ගන්නද ?"

"ඒක ඇතුලෙ තව මොනව තියෙනවද දන්නෙ නැහැ"

"මට නම් හිතෙන්නෙ සුද්දත් මහ හොල්මන් කාරයෙක්"

"ලාම්පුවෙ එළිය හුගක් වැඩියි වගේ. මම අඩු කරන්නද?"

"ටිකක් වෙන්න අඩු කරන්න..... "

"මම හිතුවෙ මිස්ටර් සොලමන්ට හෙට කියක් හරි දෙන්න"

"ඒක නම් හොඳයි"

"රුපියල් හාරදහක්..... "

"සමහරවිට ඒක අපි දෙන්නගෙ පඩිය වෙන්න ඇති"

http://e-pusthakalaya.blogspot.com



"එච්චර තමයි අපිට කොයිදේටත් තියෙන්නෙ ?"

"අපි රුපියල් එක්දහස් පන්සියක් දෙමු"

"ඇතිද ? දෙන්නගෙම කෑමටයි ඉන්නයි"

"එහෙනම් දෙදහක් දෙමු"

මා ලාම්පුවේ දැල්ල අඩුකරද්දී සුළඟට ආ තොප්පිය මගේ ගතෙහි වැදිණ. මා එය අතට ගෙන මේසය මතම තැබුවද, සිහින් ශබ්දයක් ජනේලය දෙසින් මට ඇසිණ. ඒ පිසිවෙකු පතුරුවන හඬය. මම කවුළුව අසලට ගොස් තිරපට මෑත්කොට එබී බැලිමි.

ඈත තුෂාරය ගලා යමින් තිබිණ.

බොඳව ගිය මීදුම යළිත් මතු වී තිබුණේ සඳ එළිය මැඩගෙන වුවද ඈත කඳු ශිඛර සිහින් ආලෝකයකින් වෙළාගෙන තිබිණ. මා බලා සිටිද්දීම ඇය පඩිපෙල නැග මල් පාත්ති අසලට ආවාය. සඳ එළියේ බොඳකම නිසා ඇගේ මුව මට හරියාකාරව දැකගත නොහැකි වුවත්, මට ඒ ජායාව හොඳාකාරවම පෙනිණ.

ඇය දිග සුදු සායක් හැඳ සිටියාය. ඇය පඩි පෙළ නැගුණේ සාය අල්ලාගෙනය. ඇය ආවේ මා ඉදිරිපිටටය.

"ශාන් මගේ තොප්පිය දෙන්න..... " සිහින් හඬින් කියනු මට ඇසිණ. ඇගේ හිසෙහි තොප්පියක් නොතිබිණ. මම වහා අංජු දෙස බැලිමි. ඇය අනෙක් ඇලයට හැරී සිටියාය.

වේගයෙන් සුළඟක් හමා ආයේ මටම අදහගත නොහැකි අයුරිනි. ඒ සමගම මේසය මත වූ තොප්පිය සුළඟට අවුත්ම මගේ පාමුල වැටිණ. මම එය අතට ගත්තෙමි.

"ටජානි තරහ කරගත්තොත්..... " මට සියුම් බියක් සිතිණ. මම අහක බලාගෙන ජනේලය යාන්තමට හැර තොප්පිය පිටතට වීසි කළෙමි.

අංජු තිගැස්සී හැරී බැලුවාය. මම වහා කවුළුව වසා දැමීමි.

"මොකද ඔයා කරන්නෙ...... ?"





"මොකවත් නැහැ"

"ජනේලෙ අරින්න එපා හුළඟට ලාම්පුව නිවේවි"

"නැහැ මම ජනේලෙ වැහුව..... "

"අදත් හුළං සැරයි වගේ"

ඔව්..... ඔයාට කවුරුවත් කතා කරනව. ඇහුනද ?"

"නැහැ"

"එහෙනම් කමක් නැහැ"

මම ඇඳ මතට ගොඩවී මුළු හිසම වැසෙන සේ පොරෝනය ගෙන පොරවා ගතිමි.

The Reader's Place Novel..

"ගුඩ් නයිට්"

"රෑ තිස්සෙ හොල්මන් කරල දැන් නිදිද ?"

ඇය මගේ හිසෙහි වූ පොරෝනය පහතට ඇද්දය.

"ඔහොම ඉන්න එපා. මට බය හිතෙනව"

"මොනවටද බය වෙන්නෙ..... බිත්ති හතර වටෙන්ම තියෙනව නම් ජනෙල් දොරවල් හොඳට වහල තියෙනව නම් බයවෙන්න කිසිම කාරණයක් නැහැ..... "

"ඒත් ශාන් සමහර වෙලාවට මට මේ කාමරේ ඉන්නකොට අමුතු අමුතු ශබ්ද ඇහෙනව."

"මටත් ඇහුණා. ඒ සත්තු වහල උඩ දුවනව. මෙහෙ හරියට ලේන්නු ඉන්නව..... "

"ශාන් කාමරේ ඇතුලෙත් ලේන්නු ඉන්නවද ?..... ඔයාට පිස්සු..... "

මම එකවරම නැගී සිට පොරෝනය මෑත් කළෙමි.

http://e-pusthakalaya.blogspot.com



"ඇත්තටම අංජු ඔයාට එහෙම මොකවත් ඇහෙනවද ?"

"කොහේද නාන කාමරයෙන්ද ?"

"ඔව්..... "

"මට සමහර වෙලාවට ශාන්..... ශාන්..... කියල කවුද ක කරනව ඇහෙනව..... "

"පිරිමි කට හඬක්ද ගෑනු කට හඬක්ද ?"

"ගෑනු කට හඬක්..... ?"

"මොනව ?" ඇය සිනහවක් පෑවාය.

"කවුරු කතා කරන්නද ශාන් කියල මම මිසක්..... ම විහිළුවට කිව්වෙ..... ගුඩ් නයිට් ශාන්" ඇය අනෙක් ඇලය හැරුනාය.

The Reader's Place novel..

ඇති යන්තම් මම සුසුමක් හෙලා ලය සැහැල්ලු කර ගතිමි.

පසුද මා අවදිකලේ අංජුය. මධ්‍යම රාත්‍රියේ සිට මට හො හැටි නින්ද ගොස් තිබිණ. ඇය සුපුරුදු පරිදි මගේ උදෑසන තේ කෝප්පය ගෙනවිත් තිබුණාය. ඒ මොහොතේ ළා හිරු රැස් කවුළු තුළින් ඇතුලට වැටී තිබුණේ බොඳ මිදුමද තුනී කරමිනි.

මම වටපිට බැලීමි.

"දැන් හතටත් ලඟයි..... "

"මට ටිකක් නින්ද ගියා..... "

"ටිකක් නෙවි..... ඔයා හරි නරකයි ශාන්..... "

"ඇයි..... ?"

"ඊයෙ ඔයා තොප්පිය එළියට විසි කරලා... මිසිස් තෙරේසා හිත් තරක් වෙල තිබුණ..... "

මට කට උත්තර නැත.



"ඇයි ඔයා ඒක විසි කලේ"

"මම ඒකට ආස නැහැ..... "

"ඔයා ආස නැතිවුනාට මම ආසයි. අපරාදෙ..... මිසිස් තෙරේසා ඒ තොප්පිය ආපහු තියාගත්ත"

"මොනවටද අංජු ඒ තොප්පිය අපිට ඒක එයාගෙ දුවගෙ සිහිවටනයක්නෙ....."

"අපි අද ලාච්චු ටික ඇරල බලමුද ?"

"බලමු..... "

"මම තේ බීල මුහුණකට හෝදගෙන එන්නම්..... "

"එහෙනම් මම යනව උදේ කෑම හදන්න..... ඔයා ඇවිත් මට කතා කරන්න"

එහෙත් මට ඇයට කතා කරන්නට ලැබුණේ නැත. මා මුහුණකට හෝදගෙන හැඳ පැළඳගෙන කාමරයෙන් පිටත එද්දී සොලමන් මහතා මා එනතුරු සාලයේ රැඳී සිටියේය. මා දුටු විගස ඔහු පෑවේ අහිංසක සිනහ රැල්ලකි.

"මිට්‍රන්..... ඔයාට මතකද මට ඊයෙ වුනු පොරොන්දුව"

"මොකක්ද ?"

"අපි අද ගල් පල්ලියට යන්න ඕන"

මම අංජුගේ මුව දෙස බැලීමි. ඇය නොමනාපයෙන් මෙන් අහක බලාගත්තාය. තවත් මට ඔහුට විරුද්ධ විය හැකි නොවීය. අංජුගෙ අකමැත්තට පිටුපා මම ඔහු සමග ඒ ගමන ගියෙමි. ඔහු කෙසේ කිවද ඇත්තෙන්ම ඒ පල්ලියක් නොවේ. ගරා වැටී ගිය කළු ගලින් තනන ලද ගොඩනැගිල්ලකි. ඉපැරණි ගොඩනැගිල්ලක් වූ එය කවරෙකු විසින් කුමක් උදෙසා තනන ලද්දක් දැයි කිව නොහැකි නමුත්, ඒ අසලට ලගා වෙද්දී ගොඩනැගිල්ල මුදුනේ ගසා තිබූ කුරුසයෙන් පුද්ද එය තම ආගමික ස්ථානයක් වශයෙන්, පසු කලෙක පත් කරන්නට ඇතැයි මට සිතිණ.

http://e-pusthakalaya.blogspot.com



තනිකරම කළු ගලින් නිම වී තිබූ නිසා එය ගල් ප
වශයෙන් සොලමන් මහතා හඳුන්වන්නට ඇත. අප එහි ගියේ
පාරක් ඔස්සේය. එහෙත් පුදුමයකට මෙන් ඒ පල්ලිය අවට වූයේ
වැල්ල සහිත මුඩු බිමකි. පල්ලියේ එක් පැත්තක කොටසක් වසා
අතර, එහි දොරට ඉබ්බෙකුද දමා තිබුණ.

"මේකට තිලිප්පන්ගෙ මිනිස්සු එනව..... " ඔහු
කියන්නට උත්සාහ කලද ඔහු එය විස්තර කරන්නට උත්සාහ
නැත. අපි පල්ලියේ ඉදිරිපසට ගොස් එහි කුඩා ගේට්ටුවෙන් ඇ
වීමු. ඉදිරිපස දොර වසා දමා තිබිණ. සොලමන් මහතා සාක්කුවෙ
යතුරක් ගෙන එය විවෘත කළේය. සියළුම කවුළු වසා දමා තිබූ බැ
එහි ඇතුලත වූයේ අන්ධකාරයකි.

"මේ ජනේල අරිනවට දුව කැමති නැහැ..... ඉත්න
ඉටිපන්දමක් පත්තු කරන්න"

අමුතු දුර්ඝන්ධයක් ඇතුලතින් නැගී ආයේය. මා නා
වසාගෙන එය ඉවසා විඳ දරාගත්තේ මහත් අපහසුතාවයකි
එකවරම මහත් හඬක් නැගිණ. බිය වූ යෝධ වවුලකු අත
ගසාගෙන ඉගිල්ලුනේ අම්හිරි හඬින් කෑගසාගෙනය.

"අර තියෙන්නෙ දුවගෙ මංගල ඇඳුම..... මට ඒක
බලන්න බැහැ මිටුන්. සමහරවිට දුව ඒක අඳිනව ඇති. ඒක හොඳ
පොඩි වෙලා"

මා හුස්ම ඉහළ පහළ කලේ මහත් අපහසුවකිනි. ඒ අසළම
යේසුස් වහන්සේගේ රූපය දෙස මා නෙත් යොමා බලා සි
සොලමන් මහතා මගේ පිටට තට්ටුකොට දෑස පිසද ගත්තේය.

"මිටුන් දුවත් එක්ක කතා කරන්න. එයා දැන් මෙහාට ඒ
මම එළියෙන් ඉන්නම්. එයා මා ඉස්සරහ ඔය වගේ දේවල් ක
කරන්න කැමති නැහැ....." ඔහු දොර වසා දමා පල්ලියෙන් පි
ගියේය.

මම ඒ ඉටිපන්දම් ආලෝකය අතර තනිවීමි. අනේ දෙවියනේ
ඒ දුර්ඝන්ධය මට ඉවසිය නොහැක. මම ආපසු දොර දෙසට දි
ගියෙමි. පිටතින් දොර වසා දමා තිබිණ. මා උගුලකට හසු වූ බව ම
දැනුණේ කිසිවෙකු 'මගේ උරහිසට අතක් තබන්නාක් සේ දැනු
හෙයිනි.





අනේ දෙවියනේ !

මම යන්තමට පිටපසු හැරී බැලීමි. කිසිවෙකු මා අසලකවත් නොවීය. මගේ උරහිසට බරක් දැනී මම අතගා බැලීමි. ඒ පරවී ගිය මල් පොකුරකි. එය මගේ උරහිසට වැටෙන්නට ඇත්තේ මා දොරට ගැසූ නිසා විය හැක. දොරෙහි එල්ලා තිබූ එය සමහරවිට මගේ උරහිස මතට වැටෙන්නට ඇත.

සොලමන් මහතා දොර ඇරීයේය. මම වහා පිටතට පැන ගත්තෙමි.

"දුව හම්බ වුනාද ?"

ඉහෙන් කටෙන් දහඩිය වැගිරෙනු මට පෙනිණ. මේ මිනිසා සමග මා කරන සෙල්ලමේ භයානක කම මට වැටහෙන්නේ දැන්ය. එක් අතකින් බලනකල සැබෑ ජීවිත්යේද අපි උන්මත්තකයින්ය. මම වහා මිදුලට අවුත් වේගයෙන් හුස්ම ඉහළ පහළ කළෙමි.

"ඇයි දොර වැහැව්වෙ සර්..... මට හුස්ම ගන්නත් අමාරු වුනා"

"දුව කැමති නැහැ දොර ඇරගෙන ඉන්නවට. අනික කවුරු හරි දොර ඇරල තියෙනව දැක්කොත්..... "

"කවුද දකින්නෙ..... ?"

ඔහුගේ නිහඬතාවය මට තවත් පිළිතුරක් දුන්නේය.

"තිලිප්පන්ගෙ මිනිස්සු මෙතනට එන්නෙ ආයුධ හංගන්න නේද... ?"

ඔහු බොරු කීවේ නැත.

"ඔව් මිටුන්..... හැම ගුප්ත තැනකම ඒ අයත් ඉන්නව. ඒ අය රැකවරණය ලබන්නෙ මළවුන් තුළින්"

"ඒකයි ඇත්ත ..... " මම මඳක් කෝපයෙන් කීවෙමි.

"දුවව හම්බවුනාද ?"

"ඔව්..... "



The Reader's Place novel..

http://e-pusthakalaya.blogspot.com



"මොකක්ද එයා කිව්වෙ ?"

"එයාව ඉක්මනින් මේ ආත්මයෙන් ගලවන්න කිව්ව....."

"එහෙනම් මිටුන් හරි"

"ඔව් සර්..... සුද්ද සමහරවිට ස්ටුවර්ට්ගෙ භාර්‍යා බිරිඳගෙ භූතාත්මය මිදෙව්ව වගේ මටත් පුළුවන් වේවි ටෙම්බා ආත්මයෙන් මුදවගන්න....."

මම ඉදිරියෙන් ගමන් කළෙමි.

ඔහු මා පසු පසින් ආවේය.

"මිටුන්ට කීයක් විතර සල්ලි ඕනද ?"

"මට සල්ලි එපා..... මට ඕන කරන දේ මම කියන්නම්"

සොලමන් මහතා මගේ කතාව විශ්වාස කළේය. එය දෙස බලන කල මා විශ්වාස කරනවා හැරෙන්නට ඔහුට වෙන කල හැකි දෙයක්ද නැත. අපි තවත් කතාවකින් තොරව ගෙදර ආවෙමු.

අංජු කාමරයේ දොර වසාගෙන සිටියාය.

මා කීපවරක්ම දොරට තට්ටු කල නමුත් ඇය දොර ඇරියේ නැත. මා යළි සාලයට අවුත් අසුන්ගෙන මද වේලාවක් සිටිද්දී සොලමන් මහතා කාමරයට ගොස් ආපසු ආයේ මුදල්ද රැගෙනය.

"මෙන්න ගමනට සල්ලි..... ?"

"ඇයි මේ..... ?"

"මිටුන් කිව්වෙ මන්දිර්වලට යනව කියල ....."

"මට දැන්ම සල්ලි එපා. මට සර්ව රවට්ටන්න බැහැ. මං දන්නව දැන් සර් ඉන්න තත්වෙ. ඒ වගේම තමයි මම හැකි ඉක්මනි මෙහෙන් පිටවෙන්න ඕන. නැත්නම් සර්ගෙ පුතාට මෙහාට එන ලැබෙන එකක් නැහැ....."

"ඔව් මිටුන් මම තිලිප්පන්ට කිව්වෙ ඔයා මගේ පුතා කියල"



"මම ඒක දන්නව....."

"කොහොමද ඔයා දන්නෙ....."

"එදා සර් තිලිප්පන්ගෙ මිනිස්සුන්ට එහෙම කියනව මට ඇහුණා. මම දන්නව සර් අපිට මොනතරම් උදව් කරනවද කියල. මම ඒ කළගුණ අමතක කරන්නෙ නැහැ. මම මෙහෙන් යන්නේ සර් කරපු උදව්වට උදව්වක් කරල"

අප කතා කරමින් සිටින විට අංජු තෙරේසා සමග අත වනු පෙනිණ. මා සිතුවේ ඇය කාමරයේ දොරගුළුද වසාගෙන කෝපයෙන් සිටින බවය. එහෙත් ඇය තෙරේසා සමග ඇවිදින්නට ගොස්ය.

"මම ගෝත්‍රිකයින්ගෙ ගම්මානෙ මායිම් කාලුට පෙන්නුව. කාලුට ගෙදර ඉන්න කම්මැලි හින්ද එයාව ටිකක් ඈතට එක්ක ගෙන ගියා....."

"ඒක හොඳයි....." මම කීවෙමි.

"එයා හැම වෙලාවෙම මට තෝක්කඩු කියනව එයාව කොහේවත් එක්කගෙන යන්නෙ නැහැ කියල....."

අංජු කාමරයට එද්දී මමද කාමරයට ගියෙමි.

"ඔයා ඇත්තටම කොහේද ගියේ ?"

"මට ඕන කලේ පාර බලාගන්න. දවසින් දවස ගෙවිල යනව. අපේ ගමන ඉක්මන් වෙන්නෙ නැහැ. අඩුම ගානෙ මෙහෙන් පිටවෙන්න පුළුවන් පාරවත් ඔයා හොයාගත්තද ? ඔයා මිස්ටර් සොලමන් එක්ක නිතරම ඇවිදිනව විතරයි."

කතාව දිග්ගැස්සෙන්ට කලින් මම නිහඬවීමි.

The Reader's Place novel..

http://e-pusthakalaya.blogspot.com



සුදු ජාතිකයාගේ පර්යේෂණ ගැන මා
වඩාත් උනන්දු වූයේ අපේ ගැලවීම පතාය.
එහෙත් ඔහු කල පර්යේෂණවල සත්‍ය අසත්‍යතාවය
පිළිගතයුත්තේ කෙසේදැයි මා තව දුරටත් සිතිය යුතු විය.



6

The Reader's Place Novel..

සුදු ජාතිකයාගේ බොහෝ සටහන් මම කියවා බැලිමි. හිස් කබල් දෙකක් මෙන්ම කුප්පිවල අසුරන ලද අළු ද එහි තිබිණ. ඒ මිනී අළුදැයි මම නොදනිමි. ඒ හැරෙන්නට එහි වූයේ රෝල් කොට රබර් පටියකින් තද කරන ලද කුඩා සිතියමකි.

"අංජු ඒ සිතියම හම්බ වුනා....." එය දුටු විගස මම සතුටින් කෑගැසීමි. අංජු මා අසලට දිව අවුත් එය අතට ගෙන බැලුවාය.

"ඕකෙ මන්දිර් ගැන සළකුණු කරල තියෙනවද..... ? "

"මේ තියෙන්නෙ ඊයෙ තෙරේස පෙන්නපු මායිම. මේ ගමන යන්න වෙන්නෙ ගෝත්‍රිකයින්ගෙ ගම මැදින්"





"මම දන්නෙ නැහැ එකපාරකුත් අපි ගෝත්‍රිකයින්ට කොටුවෙල බේරුනෙ බොහෝම අමාරුවෙන්. මෙහෙ හිටියත් ගෝත්‍රිකයින්ට නම් කොටු වෙන්න බැහැ අංජු..... "

"අපි මෙහාට ආපු පාරෙන්ම ගියොත්..... ?"

සුද්දා මන්දිර්වලට ගිහින් තියෙන්නෙ ගෝත්‍රිකයින්ගෙ උදව් ඇතුව. ඒ කියන්නෙ ගෝත්‍රිකයින්ට හුගක් ලඟින් ඉඳල තියෙනව.

ඔහු විසින් ලියන ලද ඇතැම් සටහන් පැහැදිලි නැත. ඒ ඔහුගේ න්‍යාය ධර්මයන්ය. ඔහු එංගලන්තයේදී කරන ලද විවිධ පර්යේෂණද එහි ඇතුලත් වේ. භූතාත්ම යනු විශ්වයේ පාවෙන තවත් ජීවීන් කොටසක් නොවේ. එහෙත් එය විඥානය පෙරදැරිකරගත් මහභූත සතරේම විකාරත්වයයි. ඔහුගේ අදහස පිළිගැනීමට කිසිවෙකුට ඔහු බලකොට නැත. ඔහුගේ අදහස එය සංවාදයකට භාජනය කල යුතු බවයි.

මිනී හිස්කබල් ඔහු එංගලන්තයේ සිට ගෙන ආ ඒවාද නැතිනම් මන්දිර්වලින් ඔහු ලබා ගත් ඒවාදැයි පැහැදිලි නැත. එහෙත් මන්දිර්වල වාසය කරන සෘෂිවරයාගේ බලසම්පන්නභාවයත්, ඔහුගේ චිත්ත බලශක්තියත් ඔහු පිළිගෙන ඇත.

මා පරිවර්තනය කල මේ සටහන දෙස බලන්න.

මරණින් මතු ජීවිතය ගැන මම බොහෝ පර්යේෂණ කොට ඇත්තෙමි. ආත්මය හැරෙන්නට තවත් උපතක් සිදු නොවෙතැයි යන හැඟීම මා තුළ මුල් බැසගෙන තිබුණේ ආගමික විශ්වාසය මත විනා යථාර්තය මත නොවේ. එහෙත් ඉන් ඔබ්බට සිතන්නට මා යොමුකල මූලික සිද්ධාන්තය වූයේ මේ මා කල පර්යේෂණවලදී මට හමුවූ විවිධ භූතාත්මයි. ඒ අතින් මම සංසාරය ගැනත් භවයෙන් භවය සැරිසරන සත්වයා ගැනත් බුදු දහමෙන් කිසියම් ආභාෂයක් ලැබුවෙමි.

මට ශර්වාන් සෘෂිවරයා ගැන අසන්නට ලැබුණේ අහම්බෙනි. ඒ ස්ටුවර්ට්ගේ මිතුරෙකු මගිනි. ඔහු කිපවරක්ම එහි ගොස් තිබුණේය. ඒ සෘෂිවරයා හට මේ භූතාත්ම, ඔවුන්ගේ ඒ පාපකාරී ආත්මයන්ගෙන් මුදවාලීමේ ශක්තියක් හා බලයක් තිබිණ. මුලදී මම එය විශ්වාස නොකළෙමි. එහෙත් එහි ගමන පිළිබඳ විස්තරයත්, එහි සිතියමත් මා ඔහුගෙන් ලබාගත්තේ, මගේ පර්යේෂණවල සාර්ථකත්වය දැකීමටත්

http://e-pusthakalaya.blogspot.com



වඩා මේ අපූරු අත්දැකීමේ කිසියම් වින්දනයක් ලබාගැනීමේ අරමුණෙනි. මිය ගිය පුද්ගලයාගේ ඇළු හෝ හිස්කබල උපයෝගීකොට ගෙන ඒ පුද්ගලයා පිළිසිඳගත් භවය කුමක් දැයි පැවසීමේ පුදුම ශක්තියක් ඔහු සතුව තිබිණ. මට එය අවබෝධවූයේ මා එහි ගිය මුල්ම වතාවේය. එක් අතකින් මට එය අදහාගත නොහැකි පුදුමයක් සේ දැනිණ. තවමත් මෙවැනි බලසම්පන්න විශ්වශක්තිය ඇති සාෂිවරුන් ඉන්දියාවේ සිටීම පිළිබඳ මම දෙවියන්ට ස්තුති කරමි. මා දෙවන වතාවට එහි ගෙන ගියේ ස්ටුවර්ට්ගේ බිරිඳගේ අළුය. ඔහු ඒ ඇළු පරීක්ෂා කිරීමෙන් අනතුරුව පැවසුවේ ඇය තවමත් සිටින්නේ භූතාත්මයක බවය. පසුව ඔහු ඇගේ ඒ භූතාත්මය මන්දිර්වෙත කැඳවූවේය. මසකින් ඇයට ශරීරයක් සහිත වෙනයම් භවයක උපතක් ලබා දීමට ඔහු මට පොරොන්දු විය.

මසකට පසු මම එහි ගියෙමි.

මට එහි ප්‍රතිඵල දැනගත හැකි විය. ඇය, ඒ පාපකාරී ආත්මයෙන් මිදී සිටියාය. සෘෂිවරයා මට විවිධ භූතාත්ම පිළිබඳ තොරතුරු අනාවරනය කළේය. එය නොපිළිගන්නට මට සාක්ෂි නොතිබිණ.

මා අංජුට මේ සියල්ල තේරුම් කොට දෙද්දී ඇය සාවධානව එය අසා සිටියාය. ඇගේ මුවෙහි බලාපොරොත්තුවේ සේයාවක් මතුවෙනු මට පෙනිණ.

"ශාන් හිතනවද මන්දිර්වලට ගියොත් අපිට ගෙදර යන්න මොකක් හරි පොටක් පාදගන්න පුළුවන් වෙයි කියල ..... "

"සුද්ද මන්දිර්වලට ගියානම් ඔහු ආපහු ආවනම්, ඒ මාර්ගය අපිටත් හොයාගන්න බැරිවෙන එකක් නැහැ. අනික් අතට මන්දිර්වලට බැතිමත්තු එන්නෙ ෂිමෝගා හරහා. ඒ කියන්නෙ ෂිමෝගා ලොකු නගරයක්..... "

"මම දන්නෙ නැහැ ශාන් මට දැන් මොන ක්‍රමයකින් හරි ඕන කරන්නෙ ගෙදර යන්නයි. මගේ අම්ම නම් මම නැති වුනොත් වහ කාවි"





"අංජු..... මේ සටහන මං සොලමන්ට පෙන්නනව. එතකොට එයාගෙ දුවගෙ භූතාත්මය මුදවගන්න එයා අපිට මේ ගමන පිළියෙල කරල දේවි"

"එයා මේව විශ්වාස කරයිද ?"

"එයා විශ්වාස කරාවි. මිස්ටර් සොලමන්ට ඕන කරන්නෙ දැන් කොහොම හරි එයාගෙ දුවගෙන් ඈත් වෙන්න. එයාගෙ ආත්මය සොලමන්ට දැන් හුගක් කරදර කරනව"

අංජු සුසුමක් හෙලුවාය.

"මම හෙට යනව ස්ටුවර්ට්ගෙ හතරවෙනි බිරිඳගෙ සොහොන් කොත ලගට. එතන සුද්ද කියල තියෙන විදියට අළු නැත්තම්, ඒ වගේම ඒ කුහරය හාරල තියෙනව නම්, මම කෙලින්ම මිස්ටර් සොලමන්ට එයාගෙ දුවගෙ ආත්මය ගලවල දෙන්න පොරොන්දු වෙනව"

"මට නම් බැහැ ඔය සොහොන් පිට්ටනිවල ඇවිදින්න"

"ඔයා එන්න එපා මම යන්නම්"

"එතන්ට ඔයාට යන්නම ඕනද ?"

"මට සුද්දගෙ සටහන්වල ඇත්ත නැත්ත බලාගන්න එතකොට පුළුවන්..... "

"ඔයා කියන්නෙ සොලමන්ගෙ දුව ඉන්නෙ භූතාත්මයක කියලද.... ?"

"එයා එහෙම විශ්වාස කරනව"

"ඒ කොහොමද ?"

"එයාට හැඟෙනව ඇති..... දැනෙනව ඇති..... "

"ඔයා ඕව විශ්වාස කරනවද ?" අංජු උපහාසය මුසුව සිනහවක් පා මා දෙස බැලුවාය.

http://e-pusthakalaya.blogspot.com



"අපි විශ්වාස කරත් නොකරත්, අපිට මේකෙන් ගැලවෙන්න තියෙන එකම මාර්ගය සොලමන්ගෙ ඒ විශ්වාසයයි"

"මම දන්නෙ නැහැ ශාන්..... ඔයා කැමති දෙයක් කරන්න..."

"ඔයා මිසිස් තෙරේසට සල්ලි දුන්නද ?"

"ඔව්..... ඒත් එයා ගත්තෙ නැහැ"

"ඇයි ?"

"එයා මාව පොරොන්දු කරගත්ත මදුරාසියේදි එයාගෙ ගෙදර ජදිංචියට..... "

"ඔයා බොරුනේද කලේ"

"වෙන මම මොනව කරන්නද ශාන්..... "

"ඒ වුනත්..... "

"ඇයි ඔයත් බොරු නේද කරන්නෙ..... ?"

"මම මොකක්ද කරන බොරුව..... "

"ඔයා ටජානිගෙ භූතාත්මයක් ගැන කියල මිස්ටර් සොලමන්ලව රවට්ටන එක බොරුවක් නෙවිද ?"

"මම ඒගොල්ලන්ව රවට්ටන්නෙ නැහැ..... ඒ ගොල්ලො තමයි ටජානිගෙ භූතාත්මය ගැන කතාකරන්නෙ..... "

"ඒ ඒගොල්ලො මානසිකව වැටිල ඉන්න නිසා..... "

"භූතාත්ම ගැන ඔයා විශ්වාස කරන්නෙ නැද්ද ?"

ඇය එකවරම හඬ නගා සිනහසුණාය.

"මේ විසිඑක්වෙනි ශතවර්ෂ..... මම ගුවන් සේවිකාවක් බව ඔයාට අමතක වුනාද ?"





ඇත්ත ඇති සැටියෙන් දැනගතහොත් ඇය මෙලෙස මට සිනහ නොවනු ඇත. එහෙත් එක අතකින් එය හොඳය. ඇය මෙහි ටජානි සිටින බව දැනගතහොත් මට වඩා සියදහස් ගුනයකින් බියවන්නේ ඇයය. සමහරවිට එය එසේ වූවානම් මට ඇගේ සෙවනැල්ලෙන් පවා ඈත්වෙන්නට නොලැබෙනු ඇත.

"අංජු..... මම ඔයාට කියන්න කියල හිටියෙ..... "

"මොකක්ද ?"

"ඔයාට බැරිද තෙරේස එක්ක ඉන්න..... "

"ඇයි ?" ඇය තිගැස්සුණාය.

"නැහැ මම හිකන් කිව්වෙ..... එහෙම ඉන්නකොට එයාට එයාගෙ දුව නැති පාළුව දැනෙන එකක් නැහැ..... "

"ඔයා හදන්නෙ මාව මේ කාමරයෙන් එළවන්නද ?"

"නැහැ..... "

"මොකක්ද ශාන් ඔයාට වෙලා තියෙන්නෙ. මෙච්චර කලක් අපි දෙන්න හිටියෙ එකට නෙවිද ?"

"අපිට එහෙම ඉන්නව ඇරෙන්න වෙන කරන්න දෙයක් තිබුණෙ නැහැ..... ඒත් අද අපිට කරන්න දෙයක් තියෙනව"

"ඔයා අකමැතිනම් මං මේ කාමරේ ඉන්නවට මම යන්නම්.... "

ඇගේ දැස්වල කඳුළු පිරේ..... ඇගේ කොපුල් තල රතු වෙයි. ඇගේ දෙතොල් චලනය වේ. ඇය මහත් හඬින් දොර වසා දමාගෙන කාමරයෙන් පිට වී ගියාය.

මම ඇඳමතට වී කල්පනා කළෙමි.

කෙසේ වුවත්, දැන් අප ටිකෙන් ටික හෝ දුරස් විය යුතුය. අප දෙදෙනාටම ආදර ගිවිසුම් දෙකක් ඇත. ඒ රටවල් දෙකකය. බලාපොරොත්තු, අනාගතය රැඳී ඇත්තේ, ඒ ගිවිසුම් දෙක තුළය.



The Reader's Place Novel..

'දේවී.....' ඇගේ බලාපොරොත්තුවයි. ඒ ඇගේ අනාගත සැමියාය.

'අරුණි' ඇය බලාගෙන සිටින්නේ ඇගේ මංගල සළු ගෙනෙන තෙක්මය. ඒ මගේ අනාගත බිරිඳයි.

අපට දැන් හරස්ව ඇත්තේ අප දෙදෙනාම හිරකොට ඇති වර්තමාන හිඩැසය. ඒ හිඩැසේ අප දෙදෙනාම සිරවී ඇත්තේ කිසිදු දෙයක් කර කියාගත නොහැකි සිරකරුවන් ලෙසය.

මම මඳ වේලාවක් ඇඳමතම දිගාවී සිටියෙමි.

මට නොදැනුවත්වම නින්ද ගොස් තිබිණ. මා අවදිවූයේ අංජු තෑ ගසන ශබ්දයකටය. මම වහා ඇඳමතින් නැගිට ඒ දෙසට දිව ගියෙමි. අංජු තරප්පු පෙළ අසල වැටී සිටියාය. ඇය කකුල අල්ලාගෙන බෙරිහන් දෙන්නට පටන් ගත්තේ වේදනාවෙන් ඇඹරෙමිනි.

මම වහා ඇය අසලට ගොස් ඇය නැගිටුවා ගතිමි. ඇගේ පාදය ඇඹරී ගොස් තිබූ අතර, අත් දෙකම තුවාල වී තිබුණේ තරප්පු පෙළෙහි වූ ලී වලටය. ඇගේ කටහඬට තෙරේසාත් සොලමන් මහතාත් දිව ආහ.

"මාව කවුද තරප්පුවෙන් පහළට තල්ලු කලා....." කිසියම් බියකින් මෙන් ඇස් කරකවමින් අංජු කියත්ම සොලමන් මහතා මා දෙස බැලුවේ කිසියම් සැකයකින් යුතුවය. මම වහා අංජු ඔසවාගෙන අවුත් ඇඳමත තැබීමි.

ඇය ඒ සමගම කුඩා දරුවෙකු සේ හඬන්නට පටන් ගත්තාය.

ඒ අතර තෙරේසා කාමරයට දිව ආයේ බෙහෙත් පෙට්ටියක්ද අතැතිවය.

"මාව කවුද තල්ලු කරා ඇන්ටි" ඇය දුටු විගස අංජු කීවේ කිසියම් බියකින් මෙනි.

"මම තරප්පුව ලඟ හිටගෙන හිටිය. මට දැනුන කවුද පස්සෙන් එනව වගේ..... මම හැරිල බලන කොටම මාව තල්ලු කරා....."





"කවුද ඔයාව තල්ලු කරන්නෙ....." තෙරේසා තුවාලවලට බෙහෙත් දමන අතරම සිනහසෙමින් ඇසුවාය.

"මට ඒක නම් හොඳටම දැනුන....."

ඇගේ දණහිසද තුවාල වී තිබිණ. ඇගේ ගවුම තෙරේසා ඉහළට සෙමින් ඔසවත්ම මම කාමරයෙන් පිටවුනෙමි. සොලමන් මහතා බලා සිටියේ මා එනතෙක් නොඉවසිල්ලෙනි.

"මොකද හොඳටම තුවාල වෙලාද ?" ඔහු කලබලයෙන් ඇසීය.

"ටිකක් තුවාල වෙලා....."

"බය වෙන්න දෙයක් නැහැ..... තෙරේස බෙහෙත් කරාවි. එයා කාලයක් මද්‍රාසියෙ පෞද්ගලික රෝහලක හෙදියක් හැටියට වැඩ කලා. අපේ හුඟක් ලෙඩ දුක්වලට බෙහෙත් කරගන්නෙ අපිමයි. මෙහෙ දොස්තර කෙනෙක් හොයන්න බීරූව්වලටම යන්න ඕන....."

"අනේ මන්ද සර්..... මට තේරෙන්නෙ නැහැ මොනව කරන්නද කියල ....."

"මොකද්ද ඔයා හිතන්නෙ මිටුන්....."

"ටජාහි එයාව තල්ලු කරන්න ඇති....."

"එයත් එක්ක මොකද්ද තියෙන තරහව"

"ශාලු කිව්ව එයා හොල්මන් අවතාර විශ්වාස කරන්නෙ නැහැ කියල. ඒක ටජාහි අහගෙන ඉන්න ඇති"

"එයා කොහේද මෙහෙ..... ?"

"එයා ඉන්නව සර්..... අර කාමරේ ලඟ තියෙන ජනේලෙ පිට පැත්තෙ. ගුලිවෙල වකුටුවෙල එයා ඉන්නව"

"මට ඒ ළමය දුක් විඳිනව..... බලන්න බැහැ..... මේ වගේ පාපකාරි ආත්මයක්. අනේ දෙවියනේ ! මිටුන් ඔයාගෙ ගමන ඉක්මන් කරන්න"

http://e-pusthakalaya.blogspot.com



අප කතාකරමින් සිටින අතර, අංජු කාමරයෙන් පිටව ආවේ තෙරේසාගේ ගෙල වටා අතයවා ඇයට බරව් කොර ගසමිනි. ඇය නිකමටවත් මා දෙස නොබැලුවාය.

"එයා කැමතියි අද මගේ කාමරයෙ ඉන්න....."

දෙයියෝ සාක්කි මට සොලමන් මහතා දෙස බැලුවේ ඉබේටමය.

"ඒ මොකද ?"

මම වහා දිවගොස් තෙරේසාට බාධා කළෙමි.

"එපා මිසිස් තෙරේසා..... මම ආස නැහැ ශාලු නිසා ඔයාට කරදරයක් කරන්න....."

"මට කරදරයක් නැහැ....."

"මොකද නැත්තෙ ..... ? මම දන්නවනෙ මිසිස් තෙරේසාගෙ ඇඳ පොඩියි. ඒකෙ දෙන්නෙකුට නිදාගන්න බැහැ....."

අංජු මා දෙස බැලුවේ නොමනාපයකින් මෙනි.

"මං අද මිසිස් තෙරේසත් එක්ක ඉන්නම්"

"ඔයාට පිස්සුද ශාලු....."

මම ඇය බලෙන්ම ආපසු කාමරයට ගෙන ගියෙමි. එදේ නොවන්නට අද මට කාමරයේ සිටින්නට වන්නේ තනිවමය. මා බිය නැතිවුවද මගේ යටි සිතෙහි ඇති හැඟීම් මා දුර්වල කරන අවස්ථාවක් එමටය. මා එය අගවන්නට උත්සාහ නොකලද ඇය මගෙන් ඇසුවේ මා දුර්වල කරවන ප්‍රශ්ණයකි.

"ඇයි ඔයා මාව බලෙන්ම කාමරේට ගෙනාවෙ ?"

මම කතා නොකළෙමි.

"ඔයාම නේද කිව්වෙ මට එයාගෙ කාමරේට යන්න කියල ....."

"කිව්ව තමයි..... ඒත්....."





"ඒත්..... ඇයි ?"

"මට හිතෙනව අපේ ප්‍රශ්ණ අපිම විසඳගන්න එක හොඳයි කියල ....."

"ඇත්තද පුදුමයි එහෙම හිතුන එක....."

"ඒ කාමරේ පොඩියි. ඇඳත් පොඩියි අනික හැම වෙලාවෙම තෙරේස තෙල් නාගෙන ඉන්නෙ....."

"ඉතින් ඔයාට මං ගැන අනුකම්පාවක් හිතුනද ?"

"ඔයා ඕන එකක් කියන්න අංජු....."

"කවුද මාව තරප්පු පෙළෙන් පහළට තල්ලු කළේ ?"

"ඔයාගෙ පය ලිස්සන්න ඇති"

"විකාර....."

"මටත් දැන් හිතෙනව ඔයා කියපු කතාව ඇත්ත කියල"

"ඒ කිව්වෙ....."

"මේ ගෙයි හොල්මන් තියෙනව"

"ඔයාට පිස්සු..... ඇරත් ඔයාට පුළුවන් ඕව විශ්වාස නොකර ඉන්න....."

ඇය කිසිත් නොකීවාය. ඒ වෙනුවෙන් ඇය කළේ කෙඳිරි ගෑමය. මම ඇය දෙස බැලීමි.

"හුගක් රිදෙනවද ?"

"ඔව්....."

"මොකද දැන් කරන්නෙ..... ?"

"මම දන්නෙ නැහැ..... මගේ ඔළුවත් කකියනව"



The Reader's Place Novel..

http://e-pusthakalaya.blogspot.com



"මම තෙල් ටිකක් ගාන්නද ?"

"එපා..... "

"ඇයි ?"

"මට ඕනෙ නැහැ ඔයාගෙ අනුකම්පාවක්"

"ඇත්තද ? ඔයාට අතීතය මතක නැහැ අංජු. කමක් නැහැ. ඔයා හැම වෙලාවෙම හිතන්නෙ ඔයා අනුන්ගෙ කියලනෙ..... " මම සුසුමක් හෙලුවෙමි.

"මම අනුන්ගෙ තමයි. ඔයත් අනුන්ගෙනෙ"

"ඒක තමයි අපි අතර තියෙන බැම්ම"

"වතල් කදවුරේදි ඒ වගේ බැම්මක් අපි අතරෙ තිබුණද ?"

"ඇයි නැත්තෙ ..... "

"ඔයාට නයා ගහපු දවසේ කකුලෙ ඉදිමුමට තෙල් ගෑවෙ මම..... "

"ඔයා මට කරපු උදව් ගැන කුල කියනවද ?"

"නැහැ..... "

"ඔයා මගේ කකුලෙ තෙල් ගෑවෙ දණහිසෙන් පහල ..... ඒත් වෙන කරන්න දෙයක් නැති නිසා. මගේ අම්ම හරි..... දේවි හරි ලග හිටිය නම්..... කවදවත් එහෙම වෙන්නෙ නැහැ..... "

"එහෙනම් මම කළේ වරදක්..... මොනව කරන්නද අංජු මගේ දෙවියත් මට දැන් සරදම් කරනව"

දොරට තට්ටු කරන හඬ ඇසිණ.

"දවල් වෙලා..... එන්න කෑම කන්න..... "

මම අංජු දෙස බැලීමි.





ඇය නැගිටින්නට උත්සාහ කළාය. එහෙත් ඒ සමගම ඇගේ මුවින් පිටවූයේ කෙඳිරියකි.

"අනේ දෙවියනේ ! මට බැහැ"

"මම ශාලුගෙ කෑම ටික ගේන්නම්..... " තෙරේසා කාමරයෙන් පිටවෙද්දී මම ඇය පසු පසින් ගියෙමි.

"ශාලුගෙ කෑම එක දෙන්න..... "

තෙරේසා මා දෙස බලා සිනහවක් පා අංජුගේ කෑම පිඟාන මා අතට දුන්නාය.

"ඔහොම තමයි හොඳ අඹු සැමියො වුනාම, දුක සැප එකට බෙදාගන්න ඕන..... "

මම අංජු වෙත අවුත්, ඇය අසක බලාගනිද්දීම ඇයට කැව්වෙමි. ඇය තිප වරක්ම එය ප්‍රතික්ෂෙප කළාය.

"ඔයාට බඩගින්නෙ තමයි ඉන්න වෙන්නෙ"

"ඕක තියන්න මම කන්නම්"

"ඔයාගෙ ඇඟිලි තුවාල වෙලා..... ඒ වුනාට ආඩම්බරකම ගිහින් නැහැ..... "

"ඕකටත් කුල කියාවිද දන්නෙ නැහැනේ"

"කිව්වත් කියන්නෙ පස්සෙනෙ දැන් කාල ඉන්න"

ඇගේ දෑසේ කඳුළු පිරුණේ හිතැතිනි. ඇය තවත් යමක් කතා කලේ නැත. ඇය මා අතින් බත් කටවල් කිපයක්ම කද්දී ඇගේ දෑසින් ගිලිහුනු කඳුළු බිඳු කීපයක් කොපුල් තල හරහා ගලා ආයේය.

"මම තරහ නැහැ ශාන්..... "

"මම ඔයාගෙ හිත රිදෙව්වෙ නැහැ අංජු"

"මම ඒක දන්නව..... මම හැම වෙලාවෙම හදන්නෙ ඔයාගෙන් හුගක් ඈතකට යන්න..... ඒත් ඒ ඈත මට පේන්නෙ නැහැ"



The Reader's Place novel..

http://e-pusthakalaya.blogspot.com



"මාත් උත්සාහ කරන්නෙ ඒකටයි අංජු....."

"අපිට ඉක්මනින්ම ගෙදර යන්න හම්බ වුනානම්"

"ඇයි දෙවියන් අපිව මේ විදියට කොටු කරන්නෙ....."

"දෛවය වෙනස් කරන්න අපිට බැහැ ශාන්"

"දෛවය අනුව අපිට වෙනස් වෙන්න බැහැ අංජු"

"ඔයා ගිහින් කෑම කන්න"

"ඔයාට මොනවද වෙන ඕන කරන්නෙ ?"

"මොකවත් නැහැ. මම ටිකක් නිදගන්නම්"

"එහෙනම් ලස්සන හීනයක් බලන්න" මම සිනහසෙමින් කීවෙමි.

"මොකක්ද බ්‍රින්දවන් එක්ස්ප්‍රස්ද ?"

"ඒ හීනෙ තමයි මේ සැබෑ වුනේ"

ඇය දෙතොලට සිනහවක් නගමින්ම දෑස් පියා ගත්තාය. මා ආහාර ගෙන යළි ආපසු එන විටත් ඇය සිටියේ නිදාගෙනය. වෙන කල හැකි දෙයක් නැත. මම සුද්දාගේ දිනපොත ගෙන එහි පිටු පෙරළා බැලීමි.

මට උවමනා වූයේ ඔහු පවසා තිබූ ස්ටුවර්ට්ගේ හතරවෙනි බිරිඳගේ සොහොන් කොත පිළිබඳ විස්තර සටහනය. ඔහුගේ තොරතුරුවල අන්තර්ගත සත්‍යතාවය මතු කරගැනීමට ඇති එකම සාක්ෂිය ඒ සොහොන් කොතය. අංජු හොඳ හැටි නිදිය.

මම කාමරයේ දොර වසා දමා සාලයට ආවෙමි. කිසිවෙකුත් පෙනෙන්නට නැත. ආහාර ගැනීමෙන් අනතුරුව සොලමන් යුවළගේ පුරුද්ද මදක් නිදගැනීමය. මම දොර සෙමින් අඩවල් කොට එළි පිටතට ආවෙමි. සටහන අනුව සොහොන් කොත වෙත යායුතුව තිබුණේ නිවසේ වම් පසිනි. මම ඒ අනුව පිටුපසින් වැටී ඇති තුඹ අඩි පාරක් දිගේ ගමන් කළෙමි. ඒ අඩි පාර වැටී තිබුණේ කුමන ස්ථානයකටදැයි මම නොදනිමි. එහෙත් මට යමක් පැහැදිලිය.





සුදු ජාතිකයා පමණක් නොව තිලිප්පන්ගේ සගයන්ද මේ පාර ප්‍රයෝජනයට ගෙන ඇති බවය. ඇතැම් විට ගෝත්‍රික ගම්මානයට යන්නේද මේ පාරෙන් විය යුතුය. නිවස ඉදිරිපසින් ඇත්තේ, අප මෙහි ආ පාර වුවද, සුදු ජාතිකයාගේ සටහනෙහි ඒ පාර සඳහන් වී නැත. මා මද දුරක් ආ විට ඔහු පවසා ඇති ගරා වැටුණු ගල් බිත්ති දෙක මට දැකගත හැකි විය.

මම ඒ අසලින් තවත් දුරක් ගමන් කළෙමි. ඔහු කී සොහොන මට හමුවිය. අතරින් පතර කැලෑව වැවී තිබුණත්, වරින්වර ඒ අසලින් ගමන් කිරීමක් සිදු වී ඇති බැවින් මට එහි ලගාවීම එතරම් දුෂ්කර නොවීය.

මා මුලින්ම කලේ සොහොන වැසී තිබූ වැල් ගලවා දැමීමය. අනතුරුව සිමෙන්ති ලෑල්ල පාදගත් මම එය හැකිතරම් වෙර දමා ඔසවා පසෙක තැබීමි.

ඔහුගේ සටහන් පරිදි ගඩොලින් තනන ලද කුහරය මට හමු විය. එහෙත් එහි තැන්පත් කොට තිබූ අළු බඳුන නොවීය. එය එසේනම් සුදු ජාතිකයාගේ සටහන නිවැරදිය. මම යළි කොන්ක්‍රීට් ලෑල්ල ඔසවා ඒ හිස් කුහරය වසා දැමීමි.

දැන් තවත් බලා සිටිය යුතු නැත.

වහාම සුදු ජාතිකයාගේ සිතියම අනුව ඒ ගමන යායුතුය. එක් අතකින් බලන කල ටජානිගේ ආත්ම ගැලවුම සේම, අපේ නිදහස්වීම ඇත්තේද ඒ ගමන තුළය. එහෙත් එතරම් දීර්ඝ ගමනක් යාමට අංජුට දැන් හැකියාවක් ඇත්ද ? ඇය ඉක්මණින් සනීප කරගත යුතුය.

මා ආපසු යාමට හැරෙනවාත් සමගම මා දුටුවේ මා ඉදිරිපසින් සිටින ගෝත්‍රිකයින් තිදෙනෙකි. ඔවුන් හැම එකෙකුම අතේ දුන්නක් ඊතලයක් සහ පොරවක්ද තිබිණ. යටිකය වසා කෙටි ඇඳුමක් ඇඳ සිටි ඔවුන්ගේ ශරීරයේ රතු සහ සුදු ආලේප තවරා තිබිණ.

මට කල හැකි කිසිවක් නොවීය. ඔවුන් කුමක්දෝ භාෂාවකින් කතා කල අතර ඒ කිසිවක් මට නොතේරිණ. මම අතින් සංඥා කොට යමක් කියන්නට උත්සාහ කළෙමි.

එහෙත් ඔවුන් එය තේරුම් ගත් බවක් මට නොහැඟිණ. ඔවුන් මා අල්ලා ගැනීමට සැරසෙත්ම මා කළේ ඔවුන්ගෙන් බේරීමට හැකි

http://e-pusthakalaya.blogspot.com



තරම් වේගයෙන් පසු නොබලා දිව්වමය. ඔවුන් මා පසු පස ලුහු බැඳිං දිව ආහ.

කෙතරම් වේගයෙන් දිව ගියත්, අවසානයේදී මට සිදුවූයේ ඔවුන්ගේ ග්‍රහණයට හසු වීමය. මා කෙතරම් දැඟලුවත් කෑ ගැසුවත් ඔවුන් මා අතහැරියේ නැත. ශක්තිමත් වැල්පට කිපයකින් මාගේ දෑත් දෙපා බැන්ද. ඔවුන් මා ලී දෙකක තබා ඔසවා ගත්තේ මට කවර යමක් කියන්නට තබා සිතන්නටවත් ඉඩ නොතබාය.

අනේ දෙවියනේ ! මා නැවත වරක් ගෝත්‍රිකයින්ට කොටු වී... පසුගිය කාලයේ මා ගෝත්‍රිකයින්ට කොටු වී වින්ද දුක් හිරිහැර මෑ... මතකය. මා ඉන් ගැලවී පලා ආයේ ගෝහිට පිංසිද්ධ වෙන්නටය. ඒ... මගේ තනියට අංජු සිටියාය. අද මා ගෝත්‍රිකයින්ට මැදිවූයේ තනිවමය.

මා කුදලාගෙන ඔවුන් යන්නේ කොයිබකටද ? මම හාත්පස... ඇස් කරකවා බැලිමි. මා දුටුවේ රූස්ස ගස් වලින් වෙලී ගිය පරිසරයත් දීප්තිමත්ව හිරු එළිය හැඟී ඇති අහසත්ය.

අව්රශ්මිය මගේ මුවට වැටෙත්ම, මට දෑස් ඇරගෙන සිටීම අපහසු විය. මම දෑස් වසාගෙන උදව් ඉල්ලා කෑගැසීමි. එහෙත් මගේ හඬ මා අවටම රැව් දුන්නා මිස, එය කිසිවෙකුට ඇසෙන්නට නැත. මම තනිවීමි.

ඔවුන් කොපමණ දුරක් මා රැගෙන ආයේදැයි මම නොදනිමි. අවසානයේදී ඔවුන් ගමන නතර කලේ, පිදුරු සෙවිලි කොට කටු මැටි ගසා සාදන ලද කුඩා ගෙවල් රාශියක් මැදිකොට ගත් මිදුලක් මැදය.

කිසිවෙකු ඝාණ්ඨාරයක් වැනි යමක් ශබ්ද කරනු මට ඇසිණ. ඒ සමගම ගෝත්‍රිකයින් රාශියක් අවුත් මා වටකොට ගත්හ. ඔවුන් සියළු දෙනාම පිරිමින් වූ අතර, ඔවුන් හැඳ සිටියේ කුඩා රෙදි කඩක් පමණි.

මිදුලේ වූ මැටි පොළවක් මත මා තැබූ ඔවුන් මා වට කොට ගත්තේ අව් අමෝරාගෙනය. ඔවුන්ගේ මුහුණුවල රැඳී තිබුණේ රකුසු පෙනුමකි. මුහුණුවල තවරා තිබූ සුදු රතු ඉරි සහිත ආලේප නිසා ඒ පෙනුම වඩාත් බියකරු විය.





තවත් මොහොතක් ගතවෙද්දී අං තට්ටුවක් වැනි හිස් ආවරණයක් පැළඳි හැඩි දැඩි මිනිසෙකු අවුත් මා පරීක්ෂාවට ලක් කළේය. ඔහුගේ බැල්ම තියුණු විය.

මොහොතකින් ඔහුගේ මුවට කෝපය ආරූඪ වෙනු මට පෙනිණ. ඔහු යමක් පිරිසට පවසා ආපසු යන්නට ගිය අතර, මා ඔසවාගත් සිව්දෙනෙකු වට යාර සියයක් පමණ දුරින් පිහිටි කොටුවකට මා රැගෙන ගියහ.

මා සිතන හැටියට ඒ ඔවුන්ගේ සිර මැදිරිය විය යුතුය. ශක්තිමත් ලී දඬුවලින් මුළු වටේම අසුරා තිබූ එහි වහල මුළුමනින්ම ආවරණය කොට තිබුණේ පිදුරුවලිනි. බිම අතුරා තිබුණේද පිදුරුය.

මා එහි ඇතුලට දමා වැසූ ඔවුන් යන්නට ගියහ. මා මගේ මුළු ජීවිතේම පළමු වතාවට සත්ව කූඩුවක් වැනි සිර මැදිරියක තනි විය.

මට අංජු සිහිවිය. ඇය සිටින්නේ කොහේ ඇද්දැයි. ඇය අවදි වූ පසු මා සොයනු ඇත. මා නිවසෙහි නොමැති බව දැනගත් විට, ඇයට කුමක් සිතෙනු ඇත්ද ? කුමක් හැඟෙනු ඇත්ද ? අනේ දෙවියනි ! මම අහස දෙස බැලිමි. දැවන්ත රාජාලියෙකු මා ඉවකරමින් අහසේ සැරි සරනු දකිත්ම, මා සියළු බලාපොරොත්තු සුන්කර ගනිමින් පිදුරු ගොඩ මත ඇද වැටුනෙමි.

http://e-pusthakalaya.blogspot.com



බෙරහඬ ඇසිණ. ඈත ගිනි මැලයකින් අහසට
විහිදුනු ගිනි සිළු සුළගේ ලෙලදෙනු පෙනිණ.
තිදෙනෙකු ආයේ ඒ ගිනි මැලය වෙත මා රැගෙන යාමටය.
ඒ ඔවුන් මා ගිනි මැලයට දමන්නට විය යුතුය.
අනේ දෙවියනේ ! මම දෑතින්ම මුහුණ වසා ගතිමි.



7

බෙර හඬ නොනවත්වාම නැගී ආයේය. අවට අඳුරින් ගිලගෙන තිබුණද, ඈත විලක්කුවලින් පැතිරුණු ආලෝකයේ සෙවනැලි මා සිටි සිරගෙය අසලටද වැටී තිබිණ. අඳුර වැටී ගෙන එන මොහොතේ සිට, කුඩා කාමින්ගෙන් මට විඳින්නට ලැබුණේ අසීමිත හිරිහැරයකි. ඔවුන්ගෙන් බේරීමට මම කෙතරම් උත්සාහ කළද එලක් නොවීය. අවසානයේදී මා කළේ කිසිවක් කරකියාගත නොහැකිව සෑ ගැසීමය. ඒ හඬට දෙතුන් දෙනෙකු කූඩුව අසලට දිව ආහ. මම ඔවුනට කාමීන් පෙන්වමින් සංඥා මාර්ගයෙන් යමක් කීමට උත්සාහ කළෙමි. ඔවුන් එය තේරුම් ගත්තාක් සේ කූඩුව අසලම පිදුරු ගොඩගසා කුමක්දෝ කොළ ගොඩක් ගෙනවුත් එයට දැමූහ. මොහොතකින් ඒ ගිනි ගොඩින් නැගුණේ විශාල දුමකි. එය කෙතරම් සැරවීදයත් මගේ ඉහමොළ රත් වී කැස්ස පවා හට ගත්තේ මට හුස්ම ගැනීම පවා අසීරු කරමිනි.





කාමින්ගෙන් සිදුවන හිරිහැරය එතකින් අවසන් විය. එහෙත් මගේ කැස්ස තව තවත් දරුණු විය. මා කූඩුවේ පොලු වැරෙන් අල්ලාගෙන කහිනු ගෝත්‍රිකයෝ පිටතට වී විමතියෙන් බලා සිටියහ. තවත් මොහොතකින් මගේ කූඩුව අසල විලක්කුවක් දල්වා ඔවුන් යන්නට ගියහ.

රාත්‍රිය ළඟාවෙනු මට දැනිණ. මට දැනුනේ පිපාසයි බඩගිනි. මුළු රැයක් මා මේ පිදුරු ගොඩ මත ගතකරන්නේ කෙසේද ? අධික කුස ගින්නක් ඒ අතර මට දැනිණ. එහෙත් මා කෑම ඉල්ලන්නේ කවරෙකු ගෙන්ද ? එකා දෙන්නා මිදුලට අවුත් මා දෙස අරුම පුදුම සතෙකු දෙස බලන්නාක් සේ මදක් බලා සිට යන්නට ගියහ. මා ඔවුන් සමග සිනහාසුනද ඔවුන් මා හා සිනහාසුනේ නැත. මම බොහෝ වේලාවක් කූඩුවේ පොලු අල්ලාගෙන කුඩා කුටි දෙස බලා සිටියේ ඉන් පිටතට එන කිසිවෙකුගෙන් හෝ උදව්වක් ඉල්ලීමටය.

ඒ ටික වේලාව පවා ගතවුනේ කල්පයක් ලෙසිනි.

යළිත් බෙර හඬ ඇසිණ. ගිනි මැලය වටයටම ඈත දැල්වෙනු පෙනිණ. එකා දෙන්නා ගිනි මැල වටා අඩුප් වාඩි වෙන්ම. ඝාන්ධාර නාදය වැනි ශබ්දයක් කණ් දෙදරවමින් ඇසී ආවේය. ඒ සමගම පිදුරු කුටි තුළින් පිටතට ඇදී ආයේ ගැහැණුන්ය. ඔවුන් මා මුලින් දුටු ගෝත්‍රික ගැහැණුන්ට වඩා වෙනස් වූයේ ඔවුන් හැම දෙනෙකුම පාහේ රතු පැහැති වස්ත්‍ර හැඳ සිටි බැවිනි.

කොපමණ පිරිසක් එහි සිටියේදැයි මම නොදනිමි. මොහොතින් මොහොත කුඩා දරුවන්ද සමග ඔවුන් ගමන් කළේ ගිනි මැලය වෙතය. තවත් වේලාවක් ගතවන විට සෑහෙන පිරිසක් ඒ ගිනි මැලයට එක් වූහ. අනතුරුව තිප දෙනෙකුම බෙර වයමින් මා සිටි කූඩුව අසලට අවුත් නටන්නට පටන් ගත්හ. ඉන් එක් අයෙකු මගේ කූඩුවේ දොර හැරියේය.

ඔහු යමක් කීවද එය මට නොතේරිණ. මා බලා සිටිද්දීම අනෙක් දෙදෙනා අවුත් මගේ දෑතින්ම අල්ලා ගත්හ. අනතුරුව ඔවුන් මා රැගෙන ගියේ ගිනි මැලය අසලටය. එහි විශාල මැස්සක් මත නායකයා වාඩි වී සිටියේය. ඒ මහලු මිනිසෙකි. ඔහු පැළඳ සිටි ගෝත්‍රික ඔටුන්න සාද තිබුණේ, මුව හෝ ගෝන අං වලින් විය යුතුය. ඔහු කරවටා පැළඳ සිටියේ සතව දත් වලින් තනන ලද මාලයකි.



Reader's Place Novel..

http://e-pusthakalaya.blogspot.com



ඔහු ඉදිරියට ගෙන ගිය මා ඒ මැස්ස අසල වූ කුඩා බංකුවක් මත මට හිඳගන්නට සැලැස්විය. අනතුරුව නායකයා මගෙන් ප්‍රශ්න කිහිපයක්ම ඇසුවද මට ඒ කිසිවක් නොතේරිණ. මා කලේ සොලමන් මහතාගේ නිවස පිහිටි දිසාවට දෑත් දිගු කරමින් මට තේරෙන භාෂාවෙන් කතා කිරීමය. ඔවුන් එය තේරුම් ගත්තේදැයි මම නොදනිමි. කෙසේ වෙතත් ඔවුන් මට අනතුරක් නොකරන බව වැටහුනේ විශාල මැටි බඳුන් කිහිපයක බහාලන ලද, පුළුස්සන ලද මස් හා අල වර්ග කීපයක්ම ගෙනවුත් මා ඉදිරිපිට තබත්මය.

ඒ මගේ ආහාර විය යුතුය. පුළුස්සන ලද මස්වලින් වහනය වූ දුර්ගන්ධය නිසා මා කීපවරක්ම නාසය වසා ගත්තේ මහත් අප්‍රියක් මට ඒ මොහොතේ දැනුනු බැවිනි. ඔවුන් ඒ මස් විශාල අල කොළයක් වැනි යමක තබා මට පිළිගැන්වූවද, මා හිස සැලුවේ මගේ අකමැත්ත ප්‍රකාශ කරමිනි. එහෙත් ඔවුන් කෝප වෙතැයි බියෙන් තම්බන ලද අල ගෙඩි දෙක තුනක් මම ආයාසයෙන් ගිල දැමුවෙමි.

The Reader's Place novel..

නැටුම පටන් ගත්තේ මා කන අතරය. කොණ්ඩයේ හා ගෙලෙහි මල් පැළඳ ගත් තරුණ කෙල්ලන් කීප දෙනෙකුම ඒ නැටුමට එක් වූහ. ඔවුන් වහල් කඳවුරේ වහලුන් සේ අප්‍රසන්න නොවූ අතර, අවලස්සනද නොවූහ. ඉන් එක් කෙල්ලක් මා දෙස බලා ඇස් පොඩි කරමින් සිනහවක් පෑවාය. පිරිස අතර සිටි ලස්සනම කෙල්ල ඇයයි.

කොණ්ඩයේ මල් ගසා රතු පැහැති හැට්ටයක් හා දිග සායක් හැඳ සිටි ඇය මා වෙත අවුත් මැටි බඳුනක වූ දියර වර්ගයක් පිළිගැන්වූයේ මට නැටුමටද ආරාධනා කරමිනි.

මැටි බඳුනේ වූ දියරය මා බීවේ ඔවුන්ගේ පෙරැත්තටය. එය කොළ වර්ගයක් මුසු කොට පැණි රස එකතු කොට සාදන ලද රසවත් පානයක් වූ හෙයින්, මට එය අප්‍රසන්න නොවීය. එහෙත් තවත් මොහොතකට පසු කිසියම් මත් බවක් මට දැනිණ.

එය මත්පැන් වර්ගයක් බව මට වැටහුනේ මගේ හිසද බමන්නට වූ බැවිනි. මම මොහොතක් වේලා නිහඬව සිටියෙමි. එහෙත් නැටූ කෙල්ලක් මා ඇදගෙන මිදුලේ මැදට ගියේ නායකයාගේ අණ පරිදිය.



සතුට ඔබේ කඳුලක් නම් සුනිල් රෝහණ

බෙර හඬ දිගින් දිගටම ඇසිණ. කල්දේරමක් වැනි භාජනයේ වූ මත්පැන් යයි සිතිය හැකි දියර වර්ගය පොරකකා බොමින් කාන්තාවන් මෙන්ම පිරිමින්ද නැටුමේ ප්‍රීති ඝෝෂා නගමිනි. ඔවුන් එසේ ප්‍රීතිවූයේ ඇයිදැයි මම නොදනිමි. මගේ පැමිණීම ඔවුන්ගේ සතුටට ඉවහල් වීද ? මට එය තේරුම් ගත නොහැක.

නැටුම අවසන් වීමට තවත් හෝරාවක් ගතවන්නට ඇත. අනතුරුව, එතැනට ගෙන ආයේ මිනී ඇට සැකිලි කීපයකි. එය නායකයා සිටි මැස්ස මත තබත්ම ඔවුන් සියළු දෙනාම මහත් හඬින් අඳෝනා නගන්නට වූහ. බොහෝ දෙනෙකු ඔවුන් පැළඳ සිටි මල් මාලා මෙන්ම වරලස ගසා සිටි මල්ද ඒ ඇට සැකිලි මතට දැමූහ.

නායකයා ඒ අතර මා වෙත පැමිණියේය.

ඔහු ඇට සැකිලි දෙසට ඇඟිල්ල යොමු කරමින් යමක් කීවද මට එය තේරුණේ නැත. මුළු බිම් තලයම ආලෝකමත් වෙද්දී ඔවුන් නැවත ගී කියමින් නැටූහ.

ඒ නැටුම අවසන් වූයේ ඔවුන් සියළු දෙනාම අධික වෙහෙසට පත් වීමෙන් අනතුරුය. ඉන්පසු හැඩි දැඩි පිරිමි කීප දෙනෙකුම අවුත් මා ඔසවා ගත්හ.

මා නායකයාගෙන් කීපවරක් ඒ ගැන විමසූ විට ඔහු අතින් සංඥාකොට කී දෙයින් මට වැටහුනේ මා රැගෙන යන්නේ අනතුරකට නොවන බවය. අනෙක් අතට ඔවුන් මා ඔසවා ගත්තේ මට ගෞරවයක් ලෙසය.

ඔවුන් මා රැගෙන ගියේ විශාල ගල්ලෙනක් වෙතය. එය තාපසයෙකුගේ වාස භවනයකි. තාපසයා ඉදිරියේ මා තැබූ හැඩි දැඩි මිනිසුන් දෙපසට වූයේ තාපසයාට හිස නමා ආචාර කරමිනි.

ඔහු මගෙන් යමක් ඇසුවේය.

මම ඔහුට භාෂාව නොතේරෙන බව කී විට ඔහු සංඥා මාර්ගයෙන් ඇසුවේ මගේ භාෂාව කුමක්ද යන්න විය යුතුය. මා දෙමළ භාෂාවෙන් කතා කල විට ඔහු මඳ සිනහවක් පෑවේ මා පුදුමයට පත් කරමිනි.

http://e-pusthakalaya.blogspot.com



"උඹට අනතුරක් නැහැ" ඔහු දෙමළෙන් කීය.

"උඹට ඒ අය හොඳින් සලකාවි. ඒ ගොල්ලන් අතරට අළුත් අය එනවට ඒ අය කැමතියි." ඔහු හැඩි දැඩි පිරිමින් දෙදෙනාට යමක් කීය. ඔවුන් ඉන් පිටව ගොස් ආපසු එතැනට ආයේ වයස අවුරුදු හය හතක් පමණ වූ දරුවන් තුන් දෙනෙකුද රැගෙනය.

"මේ ස්ටුවර්ට් දුන්න ළමයි..... සොලමන් දුන්න ළමයෙකුත් ඉන්නව. එයා තාම කිරිබොන දරුවෙක්. මේ දරුවන්ට ඒ ගොල්ලො සලකන්නෙ දෙවියන් දුන්න, දරුවො හැටියටයි. ගෝත්‍රිකයො අමුත්තො පිළිගන්නෙ ඒ ගොල්ලන්ට දෙවියො එවන දූතයො හැටියටයි."

"ඔබතුමා කොහොමද දෙමළ දන්නෙ..... ?" මා ඇසුවේ කිසියම් කුතුහලයකින් යුතුවය.

"මෙහාට ආපු අමුත්තන්ගෙන්..... සොලමන් මට හොඳට දෙමළ කියල දුන්න....."

The Reader's Place novel..

සොලමන් මහතා ගෝත්‍රිකයින්ගේ විශේෂ චරිතයක් බව මට වැටහුනේ පූජකයා විසින් හෙළිකල තොරතුරු අනුවය. මා ඔහුගෙන් ප්‍රශ්ණ කිපයක් අසන්නට උත්සාහ කලද ඔහු තව දුරටත් කතා කිරීම ප්‍රතික්ෂේප කලේය. ඒ වෙනුවට ඔහු කලේ මා ඉදිරියේ වූ කුඩා ගිනි මැලයට කිසියම් කුඩක් දමා ගොරෝසු හඬින් ස්තෝත්‍ර කීමට පටන් ගැනීමය.

මොහොතකින් ගිණි මැලයෙන් නැගී ආ දුම මා අවට පැතිර ගියේය. එහි වූයේ අසීමිත සුගන්ධයකි. ඒ සුවඳ මා මුසපත් කරමින් මගේ ඇට මස් නහර හරහා ඇදීයන්නාක් සේ මට දැනෙද්දී, පූජකයා විසින් ඉසින ලද කහ පැහැති දියරයකින් මා නැහැවී ගියේය. අනතුරුව ඔවුන් මා කැඳවාගෙන ගියේ පොකුණක් වැනි ස්ථානයකටය. එහෙත් එහි වෙනසකට වූයේ ජලනලයකින් වතුර පහරක් අවුත් පොකුණ උතුරා යනසේ ජලය ගලා යෑමය. මා ඒ පොකුණ දෙස බලා සිටිනු දුටු ඔවුන් මා අල්ලා බලයෙන්ම ඒ තුළට බැස්සවිය. මට කිසිවක් කරකියාගත නොහැකි විය. අධික ශීතලක් මට දැනිණ. පොකුණ එතරම් ගැඹුරු නොවූ බැවින් දෙවියන්ට පින් සිද්ධ වෙන්නට මා ගිලුනේ නැත.





මා ඉන් ගොඩ වූයේ ඇඳ සිටි ඇඳුම්වලින් තෙත බේරෙද්දීය. රතු පැහැති රෙදි කඩක් ඔවුන්ගෙන් මට ලැබිණ. ඒ මගේ ඇඳුම් මාරුකර ගැන්මටය. වෙන කලහැකි දෙයක් නොවූ බැවින් මා කලේ තෙත බේරෙන ඇඳුම් පසෙක ලා, ඒ රෙදිකඩ සරමක් සේ හැඳ ගැනීමය.

අනතුරුව මා ඔවුන් රැගෙන ගියේ ගල්ලෙනේ තවත් පසෙකටය. එහි විවරවූ විශාල සිදුරක් තිබිණ. සිහින් කොළ පැහැති ආලෝකයක් ඉන් ගලා ආවේය. ඒ ඇතුලත ඔවුන් මා දමා දොර වසත්ම, ඒ කුටිය තුළ මා තනිවිය.

සිහින් විවර කිපයක්ම එහි විය. ඒ ඇතුලත සඳ එළිය ගලා ආයේ කොළ පැහැති ආලෝකය හා මිශ්‍ර වෙමිනි. මම වටපිට බැලීමි.

සිහින් හඬින් ගෙජ්ජි වැනි යමක් සෙලවෙනු මට ඇසිණ. ඒ සමගම කුඩා දරුවෙකු හඬන හඬ ඇසිණ. ඒ හඬ නැගී ආයේ ඒ කුටිය අභ්‍යන්තරය තුළිනි. මම ඒ දෙසට ගමන් කලෙමි. පන්දමක් එහි කෙලවරේ දැල්වෙමින් තිබිණ. සත්ව හමකින් සැදුනු කොට්ටිල්ලක් වැනි යමක් පද්දමින් ඒ අසල සිටියේ [illegible] දුටු සුරූපි කෙල්ලය. මා දකින්ම ඇය දසන් දක්වා සිනහවක් පෑවාය.

මා ඒ අසලට යත්ම, ඇය ඇඟිල්ල දිගුකොට ඒ ළදරුවා පෙන්වමින් මට යමක් හඟවන්නට උත්සාහ කළාය.

"සො..... ල ..... මන්..... සොල ..... මන්....." ඇය කැඩිච්ච වචන කිපයක් කියමින් මහත් ආඩම්බරයකින් සිනහවක් පෑවාය. මට කාරණය තේරුම් ගැනීම එතරම් අසීරු නොවීය.

"දෙවියෝ සාක්ෂි....." මට කියවුනේ ඉබේටමය. මම ආපසු හැරී ගල්ලෙනේ ඉදිරිපසට ආවෙමි. සිහින් ගී රාවයක් ඇසිණ. ඒ ඇය දරුවා නලවන හඬය. මා දොර දෙසට ගියද එය වසා දමා තිබිණ.

මා දැන් කරන්නේ කුමක්ද ?

මට මින් පිටවිය නොහැක. පිටවූවත් යා හැකි අතක් නැත. මම කුහරයෙන් පිටත බැලීමි. සඳ එළිය හාත්පසම වැටී තිබිණ. මුළු පරිසරය තුළින්ම නැගී ආයේ දැඩි නිසලතාවයකි. පිදුරු කුටි වැනි ගෙවල්වල කිසිදු ආලෝකයක් දක්නට නොලැබිණ. දැන් වේලාව කීයදැයි මම නොදනිමි.

http://e-pusthakalaya.blogspot.com



ඔයාට දෙනාම දැඩි හිතුණේ විය යුතුය.

මට අප්පු මතක් වෙයි. සියුම් වේදනාවක් මට දැනේ. මා ඇය තනිකළ මුල්ම අවස්ථාව මෙයයි. වරක් ගෝනි ඇය රැගෙන කෙළ් එක රැයක් මා තනිකරද්දී, මට දැනුනු වේදනාව මම දනිමි. මට දැන් සිතෙන්නේ ඇය මගේ වේදනාවේම කොටසක් බවය. ඇගෙන් වෙන්ව මට සිටිය නොහැක. එවැනි හැඟීමක් මට දැන් දැනෙන්නේ ඇයි ?

සිහින් ගෙජ්ජි හඬක් ඇසී මම හැරී බැලුවෙමි. ඒ ඇයයි. ඇය මා දෙස බලා සිනහවක් පෑවාය.

මින්ගි.....මින්ගි....." අනතුරුව ඇය තමා හඳුන්වා දුන්නේ පපුවට අත තබමිනි.

මේ සොලමන්ගේ ඇසුරෙන් ඇය ලැබූ ආභාෂය විය යුතුය. විලක්කු එළියෙන් හා සඳ එළියෙන් නැහැවුනු ඇගේ ප්‍රභාසම්පන්න මුව මට පෙනේ. ඇගේ ගතින් හමා එන්නේ මල් සුවඳක් වැනි සුවඳකි. ඇගේ දෑස්වල මත් බවක් ඒ දෑස් මත් බවෙන් යන්තමට පියවෙන අයුරුත් දකිත්ම, මා තුළ ඇතිවූයේ කිසියම් නොසන්සුන් තාවයකි.

මම හිස වනා ඇය ප්‍රතික්ෂේප කරන බව ඇඟවීමි. ඇය මගේ අදහස නොතකාම ගොස් සම් ඇතිරිල්ලක් එළා එහි වැතිරුනාය. අනතුරුව ඇය උඩුකයේ වූ ඇඳුම ගලවා දැමුවේ මා බලා සිටිද්දීමය. ඇගේ පිරිපුන් ලය උස් පහත් වෙනු මට පෙනිණ. මට අප්පු මතක් විය. අරුණි මතක් විය. මම හැඟීම් මැඩගෙන දොර දෙසට දිව ගියෙමි. මගේ වාසනාවට එය අගුළුලා නොතිබිණ. මම දොර ඇරගෙන තාපසයාගේ අසපුව වෙත ආවෙමි. එහි විලක්කුවක් දැල්වුනද කිසිවෙකු පෙනෙන්නට නොවීය. මම අසපුවෙන් නික්ම මිදුලට එත්ම බල්ලෙකු උඩු බුරලන හඬ ඇසිණ. ඒ සමගම දිප්තිමත් සඳ එළියෙන් පාවී ආ ජායාවක් මගේ නෙත ගැටිණ.

ඇය සුදු දිග සායක් හැඳ සිටියාය. ඇගේ හිසෙහි වූයේ තොප්පියකි. සාය දෙපසින් අල්ලාගෙන මා ඉදිරියට ආ ඇය මට යාර දහයක් පමණ දුරින් නැවතුනාය.

ඒ වජානි යැයි මට සිතිණ. මගේ මුළු ගතම සීතල වී ගියේය. මගේ දෑස් මහත් විය.





"මගේ පස්සෙන් එන්න ශාන්" ඇය කියනු සිහිනෙන් මෙන් මට ඇසිණ. ඇය ආපසු හැරුනාය. ඇය ගමන් කළේද නැතිනම් පාවී ගියේදැයි මම නොදනිමි. බල්ලෙත් උඩු බුරලන්නට පටන් ගත්තේ ඇගේ පැමිණීමට විය යුතුය.

විය යුත්තක් වේවායි සිතමින් මා කළේ ඇය පසුපස ගමන් කිරීමය. සඳ එළියේ ඒ අඩි පාර මට යන්තමට පෙනිණ. ඇය වේගයෙන් ගොස් මදක් නැවතුනාය. මම ඇය අල්ලා ගැනීමට මෙන් ඇය ගිය අඩි පාර ඔස්සේ දිව ගියෙමි. කොපමණ දුරක් මා එලෙස දිව ගියේද, කොපමණ වේලාවක් ඒ සඳහා ගත වූවේදැයි මම නොදනිමි.

මට තවත් යාගත නොහැකිව මා අසරණ වූ විට මම නැවතුනෙමි. මගේ දෙපා අප්‍රාණික වී ගියේය. මගේ දෑස් පියවී ගියේය. මම මහත් ආයාසයක් ගෙන මගේ දෑස් අන්ධකාර වේගන එනතුරු ගමන් කළෙමි.

ගස්වැල්වලට මගේ දෙකකුල් සිරෙන්නට ඇත. මා කිපවරක්ම වැටෙන්නට ගොස් බේරුණේ අනූ නවයෙනි.

එහෙත් ඒ සටන කෙටි විය.

මා කොහේදෝ ඇද වැටෙනු මට දැනිණ. මගේ දෑස් අන්ධකාරයෙන් වැසී තිබිණ. මා කීපවරක්ම ඒ දෑස් විවෘත කරන්නට උත්සාහ කලද ඇස් පිහාටු මත විශාල බරක් ඇත්තාක් සේ මට දැනිණ. කිසිවෙකු මගේ හිස පිරිමදිනු මට දැනිණ. මා අසල කිසිවෙකු දැවටී දැවටී සිටින්නාක් සේ මට හැඟිණ.

"වජානි....." මම සිහින් හඬින් කීවෙමි.

"ශාන්....."

"ඔයාට මම කියන දේ ඇහෙනවද ?"

"ඔව්....."

"මට කිසිම දෙයක් පේන්නෙ නැහැ"

"ඔයාට මාව බලන්න බැහැ ශාන්..... ඔයාට බලන්න පුළුවන් මගේ ජායාව විතරයි....."

http://e-pusthakalaya.blogspot.com



"ඒ ඇයි..... ?"

"ඒක මගෙන් අහන්න එපා....."

"බැහැ ටජානි..... ඔයා මගේ ඇස් වහගෙන ඉන්නෙ ඇයි ?"

"ඒ ඔයාට මාව පේනවට....."

"ඒ වුනත් ඔයාව මට සිහිනෙන් වගේ පේනව"

"අපිව දකින්න පුළුවන් මනසින් විතරයි....."

"මට යන්න දෙන්න ටජානි"

"අංජු ලගටද ?"

"ඔව්....."

"එයා ලගට මට ඔයාව එක්කගෙන යන්න බැහැ. මට එච්චර ශක්තියක් නැහැ..... ඒත් අංජු තාම අඬනව. මට ඔයාට උදව් කරන්න බැහැ....."

"ටජානි මම ඔයාව ඔය ආත්මයෙන් මුදවනව"

"ඔයාට ස්තුතියි ශාන්....." ඇය මගෙන් ඉවත්ව යන්නාක් සේ මට හැඟිණ. මම දෑස් ඇරියෙමි. සඳ එළියෙන් ඈත එපිට නිවසක සේයාවක් පෙනිණ.

ඒ වෙනකක් නොවේ. සොලමන් මහතාගේ නිවසය. මම මහත් ආයාසයක් ගෙන වැටී හුන් තැනින් නැගී සිටියෙමි.

සඳ එළිය හා මුසුව අහසේ දහස් ගනන් තරුවලින් නැගුණු දීප්තිය පොළව සිපගෙන තිබිණ. මම සෙමින් සෙමින් ගේ දෙසට ගමන් කළෙමි.

ගෙයි ලාම්පු දැල්වෙමින් තිබිණ.

ටජානි තරප්පු පෙළ අසල ගුලි වී වාඩි වී සිටිනු මට පෙනිණ. මා නතර වූයේ සිහින් තිගැස්මක් මා තුළ ඇති වූ බැවිනි. මගේ හදවත ගැහෙන හඬ මට ඇසිණ. මා ටජානි පසු පසින් ගමන් කළේ





ප්‍රියවී සිහියකින් නොවේ. එහෙත් ප්‍රකෘති සිහිය ලැබෙත්ම මගේ සතුට එක්කල බිය නිසාම මට කෑගසුනේ ඉබේටමය.

"අනේ දෙවියනේ !"

මොහොතකින් ලාම්පුවේ දැල්ල වැඩිවෙනු පෙනිණ. සාලයේ දෙරටුව තුළින් ආලෝක පටියක් මිදුලට වැටෙත්ම, තරප්පු පෙළ අසල ටජානි පෙනෙන්නට නොසිටියාය.

මගේ මනස අවුල් වී තිබිණ.

සොලමන් මහතාගේ විදුලි පන්දමේ ආලෝකය මා දෙසට එල්ල විය.

"මිථුන්....."

"සර්..... මම හතිලමින් කීවෙමි.

ඔහු මා සමීපයට දිව ආවේය.

"මොකද දෙවියනේ ඔයාට වුණේ..... ?"

මම කතාවකින් තොරව තරප්පු පෙළ නැග ගෙට ඇතුළුවීමි. මා හැඳ සිටි රතු රෙදි කඩ දකිත්ම, සොලමන් මහතාගේ මුව අමුතු විය.

"කෝ අංජු ?" මම යන්තමටම ඇසීමි.

"එයා මුළු දවසම අඬ අඬා ඉඳල කාමරෙත් වහාගෙන නිදගත්ත. අද තෙරේසත් නිදගත්තෙ එයාගෙ කාමරේ"

"සර් මාව ගෝත්‍රිකයො පැහැරගත්ත"

"මට ආරංචි වුනා....."

"මොනව.....?"

"ඊයෙ රාත්‍රියෙම මට ආරංචිය ආව..... ඒත් මම කොහොමද රෑ එන්නෙ....."

http://e-pusthakalaya.blogspot.com

The Reader's Place novel..

http://e-pusthakalaya.blogspot.com



"මම කාටවත් කියන්නෙ නැහැ සර්....." ඔහු මගේ පිටට තට්ටු කළේය.

"හැම දෙයක්ම සිද්ධවෙන්නෙ අපි හිතන විදියට නෙවි. මාව දාල ගල්ලෙනේ දෙර වැහැව්ව විතරක් නෙවි ඒ ගොල්ලො මගේ මනැස මත් දියරයෙන් විනාශ කළා....."

"මට තේරෙනව සර්ගෙ හිතේ තියෙන වේදනාව....."

"මම අදත් ඒ ගැන පසුතැවෙනව"

"මම වජාහිට පොරොන්දු වුනා එයාගෙ ආත්මෙට සහනයක් දෙන්න....."

"ඔව් මිටුන්..... මේ හැම දෙයකම දැන් කෙළවරක් දකින්න ඕන. මට ඉක්මනින්ම මෙහෙන් යන්න ඕන. විශේෂයෙන්ම තෙරේස නිසා..... මිටුන්ට හුඟක් මහන්සි ඇති. ඔය ඇඳුම ගලවල දාල මේ ඇඳුම ඇඳගන්න. ඔයාගෙ ඇඟෙන් තවමත් සුවඳ එනව"

"මගේ ඇඟේ මොනව ගෑවද කියල මට හිතාගන්නවත් බැහැ"

"ඔය සුවඳ යන්න තව දවස් තුන හතරක්වත් යනව"

"දෙයියෝ සාක්කි"

"මොකක්ද කිව්වෙ..... ?"

"අර වචනෙ....."

"ඔයා හැම වෙලාවෙම ඒ වචනෙ කියනව"

"ඔව් සර්..... මට දැන් ඒක පුරුද්දක් වෙලා....."

"ඔයා දැන් මොකක්ද ශාලුට කියන්නෙ..... ?"

"ඒක තමයි මාත් කල්පනා කලේ....."

"දැන් කල්පනා කරන්න යන්න එපා. ඔයාට හුඟක් වෙහෙසයි. ඔයා [illegible] නිදාගන්න. මම සැටියෙ ඉන්නම්....."





"එපා සර්..... මම සාලෙට යන්නම්....."

"නැහැ මිටුන් මගේ හිතට විවේකයක් ගන්න ඕන. මම හිතාගෙන හිටියෙ මෙච්චර කාලයක් ඒක රහසක් වේවි කියල....."

"මාව විශ්වාස කරන්න..... අපි ආයෙත් මුණගැහෙන එකක් නැහැ....."

"මම ඉක්මනට ගමන පිළියෙල කරන්නම්"

"ඕමෝගාවලට ගියොත් අපිට ගෙදර යාගන්න මගක් පෑදේවි"

"ඒක හොඳයි....."

"මම සර්ට වුනු පොරොන්දුව ඊට ඉස්සෙල්ල ඉටුකරනව"

සොලමන් මහතා කාමරයෙන් පිටව ගියේය. මම ඔහුගේ ඇඳ මත වැතිරුණේ විඩාපත් ශරීරයකින් යුතුවය. මොහොතකින් විදුරුවක් ගැටෙන සිහින් හඬක් ඇසිණ. මම හිස ඔසවා බැලිමි.

සාලයේ වූ පුටුවක සොලමන් මහතා වාඩි වී සිටියේය. හැර දමා තිබූ දොරෙන් මා දුටුවේ එහි කොටසක් පමණි. මත්පැන් බෝතලයක් හා විදුරුවක් කඟප්පුව මත තිබිණ.

ඔහු තම මානසික පීඩනය උදෙසා මත් පැනෙහි පිහිට පතන බව මට අමුතුවෙන් සිතිය යුතු නොවීය. මම මින්හිගේ මුව මතකයට නගා ගැන්මට උත්සාහ කලද ඒ සමගම මගේ දෑසට දැනුනේ අධික නිදිබර ගතියකි.

මොහොතකින් මගේ දෑස් පියවී ගියේය.

මා අවදිවන විට සොලමන් මහතා සිටියේ මිදුලේ සක්මන් කරමිනි. මම ඔහුගේම කාමරයේ සිට ඔහු දෙස මද වේලාවක් බලා සිටියෙමි.

මට ඔහු කෙරෙහි උපන්නේ අනුකම්පාවකි. සිතට එකඟව නොකරන බොහෝ දේ හමුවේ විටෙක අප අසරණය. ඇතැම් විට නොකල වරද පවා වරදක් සේ අපට වැටහෙන්නේ, අපේ ආත්ම

http://e-pusthakalaya.blogspot.com



සංයමය නිසාය. තවත් මොහොතක් මා ඒ ලෙන තුළ ගත කළේනම්, මගේ මනැස මතින් අවුල් වී ගියේනම් මට සිදුවීමට තිබුණේද එවන් අවාසනාවන්ත ඉරණමක්ද ? මම කෙසේවත් ඊට එකඟ නොවෙමි, ඉන්පසු උදවන තත්වය කෙබඳු විය හැකිද ?

මම කාමරයෙන් පිටතට ආවෙමි.

හිම්දිරි ආලෝකය වීදුරු කවුළු තුළින් ගේ තුළට වැටී තිබිණ, මා සාලයට අවුත් මඳ වේලාවක් එහි සැටිය මත දිගා වී සිටිත්ම, තෙරේසා දොර ඇරගෙන කාමරයෙන් එළියට ආවාය. ඇය මා දකිත්ම, ඇයට කෑගැසුනේ ඉබේටමය.

"ශාලු..... ශාලු..... මෙන්න මිට්ටුන් ඇවිල්ල....."

මම වහා කාමරයට දිව ගියෙමි. මා දුටු විගස අංජු ඇඳෙන් නැගිටින්නට උත්සාහ කළාය. එහෙත් ඇයට ඒ සඳහා ශක්තියක් නොතිබිණ. මා ඇඳ අසලට යත්ම ඇය මා අල්ලා ගත්තේ හඬා වැළපෙමිනි.

"ශාන් ඔයා කොහේද ගියේ..... ඇයි ශාන් ඔයා මාව දාල ගියේ..... ?"

මා ඇඳමත වාඩිවෙත්ම, ඇගේ හිස මගේ පපුව මත තබා ඉකිගසමින් කුඩා දැරියක සේ තව තවත් හඬන්නට පටන් ගත්තාය.

මම ඇගේ හිස සෙමින් සෙමින් පිරිමැද්දෙමි. තවත් මොහොතකින් ඇය මා අතහැරියේ හැඬීම තදකොටගෙන මා දෙස විශ්මයෙන් බලමිනි.

"ශාන් ඔයාගෙ මුළු ඇඟම සුවඳයි"

මම සිදු වූ සියළු පුවත් ඇය හා කීවෙමි. එහෙත් මම මින්ගි හා සොලමන් මහතා අතර වූ සම්බන්ධය නොකීමට පරිස්සම් වූවෙමි. ඇය ඒ සියල්ල අසා සිටියේ තුෂ්නිම්භූතවය.

"මම කොහොමද ශාන් ඕව විශ්වාස කරන්නෙ..... ?" අනතුරුව ඇය ඇසුවාය.

"ඒක තමයි ලොකුම ප්‍රශ්නෙ..... ඒත් ඇත්ත ඒකයි අංජු"





"ඔයා කියන්නෙ ටජානි අපිට උදව්කරනව කියලද ?"

"ඔව්....."

"කොහොමද ඒක ඔප්පු කරන්නෙ..... ?"

"ඔප්පු කරන්න බැහැ. ඒත් ඔප්පු කිරීමයි පිළිගැනීමයි අතර වෙනසක් තියෙනව. ඇයි අපි දෙවියන් ලඟට ගිහින් පිහිට ඉල්ලන්නෙ, ඇයි අපි අපේ මියපරලොව ගිය අය වෙනුවෙන් දානමානාදි පිංකම් කරන්නෙ..... ? ඒ අපි ඒ අය අදෘෂමානව අපි අතර ඉන්න බව පිළිගන්න නිසා"

ඇය එයට යමක් නොකීවාය.

එහෙත් ඇය යමක් කල්පනා කරනු පෙනිණ.

"අපේ ගමන සොලමන් මහත්තය පිළියෙල කරාවි. ටජානි කැමතියි මේ භූතාත්මයෙන් මිදෙන්න. දැන් තියෙන ලොකුම ප්‍රශ්නෙ කොහොමද අපි යන්නෙ කියන එකයි. මේ තත්වයෙන් ඔයාට යන්න බැහැ"

"මට පුළුවන් යන්න....."

"ඒක දුෂ්කර ගමනක් අංජු....."

"කමක් නැහැ....."

"ඔයාගෙ තවම තුවාල සනීප නැහැ....."

"දැන් ඒ තරම් අමාරු නැහැ....."

"එක දවසට..... ඔයා බොරු නේද කියන්නෙ..... ?"

"එහෙනම් ඔයා හදන්නෙ මාව දාල යන්නද ?"

"අපෝ නැහැ....."

"මම එක තීරණයක් අරගෙන තිටියෙ..... හදිසියෙවත් ඔයා නාවනම් මගේ බලන්න වෙන්නෙ මිහිය"

http://e-pusthakalaya.blogspot.com



"එච්චරටම ඔයා දරුණු වෙලාද ?"

"ඔයා නැතුව මට තවත් ගැලවීමක් ගැන හිතන්න බැහැ"

"දැන්ද මගේ අගේ තේරුනෙ....."

ඇයට යමක් වැරදී ඇති බව වැටහුනේ මගේ කතාවටය. ඇය එය හරිගස්වා ගැනීමට තැත් කළාය.

"මම කටට ආවට කියපු දේවල් ගැන ඔයා ඔය තරම් ඇයි හිතන්නෙ..... ?"

"දැන් ඔයා එහෙනම් කතා කලේ කටට ආපු දේවල්ද ?"

"ඔව්....."

"ඇයි එහෙනම් මාව බඳගෙන ඇඩුවෙ....."

"මම දැයි බඳගත්තෙ....."

"එහෙනම් මමද ?"

"ඔව්....."

"එහෙනම් දේවි මේක දැනගත්තොත් මට මොනව කරයිද දන්නෙ නැහැ....."

"වෙන්න පුළුවන්....."

"ඒ කියන්නෙ මං කලේ වරදක්....."

"වරදක් වෙන්න පුළුවන්....."

"එහෙනම් ඉතින් ප්‍රශ්නයක් නැහැ. මටත් ඕන කලේ ඒ ටික දැනගන්න. ඔයාට පුළුවන් තව මාස තුන හතරක් මෙහෙම ඉඳල එන්න..... මම යන්නම්....."

"ඒකද දැන් ඔයා කරන්න හදන්නෙ..... ?"

"ඔව්....."





"ඔයාට බැහැ එහෙම කරන්න. ඔයාගෙ වගකීම මාව දේවිට බාරදෙන එක. ඔයා ඒක මට වුනු පොරොන්දුවක්"

"ඒකත් ඇත්ත....."

"යාළුකම එකයි..... පොරොන්දුව තවත් එකක්"

"අපරාදෙ, මම ගෝත්‍රිකයින්ගෙන් බේරිල පැනල ආවෙ ?"

"ඇයි එහේ අර වහල් කඳවුරේ වගේ කෙල්ලො හිටියද ?"

"ඔව්..... මින්ගි කියල ලස්සන කෙල්ලෙක් හිටිය"

ඇය එකවරම දෑස් දල්වා මා දෙස බැලුවාය.

"ලස්සන කෙල්ලෙක්..... ?"

"ඔව් ඔයාටත් වඩා ලස්සන කෙල්ලෙක්....."

ඇගේ මුව වෙනස් වෙනු මට පෙනිණ.

"එහෙනම් ඔයා මට කිව්වෙ බොරු....."

"මම බොරු කිව්වෙ නැහැ....."

"මටත් ඕන වුනේ ඒ ටික අහගන්න. ඔයාගෙ ඇගේ සුවඳ ගාල තියෙන්නෙ හිතන් නෙවි. ඔයා උවමනාවෙන් නේද එහාට ගියේ..... ?"

"නැහැ....."

"අරුණිට දේහි වෙන්න එපා ඝාන්. ඒක වරදක්"

මම සිනහාවක් පා ඇය වෙතින් ඉවත්ව කවුළුව අසලට ගියෙමි. තවමත් උදෑසන අවදි වී නැත. ළා හිරු රැස් අහසේ සිට විටින් විට එබිකම් කරන්නාක් සේ කවුළුව තුළින් ඇතුළට ඇදී එන්නට උත්සාහ දරණු පෙනේ. මම ඒ කවුළුවෙන් පිටත දිස්වෙන මල් පාත්ති දෙස බැලීමි.

http://e-pusthakalaya.blogspot.com



මගේ හදවත සියුම් සතුටකින් වෙළී ඇත. ඒ කුමක්දැයි කියන්නට මට ශක්තියක් නැත. මගේ මුළු ගතම සුවඳින් නැහැ වී ඇතත් මගේ සිතට දැනෙන්නේ ඊටත් එහා ගිය ආත්මීය සුවඳකි.

"ශාන්....." ඒ අතර අංජු කතා කළාය.

මම ඇය දෙස බැලීමි.

"එහෙනම් ඔයා තනියම යන්න....."

"කමක් නැද්ද ?"

"ඔයා මගේ යාළුවෙක් නෙවි ශාන්. හොඳ යාළුවෙක් කවදාවත් මේ විදියට කටයුතු කරන්නෙ නැහැ. මට පුළුවන් දෙයක් මම කරන්නම්. ඔයා තනියම මෙහෙන් නිදහස් වෙල යන්න. ඊකනේ ඔයාට ඕන කලේ....."

ඇය ඇඳ මතින් නැගිට කොරගසමින් නාන කාමරය වෙත ගියාය. සියුම් වේදනාවක් මගේ සිතට දැනුනේ ඇයිදැයි මම නොදනිමි. මා ඇයට කල විහිළුව ඇස් රතු වෙනතෙක් දුරදිග ගොස් ඇත.

මා කවුළුවත් මෑත්වෙත්ම, මා දුටුවේ මේසය මත වූ ලිපියකි. එය ලියා ඇත්තේ අංජුය.

දේවි වෙත ලියමි.

මම දිගුකලක් ඔයා බලාපොරොත්තුවෙන් සිතත් කයත් අතර සටන් කළෙමි. එහෙත් ඒ සටනින් මා අද ලබා ඇත්තේ පරාජයකි. අප අතර ඇතිවූ විවාහ ගිවිසුම බිඳියතැයි යන බිය තවමත් මගේ හදවත තුළ රැව්දේ. එහෙත් සිදු වී ඇත්තේ අප කිසිසේත් බලාපොරොත්තු වූවාක් නොවේ. මට දැන් කොහෙත්ම සිත හද ගත නොහැක. දහස්වාරයක් මැරී උපදින මම හැම විටම ඔහු අමතක කර දැමීමට උත්සාහ කරන අතර, ඔහුගෙන් හැකිතරම් දුරට ඈත්වෙන්නටද සිතමි. එහෙත් ඒ සෑම විටම මට දැනෙන්නේ මා කාන්දමක් සේ තව තවත් ඔහුට ඇදෙන බවය. ඔහු මගේ ජීවිතෙන් කොටසක් වී ඇත. ඔහුට තරම් මම මගේ ජීවිතේ කිසිම පිරිමියෙකුට ලං නොවීමි. මගේ ඇටමස් නහරවල පවා දිවයන්නේ දැන් ඔහුගේ උණුසුමයි. ගැහැණියකට මෙලොව උරුම පිරිමියෙකුගේ රැකවරණය නම්..... ඔහු





මගේ ගැලවුම්කරුවා විය. ඔහු උදාර මිනිසෙකි. ඔහු වැනි පුද්ගලයෙකු මගේ ජීවිතයට යළිත් කිසිදු දිනක මුණ නොගැසෙනු ඇත.

අද ඔහු මගෙන් වෙන්ව ගොස්ය.

මම හඬා වැළපුනෙමි. ඔහුට යම් අනතුරක් සිදු වී ඇතැයි මට හැඟේ. ඔහු මා රැකබලාගත්තේ කුඩා දරුවෙකු රැකබලාගන්නා ලෙසිනි. එහෙත් ඔහු රැකගැනීමට මට නොහැකි විය. ඒ මා ගැහැණියක නිසාය.

දැන් මගේ ජීවිතය හඬා වැළපෙයි.

එහෙත් මා සනසන්නට කිසිවෙකු මා ලග නැත. මම ඔබට දේනී නොවෙමි. යම් දවසක හෝ වේවා මේ ලිපිය ඔබ අතට පත්වෙතැයි මම විශ්වාස කරමි.

එතෙක් මම සියල්ල දෙවියන්ට භාර කරමි.

මේ

දයාබර,

අංජු

මම ලිපිය එලෙසින්ම තබා කාමරයෙන් පිටව ආවෙමි. අංජුත් මාත් අතර ඇති සම්බන්ධය ගෙතූ පොත්තත් අරටුවත් බඳුය. දැන් අරටුව වී ඇත්තේ අප දෙදෙනා අතර ඇති බැඳීමයි. එහෙත් පොත්ත නැතිව අරටුවෙහි රඳ පැවතීමක් නැත.

මා ආලින්දයට එන විට සොළමන් මහතා පෙනෙන්නට නොසිටියේය. තෙරේසා පැවසුවේ ඔහු ගෝත්‍රිකයින් මුණ ගැසීමට පිට වී ගිය බවය.

"එයා ගියේ ගමන පිළියෙල කරන්න....." තෙරේසා මඳක් දුබල හඬින් කීවාය.

"ඔයගොල්ලො ෂිමෝගාවලට යනවලු"

"අපිට මෙහෙම ඉන්න බැහැ. අපි ගෙදර යන්න ඕන මිසිස් තෙරේසා"

http://e-pusthakalaya.blogspot.com



"සොලමන් ගියේ ගෝත්‍රිකයින් දෙන්නෙක් ලැහැස්ති කරන්න. එයා තිලිප්පන්ගෙ මිනිසුන්ටත් කියාවි"

"ඒ ගොල්ලො කොහේද ඉන්නෙ..... ? "

"මම දන්නෙ නැහැ මිටුන්. ඒ හුගක් දේවල් දන්නෙ සොලමන්. ගෝත්‍රිකයො සොලමන්ට ගරුකරනව"

මම කතාව දිග්ගස්සන්නට නොගියෙමි. ඒ දිග්ගැස්සීමෙන් සිදුවන්නේ සතප වසා මතුවන බොරුවකි. එක් අතකින් බලන කල අපේ මුළු ජීවිතයම රැවටීමකි.

"අංජුගෙ බේත් පෙට්ටිය දෙන්න" මම තෙරේසාට කිවෙමි.

"ඇයි මං බේත් දන්නම්. අර වැටුන එකේ තැල්ම මිසක් තුවාල ඒතරම් ලොකු නැහැ. මේ බේත්වලට ඉක්මනට තුවාල වේලිල යාවි"

"මට පුළුවන් බේත් ටික දන්න....."

"ඔව් ඒකත් ඇත්ත. තමන්ගෙ ස්වාමිපුරුෂයා අතින් බේත් දනකොටත් තුවාල ඉක්මනින් සනීප වෙනව. සමහර විට ඊයෙ ඉඳන් එයාගෙ හිතත් තුවාලවෙල ඇති" තෙරේසා සිනහවක් පෑවාය.

මා කාමරයට එන විට අංජු සිටියේ කවුළුව අසලය.

"එන්න බේත් දන්න....." මම කිවෙමි.

"ඇයි ඔයා දන්නෙ....." ඇය මා දෙස හැරී ගත් කටටම ඇසුවාය.

"ඔයාගෙ හිතේ තියෙන තුවාලෙ සනීප කරන්න"

"මට බැහැ....."

මම ඇය වෙත ගොස් ඇය බලයෙන්ම අල්ලා ඔසවා ගෙන අවුත් ඇඳමත තැබීමි.

"අංජු ඔයා මාත් එක්ක තරහද ?"





ඇය කතා නොකළාය.

ඇගේ සිනිඳු කෙස් රොදවල් කිපයක් මුව මතට වැටී තිබිණ. මම ඒ කෙස් රොදවල් ඇඟිලි තුඩු අගින් සකස් කළෙමි. ඇගේ දෑසට කඳුළු පිරුණේ නිතැතිනි.

"අපි අපේ දුක දෙවියන්ට කියමු අංජු..... මේ ප්‍රශ්නය විසඳන්න දෙවියන්ට ඇරෙන්න වෙන කාටවත් බැහැ"

ඇය කතා නොකළාය. ඒ වෙනුවට ඇය කලේ මගේ එක් අතක් ගෙන ඇගේ කම්මුල මත තබා ගැනීමය.

මම සෙමින් ඇගේ කොපුල් තල පිරිමැද්දෙමි.

"අපි තාම හොඳ යාළුවො නේද ?"

"ඔව් ශාන්"

"ඔයා දේවිට ලිව්ව ලියුම මං දැක්ක" ඇය දෑස් මහත් කළාය.

"ඔයා ඒ ලියුම් කියෙව්වද ?"

"ඔව්....."

"අනුන්ගෙ ලියුම් කියවන්න ඔයාට ලැජ්ජ නැද්ද ?"

"මං හිතුවෙ ඒක නිකන්ම සටහනක් කියල....."

"නිකන්ම සටහනක් නෙවි"

"ඒකද ඔයාගෙ අවසාන බලාපොරොත්තුව"

"නැහැ....."

"බොරුද කියන්නෙ ?"

"ලියන හැම දෙයක්ම ඇත්ත නෙවි"

"මට පේන්නද එහෙනම් එහෙම ලිව්වෙ"

"වැඩේමයි....."

http://e-pusthakalaya.blogspot.com



"දැන් බේත් දන්නද ?"

"මටත් පුළුවන් දගන්න....."

"මෙන්න එහෙනම් බේත් පෙට්ටිය"

මම ඇය අසලින් නැගී සිටියෙමි. ඇය ඇඳේ වාඩි වී බෙහෙත් දමා ගැනීමට උත්සාහ කළාය.

"ඔයා අහක බලාගන්න"

"ඇයි....."

"තුවාලේ තියෙන්නෙ දණ හිසෙන් ටිකක් උඩ....."

"ඇත්තද ?"

"එහෙනම් මම යන්නම් බේත් දල ඉවර වුනාම කතා කරන්න"

මා කාමරයේ දොර දෙසට යත්ම ඇය වේදනාවෙන් කෙඳිරි ගෑවාය.

"ඇයි ?"

ඇගේ වම් කකුල මුළුමනින්ම නිරුවත් වී තිබිණ. ඒ සුදු පැහැති කකුලේ දණහිසෙන් මදක් උඩට වෙන්නට තිබුණේ තද රතු පැහැති ලපයකි.

"ඌයි රිදෙනව..... මට බේත් දගන්න බැහැ"

"ඒක තමයි මම ඇහැව්වෙ"

මා ආපසු හැරී ඇය වෙත එත්ම ඇය වේදනාවෙන් කකුල අල්ලාගෙන සිටියාය.

එය තරමක් ලොකු තුවාලයකි. මම ඇයට නොරිදෙන සේ තුවාලය සෝද පිරිසිදු කරත්ම ඇය අහක බලා ගත්තාය.

"මේ තුවාලෙ සනීපවෙන්න අඩුම ගානෙ තව දවස් දෙකක්වත් යාවි..... එතකන් අපිට මෙහෙන් පිටවෙන්න බැහැ....."





"අපේ ගමන තවත් කල් යනව"

"ඒ ඔයා නිසා....."

"මං නිසා..... ?"

"ඔව්....."

"ටජානිනෙ මාව තල්ලු කලේ....."

"එයා එහෙම කරන්නෙ නැහැ"

"ඔයාට මටත් වඩා එයාව විශ්වාසද ?"

"මළවුන් බොරු කියන්නෙ නැහැ"

"ඔයා දේවි ඉන්න තැන නම් ඕව කියන්න එපා"

"ඇයි ?"

"ඔයාව පිස්සෙක්, මෝඩයෙක් හැටියට ගනන් ගනීවි"

"එක අතකින් ඇත්ත කියන මිනිස්සු මෝඩයො පිස්සො තමයි"

"මේව දේවි කරන්න ඕන දේවල්"

"ඒක ඇත්ත. මම දේවිට ඇරෙන්න වෙන කාටවත් මගේ ඇගට අතක් තියන්න දෙන්නෙ නැහැ"

"අපරාදෙ මට කියල බේත් දගත්තෙ....."

"ඒක තමයි මම මුලින් එපා කිව්වෙ මම දේවිට කරන්නෙ පවිත්‍ර ආදරයක්..... මගේ හිතත් ගතත් දැන් එයාගෙ"

"එද නයා කාපු දවසෙත් මට කියල තෙල් ගාගත්ත..... අදත් එහෙමයි"

"ඒව ඔයා ඔක්කොම කලේ මගේ කැමැත්තෙන් නෙවි"

"එහෙනම් මගේ කැමැත්තෙන්ද ?"

http://e-pusthakalaya.blogspot.com



"වෙන්න පුළුවන්..... ඔයාට ගැහැණු ළමයෙක්ගෙ මෙහෙම කකුලක් දිහා බලන්න ලැජ්ජ නැද්ද ?"

"මාත් මේ හැම දෙයක්ම කරන්නෙ පවිත්‍ර හිතින්"

"එහෙම තමයි මාත් හිතන්නෙ..... නැත්තම්....."

"නැත්තම් මොකද ?"

"එහෙම නම් මම ඔයාගෙ ළඟටවත් එන්නෙ නැහැ"

"ඔයා නම් ගුවන් සේවිකාවක්ම තමයි"

"ඔව් ඔයාල වගේ කස්ටර්මර්ස්ලා අපිට හම්බවෙනව"

"ඒ කියන්නෙ ?"

"සමහරු අපේ ඇඟටම එනව"

"මාවත් සළකන්නෙ එහෙමද ?"

"මං දන්නෙ නැහැ..... බේත් දල ඉවරද ?"

"ඔව්....."

"එහෙනම් ගිහින් අත හෝදගන්න....."

මා නානකාමරයට ගියේ අත සෝද ගැනීමටය. එහෙත් ඒ සමගම අංජු යටිගිරියෙන් කෑ ගැසුවාය. මා වහා නානකාමරයෙන් දිව එන විටත් ඇය සිටියේ ඇඳෙන් බිමය. මම වහා ඇය ඔසවා යළි ඇඳමත තබත්ම, ඇය මගේ ගෙල බදගත්තාය.

"මම එයාව දැක්ක..... මං දැක්ක ශාන්. සුදු ගවුමක් ඇඳල තොප්පියක් දාගෙන අර ජනේලෙ ළඟ මං දිහා බලාගෙන හිටිය. මම හොඳටම බය වුනා. මම ඇඳෙන් පැන්න....."

"ඔයාගෙ තුවාලෙ ආයෙත් පෑරෙන්න ඇති"

"ඔව්....."





දොරට තට්ටු කරන හඬ ඇසිණ. මම දොර ඇරියෙමි. ඒ සොලමන් මහතාය.

"ඇයි කෑ ගැහැව්වෙ..... ?"

මම දොර අසල සිටි සොලමන් මහතා වෙත ගියෙමි.

එයා ටජානිව දැකල බයවෙල"

සොලමන් මහතාගේ මුවෙහි නැගුනේ කනස්සලයෙකි.

"මේ ළමය අපිට තවත් වද දෙනව"

"සර් ගිය වැඩේ හරිද....."

"නැහැ"

"ඇයි....."

"ඒ ගොල්ලො මිටුන්ව ඉල්ලනව"

"මොනව..... ?"

"මං කිව්ව එයා මෙහෙ ආවෙ නැහැ කියල"

"ඔයා පැනල ආවෙ කොහොමද කියන එක ඒගොල්ලන්ට ප්‍රශ්ණයක්..... ඒ ගොල්ලො හැමතැනම ඔයාව හොයනව..... විශේෂයෙන් මින්ගි..... මින්ගි ඔයාට පිස්සු වැටිල....."

"දෙයියෝ සාක්කි....."

"උන් මෙහාටත් එයිද දන්නෙ නැහැ"

"අද රෑ භයානකයි"

"අපි පස්සෙ කතා කරමු..... ශාලු බලාගෙන ඉන්නව"

"හොඳයි මිටුන් දෙර වහාගන්න"

මම යළි අංජු වෙත යත්ම, ඇය හඬමින් සිටියාය.

http://e-pusthakalaya.blogspot.com



"මට මෙහේ ඉන්න බයයි ශාන්"

"ඇයි ?"

"මම ටජානිව හොඳටම දැක්කා....."

"ඒ ඔයාගෙ හිතේ තිබුණු දෙයක්....."

"නැහැ..... ශාන්"

"ටජානි ඇවිත් ඇත්තෙ එයාගෙ දුක කියන්න"

"නැහැ. එයා අපි දෙන්න දිහා බලාගෙන ඉඳල තියෙනව....."

"එයාගෙන් අපිට අනතුරක් සිද්ධවෙන්න නැහැ අංජු. මට ඒක හොඳටම විශ්වාසයි"

"ඔයා ඔය කියන්නෙ ඇත්තද ?"

"ඔව්....."

"හිතේ එක එක දේවල් තියෙන කොට ඒව යටි හිතේ වැඩ කරනව අංජු"

"මම හිත හිතා හිටියෙ ටජානි ඔයාට උදව් කලා කිව්ව හැටි..... මට එයාව මැවිල පේන්න ඇත්තෙ ඒකයි"

"එහෙම වෙන්න පුළුවන්"

ඇය යළිත් වරක් ජනේලය දෙස බැලුවාය. එහෙත් එහි කිසිදු වෙනසක් නොවීය. සුළඟේ පාව් ආ කවුළු තිර රෙදි ඒ මේ අත වැනුනද, වීදුරු තුළින් දිස් වූයේ මිදුලේ වූ රෝස පාත්ති පමණි.





සොලමන් මහතා කිවාක් මෙන් ඒ රාත්‍රිය බිහිසුණු යැයි මට සිතුණේ, වේගවත් සුළඟත්, අධික වර්ෂාවත් හවස් යාමය ගෙවී යන්නටත් පළමු හටගත් බැවිනි. මධ්‍යම රාත්‍රියේ සිහින් ඉකි ගැසීමේ හඬක් කාමරයෙන් පිටත ඇසිණ.



## 8

අහස ගිගුම් දෙන හඬ ඇසිණ.

විදුලි කෙටීමෙන් වරින් වර මුළු ගෙයම ආලෝකමත් විය. සුළඟේ හඬත්, ගෙරවිල්ලත් එක දිගට ඇසෙද්දී, සොලමන් මහතාත් මාත් සාලයේ කතාකරමින් සිටියේ, දවසේ සිදුවිය හැකි බිහිසුණු සිදුවීමක් සම්බන්ධයෙනි. තෙරේසා සිටියේ ඒ මොහොතේ අංජු සමග කාමරයේය. අප එදා වේලාසනින්ම ආහාර ගත්තේත්, දොරවල් වසා දමා ඉක්මනින් රාත්‍රියේ කටයුතු අවසන් කිරීමටය.

"මම ගිහින් ඒ ගොල්ලන්ගෙන් මිටුන්ව ඉල්ලුව. මම එහෙම කලේ උන් මෙහාට ඇවිත් ඔයාව අරන් යාවි කියල හිතාගෙන. උන් හොඳ වුනත් එක අවස්ථාවකදී උන් ඕනවටත් වඩා දරුණුයි"

"දැන් උන් මෙහාට ආවොත් මොකද කරන්නෙ ?"

http://e-pusthakalaya.blogspot.com



"ඔයාට හැංගෙනව මිසක් වෙන කරන්න දෙයක් නැහැ"

"උන් ගෙට කඩාගෙන පනීවිද ?"

"මම තිලිප්පන්ට පනිවුඩයක් ඇරිය. හොඳ වෙලාවට මම යනකොට තිලිප්පන්ගෙ මිනිහෙක් ගෝත්‍රික කෙල්ලෙක් එක්ක හිටිය"

"තිලිප්පන් මෙහාට ඒවිද ?"

"සමහරවිට....."

"මට නම් ශාලු නිසා හරි බයයි සර්..... ශාලුගෙ ලස්සන දැක්කම උන්ට මොකවත් හිතෙයිද ?"

"කොයිකටත් අපි ශාලුව හංගමු"

"එයා ඒකට කැමති වෙයිද දන්නෙ නැහැ"

"එයාව බාත් රූම් එකේ දාල වහන්න. වෙන කරන්න දෙයක් නැහැ"

"මම ශාලුට කියල බලන්නම්....."

"මටත් හිතෙනව ඉක්මනින්ම දැන් ඔය ගොල්ලො මෙහෙන් යන එක හොඳයි කියල"

"කොහොමද අපි මෙහෙන් ගැලවිල යන්නෙ....."

"මං හිතුවෙ ගෝත්‍රිකයො දෙන්නෙක් එක්ක ඔය දෙන්නව පාරට ඇරලන්න. දැන් ඒ අදහස අත අරින්න වෙනව. දැන් ඔයගොල්ලන්ට ඒ ගොල්ලන්ගෙනුත් ආරක්ෂා වෙන්න වෙනව..... මිටුන්ව අරගෙන යන්න හදන්නෙ උන්ගෙ පරම්පරාව බෝකරන්න....."

මම සුසුමක් හෙළුවෙමි. අනේ දෙවියනේ මේ මොන කරුමයක්ද ? එක සිදුවීමක් මදිවට දැන් සිදුවන්නට යන්නේ මට මුළු ජීවිත කාලයටම විඳවන්නටත්, පසුතැවෙන්නටත් සිදුවන කාරියකි.

ඈත වෙඩි හඬක් ඇසිණ.





සොලමන් මහතා කලබල වී පුටුවෙන් නැගී සිටියේය.

"තිලිප්පන් එනව වගේ. ඒක තමයි එයාලගෙ සංඥාව. ඉක්මනට ගිහින් ශාලුව හංගන්න....."

මම කාමරයට දිවගොස් අංජුට කතා කළෙමි.

"තිලිප්පන් එනව ශාලු..... ඔයා මෙහෙම ඉන්න එක හොඳ නැහැ"

තිලිප්පන් ගැන ඇසූ විගස තෙරේසා කාමරයෙන් පිටව සාලයට දිව ගියාය.

"සොලමන් එක පාරට දොර අරින්න එපා" ඇය කෑ ගසනු මට ඇසිණ.

"ඔයා හැංගෙන්න අංජු....."

"කොහේද ?"

"බාත් රූම් එකේ..... ?"

"උන් ඒක ඇරියොත් ?"

"අනේ දෙවියනේ..... එහෙනම් ඔයා අල්මාරියෙ පිටිපස්සට යන්න මම ඒක මෙහාට අදින්නම්....."

"මට බයයි ශාන්....."

මම අල්මාරිය ඉදිරියට ඇද එහි පිටුපස විවරයක් සෑදුවෙමි. හොඳ වෙලාවට අල්මාරිය තනා තිබුණේ සැහැල්ලු ලීයකිනි. අංජු අකමැත්තෙන් වුවද අල්මාරියේ පිටුපසට ගියාය. ඇය එය තල්ලු කලේද මහත් අපහසුවෙනි. ඇඳ මතවත් සිටින්නට නොහැකි ඇයට අල්මාරියක් පිටුපසට යාම මොනතරම් අසීරු කරුණක්ද ? එහෙත් වෙන කල හැකි දෙයක් නැත.

බිහිසුණු මිනිසෙකු ඉදිරියේ අංජු ගැන මා තබන විශ්වාසය කුමක්ද ?

http://e-pusthakalaya.blogspot.com



දොරට ගසන ශබ්දයක් සුළං හා මුසුව ඇසිණ. මම කාමරයේ අගුළු දගෙන දොර කවුළුවෙන් බලා සිටියෙමි. සොලමන් මහතා විවෘත කල දෙරින් කීප දෙනෙකුම සාලයට කඩා පැන්න.

"කෝ තමුසෙගෙ පුතා....."

"එයා ඉන්නව....."

"මට එයාව බලන්න ඕන"

දොරට තට්ටු කරන හඬ ඇසිණ. ඔහු කාමරයට අවුත් මට කතා කලේ ඉංග්‍රීසියෙනි. මම කාමරයෙන් පිටව සාලයට ආවෙමි. තුවක්කුවක් උරහිසේ එල්ලා ගත්, මුහුණ පුරා රැවුල වැඩුණු හැඩි දැඩි මිනිසෙකු මා ඉදිරියේ සිටියේ තවත් සිව් දෙනෙකු සමගය.

"තමුසෙගෙ නම කවුද ?"

"මිටුන්..... ?"

"මෙයාද සර්ගෙ පුතා..... ?"

"මේ ලොකු පුතා..... එයා ඉන්නෙ කැනඩාවේ"

"ඇයි තමුසෙ ගෝත්‍රිකයින්ට කරදර කරන්න ගියේ"

"මම ගියේ නැහැ. උන් මාව අරගෙන ගියා"

"තමුසෙ ඒ කෙල්ල එක්ක හිටියද ?"

"නැහැ....."

"කෝ තමුසෙගෙ ගෑණි....."

"එයා වැසිකිලියෙ....."

"හොඳයි මේ දෙන්නව බීරුට් වෙනකන් ගිහින් ඇරලනව."

"කවදද යන්නෙ....."

"තව දවස් දෙකකින්"





"මගේ මිනිහෙක් ඒවි. සර්ට පුළුවන් එයත් එක්ක මේ දෙන්නව බීරුට් වෙනකන් එක්කගෙන යන්න..... අපි යමු....."

ඔවුන් පිටව යත්ම සොලමන් මහතා දෙර වසා අගුළු දැම්මේය. ඔහුගේ මුළු ගතේම දහඩිය නැගවිත් තිබිණ. ඔහු සැටිය මත දිගා වූයේ දෙවියන්ට ස්තුති කරමිනි.

"අපි බේරුන මිටුන්....."

මම වහා කාමරයට ගොස් අල්මාරිය පිටුපසින් ඇංජු එළියට ගතිමි. ඇය හොඳ හැටි බියපත්ව හෙම්බත් වී සිටියාය. ඇගේ ඇඳුම්වල පවා අල්මාරියේ පිටුපස වූ දූවිලි තැවරී තිබිණ.

"ඒ ගොල්ලො ගියා....."

"මට හුස්ම ගන්නත් අමාරුයි. මගේ ඇඳුම්වල දූවිලි....."

"මොනව කරන්නද ඇංජු ඔයා ගිහින් ඇඟ හෝද ගන්න. තුවාලෙ තෙමුනොත් මම ආයෙත් බෙහෙත් දාන්නම්"

"මට දැන් අඳින්නවත් එකක් නැහැ. උදේ හිටන් ඇඳගෙන හිටිය ගවුම දහඩිය ගඳයි..... හෙට ඒක හෝදන්න වෙනව. මම කොහොමද රෙදි ටික හෝදගන්නෙ. මගේ අතේ ඇඟිලි තවම සනීප නැහැ"

"මම තෙරේසගෙන් ඇඳුමක් ඉල්ලන්නද ?"

"එයා දුන්න නයිට් ගවුමත් බාත් රූම් එකේ..... මට දැන් ලැජ්ජත් එක්ක, ආයෙත් එකක් ඉල්ලන්න.

"මොනව කරන්නද ඔයාගෙ තත්වෙ එයා දන්නව"

"ඒ වුනත්..... ?"

"මම මොකක් හරි කරන්නම්. ඔයා ගිහින් ඇඟ හෝද ගන්න"



The Reader's Place Novel..

http://e-pusthakalaya.blogspot.com



ඇය කොරගසමින් නානකාමරයට යද්දී මම තෙරේසා වෙත ගියේ ඇඳුමක් ඉල්ලා ගැනීමටය. ඇය කිසිදු පැකිළීමකින් තොරව සැහැල්ලු රාත්‍රී ඇඳුමක් දී අංජුගේ අවශ්‍යතාවය ඉටු කළාය. ඒ ඇඳුම දෙන විටත් තෙරේසාගේ දෙනෙත්වල වූයේ කඳුළුය.

"මේව ඔක්කොම දුවගෙ ඇඳුම්. මම පරිස්සම් කරල අරන් තියාගෙන ඉන්නව"

ඒ සිනිඳු ඇඳුම ලා නිල් පාටය. යන්තමට විනිවිද පෙනෙන සුළුය. මගේ සිතට කිසියම් චකිතයක් දැනුනේ ටජානි මේ ඇඳුම, අංජු ඇඳගෙන සිටිනවා දුටු විට කුමන ප්‍රතිචාරයක් දක්වාවිදැයි සිතුනු විටය.

අනේ දෙවියනේ ! දැන් අංජුටත් ටජානි දර්ශනය වන්නට පටන්ගෙන ඇත.

මම නානකාමරේ දොරට තට්ටු කළෙමි. අංජු යන්තමට දොර ඇර ඇඳුම අතට ගත්තාය. ඒ අතර මා කවුළුව අසලට ගියේ කිසියම් සැකයකින් මෙනි. එහෙත් ඝණ කළුවර හැර කිසිවෙකු පෙනෙන්නට නොවීය. තවමත් වැස්ස පායා නොතිබිණ. විදුලි කෙටීම අඩු වී තිබුණද සුළගේ වේගවත් කම තවමත් එලෙසම පැවතිණ.

සොලමන් මහතා කී පරිදි මේ රාත්‍රියේ බිහිසුණුකම තවම ගෙවී නැත. එක් අතකින් තිලිප්පන්ගේ පැමිණීම මගේ ගැලවීමට හේතුවකි. ඕනෑම දරුණු මිනිසෙකුගේ වුවද දැකිය යුතු හොඳ පැත්තක්ද ඇත.

අංජු නානකාමරයෙන් අවුත් ඇඳ මතට ගොඩ වී පොරෝනය ගෙන මුළුගතම වැසෙන සේ පොරවා ගත්තාය.

"තුවාලෙ තෙමුනද ?"

"නැහැ..... මම එතන ගවුමෙන් ඔතාගත්ත"

"ආයෙත් බේත් දන්න වෙයි කියලද ?" මම සිනහවක් පෑවෙමි.

"ඔව්....."





"අංජු අපිට තව දවස් දෙකකින් මෙහෙන් යන්න පුළුවන්. තිලිප්පන් පොරොන්දු වුනා එයාගෙ මිනිහෙක් අපේ ආරක්ෂාවට දෙන්න..... මිස්ට සොලමන් එයත් එක්ක ගිහින් අපිව බිරූට්වලට ඇරලාවී. එතනින් එහාට ඒ ගොල්ලන්ට කරන්න දෙයක් නැහැ"

"ඊට පස්සෙ අපි මොකද කරන්නෙ..... ?"

"බිරූට්වල ඉඳල අපිට පාර හොයාගන්න වෙනව"

"අපි එතනින් බැංගලෝර් යනවද ?"

"නැහැ..... අපි යන්නෙ මන්දිර්වලට....."

"මන්දිර්වලට. අපි යන්නම ඕනද ?"

"ඔව් අංජු. ඒක මගේ පොරොන්දුවක්. අපි එහෙම නොකලොත් ටජානි අපෙන් පළි ගනීවි. කාගෙන් බේරුනත් අපිට ටජානිගෙන් බේරෙන්න බැහැ අංජු"

"දැන් වෙලාව කීයට විතර ඇත්ද ?"

"දැන් දොළහට ලං වෙලා....."

"බල්ලො උඩු බුරනව ඇහෙනව....."

"අද රාත්‍රිය ඒ තරම් හොඳ නැහැ....."

"ඇයි..... ?"

"ගෝත්‍රිකයො මාව හොයනවලු..... ඒ ගොල්ලො මම පැනල ආවට හුගක් ඇවිස්සිලා. ගෝත්‍රිකයො පරාජය බාරගන්න අය නෙවි..... මං කිව්වෙ අංජු අර එහෙ හිටිය ලස්සන කෙල්ලක් ගැන..... එයාගෙ නම ෂින්ගි....."

මෙතෙක් වෙලා යන්තමට දෑස් පියාගෙන සියල්ල නිසොල්මනේ අසා සිටි ඇය මා ෂින්ගි ගැන සඳහන් කරත්ම, පොරෝනයද පසෙකලා උස් වී මා දෙස බැලුවාය.

"ෂින්ගි තමයි මාව හොයන්නෙ....."

http://e-pusthakalaya.blogspot.com



"ඔයා මොනවද මේ කියන්නෙ....."

"මං කියන්නෙ ඇත්ත. මං එදා එයාගෙන් බේරිල ආවෙ හරිම අමාරුවෙන්..... එයා මාව..... කොච්චර පොළඹවන්න හැදුවද ? අන්තිමට මම එයාව තල්ලු කරල දල පැනල ආවෙ....."

"ශාන්..... එයා ඔයාව ඉම්බද ?"

මම සිනහවක් පෑවෙමි.

"නැහැ....."

"එහෙනම් කමක් නැහැ"

"ඇයි....."

"නැත්නම් ඒක අරුණිට හොඳ නැහැ"

"ඒකත් ඇත්ත"

"ශාන් ඒ කෙල්ල මටත් වඩා ලස්සනද ?"

"නැහැ....."

"එහෙම වුනු එක හොඳයි"

"ඇයි ඔයා ඔයතරම් ඒ ගැන අහන්නෙ"

"අරුණි වෙනුවෙන් මම ඔයාව බලාගන්න එපායැ"

"උන් ඇවිත් මාව ආයෙත් අරන් ගියොත් ඔයා කොහොමද මාව බලාගන්නෙ....."

"මම කාටවත් ඔයාව ගන්න දෙන්නෙ නැහැ"

"උන් ආවොත් ඔයා අල්මාරියෙ අස්සෙ හැංගේවි"

"හිතේ ඇති මම එච්චර බයගුල්ලෙක් කියල. ඔයාට හැම වෙලාවෙම අමතක වෙනව මං ගුවන් සේවිකාවක් බව"

"එළිවෙනකන්ම ඔයා කතා කර කර ඉන්නද හදන්නෙ"





"ඔයා නිදගන්න එපා. මම නිදගන්නකන්"

"ඔන්න ඔයාගෙ පොරෝනෙ ඇරිල ....."

"ඒකත් බලනවද ?"

"දේවි වෙනුවෙන් මං ඔයාවත් බලාගන්න එපායැ"

"අපි දෙන්නට තියෙන්නෙ පුදුම ආදර ගිවිසුමක්නෙ"

"ඒ ගිවිසුම කඩන්නත් බැහැ. මේ ගිවිසුම කඩන්නත් බැහැ"

"මොකක්ද මේ ගිවිසුම"

"ඇයි අපේ යාළුකම"

"ශාන් හෙට උදේට සිහියම බලන්න. බීරුට්වල ඉඳල අපි කොහොමද යන්නෙ කියල. මෙහෙම අතරමං වෙන්න නම් ආයෙත් යන්න බැහැ"

"අපිට සල්ලි ඇති වෙයිද ?"

"මිස්ටර් සොලමන්ගෙන් ණයක් ඉල්ලගමු. මට පුළුවන් ඒ ගොල්ලො මද්‍රාසියට ගියාම ඒ ණය ආපසු දෙන්න"

"ඔයාම ඉල්ලන්න"

"කීයක් විතර ඕන වෙයිද ?"

"රුපියල් පන්දහක්. හාරදහක් අපිට තියෙනවනෙ"

"ශාන්..... තිලිප්පන්ගෙ මිනිහ විශ්වාසද ?"

"ඇයි එහෙම අහන්නෙ ?"

"උන් කොහොමටත් හොරුනෙ..... උන් අපිට මගදී මංකොල්ල කෑවොත්....."

"ඒකත් ඇත්ත. ඒකට පේන්න සල්ලි ගෙනියන්න නරකයි"

http://e-pusthakalaya.blogspot.com



"ඉතින් කොහොමද ගෙනියන්නෙ..... මගේ කලිසමත් ටිකක් ලොකුයි. පටියක් බැඳල යන්තමට ඒක රඳවගෙන ඉන්නෙ....."

"ඉතින් මොකද කරන්නෙ..... ?"

"ඔයා තියාගන්න....."

"මං කොහේ තියාගන්නද ?"

"හැට්ටෙ අස්සෙ ගහගන්න....."

"ගවුමෙ කොහෙද අමුතුවෙන් හැට්ටයක්"

"එහෙනම් ඉතින් මොකද කරන්නෙ..... ඔයා තෙරේසගෙන්වත් යට ඇඳුමක් ඉල්ල ගන්න"

"ඔයාට පිස්සුද ?" ඇය සිහින් පහරක් මගේ කම්මුලට ගැසුවාය.

"ඒ නාකි ගෑණිගෙන් කොහොමද මම ඒව ඉල්ලන්නෙ ?"

"අපිට තියෙන ප්‍රශ්ණ වෙන කාටවත් නැහැ"

"මේ ප්‍රශ්ණ නම් විසඳගන්න බැහැ අංජු..... අපි බිරූට්වලින් ඇඳුමක් දෙකක් ගමු."

"ඔව් ශාන්. ගවුම් ඇඳගෙන මේ ගමන යන එක භයානකයි. ඔයත් කුර්තා එකක් අඳින්න"

"ඒක තමයි කරන්න තියෙන හොඳම දේ. එතකන් මොකද කරන්නෙ ?"

"මං කියන්නම් මම තෙරේසගෙන් රෙදි කෑල්ලක් ඉල්ලගෙන ගවුමට යටින් හොරසාක්කුවක් මහගන්නද"

"අන්න හොඳයි"

"ඊත් ඔයා කොහොමද ඇඟිලිවලින් ඉඳිකටුව අල්ලන්නෙ"

"මං තෙරේසට කියන්නද මහල දෙන්න කියල"





"ඒක අපි උදේට බලමු. දැන් නිදගන්න..... හුඟක් රෑවෙලා"

අංජු දෑස් පියාගත්තාය.

මඳ වේලාවක් ගත වෙද්දී ඇයට නින්ද ගියාය. මා අවදිව සිටියේ කිසියම් සියුම් බියක් මා තුළ ඇතිවූ බැවිනි. යම් විදියකින් ගෝත්‍රිකයින් ආවොත් මා ඔවුනට මුහුණ දිය යුත්තේ කෙසේද ? සොලමන් මහතාට ඔවුන් මර්ධනය කොට ගත හැකිද ? විශාල පිරිසක් අවුත් ගේ වටකොට ගතහොත්..... දහසකුත් එකක් සිතුවිලි මගේ සිතට නැග ඒ..... මම අංජු දෙස බලමි. ඇය අහිංසකව නිද සිටී. ඇයට බියක් ඇතත් මෙහි කිසිදු බරපතල කමක් ඇයට වැටහෙන්නේ නැත.

සිහින් හඬින් ඉකිගසන හඬක් ඇසිණ.

මම වට පිට බැලිමි. කිසිවෙකුත් ජේනතෙක් මානයේ නැත. මොහොතක් වේලා මම නිශ්චලව ඒ හඬට සවන් දී සිටියෙමි.

ඒ හඬ නැගී ආයේ කවුළුව දෙසිනි.

මම නැගිට ගොස් තිරපට මෑත්කොට ඒ අවට බැලිමි. ටජානිගේ ජායාව මට පෙනිණ. ඇය සුපුරුදු පරිදි බිත්තියේ අගුවට ගුලි වී සිටියාය.

"මම ඉක්මනට ඔයාව නිදහස් කරනව ටජානි. තව දවස් දෙකයි. ඔයා ඒ දවස් දෙකත් ඉවසන්න" මම කිවෙමි. ඒ සමගම ඇය නොපෙනී ගියාය. කළුවර නිසා ඇගේ සුදු ගවුම හැර මට කිසිවක් දැකගත හැකි නොවීය. වරින් වර විදුලි කොටද්දී ඇය එයින්ද සැඟවෙන්නට ඇත.

ඒ රාත්‍රිය මා ගෙවා දැමුවේ මහත් අසීරුතාවයකිනි. මා උදෑසන නැගිට තේ කෝප්පය අංජු අතට දෙද්දී ඇය මා දෙස බැලුවේ කිසියම් අපහසුතාවයකින් මෙනි.

"එපා ශාන් දැන් මට හොඳයි. ලොකු තුවාලෙ විතරයි. ටිකක් රිදෙන්නෙ..... මම අද මිසිස් තෙරේසට උදව් වෙනව"

"ඔයාගෙ ඇඟිලි තාම සනීප නැහැ"

http://e-pusthakalaya.blogspot.com



"ඒත් ඇඟිලි නවාගන්න පුළුවන්. දැන් ඉදිමුව විතරයි තියෙන්නෙ....."

"කෝ ඔයා නැගිටින්න....."

"ඉන්න මම ගවුම ඇඳගන්නකන්. මේ හයිට් ගවුමෙන් එහා මෙහා පේනව"

"ඔයාගෙ හැඩ බලන්න මම හැර වෙන කවුරුවත් මෙහෙ නැහැ"

උදේ රැයින්ම ඇය එපා කියද්දීම මම ඇගේ රෙදි ටික සෝදා දැමුවෙමි. තව දුරටත් තෙරේසාගෙන් ඇඳුම් ඉල්ලිය නොහැක. ඇය දී ඇති ගවුම් දෙක කිලිටි වී ඇති බැවින් තවත් ඇඳුම් ඇගෙන් ඉල්ලන්නේ කෙසේද ? මම අංජුගේ තෙත ඇඳුම් එළිය වැලේ වනනවා දුටු තෙරේසා සිනහවක් පෑවාය.

"ඔයා හොඳ ස්වාමි පුරුෂයෙක් මිටුන්..... සොලමනුත් මුල්කාලෙ ඔහොම තමයි. ළමයි හම්බවෙන කාලෙ මට සාත්තු කලෙත් එයා....."

අංජුට ඒ කතාව ඇසෙන්නට ඇත. ඇය ඒ මොහොතේ සිටියේ සාලයේය.

"ඔයාට නම් හම්බවෙල තියෙන්නෙ හොඳම හොඳ මහත්තයෙක්. මදුරාසියට ආවම අපි අර කිව්ව සාමි ලඟට යමු. එයා දරු ඵල අරන් දෙනව. පූජාවල් තුනක් තිබ්බම හොඳටම ඇති"

මම අංජුගේ මුව දෙස බැලීමි. ඇය මට රැව්වාය. තෙරේසා ඇත්ත ඇති සැටියෙන් දනී නම් අපගේ තත්වය කෙබඳු විය හැකිද ? අප දෙදෙනාට එසේනම් මෙලෙස කාමරයක් වෙන් නොවෙනු ඇත. අපට මෙතරම් සමීප වීමටද ඉඩක් නොලැබෙනු ඇත. නියත වශයෙන්ම එය එසේ වූවා නම් මට කිසි දිනක මේ කතාව ඔබට කියන්නටද හැකි නොවනු ඇත.

අංජු එද මැදක් එළිමහනේ ගත කළාය. මා එළියට නොගියේ සොලමන් මහතාගේ උපදෙස් මතය. මා උදේ වරුවම ගත කලේ වැඩි දුරටත් මන්දිර් පිළිබඳ කරුණු සොයා ගැනීමටය.





බීරූට් සිට මන්දිර් කරා යා හැකි මගක් මට සොයා ගැනීමට හැකි වූයේ ස්ටුවර්ට්ගේ සටහනක් තුළිනි. මම ඒ ගැන අංජු හා කීවෙමි.

"බීරූට්වල ඉඳල මිමෝගාවලට හැතැප්ම සීයක් විතර තියෙනව. මිමෝගවලට ගියොත් අපිට මන්දිර්වලට යන පාර හොයාගන්න පුළුවන් වේවි. ඔය කියන හැටියට මිමෝගා ලොකු ටවුන් එකක්. මිමෝගවලට ස්ටුවර්ට් එයාගෙ හතරවෙනි බිරිඳත් එක්ක ගිය ගමනක් ගැන සටහනක් එයාගෙ දින පොතක තියෙනව. මොනව වුනත් සුද්දන්ට හොඳ පුරුද්දක් තියෙනව. ඒ ගොල්ලන් තමන්ගෙ දිනපොත ලියන්නෙ අනාගතයේදී කාට හරි ප්‍රයෝජනය වෙන්න. ඒකට අපි....."

"අපි මොනව කරන්නද ශාන් දින පොතක් තියා අපිට හරියට අඳින්න වස්ත්‍රයක්වත් තියෙනවද. ලොකු වුනත් ඔයා කලිසම ඉල්ල ගත්තෙත් මිස්ටර් සොලමන්ගෙන්"

"ඔයා කොහොම හරි මොනව හරි දෙයක් මට කියනව..... ඒකෙන් වැඩක් නැහැ. ඔයා තෙරේස එක්ක සල්лි ගැන කතා කලාද ?"

"ඔව්..... එයා මිස්ටර් සොලමන්ට කියාවි"

"කොයිකටත් අපිට ඉතිරිවෙල තියෙන්නෙ හෙට රෑ විතරයි."

"එයාල නම් කැමති නැහැ අපි යනවට"

"අපි හිටිය මිසක් වෙන කිසිම කෙනෙක් එක දවසක්වත් මෙහෙ ඉන්නෙ නැහැ....."

"ඇයි ?"

"මේක ගෙයක් නෙවි හොල්මන් මන්දිරයක්..... මම ජීවිතේටම අහල නැහැ මිනිස්සුයි භූතයොයි එකට ජීවත්වෙනව. කවද හරි දවසක මට ලංකාවට යන්න ලැබුණොත්, මම නම් මේ කතාව කාටවත් කියන්නෙ නැහැ. මේක කවුරුවත් විශ්වාස කරන්නෙත් නැහැ. පිළිගන්නෙත් නැහැ"

"ශාන් ඇයි ඔයා ලංකාවට යන්න ලැබුණොත් කියල කිව්වෙ. ඇයි ඔයා හිතන්නෙ ඔයාට ලංකාවට යන්න ලැබෙන එකක් නැහැ කියලද ?"



The Reader's Place Novel..

http://e-pusthakalaya.blogspot.com



"කවුද දන්නෙ අපි දැන් හිතපු දේවල්ද වුනෙ ?"

"මට ඔයාගෙ පාස්පෝට් එකයි වීසා එකයි හදල දෙන්න අමාරු වෙන්නෙ නැහැ. මදුරාසියේදී මට හුගක් දේවල් කරන්න පුළුවන්. කොමසාරිස් කාර්යාලයෙ අයත් මම හුග දෙනෙක් දන්නව. දේව් වුනත් ඔයාට උදව් කරාවි. ශාන් දන්නවද මං කෙලින්ම පූනෙ යමු කියල කිව්වෙ ඇයි කියල ....."

"නැහැ....."

"පූනෙ එස්. එස්. පී. අපේ අම්මගෙ ලොකු අක්කගෙ පුතා..... ඉතින් හුගක් දේවල් අපිට එයාට කියල ගොඩින් බේරගන්න පුළුවන් වේවි"

"ඔයා මට ඒක කලින් කිව්වෙ නැහැනෙ"

"බැංගලෝර්වලට ගියාට පස්සෙ, මම කොහොමටත් ඔයාට කියන්න හිටියෙ....."

"තව මොනව මොනව ඔයා හිතේ තියාගෙන ඉන්නවද මන්දා"

"ඒකනෙ ශාන් පිරිමියි ගෑණුයි අතර තියෙන වෙනස"

"මිටුන්....." සොලමන් මහතා කතා කරනු ඒ අතර ඇසිණ. මම සියල්ල පසෙක දමා ඔහු වෙත ගියෙමි.

"හෙට අන්තිම දවස නිසා පොඩ්ඩක් වෙන්න ගමුද ?"

ඇන්ජු කාමරයේ දොරකඩ අසල බලා සිටියාය. ඇය හිස සලනු මට පෙනිණ.

"එපා....."

"ශාලු මොද එපා කිව්වෙ....."

"නැහැ....."

"ශාලුටත් එන්න කියන්න....."

මම ඇයට කතා කළෙමි.





"තෙරේස මට ඔයාගෙ පණිවිඩේ කිව්ව. මෙන්න ඒ සල්ලි. මට ආයෙත් මේ සල්ලි ඕනෙ නැහැ"

"එපා ඒක අපි ගෙවන්නම් සර්....."

"ඔයාල මන්දිර්වලට යන්නෙ මගේ දුවට ජීවිතයක් දෙන්න. රුපියල් පන්දහකින් කොහොමද ජීවිතයක් දෙන්නෙ. මෙතන රුපියල් අටදහක් තියෙනව. මන්දිර්වලට රුපියල් තුන්දහක් පරිත්‍යාග කරන්න මිටුන්"

තෙරේසා ශාලුගේ දෑතින් අල්ලාගෙන සිටියාය. ඇය ඒ දෑත් මුවට තබා සිපගත්තේ කඳුළු පිරුණු දෙනෙතිනි.

"ලස්සන දවස් ගෙවිල ගියා. ඔයා ගියාම මට කොච්චර පාළුවක් දැනේවිද. මට මේ දවස්වල දුව නැති පාළුව දැනුනෙ නැහැ....." ඇගේ මුව සොහොසින් බරව ඇත. ඇන්ජු ඇයට මදක් තුරුළු වූවාය.

"මදුරාසියට ගියාම මම ඇන්ටිව බලන්න එනව"

"ඒක පොරොන්දුවක් ශාලු"

"ඉක්මනින් ඒ දවස් උදාවේවි....."

"මම දෙවියන්ට නැමදුම් කියන්නෙ ඒකයි. මෙහාට ආව නිසාම මොනවද අපිට ලැබුනෙ. දුකයි පාළුවයි බයයි විතරයි"

මම සොලමන් මහතාගේ මුව දෙස බැලීමි. ඔහු වහා අහක බලාගත්තේය.

"අර දරුවව අළු යන්න ඔබට දුක නැද්ද !" එසේ ඔහුගෙන් අසන්නට මට එය අවස්ථාවක් නොවීය. එහෙත් ඔහු කතාකළේ මගේ අදහස දැනගෙන විය යුතුය.

"මට ගෝත්‍රිකයො ගැන අනුකම්පාවක් තියෙනව. මොනව වුනත් උන් අපිව බලාගත්ත. අපිට කරදරයක් කළේ නැහැ. සමහර විට මිටුන්ව හොයන්න මෙහාට ආවෙත් උන් මට කරුණාකරපු නිසා වෙන්න ඇති." ඒ කතාව එතැනින් නතර කරන්නට ඔහු උත්සාහ කළේය.

http://e-pusthakalaya.blogspot.com



"තෙරේසා..... හෙට ඒ ගොල්ලො ටජානිගෙ අළු මෙහෙත් අරගෙන යනව....."

"හෙට ගමනට අඳින්න ටජානි ආස කරපු අර දම්පාට මල් ගවුම මම ශාලුට දෙනව....."

"එපා ඇන්ටි. මම බීරූට්වලින් ඇඳුම් ටිකක් ගන්න ඉන්නෙ. විශේෂයෙන්ම සල්වාර් දෙක තුනක්. ගවුම් ඇන්දම මිනිස්සු ටිකක් අපි දිහා බලන්නෙ අමුතු විදියට....."

"ඒකත් ඇත්ත. මන්දිර්වලට ගවුම් ඇඳගෙන යන්න බැරිවේවි" සොලමන් මහතා කීවේය.

"ශාලු එහෙම හිතපු එක හරි....."

අපි සොලමන් මහතාට අනේකවාරයක් ස්තූති කළෙමු. ඒ අපට කල ගරු සත්කාරවලටත්, ඔහු දුන් මුදල්වලටත්ය. ඒ මුදල් කාමරයට ගෙන ආ සැනකින්ම අප කලේ එය කොට්ටය යට තබා ගැනීමය.

හවස්වන විට අංජුගේ ඇඳුම් වේලී තිබිණ. අපි ඉන් එක් ගවුමක් ගෙන එහි ඇතුල් පැත්තේ සාක්කු තුනක් මසා මුදල් එහි සැඟවූවෙමු.

එද රාත්‍රියේ අපට සැනසීමකින් නිදගත හැකි විය. පසුද හිමිදිරියේම නැගිට අපි ගමනට සූදානම් වූවෙමු. සොලමන් මහතා අපටත් කලින් අවදි වී සිටියේය.

ඈත වෙඩි හඬක් ඇසිණ.

ඒ හිලිප්පන්ගේ සංඥාවය. සොලමන් මහතා ඊට කන්දී මද වේලාවක් බලා සිටියේය. දෙවන වෙඩි හඬ ඇසෙත්ම අපි ගමන් ඇරඹුවෙමු.

තෙරේසා කඳුළු පිරී දෙනෙතින් ඉදිරිපස උළුවස්ස අසල බලා සිටියාය.





ටික දිනක් හෝ වේවා අප සිටියේ ඔවුන්ගේ සෙවනේය. මවක් හැටියටත්, මිතුරියක් හැටියටත් ඇය අපට කල උදව් අප කෙසේ නම් අමතක කරන්නද ? අප සියල්ල සිත යට තෙරපාගෙන සොලමන් මහතාගේ මොටර් රථය නතර කොට තිබූ ස්ථානය කරා ගමන් කළෙමු.

මගදී අපට හිලිප්පන්ගේ සගයන් දෙදෙනකු මුණ ගැසිණ. ඔවුන් දෙදෙනා අතම තුවක්කු තිබිණ. වෙඩි හඬ පිට වූයේ ඒ තුවක්කු තුළිනි.

"ගෝත්‍රිකයො එළියට බහින්නෙ නැහැ. උන් තුවක්කුවලට බයයි." ඔවුන් කතා කලේ දෙමළ භාෂාවෙනි.

"උන් දන්නව මේ තුවක්කු හඬ හිලිප්පන්ගෙ බව"

වාහනය ලඟට ආ සොලමන් එය මහත් ආයාසයක් ගෙන එළියට ගත්තේය. අනතුරුව ඔහු එය පණගැන්වූවේද ආයාසයක් ගෙනය. ඊට හේතුව එය දිනගණනක් පාවිච්චි නොකිරීම නිසා විය යුතුය.

අප මෝටර් රථයට නගින්නට මත්තෙන් අපේ අත් දෙක හා ඇස් දෙක කළු පැහැති රෙදි පටිවලින් බැඳ දැමුවේය. ඒ හිලිප්පන්ගේ නියෝගයක් මතය. මා එයට විරුද්ධතාවයක් නොදැක්වූයේ අප යන මේ ගමනට ඇතැම් විට අපේ විරෝධය බාධාවක් විය හැකි බැවිනි. අපට තිබුණේ ගමන් මලු දෙකක් පමණි. එක් ගමන් මල්ලක අපේ රෙදි ටිකත් දහවලට කෑමට ආහරත් වූ අතර, අනෙක් මල්ලේ පෙට්ටියක් තුළ බහා තිබුණේ ටජානිගේ මිනී-අළුය.

පැයක පමණ ගමනකින් පසු මෝටර් රථය නතර විය. ඒ වන විටත් ඇස් හා අත් පා බැඳීමෙන් අප පත්ව සිටියේ මහත් අසීරුතාවයකටය.

මෝටර් රථයේ දොර හරින හඬ ඇසිණ.

සොලමන් මහතා හිලිප්පන්ගේ මිනිසුන්ට බැණ වදිමින් අපේ දෙනෙත් හා දෑත් බැඳ තිබූ රෙදි පටි ලිහා දැමුවේය. ඒ මොහොතේ කිසිවෙකු අප අසල පෙනෙන්නට නොවීය. වංගුවක් හා ඊට පිටුපසින් කැළයක් හැරෙන්නට පාරෙහි ගමන් කරන කිසිදු වාහනයක් දක්නට නොවීය.

http://e-pusthakalaya.blogspot.com



"ඒ ගොල්ලො කෝ ?" මම වට පිට බලමින් ඇසීමි.

"උන් කැළෑ වැදුන....."

"ඇයි උන් අපේ ඇස් බැන්දෙ"

"අවිශ්වාසෙට. උන් හැම දෙයක්ම කරන්නෙ පරිස්සමින්. උන්ගෙ වැයික්කිය දැන් පහුවෙලා..... දැන් අපට නිදහසේ යන්න පුළුවන්....."

මෝටර් රථය යළි පණ ගන්වන්නට කිපවරක්ම ඔහු උත්සහ දැරූ නමුත් එය ව්‍යවර්ථ විය. ඔහු හාත්පසම බැලුවේ ගතයුතු පියවර කුමක්දැයි කල්පනා කරමින් විය යුතුය.

"කාර් එක ටිකක් තල්ලු කරන්න වේවි"

අපි මෝටර් රථයෙන් බැස්සෙමු. අනතුරුව මා එය තල්ලු කරද්දී අංජුද මගේ සහායට ආවාය.

"ඔයා පැත්තකට වෙන්න ඔයාට බැහැ"

"නැහැ මට පුළුවන්....."

"අංජු ඔයාගෙ තුවාලෙ පෑරෙයි....."

මා එසේ කිවද මෝටර් රථය තනිවම තල්ලු කිරීම ලෙහෙසි පහසු නොවිය. අපේ ඉහෙන් කටෙන් දහඩිය ගලා ආයේය. බෑටීම තැන අංජු ඉනට අත තබාගෙන හතිලමින් නැවතුනාය. කෙතරම් අසීරු වුවද මා එය අත හැරියේ නැත. අපේ වාසනාවකටදෝ එය යළිත් පණ ගැන්විණ. එසේ නොවූවානම් තව මොහොතකින් සිදුවන්නට තිබුණේ යළිත් වරක් අප අතරමංවීමය.

බීරූටි තෙක් මෝටර් රථය ගමන් කළේ අඩු වේගයකිනි. ඊට හේතුව පාර දැඩි ලෙස අබලන් වී තිබීමය. බීරූටි වෙත ලඟා වන විට දහය පසු වී තිබිණ.

එය එතරම් විශාල නගරයක් නොවීය. නගරයට ඇතුළුවන්නට යාර සීයක් පමණ ඈතින් මෝටර් රථය නතර කල සොලමන් මහතා අපෙන් සමුගත්තේය.





"නගරයට යන්න මම කැමති නැහැ" ඔහු කියේ සුසුමක් හෙලමිනි.

"තවම මාව පොලිසියට ඕන කරන මිනිහෙක්. මෙහෙ පොලිසිවල කිසිම නීතියක් ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. හැම පොලිසියක්ම ඉන්නෙ මහජනයාගෙන් කීයක් හරි හම්බ කරන්න. ඔයගොල්ලෝ නිකමටවත් පොලිසියට අහුවෙන්න එපා. උන් තිලිප්පන්ටත් වඩා භයානකයි"

ඔහු අපට අවවාද කළේය. ඔහුගේ දෑස තෙත් වී තිබිණ. අපි ඔහුගේ පාද නමස්කාර කොට ඔහුගෙන් සමුගෙන නගරය කරා සෙමින් සෙමින් පා නැගුවෙමු. ඒ මොහොතේ කිසියම් සතුටක් අපට දැනිණ.

"ටවුමේදි ඔයාගෙ සල්ලි අදින්න එපා. මම වෙනම රුපියල් දහක් සාක්කුවෙ දාගත්ත. බාල වුනාට කමක් නැහැ අඩුගානෙ ඇඳුම් ගමු"

මදක් ජනාකීර්ණ මාර්ගයේ ඇවිදින විට බොහෝ දෙනෙකු අංජු දෙස කුතුහලයෙන් බලනු පෙනිණ. ඒ ඇගේ ඇඳුම නිසා විය යුතුය.

"ගවුම ගලවන්න එපා. සල්ලි තියෙන්නෙ ඒකෙ. ගවුමට යටින් සල්වාරයෙ කලිසම ඇන්දම හරි"

"ඔයත් යමක් දන්නවනෙ....."

"ඔයානම් ඔය බම්බුව මාරු කරන්න. ඔයාට ඉස්සෙල්ල කලිසම යනව"

"අපි දැන් මෙහෙම කතා කරන්නෙ මෙහාට ආපු නිසා නැත්තම් මෙහෙමවත් ඇඳුමක් තිබුණායැ....."

අපි මඳ දුරක් ගොස් කුඩා සාප්පුවකට ගොඩවීමු. එහිදී අපට අවශ්‍ය ඇඳුම් පැළඳුම් සියල්ල මිළදී ගත හැකි විය. ඒ අතරම අපට කුඩා නැවතුම් පොළක්ද සාප්පුකාරයාගේ පිහිටෙන් සොයාගත හැකි විය. එය පිහිටා තිබුණේ නගරයට මදක් ඈතිනි.

http://e-pusthakalaya.blogspot.com



සාප්පුකාරයාගේ දියණියට අයත් ඒ කුඩා ලැගුම් හල සරා අප ගියේ ශ්‍රී රෝද රථයකිනි. මුඩුක්කුවක් සේ බැලූ බැල්මට පෙනුනද කාමරය එතරම්ම අපිරිසිදු නොවීය. කාමර බිල රුපියල් එකසිය පනහකි. වෙනමම තරප්පු පෙළක් දිගේ ඊට නැගිය යුතු විය. තනිකාමරයක් ලෙස ඉතා කුඩාවට පෙනුනු එහි තිබුණේ තනි කෙනෙකු නිදන කුඩා ඇඳක් පමණි. වැසිකිළිය තිබුණේ පහලය.

අවස්ථාවේ හැටියට අපිට වෙන කරන්නට දෙයක් නැත.

"ඔයා ගිහින් ඉස්සෙල්ල මුහුණ කට හෝදගෙන එන්න. ඊට පස්සෙ මම යන්නම්....."

මම කාමරයේ දොර වසාගන්නට අංජුට පවසා පහත මාලයේ වූ නානකාමරය වෙත ආවෙමි. මා එහි යනවිටත් දෙදෙනෙකු පමණ තම වාරය එනතෙක් එහි රැඳී සිටියහ. මගේ වාරය එනවිට පැය භාගයකට ආසන්න වේලාවක් ගත වී තිබිණ. මා ආපසු කාමරයට යනවිට අංජු මුහුණ පුළුටු කොට ගෙන සිටියාය.

"මෙච්චර වෙලා ඔයා මොනවද කලේ..... ?"

"මේක හරියන වැඩක් නෙවි. එතන පිරිමි පෝලිමක්..... ඔයාට එතනට යන්න බැහැ. ඔයා ඇඳුම් මාරු කර ගත්තද ?

"ඔව්....."

"කාන්තාවන්ට වෙනම තැනක් තියෙනවද දන්නෙ නැහැ..... මම ගිහින් අහල එන්නම්....." මා පහත මාලයට අවුත් සාප්පුකාරයාගේ දියණිය මුණ ගැසී අංජුගේ ප්‍රශ්ණය කීවෙමි. ඇය අංජුට ඒ අනුව පහත මාලයේ ඇගේ පදිංචි නිවසේ නානකාමරය පාවිච්චි කිරීමට ඉඩ දුන්නාය.

"අප දහවලට කෑවේ තෙරේසා සාද දුන් ඉඩ්ලිය. රාත්‍රී ආහාරය ගැනීමට කඩපිලට යාමට යෝජනා කලේ අංජුය.

දහවල්. ආහාර ගැනීමෙන් පසු මා ඇඳට ගොඩ වූයේ මද වේලාවක් නිදා ගැනීමයට. එහි වූයේ එක් කොට්ටයක් පමණි. ඇඳ හැරෙන්නට බිත්තියේ ගසන ලද කණ්නාඩියක්ද ඊට අමතරව කුඩා බංකුවක්ද තිබිණ. අංජු බංකුවේ වාඩි වී සිටියාය.





"අපි මාරුවෙන් මාරුවට නිද ගමු" මම අංජුට කීවෙමි.

"කිසිම පහසුකමක් නැහැ. දෙන්නෙකුට මේ කාමරේ කොහොත්ම ඉන්න බැහැ....."

"වෙන මොකද කරන්නෙ..... මේක පිරිමින්ට වෙන්වුනු තනි කාමරයක්....."

"ඇයි ඔයා තනි කාමරයක් ඉල්ලුවේ..... ?"

"මේ පැත්තෙ හෝටල් නැහැ අංජු. ටිකක් හරි ලොකු හෝටලයකට යන්න තව කැතැප්මයක් විතර යන්න වෙනව. බ්‍රාහ්ම්ඩවරි වලට හෙට පාන්දර හයට බස් එකක් තියෙනව. එතන ඉඳල පුළුවන්නු ආරාසාලුවලට යන්න. එහෙම යනව නම් අපිට ම්මෝගාවලට යන්න ඕන වෙන්නෙ නැහැ. ඔයා ඇඳුම් ගන්න අතරෙ මම සාප්පුකාරයගෙන් විස්තර ඔක්කොම අහගත්ත....."

"හෙට පාන්දර වෙනකන්වත් මේකෙ ඉන්නෙ කොහොමද ? තනිකෙනෙකුටවත් ඔය ඇඳේ හැටිල නිදගන්න ඉඩ මදි"

"බිම නිදගන්න පැදුරක් ඉල්ල ගමුද ?"

"එපා ශාන් කොහොම හරි අපි රෑ ගත කරගමු. මට පුළුවන් මේ බංකුවෙ ඉඳගෙන බිත්තියට ඔලුව තියාගන්න"

"ඔයාගෙ සතුටක් අංජු..... ඔයාට බාත්රූම් එකට යන්න ඕන නම් කියන්න. මට ඔයාව තනියම පහලට අරින්න බැහැ"

මගේ දෑස පියවුනේ ගතෙහි විඩාවටද නැතිනම් සිතේ විඩාවටදැයි මම නොදනිමි. කුඩා කාමරයක තනි වූ අප දෙදෙනා දැන් තවත් දවසක් ගත කිරීමට සූදානම්ය. එහෙත් දෙවියනි ! මෙවැනි අත්දැකීමක් නම් තවත් කිසිදක කිසිම සිංහලයෙකුට උරුම වෙතැයි මම නම් නොසිතමි.

http://e-pusthakalaya.blogspot.com



අප සිටින කාමරයේ ටජානිගේ මිනි අළු සහිත බඳුන ඇත.
මිනි අළු තැබිය යුත්තේ සොහොන් පිටියකය.
එහෙත් අප නිදන කාමරයේ මිනි අළු තබාගත්තේයැයි මා යම් දවසක ඔබ හා කිවොත්, ඔබ එයත් පිළිනොගන්නා බව මට විශ්වාසය. එහෙත් මේ කතාවේ ගැබ්ව ඇති සත්‍යතාවය එයයි.



9

The Reader's Place novel..

මා අවදිවන විට අංජු පෙනෙන්නට නොසිටියාය. මා අංජු යැයි මදක් හඬින් කිපවරක්ම කතා කලද කිසිදු පිළිතුරක් නොවිය. මා කලබල වූ තරම කියතොත් මා පහලට දිවගියාද නැතිනම් ඉගිලුනාදැයි මම නොදනිමි. මා යනවිට සාලයේ සාප්පුකාර දියණියත් සමග අංජු තේ පානය කරමින් සිටියාය. මා දුටු විගස ඇය මට කතා කලේ කිසිදු පැකිළීමකින් තොරවය.

"එන්න ශාන් තේ බොන්න....."

"මම ඔයාව හෙව්ව....."

"මට කම්මැලි හිතුන නිසා මම පහලට ආව" ඒ පිළිතුර ඉතා සැහැල්ලුය.





"මේ කවිත..... එයත් ටිකක් දන්නව මන්දිර් ගැන. එයානම් කියන්නෙ අපිට එහෙ යන්න එපා කියල....."

"ඇයි ?"

"ඒ ගමන හරි දුෂ්කරයිලු..... අපි දෙන්නට යන්න අමාරු වෙයිලු....."

"කරන්න දෙයක් නැහැ. යන්නම වෙනව"

කවිතාගේ පියා කේරළ වැසියෙකි. ඔහු මෙහි පැමිණ ඇත්තේ වෙළඳමටය. ඒ මීට දසවසරකට පෙරය. කවිතාට ඉංග්‍රීසි භාෂාවද කතා කල හැක. ඒ ඇය කේරළයේ සිටින ඥාතීන් හා නිතර නිතර සම්බන්ධතා පවත්වන හෙයිනි. වරක් කවිතා සගාර්වලට ගොස් ඇත. සගාර් පිහිටා ඇත්තේ මන්දිර්වලට යන මහා ගංගාවෙහිම වම් ඉවුරේය. ඇය එහි ගොස් ඇත්තේ දරු වළක් ඇති කරගැනීමේ බලාපොරොත්තුවෙනි.

"තවම ඔයාලට බබාල නැද්ද ?" ඇය සිතා සිටින්නේ අප යන ගමනේද අරමුණ එය බවය.

"නැහැ" අංජු මා දෙස බලා ඇහෙන් ඉඟියක් කළාය.

"සාමිට කියල ආශිර්වාදයක් කරගන්න. ඒක හරියටම හරි..... දැන් මට ළමයි තුන් දෙනෙක් ඉන්නව. අවුරුද්දට එකා ගානෙ....."

"ඇත්තද ?"

"අවුරුදු පහක් මම ළමයි නැතුව හිටිය"

මේ දරුවන් ගැන කතාකල තෙවන වතාවය. දැන් අංජුට ඒ කතාව එතරම්ම එපා වී ඇත. එහෙත් ඉන් ගැලවෙන්නට ද අපට නොහැක්කේ, අපේ අරමුණ ගැන ඇය හා කියන්නට අපට පුළුවන් කමක් නොවූ හෙයිනි. යම් හෙයකින් ඇය අප මිනි අළු බඳුනක් මෙහි ගෙන ආ බව දැනගතහොත් තව තත්පරයක්වත් අපට මෙහි සිටින්නට ඉඩ නොදෙනු ඇත.

කඩවීදියේ ඇවිදින්නට අංජු කල යෝජනාව මා එකහෙලාම අනුමත කලේ සාප්පුකාරයාගේ දියණියගෙන් බේරීමටය. ඒ කතාව

http://e-pusthakalaya.blogspot.com



තවත් දුරදිග යන්නට කලින් අපි ඒ නවාතැනෙන් පිට වී පාරට බැස්සෙමු.

හරක් රංචු පිටින් පාරෙහි ලැග සිටියහ. එක් පසක වූ කානුවකින් බැස ගියේ දුගඳ හමන පල් වූ වතුරය. පලින් පල රොටි ගසන හඩත්, සිල්ලර කඩත් දක්නට ලැබුණු අතර, ඒ කඩ වලින්ද බොහෝ විට දර්ශනය වූයේ අපවිත්‍රකමය.

"මේක නම් මහා අපායක්. අපි ආපහු යමු අංජු" මම ආපසු හැරෙමින් කීවෙමි.

"කොහාට යන්නද අර හුංඩුවක් වගේ කාමරේටද ?"

"වෙන ඉතින් කොහේ යන්නද ?"

"බංකුවෙ ඉඳගෙන ඉඳල කොන්දත් කැඩුන. ඔයා නම් හොඳට නිදගත්ත"

ඊයෙ රෑ මට නින්ද ගියේ නැහැ අංජු. ඒක හින්ද වෙන්න ඇති දවල් නිදගත්තෙ....."

"මේ බාල සල්වාර් ඇන්දම ඇඟ කසනව"

"හැම දෙයක්ම සිද්ධවෙන්නෙ අපිට අරියාදුවට"

"එක අතකින් හොඳයි මිනිස්සු අපි දිහා ඒ තරම් බලන්නෙ නැහැ....."

"මෙහෙ ඉන්නෙ කලවම් මිනිස්සු. කව්තට හින්දිත් කතා කරන්න පුළුවන්. හුගක් වවුන් අල්ලගෙන කඩදගෙන ඉන්නෙ පිටින් ආපු මිනිස්සු"

"අපි බස් ස්ටෑන්ඩ් එක ලඟට ගිහින් බලමුද ? හෙට උදේ කෙලින්ම එතකොට එතනට යන්න පුළුවන්"

අංජු කීප දෙනෙකුගෙන්ම බස් නැවතුම් පොළ ගැන විමසුවාය. අනතුරුව අප එහි යනවිට එහි නතර කොට තිබුණේ බස් රථ දෙකක් පමණි. බ්‍රාහද්‍රාවටී වලට යන බස් රථය එවන විටත් පැමිණ තිබුණේ නැත. එය එන්නේ රාත්‍රී නමයටය. පසුද පාන්දර





පහට පිටත්වෙන ඒ බස් රථයේ අසුන් සියල්ලම හෝර පාරේ වැඩි මිළ ගනන්වලට දැනටමත් විකුණා ඇත. එය ඇසූ අංජුගේ සිත හොඳටම පෑරී ගියේය.

"දැන් මොකද කරන්නෙ....."

"හිටගෙන හරි යමු. මෙහෙ නම් තව දවසක් වත් ඉන්න බැහැ....."

අප ආපහු කාමරයට යන විට අඳුර වැටී තිබිණ. රාත්‍රී ආහාර සූදනම් කොට තිබුණේ සාප්පු කාරයාගේ දියණියයි. පරාටා සමග එළවළු හොද්දක් ලුණු ඇඹුල් සහිතව තිබූ නිසා මම කුස පිරෙන්නට කෑවෙමි. අනතුරුව අංජු මා එහි සිටියදීම, කාමරයට ගොස් ආයේ ඇගේ රාත්‍රී ඇඳුම්ද රැගෙන ඇගපත සෝද ගැන්මටය.

මාද ඇඟපත සෝදගෙන, ඇය සමගම කාමරයට ආයේ ඒ රාත්‍රිය කෙසේ ගත කල හැකිදැයි සිතමිනි. අඩි දෙකහමාරක් පලල ඇඳක එකම කොට්ටයක අප දෙදෙනා නිදගන්නේ කෙසේද ? අංජු පළමුව නිදගත යුතුය. පළමුව ඇත්තේ ඇගේ වාරයයි. ඇය ඇඳට ගොඩ වූ පසු මම බංකුව මත හිඳගෙන බිත්තියට හිස හේත්තු කොට ගතිමි.

"ශාන් ඔයා හඳන්නෙ එළිවෙනකන්ම ඔහොම ඉන්නද ?"

"ඔව්....."

"එපා ශාන්..... ඔයත් එන්න මෙතනට"

"ඔතන දෙන්නෙකුට ඉඩ නැහැ අංජු"

"එහෙනම් ඔයා ඇවිත් නිදගන්න. මං බංකුවෙ ඉන්නම්"

"එපා මම දවල් නිදගත්ත"

"ඒ වුනත් මට බැහැ ඔයා ඔහොම ඉන්නකොට නිදගන්න"

"කමක් නැහැ"

"එන්න ශාන් මෙතනට....." ඇය මට කීපවරක්ම ඇවිටිලි කළාය. ඇය බිත්තියට හැකිතරම් අයින් වූයේ මට ඉඩ සලසා දීමටය.

http://e-pusthakalaya.blogspot.com



"මේ ඉඩ ඔයාට මදිද ?"

"ඇති....."

මම ඇය සමීපයෙහිම වැතිරුනෙමි. ඇගේ උණුසුම මට දැනිණ. ඇය මගේ ගතට ඉතා සමීපව සිටියාය. ඇගේ ගතින් විහිදුනු සබන් සුවඳ මට දැනිණ.

"ශාන්"

"ඇයි....."

"ඇත්තටම මම කාගෙද ශාන්....."

"ඔයා දේවිගෙ....."

"මමත් හිතනව..... ඒත්..... මම කවදාවත් දේවි එක්ක මෙහෙම ඉඳල නැහැ. මං හිතන්නෙ මේ තරම්ම මට ලංවුනේ අම්ම ඇරෙන්න ඔයා විතරයි..... මේ දවස් ගෙවිල යන හැටි..... අපි දෙන්න කෑවෙ එකට..... නිදාගත්තෙ එකට..... දුක සැප බෙදාගත්තෙ එකම ජිවිතයක් වගේ....."

"ඔයා මොකක්ද කියන්න හදන්නෙ....." ඇය මගේ අතගෙන ඇගේ මුව මත තබාගත්තාය.

"ඔයා හරි උදාර මනුෂ්‍යයෙක් ශාන්"

"ඇයි..... ඒ....."

"මට කියන්න තේරෙන්නෙ නැහැ. ඒත් ඇත්ත ඒකයි. ශාන් දන්නවද ඉස්සර මට නින්ද යනකන් අම්ම මගේ ඔලුව අතගානව....."

"ඇත්තද ?" මම ඇගේ හිස සෙමින් සෙමින් පිරිමැද්දෙමි. ඇය දෑස් පියා ගත්තාය. මම නැගිට ගොස් විදුලි පහන නිවා දැමුවෙමි. කොහේදෝ සිට ආ පහන් ආලෝකයක් කාමරය තුළට වැටිණ. මා මඳ වේලාවක් එසේ සිටියද ඇය කිපවරක්ම මගේ ඇගමතට තද වූ බැවින් මම නැගිට අවුත් බංකුව මත හිඳගෙන බිත්තියේ හිස තබාගෙන නිදාගතිමි.

හිතේ වූ බරටම මා අවදි වූයේ හිමිදිරියේය. අංජුට කලින් මම නාන කාමරයට ගොස් මුහුණකට සෝදාගෙන ඇයට කතා කළෙමි.





"ඉක්මනට ලැහැස්ති වෙන්න. දැන් වෙලාව පහයි කාලයි....." අංජු කලබලයෙන් අවදි වූවාය.

"මම නම් ලැහැස්ති වෙලත් ඉවරයි. පහල බාත්රූම් එකට යන්න. මේ වෙලාවෙ කවුරුවත් නැහැ"

ඇය හනික ලැහැස්ති වූවාය. අප ඉන් පිටවූයේ උදෑසන තේ එකවත් නොබිය. හිමිදිරි පාන්දර බැවින් තේ කඩයක් පවා තිබුණේ බස් නැවතුම් පොලේ පමණි. අප යනවිටත් මුළු බස් රථයම සෙනඟින් පිරී තිබූ අතර, බස් රථයේ වහල උඩ යකඩ රාමුවේ පවා මිනිසුන් පටවා තිබිණ.

වෙන කල හැකි දෙයක් නැත. අපි දෙදෙනාද සෙනග තෙරපාගෙන බස් රථයට ගොඩ වුනෙමු. යන්තමට අප හුස්ම ගත හැකි අයුරින් මඳක් ඇයිනකට වුවද, කළු ඇඳුම් ඇඳගත් වන්දනා කරුවන් තවතවත් ඊට ගොඩ වූ බැවින් අපට සිදුවූයේ මහත් දුෂ්කරතාවයකට මුහුණ දීමටය. ඒ අතර අප බලා සිටියදීම එළුවන් දෙදෙනෙකුද ඊට පැටවූහ. එකෙක් තෙරපී අවුත් ගුලි වූයේ මා අසලය.

"මේක සත්තු පටවන එකක්ද මිනිස්සු පටවන එකක්ද ?" බැරිම තැන මම මඳක් වේගයෙන් ඇසීමි.

"මේකට උෟරෙක් විතරයි අඩු"

"කෑ ගහන්න එපා ශාන්....."

කළු මහත මිනිසෙකු අංජුගේ ඇගට සෙමින් සෙමින් තද වෙනු දුටු මම අංජුව මගේ ඇගට තබා ආවරණය කොට ගතිමි. ඇය මා දෙස බලා අඩ සිනහවක් පා මගේ මුළු ගතටම හේත්තු වූවාය.

"මොකද ඊර්ෂ්‍යා හිතුනද ?"

"මූන් මිනිස්සු නෙවි සත්තු"

"කවුරුත් බස් එකේ යන්න එපායැ"

"අදනම් යන්න ඉස්සෙල්ල එකෙක් දෙකෙක් මැරෙනව"

http://e-pusthakalaya.blogspot.com



කිප දෙනෙකුම අංජු දෙස බැලුවේ ගිලින්නට මෙනි. ඒ මුළු බස් රථයේම සිටි ලස්සන ගැහැණිය ඇය නිසා විය යුතුය. කවුදෝ එළුවෙකුගේ කකුල පෑගූ හෙයින් ඌ මර ලතෝනි දුන්නේය.

"දෙයියෝ සාක්කි. එළුවෙකුටවත් මේකෙ යන්න බැහැ. ඉතින් ගෑණු කොහොමද යන්නෙ....."

"ශාන් ඔය කතාව නවත්වන්න"

එකෙකු අංජුගේ අත මත අත තබනවා දකිත්ම මට වැරෙන් පහරක් ඒ අතට ගසන්නට සිතිණ. මම වහා අංජුගේ අත ගෙන අල්ලා ගතිමි.

"මේ බස්වල ඔහොම තමයි ශාන්....."

බස් රථය ගමන් කළේ මදක් වේගයෙනි. කිප වරක්ම එය වලවල් වල වැටී ගොඩ ආවේය. ඒ සෑම මොහොතකම මිනිසුන් පලින් පල විසි වී ගොස් එකිනෙකා මත වැටුනේය.

අනේ දෙවියනේ !

බස් රථය පැය දෙකක් පමණ ගමනකින් පසු බ්‍රාහද්දාවට්වලට ලඟා විය. අප ඉන් බැසගත්තේ පුදුම ගැලවීමක් හා සැහැල්ලුවක් ලබමිනි. එහෙත්, අපට එහි වැඩි වේලාවක් රැඳී සිටීමට නොහැකි විය. ඒ අරාසාලුවට යන බස් රථය එවන විටත් පිටත් වීමට සූදනම්ව තිබූ හෙයිනි. අපි දුවගොස් ඒ බස් රථයට ගොඩවීමු. එහි එතරම් සෙනඟක් නොවූ හෙයින් එක ලඟ අසුන් දෙකක වාඩි ගැනීමට අපට පුළුවන් විය. ඒ මොහොත වන විට අංජු සිටියේ මහත් අපහසුතාවයකිනි. ඇගේ මුහුණ මැළි වී තිබිණ. උදේ සිටම ආහාරයක් නොවූ නිසාදෝ ඇය වමනය යන්නට එන බව කිප වරක්ම කිවාය. ඇගේ මුවෙහි වූයේ සුදු මැළි පෙනුමකි.

"මගේ ඔලුව කරකවනව වගේ ශාන්..... මට බඩත් ගිනියි....."

"අපිට කිසිම දෙයක් කන්න ගේන්න බැරි වුනා....."

ඇය වේගයෙන් හුස්ම පිට කළාය.





"වමනෙ යන්න එනව නම් දන්න..... වතුර බෝතලේ තියෙනව දෙන්නද ?"

මම බෑගයෙන් වතුර බෝතලය ගෙන ඇය අතට දුන්නෙමි. ඇය ඉන් උගුරු කිපයක් බී දැමුවාය. අනතුරුව ඇය මගේ උඩොක්කුව මත හිස ගසා ගත්තාය.

කවුළු තුළින් සුළං පහර ඇදී ආයේය. අප අරාසාලුවලට ලඟාවන විට දහවල් දොළහ පසු වූ අතර, බස් රථයේ රැඳී සිටියේ අප හැර තවත් හතර පස් දෙනෙකු පමණි.

විශාල වශයෙන් ගල් වැටිවලින් ගහන, ජනගහණය ඉතා අඩු ප්‍රදේශයක් වූ එහි නගරයකට තිබුනේ කඩ හත අටකින් සමන්විත කුඩා පෙදෙසක් පමණි. බස් රථය අවසානයට නතර කරන විට බස් රථයේ සිටි ඉතිරි කිහිප දෙනාද බැස ගොස් තිබූ බැවින් අන්තිමට ඉතිරි වූයේ අප දෙදෙනා පමණි.

"අංජු නැගිටින්න....." මම ඇය අවදිකරමින් කිවෙමි.

"අපි බහිමු....." ඇය අවදි වී වට පිට බැලුවාය.

"මේ කොහේද ?"

"අරාසාලු....."

අපි බසයෙන් බැස්සෙමු. බසය නතර කරන ස්ථානයේම තේ කඩයක් තිබිණ. අපි රොටි කා තේ බිවෙමු. ආහාර ගැනීමෙන් අනතුරුව අංජු මදක් ප්‍රකෘති තත්වයට පත්වූවාය. ඒ අතර මා මන්දිර් ගැන කඩ හිමියාගෙන් විස්තර අසා දැන ගතිමි.

තවත් සැතපුමක් පමණ ගිය විට වානිවිලාසා සාගරය මුණ ගැසෙයි. සාගරය වශයෙන් හැඳින්වුවත් එය රළ ගසන පරාක්‍රම සමුද්‍රය වැනි විශාල ගංගාවකි. මන්දිර් කරා යෑමට සැතපුමක දුරක් ඒ ගඟ තරනය කල යුතුය. මෙතැන් සිට යායුතුව ඇත්තේ පා ගමනිනි. දහවල් කාලයේ වැල්ල රත් වී ඇති බැවින් එහි ගමන් කිරීම අතිශයින් දුෂ්කරය. ඒ නිසා බැතිමතුන් බොහෝ දෙනා ඒ ගමන යාමට තෝරා ගත්තේ රාත්‍රී කාලයයි.

http://e-pusthakalaya.blogspot.com



එහි යන අප වැනි කිපදෙනෙකුම බස් නැවතුම් පොලේදී අපට මුණ ගැසිණ. ඔවුන්ගෙන් දෙදෙනෙකු කේරළ වැසියන්ය. තවත් සිව් දෙනෙකු පැමිණ ඇත්තේ නගොඩ් සිටය. ඔවුන් එතරම් වැදගත් පිරිසක් නොවූ හෙයින් මම ඔවුන් හා සම්බන්ධවීමට නොගියෙමි. කඩ හිමියා කතා කලේ හින්දි භාෂාවෙනි. ඒ නිසා අංජුට ඔහු හා අදහස් හුවමාරු කර ගැනීමට එතරම් අපහසු නොවීය.

මන්දිර්වලට යන්නන්ගේ පහසුව තකා මග පෙන්වන්නෝද එහි ගැවසෙති. තේ කඩ හිමියා අපට උදව්වක් වශයෙන් රුපියල් සියයක මුදලකට එක්තරා විශ්වාසවන්ත මග පෙන්වන්නෙකුගේ සේවය ලබා දුන්නේය. එය අපට මහත් සැනසීමයක් විය.

රාත්‍රී කාලය තෙක් අප ගත කලේද තේ කඩයටම යාබදව පිහිටා තිබූ කුඩා මඩුවක් වැනි කොටසකය. එහි පුටුවකට වී අංජු නිදගත්තාය. මම ඇගේ නින්දට බාධා නොකළෙමි.

එහෙත් කාලය ගෙවා දැමීම මට මහත් අසීරු විය. දෙමළ භාෂාව එතරම්ම නොදත් බැවින් කඩ හිමියා සමග කතාවට වැටී නැති කරදර ඇතිකර ගන්නටද මට පුළුවන් කමක් නැත. අංජු තනිකොට දමා කඩෙන් පිටතට යාමටද මට නොහැකි බැවින් මා කලේ අපහසුවෙන් වුවද අංජු ලඟටම වී සිටීමය.

හවස හයට පමණ අපි ගමන අරඹිමු. මග පෙන්වන්නාගේ නියමය පරිදි අප ගමන් කළේ බිලි ගිලි රන්ගල් කඳු වැටිය හරහා වැටී ඇති වැලි සහිත පාරෙනි. එය එරෙන සුළු බැවින් පාවහන් පැළඳ ගමන් කිරීම පවා අපහසු විය. එහෙත් අංජුගේ සිනිඳු යටි පතුල් නිසා වැල්ලේ තවමත් නිවී නොගිය රස්නය ඇය දරාගත්තේ මහත් ආයාසයකිනි. ටික දුරක් ගමන් කොට ඇය මගේ උරහිසෙහි එල්ලුනාය.

"ශාන් මට මේ ගමන යන්න බැහැ..... " ඇය කීයේ හතිලමිනි.

"මෙච්චර දුරක් මම කවදාවත් පයින් ගිහින් නැහැ..... මගේ කකුල් රිදෙනව....."

"අපි ටිකක් ඉඳල යමු....."





මම මගපෙන්වන්නාට කිවෙමි. මා කී දෙය ඔහුට තේරුම් කොට දුන්නේ අංජුය. ඇය අසල වූ ගලක් මත වාඩි වී ගිමන් හැරියාය.

"ඇයි ශාන් අපි මේ තරම් දුකක් විඳින්නෙ. අපි ආපහු හැරිල යමු"

"ඒක කරන්න බැහැ. අපිට මේ ගමනට මිස්ටර් සොලමන් ගෙවීමක් කරල තියෙනව. අනික් අතට මේක මං ටජානිට වුනු පොරොන්දුක්....."

"ඔයාගෙ මේ විකාර හින්ද තමයි ඔක්කොම වෙන්නෙ. අපිට බීරූට් වලින් පූනෙට කොහොම හරි යන්න තිබුණ"

"ඔයාට හිතෙනවද එහෙම කලානම් ටජානිගෙන් අපිට සමාවක් ලැබෙයි කියල ....."

මග පෙන්වන්නා අපිට සංඥාවක් කළේය. ඒ අප පමා නොවිය යුතු බව ඇඟවීමටය. තවත් පැයකින් පමණ පාරුව පිටත් වෙයි. එහි යාමට හැක්කේ පනහකට ආසන්න පිරිසක් පමණි. උදේ රැයින් ගිය කොටසද එම පාරුවේ යාමට බලාපොරොත්තුවෙන් වාඩිලා සිටින බව මග පෙන්වන්නා කී විට අංජුගේ මුව තව තවත් මළානික වූවාය.

"ඒකත් හරියට අපි ආපු බස් එක වගේ. ඒකේ හිටියේ එළුවො විතරයි. මේකෙ හරක් පවා පටවගෙන යනවලු" මම සුසුමක් හෙළුවෙමි.

"යමු අංජු තවත් හිටියට ප්‍රශ්නෙ විසඳෙන්නෙ නැහැ"

මම ඇගේ බඳ වටා අත යවා ඇය වත්තම් කොට ගෙන තවත් දුරක් ගමන් කළෙමි. ඒ දුරත් ගොස් නැවතුන විට මම ඇය ඔසවා ගතිමි.

"එපා ශාන් මාව බිමින් තියන්න..... ඔයාට බරයි"

"පුළුවන් තරම් දුරක් යමු"

"ඇයි ශාන් මම මේ තරම් ඔයාට බරක් වුනේ....."



The Reader's Place novel.

http://e-pusthakalaya.blogspot.com



"නැහැ එහෙම වුනේ නැහැ....."

ඇය මගේ කර වටා අත දමාගත්තාය. තවත් දුරක් යනවිට අධික මහන්සියක් මට දැනිණ. මා හතිලනු දුටු අංජු යළිත් බිමට බැස්සාය.

"යමු ශාන් මගේ බර තවත් ඔයාට උහුලන්න බැහැ"

එවර ඇය ගමන් කලේ ඉතා සෙමිනි. රාත්‍රියේ සඳ නැග එමින් තිබිණ. මුළු අහසම තරු එළියෙන් නැහැවී තිබිණ. අප වානිවිලාසා සාගරය අසලට ලඟාවන විට බැතිමතුන් සෑහෙන පිරිසක් එහි සිටියහ. ඔවුන් සිටියේ කඳවුරු බැඳගෙනය. ඔවුන් ආහාර පිසූ ගිනි ගොඩවල් පලින් පල තවමත් දැල්වෙමින් තිබිණ.

හිටිහැටියේ ඝෝෂාවක් නැගිණ. ගඟෙහි ඈත කෙළවරේ රතු පැහැති එළියක් වරින් වර නැගී උස් පහත් වුවේය. ඒ පාරුව ඉවුරට ලඟා වීමේ පෙර නිමිත්තකි. උදේ සිට සවස් වන තුරු මග බලා සිටි පිරිසට පමණක් නොව අපටද එය සතුටට හේතු විය. ඒ අතර පිරිසෙහි සිටි තරුණ යුවළක් අප හා කුළුපග වූයේ අපේ වාසනාවටය.

ඔවුන් පැමිණ ඇත්තේ මැංගලෝර් සිටය. දෙදෙනාම උපාධිධාරීන්ය. දෙදෙනාගේම වෘත්තිය වූයේද ගුරු වෘත්තියයි. ඔවුන් පැමිණ සිටියේ ශර්මාන් ස්‍වාමිවරයා මුණ ගැසී, ඔහුගේ ආශිර්වාදය ලබා කොප්පා වෙත යාමටය. කොප්පා යාමට ප්‍රථම ශර්වාන් ස්‍වාමිවරයාගේ ආශිර්වාදය ලබාගත යුතු බව ඔවුන් පැවසුවේ පූර්ණ විශ්වාසයක් ඇතුවය.

"ඔයාල යන්නෙත් ඒකටද ?"

. ඔවුන් කතා කලේ ඉංග්‍රීසියෙනි. දිගු කලකට පසු ඉංග්‍රීසි වචනයක් පවා අසන්නට ලැබීම සතුටට හේතුවකි.

"අපි නංගිගෙ අළු අරගෙන යනව..... " මට කියවුනේ ඉබේටමය. අංජු මගේ මුව දෙස බැලුවාය.

"නංගි මැරිලද ?"

මට කට උත්තර නැති විය. මා මෙහි ආයේ නංගිටද සාරියක් ගෙනයාමටය.





"එයාගෙම නංගි නෙවි" අංජු කිවේ මා අස්වසමිනි.

"එයාගෙ නැන්දගෙ දුව....."

"ඔබා හම්බවෙන්න ගිහිල්ලද මැරුනෙ"

"නැහැ ඇක්සිඩන්ට් එකකින්"

"එහෙනම් භූතාත්මයක වෙන්න ඇති ඉන්නව ඇත්තෙ"

"ඔව්....."

"අපේ මාමවත් ශර්වාන් තුමා භූතාත්මයෙන් නිදහස් කරා....."

"ඒක හරියටම හරිද ?"

"ඔව්..... ශර්වාන් තුමා බලගතු ස්‍වාමිවරයෙක්. එයාට මුළු විශ්වයේම සියුම් තැන්වලට යන්න පුළුවන්. ඒ තරමීම එයාගෙ හිත දියුණුයි."

අප කතාකරමින් සිටින අතර පාරුවට මිනිසුන් පටවාගනු පෙනිණ. පෝලිමක් නොතිබුනු බැවින් මිනිසුන් පොරකෑවේ එහි අසුන් අල්ලා ගැනීමටය. මට උවමනා වූයේ අංජුට අසුනක් අල්ලා දීමටය. මා පොරකමින් ගොස් එක පොදියකට අයිනට වෙද්දී පාරුවෙහි වම්පස මදක් ගිලී ගියේය. ඉන් මගේ මුළු පිටුපසම තෙමී බත්වූයේ කුර්තාව අස්සේද වතුර යමිනි. එහෙත් මම මගේ උත්සාහය අත නොහැරියෙමි. අන්තිමේදී අංජුටත් මටත් වාඩි වීමට අසුන් දෙකක් ලැබිණ.

"මොකද දැන් කරන්නෙ. අර කෙල්ල හිටගෙන යන්නෙ..... ඔයා සීට් එක දෙනවද ?" අංජු මගේ කණට ලං කර ඇසුවාය.

"ඔයාට පිස්සුද මගේ පස්ස තෙමිල. කුර්ත කලිසමේ කකුල් දිගේත් වතුර බේරෙනව"

"මොකද්ද ශාන් ඔයා පොඩි ළමයෙක් වගේ කලිසම තෙමාගත්තෙ ?" මම ඇගේ ඇඟිල්ල මිරිකුවෙමි.

"කෑ නොගහ ඉන්න. ඕනකමින් කරගත්ත දෙයක් නෙවි. පොරකන කොට ඒ පැත්ත පාත් වුනා..... චික් විතරක්..... මට මෙහෙම ඉන්නත් අමාරුයි"

http://e-pusthakalaya.blogspot.com



"මොකද කරන්නෙ..... දැන්"

"මොනව කරන්නද කලිසම ලිහන්නයැයි ඔහේ ඉවසගෙන යනව මිසක්"

"අර කෙල්ල වරින් වර බලනව"

"මම අහක බලාගෙන ඉන්නෙ....."

"හැතැප්මයක් යන්න තියෙනව ශාන්"

"අනේ මන්ද ?"

"හොඳ වෙලාවට සල්ලි මගේ ලග තිබුනෙ. නැත්තම් ඒවත් තෙමෙනව....."

"මන්දිර්වලදී තුන්දාහක් එළියට ගන්න වෙනව"

"ඒකත් ප්‍රශ්ණයක්. ගවුම ඇතුලට වෙන්නනෙ සාක්කුව ඇල්ලුවෙ. සල්වාරයෙ පහල කොටස ඇන්ද එක හොඳට ගියා"

"අංජු අර දෙන්න මැංගලෝර් කියන කොට මට ඇහුනෙ බංගලෝර් කියල ..... ඒ වෙලාවෙ මගේ හිතට පුදුම සතුටක් ආවෙ....."

"මැංගලෝර් තියෙන්නෙ කොහේද බැංගලෝර් තියෙන්නෙ කොහේද ?"

"ඒකනෙ කියන්නෙ....."

"හොඳට ඔයා කියන දේත් අහගන්න. කියනදේත් හරියට කියන්න....."

"ඔයා නංගි මැරිල කියල කිව්වනෙ..... පව් ශාන්"

"මගේ කට වැරදුනා"

"ඒක තමයි මම කිව්වෙ. හුගක් පරිස්සමින් කතා කරන්න"

"හරිම ශීතලයි....."





ඇය මගේ ගතට හේත්තු වූවාය.

"දැන් හරිද ?" මම සිනහාවක් පෑවෙමි.

"ඔයත් මොනවත් දන්නෙ නැහැ"

"ඔයා තරම් දන්නෙ නැහැ අංජු"

"බබා....."

ඇගේ මුවෙහි වූ මළානිකත්වය දැන් නැත. එය මගේ සතුටට හේතුවකි. මුහුදේ නැගෙන ඝෝෂාවක් වැනි හඬක් විටින් විට නැගේ. සඳ එළිය දීප්තිමත්ව ජලය මතට වැටී ඇත. අහසේ මල් විසුරුවාක් සේ නැගී තිබූ දහසක් තරු දෙස මා දෑස් යොමු කලේ දිගුකලකට පසු සිතෙහි නැගී ආ සැනසීමකිනි.

"අංජු මගේ හිතට අද මොකක්දෝ සතුටක් දැනෙනව"

"අපි යන්නෙ ශර්වාන් ස්වාමි ලගට හින්ද වෙන්න ඇති. මටත් අමුත්තක් දැනෙනව....."

"බලන්න අංජු අහස දිහා. තරු පිරිල හරි ලස්සනයි"

"අපි දෙන්න ආශ්‍රමයේදී ප්‍රාර්ථනාවක් කරමු"

"ඒ මොකක්ද ?"

"ඊළග භවයෙත් අපි දෙන්න හමුවෙන්න කියල....."

"මේ වගේමද ?"

"හපෝ නැහැ....."

"එහෙනම්....."

http://e-pusthakalaya.blogspot.com



ඇය මා දෙස බලා අඩ සිනහාවක් පෑවාය. අප අසලම දැල්වුනු ලන්තෑරම් එළිය නිසා ඇගේ මුව මට පැහැදිලිව පෙනිණ. ඒ මුවෙහි වූයේ සඳ අනුස්මරණීය ආදර බැල්මකි. මම ඇගේ අත අල්ලාගත්තද ඇය එය සෙමින් මෑත්කොට ගත්තාය.

"එපා ශාන් මිනිස්සු බලාගෙන ඉන්නව"

"අර කපල් එකත් අපි දිහා බලනව"

"මේක යන්නෙ හරිම හෙමින්"

"මම අර කෙල්ලට කතා කරන්නද ? හිටගෙන යන හින්ද පවි කියලත් හිතෙනව"

"ඔයාගෙ කැමැත්තක්"

මම ඇයට හඬ ගසා මගේ අසුන ඇයට දුන්නෙමි. ඇය අංජු හා කතාවට වැටුනාය. ඇගේ නම අම්ෂාය. ඔහු කුමාර්ය. ඔහු මන්දිර් ගැන බොහෝ තොරතුරු අපට කියා දුන්නේය. මන්දිර්වල වෙනමම කොටසක ඇත්තේ කුණු වී දිරායන මළ මිනිය. ඉන් ගලන ඕජස ආඝ්‍රාණය කරන භූතයින් සිටින්නේ ගල්ලෙනකය. සෑමිවරයාගේ අණසක යටතේ සිටින එකී භූතයින් බලා සිටින්නේ ඔවුන්ගේ ගැලවීමේ වාරය එනතුරුය.

පූනෙ ගැනද ඔහු දනී.

ඔහුගේ අදහස අනුව පූනෙ යාමට නම් අප මුලින්ම යායුත්තේ නාපි වෙතය. පනාපි ගෝවේ අගනුවරයි. ගෝවෙට ගිය විට එතැන් ිට පූනෙ යන මාර්ගය අංජු දනී. ඇය කීප වතාවක්ම ගෝවෙ පැමිණ ැත. එහෙත් කුමාර්ගේ අදහස පනාපි යාමට ඇති කෙටිම මාර්ගය තා දුෂ්කර බවය. අප ඒ සඳහා ඉතා දුෂ්කර පළාත් කීපයක්ම සුකල යුතුය. කුමාටා, ඇත්කෝල, බලා යන බස් ඉතා අබලන්ය. ඒ ස් ද බොහෝ විට ගමන් කරන්නේ රාත්‍රී කාලයේය. එයට හේතුව, නගහනය අධික වීමත්, ගොනුන් බැඳි කරත්ත ඉතා විශාල මාණයක් දහවල් කාලයේ මාර්ගවල ගමන් කිරීමත්ය.

අප සොලමන් මහතාගේ නිවසේදී සිතුවාක් මෙන්ම, කුමාර්ගේ මුවීම අපට දෙවියන් ලබාදුන් ත්‍යාගයක් බඳුය.





"හැම දෙයක්ම හොඳින් සිදු වේවි. ඔයගොල්ලො සගාර්වලට ගිහින් ජෝග් ෆෝල්ස්වලට යන්න. සගාර්වල ඉඳල ජෝග්ෆෝල්ස් යන්න පුංචි බෝට්ටු දෙක තුනක් තියෙනව....."

"කුමාර් අපිට උදව් කරන්න" මම ඔහුගේ අත කිසියම් සෙනෙහසකින් අල්ලා ගතිමි.

"සත්තකින්ම..... " ඔහු මගේ සිතට දහසකුත් බලාපොරොත්තු ඇති කළේය.



The Reader's Place novel..

http://e-pusthakalaya.blogspot.com



දැන් අප සම්පව ඇත්තේ අවසාන අදියරයටය. අප යන ගමන් මාර්ගය දැන් පැහැදිලිය. අප දැන් තනා ඇත්තේ, ලෝක ප්‍රකට සඳනුස්මරණිය ආදරය වෙනුවෙන් තැනූ ටජ්මහල දැයි විටෙක මට සිතේ.



10

එය බිලිගිලිරන්ගන් කඳු වැටියේම කොටසක් සේ පිහිටා තිබුණේය. වඩාත් ජලජ පක්ෂීන් ගහන දූපතක් සේ බැලූ බැල්මට පෙනුණද එය විශාල ගල් තලාවක් විය. එහි ලඟාවන විට මධ්‍යම රාත්‍රියට ආසන්න වී තිබිණ. පාරුව නතර කරත්ම, අපි ගල් තලයට යාබදව තනා තිබූ ලී වේදිකාවකට බැස ගතිමු. එහි පලින් පල විශාල විලක්කු දැල්වෙමින් තිබිණ. පූජාව තිබුණේ මධ්‍යම රාත්‍රියේය. ඒ සඳහා ගල්ලෙනක් වැනි තැනක ගිනි මැලයක් දල්වා තිබූ අතර, ඒ අවට පූජකයින් කිප දෙනෙකු වාඩි වී ස්තෝත්‍ර කියමින් සිටියහ.

"මිථුන්....."

කුමාර් මට කතා කලේද ඒ නමිනි. ඊට හේතුව අප කිසිවක් අපේ තතු ඔවුන් සමග නොකීමය. එසේ කියන්නට හැකියාවක්ද අප





සිටින තත්වය අනුව අපට නොවිය. ඉන්දියානු සංස්කෘතිය අනුව අවිවාහක යුවළකට මෙලෙස මේ ගමන පැමිණෙන්නට කෙලෙසකවත් ඉඩක් නැත. එහෙයින් අපි හැකි හැමවිටම ප්‍රවේශම් වීමට වග බලා ගතිමු.

කුමාර් අපව ගල්තලාවේ වූ එක්තරා කුඩා මණ්ඩපයක් වෙත රැගෙන ගියේය. ඒ ශර්වාන් සාමිවරයාගේ අසුපුව වූ අතර, එහි ඉදිරිපස බොහෝ දෙනෙකු වාඩි වී සිටියහ.

සුදු වස්ත්‍රයක් ඉණට ඇඳ උඩුකය නිරුවත් මහලු මිනිසෙකු අප ඉදිරියට අවුත් කුමාර්ගෙන් යමක් විමසුවේය. ඔහු කතා කලේ කුමන භාෂාවකින්දැයි මම නොදනිමි. අංජුටද එය වටහා ගැනිම අසීරු විය. කුමාර් අප දෙස බලමින්ම යමක් විස්තර කලේය.

"මෙහාට ආධාරයක් කරනවද ?" කුමාර් මගෙන් ඇසිය.

"ඔව්....."

"කීයක් විතර....."

"රුපියල් තුන්දහක්"

"තුන්දහක් ?"

පූජකයාගේ නලලේ රැළි ගැන්වෙනු පෙනිණ. ඔහු හනික අප දෙදෙනාව රැගෙන ගියේ අසපුව අභ්‍යන්තරයේ වූ කුඩා කුටියකටය. එහි වූ තැටියක් පෙන්වා මුදල් එහි තබන ලෙස ඔහු මට සංඥාවක් කලේය. මම රුපියල් තුන්දහ එහි තැබිමි. අනතුරුව, ඔහු අප දෙදෙනාත් කුමාර් යුවළත් ළිඳක් වෙත කැඳවාගෙන ගියේය. ඒ ළිඳ ජලයෙන් පිරී තිබූ අතර, විශාල බඳුන් දෙක තුනක්ම ඒ අසල තවා තිබිණ.

"මිථුන් ඔය දෙන්නම බාල්දි හතක් මේකෙන් නාන්න" කුමාර් අපට කියේ ඉන් එක් බාල්දියක් මා අතට දෙමිනි.

"මේ ඇඳුම් පිටින්ම නාන්නෙ කොහොමද ?"



The Reader's Place novel..

http://e-pusthakalaya.blogspot.com



ඔහු සිනහවක් පෑවේය. අනතුරුව මා බලා සිටිද්දීම ඔහු තවත් බාල්දියක් ගෙන වතුර බාල්දි හතක්ම හිසට වත් කරගත්තේය. අම්ෂාද ඔහු අනුගමනය කළාය. වෙන කල හැකි දෙයක් නැති තැන මා වතුර බාල්දියක් ගෙන එය ඇංජුගේ හිසට වත් කළෙමි.

ඇය වහා අහකට පැන්නාය.

"හරිම ශීතලයි"

මම එක වතුර බාල්දියක් ඇද ඔලුවට වත්කොට අනිත් බාල්දි හයම එක දිගට වත්කර ගතිමි. ඇංජු සීතලෙන් වෙව්ලමින් පසෙකට වී බලා සිටියාය. ඇය අකමැති වුවද මා ඊළගට කලේ ඇය නැහැවීමය.

අපේ ඇඳුම් තෙත බරිත වී තිබිණ.

වරින් වර තමා එන පුළඟට අප කට කට ගා වෙව්ලනු අපට දැනිණ. ඒ අතර පූජකයා අප කැඳවාගෙන ගල්ලෙනක් වෙත ගියේය. එහි දෙපස විලක්කු දැල්වෙමින් තිබුණු අතර දැඩි උණුසුමක් එහි විය. ඒ ගල් ලෙනෙහි අපට යන්තම් ලැබුණේ මඳ දුරක් පමණි. මරලතෝනි දෙමින් විලාප තගන විවිධ රාවයන් අපට ඇසිණ.

"ඔය කෑගහන්නෙ භූතාත්ම. මළුන් මේ ගල්ලෙනේ එම පැත්තෙ අළු වළල තියෙනව. එයාලගෙ කාලයත් ආයුෂත් අවසන් වෙනකන්....."

ගල්ලෙන අවසාන වූයේ විශාල කොටු මිදුලකිනි. අප ඒ කොටු මිදුලට පිවිසෙන විට පුදුමයකි. අපේ ඇඳුම් සියල්ල වියළී තිබිණ. පූජකයා අප කොටු මිදුලෙහි මැදකට නතර කොට, විශාල කඹවලින් තැනූ දොරක් ඇරගෙන ඇතුලට ගියේ අප දුන් අළු බඳුනද රැගෙනය.

පැය කාලකට ආසන්න මොහොතක් ගත වෙන්නට ඇත. පූජකයා යළිත් වරක් අප කැඳවූවේය.

"කුමාර් එන්න යන්න අපිට මේ භාෂාව තේරෙන්නෙ නැහැ"

මම කුමාර්ට යෝජනා කළෙමි.



The Reader's Place novel..



අපට කුමාර් මෙන්ම අම්ෂාද උදව් කලහ. ඔවුන් සමග පූජකයා ගමන් කරන ස්ථානය කරා යාමටද ආහ. පූජකයා අපට අසුන් ගන්නා ලෙස අවසානයට තිබූ විශාල ගල් පර්වතයක් අසලය. ඒ මුළු ගල් පර්වතයම සඳ එළියෙන් ආලෝකමත් වී තිබුනද හතර වටින්ම වෙලාගෙන තිබුණේ ගස්වල සෙවනැලිය. පුළඟේ ගස් සෙලවෙන ආකාරයට සෙවනැලිද සෙලවෙනු පෙනිණ.

"බලන්න අර පර්වතය දිහා....." ද්‍රවිඩ භාෂාවෙන් කවුදෝ කියනු අපට ඇසිණ. අප ඒ දෙස බලා සිටියෙමු. සුදු පැහැති දුමක් අප සිටි දෙසට පාවී ආයේය. එහි වූයේ සිත අවුල් කරවන සුව ප්‍රසන්ධයකි.

"භූතාත්මය කාගේද ?"

"අපේ....." මම පිළිතුරු දුන්නෙමි.

අප ඉදිරියේ සිටියේ ඇට මාලයක් අනිත් ගත් කොණ්ඩය තාපසයෙකු සේ බැඳ සිටි තුඩා මිනිසෙකි. පූජකයා ඔහුට වැඳ නමස්කාර කළේය.

"ඒ තමයි ශේවාන් තුමා"

කුමාර් මගේ කනට කොඳුරා කියද්දී මම තවත් බලා නොසිට ඔහුගේ පාද නමස්කාර කළෙමි. ඔහු අත මා දුන් කළය තිබිණ. ඒ කළය වෙත යමක් මැතිරූ ඔහු එය ගල්පරය වෙත විසි කළේය. එය ඈතට ගොස් බිම වැටුනද ඉන් නැගී ආයේ අස්වාභාවික හඬකි. ඔහු තවත් මොහොතක් දෑස් පියාගෙන යමක් කියාගෙන කියාගෙන ගියේය.

"එයා එනව දරුව..... එයා තව ටිකකින් පර්වතයට ලගා වේවි"

මා සිටි තැන දෙදරනු මට දැනිණ. ඇංජු මා අල්ලා ගත්තාය. ඔහු පර්වතය දෙසට දෑත් යොමුකරමින් කුමක්දෝ මතුරන්නට පටන් ගත්තේය. වේගවත් සුළං පහරක් අප දෙසට ඇදී ආයේ බලාපොරොත්තු නොවූ අයුරිනි. ඒ සුළං පහරට අප විසිවී ගොස් බිත්තිවල පවා හොගැටී බේරුණේ අනුහවයෙනි.

http://e-pusthakalaya.blogspot.com



නිල් පැහැති එළියක් ශර්වාන් තුමාගේ ශරීරයෙන් පිටවෙන්නට විය.

"එයා එනව දරුව....." ඒ ගැඹුරු කට හඬ යළිත් වරක් මතු විය.

"බලන්න පර්වතය දිහා....."

අපි පර්වතය දෙසට නෙත් යොමු කළෙමු.

සුදු පැහැති ඡායාවක් ඈත එනු පෙනිණ. සුදු දිග ගවුමක් හැඳ තොප්පියක් පැළඳ සිටි ඒ රූපය අප බලා සිටිද්දීම පර්වතයේ අඳුරු තැනකින් නොපෙනී ගියාය. මොහොතකින් සියල්ල නිශ්චල විය.

"තව මාස දෙකයි දවස් හතකින් එයාට පිවිතයක් ලැබේවි. ඒ පීවිතය වෙනුවෙන් අද සිට පුරා මාස දෙකක් ඇය වෙනුවෙන් දේව පූජා මෙහෙ පැවත් වේවි. දේව කන්නලව් මේ විශ්වයට පාවී යාවි. එවිට ඇයට අළුත් භවයකට ආරාධනා ලැබේවි. ඒත් අපිට ඇගේ කර්ම ශක්තියන් වලක්වන්න බැහැ. ඒ හැම කර්මයක්ම අළුත් බවයේදී ඇයට එල විපාක ලබාදේවි"

ඔහුගේ කතාව නතර විය.

කුමාර් හා ඔහුගේ බිරිඳ ඒ අතර ඔහුගේ ආශිර්වාදය ලබාගත් අතර ඔහු මගේ හිස මත අත තබා යන්නට ගියේය. එතැනින් සියල්ල අවසන් විය.

"මිටුන් අපි දැන් යමු. වෙන මොනවද ඔයාලට ඕන කරන්නෙ" කුමාර් ඇසුවේ මා සිදු වූ දේ ගැන සිතමින් සිහි එළවාගත නොහැකිව ගල් ගැසී බලා සිටිද්දීය. අංජු මගේ අත තරයේ අල්ලාගෙන සිටියාය. ඒ සමගම ඈත අදේනාවක් යළි නැගී ආයේය.

"අපි මෙතන ඉන්න හොඳ නැහැ මිටුන්..... සමහර ප්‍රේතයෝ මලම්නිවල ඕජස ආඝ්‍රාණය කරන වෙලාව. අපි ඉක්මනට මෙතනින් පිට වෙමු."





මගේ සිතට අමුතුම බියක් දැනිණ. මම අංජු සමග ඔවුන් හා එක්ව එතැනින් පිට වී ආවෙමු. මට තවත් කිසිවක් උවමනා නොවිය. අපි හැකිතරම් ඉක්මනින් අවුත් පාරුව අසලට ලගාවීමු.

ලන්තෑරුමක් එතැන එල්ලෙමින් තිබිණ. බැතිමතුන් වෙනුවෙන් ආහාර පිසින පිරිසක්ද එහි සිටියහ. ඔවුන්ගෙන් අපට අල හොද්දක් සහිත රොටි කිහිපයක් ලැබිණ. අවස්ථාවේ හැටියට අප ඒ ආහාර ගිල දැමුවේ ඒ වන විටත් අප සිටියේ අධික කුස ගින්නෙන් බැවිනි.

"අද හුගදෙනෙක් මෙහෙ ගත කරාවි. මෙහාට එන හුග දෙනෙක් දවස් දෙකක පූජාවකට සහභාගි වෙල ආත්මයන් වෙනුවෙන් පූජා සත්කාර කරනව"

"අපිට එකෙන් වැඩක් නැහැ කුමාර්..... අපිට දැන් ඕන කරන්නෙ මෙහෙන් හැකි තරම් ඉක්මනින් පූනෙවලට යන්න....."

"පූනෙවලට යන්න කලින් ඔයාලට ජෝග්ෆොල්ස්වලට යන්න වෙනව. ජොග්ෆෝල්ස්වලට මට පුළුවන් ඔයාලව ඇරලවන්න සාගාර් ගියාට පස්සෙ..... අනිත් එක ඔයාලත් කෝප්පාවලට ගියොත් හොඳයි. ආයෙත් මේ වගේ ගමනක් ඔයාලට ලෙහෙසියෙන් එන්න ලැබෙන්නෙ නැහැ"

"අපි දැන්ම ඔබාල බලාපොරොත්තු වෙන්නෙ නැහැ" අංජු ගත් කටටම කීවාය.

"ඒ වුනත් පස්සට හරි බලාපොරොත්තු වෙනවනෙ. ඔයා ආශිර්වාදයක් ලබාගන්න....."

"මොකද කියන්නෙ අංජු....."

"අපි කෙලින්ම යමු"

"එහෙනම් ඔයාලට යන්න වෙන්නෙ හෙට"

"ඒ ඇයි..... ?"

http://e-pusthakalaya.blogspot.com



"මේ පාරුව බැතිමත්තු ඇරලන්නෙ ආයෙ හෙට හවස. එතකන් ඔයගොල්ලන්ටත් මෙහෙ රැඳෙන්න වේවි"

"ඒ කියන්නෙ තවත් දවසක්....."

"ඔව්....."

"අනේ දෙවියනේ අපි කොහොමද මෙහෙ තවත් දවසක් ඉන්නෙ....."

"එහෙනම් අපිත් එක්ක කොප්පාවලට යමු"

"ඔයගොල්ලො යන්නෙ කොහොමද ?"

"පොඩි ඔරුවකින්..... අර එහා පැත්තෙ ඔරු දෙකක් නවත්තල තියෙනව. ඔයගොල්ලො එනව නම් මට ටිකක් ලොකු ඔරුවක් ගන්න පුළුවන්"

අංජු නලලේ අත තබා ගත්තාය.

"යමු අංජු වෙන කරන්න දෙයක් නැහැ"

මම කීවෙමි. කැමැත්තෙන් හෝ අකමැත්තෙන් හෝ ඒ ගමන යායුතු විය. කුමාර් මදක් විශාල ඔරුවකට කතා කළේය. ලන්තෑරුමක් ඔරුවේ කොනක් වූ ලියක එල්ලාගෙන ඔරුකරු අප රැගෙන ඒ මධ්‍යම රාත්‍රියේ ගමන ඇරඹුවේ කෝප්පාවෙතය.

අධික නිදිමතක් දැනුනද මම නිඳ නොගතිමි. ඒ ගමන එතරම් සුබදයක නොවිය. සුළං පහරත් සමග වරින්වර ඔරු කඳ පැද්දෙනු මට දැනිණ. අංජු ඒ කිසිවක් නොදන්නාක් සේ මගේ ඔඩොක්කුව මතට හිස තබාගෙන නිදගත්තාය. ඒ තවත් පැය දෙකක ගමනකි.

සාගාර්වලට ඒමට ඔරුවට පැය දෙකකට ආසන්න කාලයක් ගත වෙන්නට ඇත. ඔරුව නතර කලේ සාගාර්වල වූ එක්තරා කුඩා ගම්මානයක් වැනි ස්ථානයකය. එය ඉවුරේ නතර කරත්ම, කීප දෙනෙකුම අප දෙසට දිව ආහ. මම අංජු නැගිටුවා ගතිමි.

කුමාර් මට කීයේ ඒ බැතිමතුන් උදෙසා නවාතැන් පහසුකම් සලසන්නන් බවය. ඔවුන් සැම කෙනෙකුම අත අපේ කතරගම සේ පූජා වට්ටි වැනි කොළවලින් සාදන ලද වට්ටි තුළ විවිධ පාටින්·යුත්





ඇය එසේ කීවේ ඇයි දැයි මම නොදනිමි. ඇගේ හැසිරීමේ කිසියම් වෙනසක් මට පෙනිණ. ඇය කවුළුව අසලට වී මඳ වේලාවක් කල්පනා කරමින් සිටියාය.

"අංජු මට සීතලක් දැනෙනව....."

ඇය මා අසලට අවුත් ඇඳ මත වාඩි වූවාය. ඇය මා දෙස බලා සිටියේ කඳුළු පිරී ගිය දෙනෙතිනි.

"ඇයි අංජු ඔයා අඬන්නෙ.....?"

"නැහැ මොකවත් නැහැ....."

"මට හරි අමුත්තක් දැනෙනව අංජු..... මගේ හිසත් කකියනව. මාව ශීතලෙන් වෙව්ලනව වගේ..... මට මොකවත් වෙයිද ?"

"නැහැ ශාන් කිසිම දෙයක් වෙන්නෙ නැහැ"

මට ඔයා ගැන බයයි අංජු....."

"ඇයි ඒ....."

"අපිට මෙහෙ ඉන්න සල්ලි තියෙනවද ?"

"හ්.....ම්"

"ඇයි මට මෙච්චර ශීතලක් දැනෙන්නෙ..... මගේ තොලත් වෙව්ලනව..... මේ බලන්න"

ඇය මා දෙස මඳ වේලාවක් බලා සිටියාය. අනතුරුව ඇය මගේ මුව ඇගේ පපුවට තබා තුරුළු කොට ගත්තාය. ඇගේ ඒ උණුසුම මට දැනිණ. ඇය සිහින් හඬින් ඉකි ගසනු මට ඇසිණ. මම ඇය තරකොට අල්ලා ගතිමි. මගේ දෑස් නිදිබරව ගියේය.

"දැන් හරිද ?"

ඇය අසනු මට යන්තමට ඇසිණ.

"ඔයා මේ බේත් ටික බොන්න. නිදි පෙත්තකුත් තියෙනව. හොඳට නින්ද ගියාම, හෙට උදේට ඔයාට සනීපයක් දැනේවි."

ඇය මගේ කටට බෙහෙත් පෙති කිහිපයක් දැමුවාය. අනතුරුව ඇය මගේ නලල් තලය පිරිමදිනු මට දැනිණ. මගේ දෑස් නිදිබරව මා කොහේකටදෝ පාවී යන්නාක් සේ මට දැනිණ.

http://e-pusthakalaya.blogspot.co

මා යළි අවදිවන විට උදෑසන හිරු රැස් කවුළුව තුළි කාමරයට වැටී තිබිණ. මගේ හිසෙහි වේදනාව අඩු වී තිබිණ. ම ඇඳ මතින් නැගී සිටියෙමි. අංජු කාමරයෙහි පෙනෙන්න නොසිටියාය. මම ඇයට කතා කළෙමි. එහෙත් ඇය ආයේ නැත. ඇ වෙනුවට ආයේ රාජුය.

"ඇයි මහත්තය මොනවද ඕන කරන්නෙ....."

"කෝ නෝන..... ?"

"නෝන පාන්දරින්ම ගියා. මහත්තයට මේ ලියුම දෙන්න කිව්ව"

ඔහු මා අතට ලිපියක් දිගු කලේය. මම එය අතට ගෙන කියව බැලීමි.

ආදර ශාන්....."

මේ ලියුම කියවන විට, මම මෙලහකට හුඟක් දුර ගිහින්. ම ඊයේ කැන්සල් කලේ ඔයාගෙ ටිකට් එක විතරයි. ඔයා හිතුව හ ශාන්. අපි දෙන්නට මෙහෙ සතියක් ගත කරන්න සල්ලි නැහැ. ඒ නිස මං තීරණය කලා මේ ගමන තනියම යන්න. ඇරත් මං කොහොම ඔයත් එක්ක ගෙදර යන්නෙ ? ඒ ගොල්ලො අපි දෙන්නව දැක්ක ගම සැක කරාවි. මම ගෙදර ගිහින් මේ ප්‍රශ්නෙ හෙමින් සැරේ විසඳගෙ දේවි එක්කම ඔයාව බලන්න හැකි ඉක්මනින් එන්නම්. ඒ ආවම අ කෙලින්ම වෙන්නායි ගිහින් පාස්පෝට් හදගමු.

අනික් අතට සල්ලි නැතුව දැන් මොකවත් කරන්න බැහැ ඔයාගෙ බිලත් ගෙවන්න තියෙනව. අරුණිට වෙඩින් සාරිය ගන්න තියෙනව. මගේ ගානෙ අරුණිට තෑග්ගක් දෙන්නත් ඕන. ඒ නිසයි ම මේ තීරණය ගත්තෙ. මං එනකන් ඔයාව හොඳින් රාජු බලා ගනිවි ඔයාට දෙවි පිහිටයි.

The Reader's Place novel



මේ

අංජු

නිමි.

http://e-pusthakalaya.blogspot.co





The Reader's Place
Novel..

මිල රු. 275/-